7 කොටස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ එමගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා පිළිබඳ හැඳින්වීමක්

මෙම කොටසින් රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ඇති පහසුකම් පිළිබඳව විස්තර කෙරේ. මීට අමතරව, එක් එක් විශ්වවිද්‍යාලයේ/ උසස් අධ්‍යාපන ආයතනයේ පවත්වන පාඨමාලා පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් ද ඔබට ලබා දේ.

කොළඹ විශ්වවිද්‍යාලය	2
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	8
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	17
කැලණිය විශ්වවිද්‍යාලය	30
මොරටුව විශ්වවිද්‍යාලය	46
යාපනය විශ්වවිද්‍යාලය	50
රුහුණ විශ්වවිද්‍යාලය	52
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව (මඩකලපුව)	61
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ඔලුවිල්)	63
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (මිහින්තලේ)	65
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (බෙලිහුල්ඔය)	71
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (කුලියාපිටිය)	78
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	84
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	89
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	95
වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	96
ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය	96
ත්‍රීකුණාමල මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	97
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය	97
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	97

7 කොටස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ එමඟින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා පිළිබඳ හැඳින්වීමක්

කෙටි නම්:

ව්‍ය. ගණිතය	-	ව්‍යවහාරික ගණිතය	රසායන වි.	-	රසායන විද්‍යාව
ශු. ගණිතය	-	ශුද්ධ ගණිතය	භෞතික වි.	-	භෞතික විද්‍යාව
සං. හා පරි. විද්‍යාව	-	සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව	උද්භිද වි.	-	උද්භිද විද්‍යාව
පරි. විද්‍යාව	-	පරිගණක විද්‍යාව			
සං. පර්. සහ තො. තා.	-	සංකාර්යය පර්යේෂණ සහ තොරතුරු තාක්ෂණය			

ඉ/මා - ඉගැන්වීමේ මාධ්‍යය

S - සිංහල T - දෙමළ E - ඉංග්‍රීසි A - අරාබි

කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	-	S/T/E
කළමනාකරණය +	-	E
නීතිය	-	E
වෛද්‍ය විද්‍යාව	-	E
භෞත චිකිත්ස	-	E
කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය*	-	E
ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව*	රසායන විද්‍යාව, ශාක විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
ජෛවීය විද්‍යාව*	රසායන විද්‍යාව, ශාක විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, සංඛ්‍යානය, රසායන විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, සංඛ්‍යානය, භෞතික විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව*	ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව	E
භෙද	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය	-	E
යුනානි වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය	-	E
ප්‍රාථමික අධ්‍යාපනය	-	S
වෛද්‍ය ප්‍රතිබිම්භ තාක්ෂණය	-	E

[+]කළමනාකරණ හා මූල්‍ය පීඨය

හැඳින්වීම

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇතිවන ප්‍රවණතාවන්ට සරිලන පරිදි 2009 වසරේදී කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨය මඟින් ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව සඳහා නව විෂය මාලාවක් හඳුන්වා දෙන ලදී. මෙම නව විෂය මාලාවෙහි මූලික අරමුණ වන්නේ ශාස්ත්‍රීය උසස් අධ්‍යාපනය හා කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අවශ්‍යතා අතර පවතින පරතරය අවම වන අයුරින්, ශාස්ත්‍රීය හා ප්‍රායෝගික යන දෙඅංශයේම දැනුමෙන් යුත් උපාධිධාරීන් පිරිසක් බිහි කිරීමයි. නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙන් පහත සඳහන් අරමුණු සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

- විවිධ ක්ෂේත්‍රයේ විශේෂඥභාවයකින් යුත් පීඨ ව්‍යාප්ත උපාධි පාඨමාලාවක් හඳුන්වා දීම.
- දැනට පවතින දෙපාර්තමේන්තු ශාස්ත්‍රීය වශයෙන් විශේෂිත වූ සේවා දෙපාර්තමේන්තු බවට පත්කිරීම.
- පාඨමාලා ඒකක ක්‍රමය (Course Unit System) හඳුන්වා දීම.
- ඉගෙනුම් ක්‍රියාවලියේ නම්‍යශීලී බවත්, පෘථුල බවත් වැඩි දියුණු වන අයුරින් වෛකල්පිත පාඨමාලා (Elective courses) ප්‍රමාණය වැඩි කිරීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ අදාළ ප්‍රායෝගික පුහුණුව සඳහා විද්‍යාර්ථීන්ට අවකාශය සලසා දීම.

ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව (BBA)

මෙය සිව් අවුරුදු පූර්ණකාලීන- ගෞරව පාඨමාලාවකි. ගිණුම්කරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මූල්‍යකරණය, ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය සහ ජාත්‍යන්තර ව්‍යාපාර යන විෂය ධාරාවන් සඳහා ද කළමනාකරණ පීඨය මඟින් උපාධි පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලාවෙහි විෂය මාලාව අදියර I (BBA Level I) සහ අදියර II (BBA Level II) වශයෙන් කොටස් දෙකකින් යුක්තවන අතර, එම සෑම අදියරක්ම පිළිවෙලින් සෙමෙස්තර හතරකට (04) අයත් වේ. ඒ අනුව සම්පූර්ණ උපාධි පාඨමාලාව සෙමෙස්තර අටකින් (08) සමන්විත වේ. BBA අදියර II හි දී (එනම් V, VI, VII, VIII සෙමෙස්තර වලදී) විද්‍යාර්ථීන් තෝරා ගන්නා විශේෂ විෂය ධාරාව කුමක් වුව ද BBA අදියර I (එනම් I, II, III හා IV සෙමෙස්තර) සෑම විද්‍යාර්ථියෙකුම පොදුවේ හැදෑරිය යුතු වේ.

ඒ අනුව (විද්‍යාර්ථීන්ට) පහත සඳහන් උපාධි පාඨමාලා හැදෑරිය හැකිය.

- ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- ගිණුම්කරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- ව්‍යාපාර ආර්ථික විද්‍යාව - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- මූල්‍ය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- ආගන්තුක සත්කාර සහ විවේක කළමනාකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- මානව සම්පත් කළමනාකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- ජාත්‍යන්තර ව්‍යාපාර - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව
- අලෙවිකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව

මෙම උපාධි පාඨමාලා පිළිබඳ කෙටි හැඳින්වීක් පහත දැක්වේ.

ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours)

කළමනාකරණය සහ සංවිධාන හා සම්බන්ධ විවිධ පර්යාවලෝකනයන් පිළිබඳ අත්‍යවශ්‍ය දැනුම, කුසලතාව සහ පුහුණුව ලබාදීමේ අරමුණින් මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර තිබේ. කළමනාකරණය සහ සංවිධානය පිළිබඳ ප්‍රමාණවත් න්‍යායාත්මක අවබෝධයක් සපයන අතරම, කළමනාකරණය සහ ආයතනික ක්‍රියාකාරකම් ආශ්‍රිත තත්කාලීන ගැටළු විශ්ලේෂණය කිරීමේ හැකියාව විද්‍යාර්ථීන්ට ලබාදීම මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වේ.

ගිණුම්කරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Accounting)

මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන විද්‍යාර්ථීන් සඳහා ගිණුම්කරණය පිළිබඳ මූලික අවබෝධයකින් යුතුව ආයතනික ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම, අදාළ තොරතුරු වාර්තා කිරීම, ආයතනික පරිපාලන ක්‍රමවේද සැලසුම් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම යනාදිය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපාර ආර්ථික විද්‍යාව - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Business Economics)

මෙම පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් හට ව්‍යාපාර පිළිබඳව ආර්ථික විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයකින් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දෙනු ලැබේ. ආර්ථික විද්‍යාව පිළිබඳ සම්ප්‍රදායික උපාධි පාඨමාලාවලදී මෙන් නොව මෙහිදී කළමනාකරණය හා සම්බන්ධ සියලු හර විෂයයන් ඉගෙනීමට විද්‍යාර්ථීන්ට අවකාශය සැලසේ. විවිධ නිබන්ධන සහ ඉගෙනුම් ආධාරක මඟින් ව්‍යාපාර කළමනාකරණය ආශ්‍රිත තත්වයන් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා විද්‍යාර්ථීන් තුල වර්ධනය කරවීමට අපේක්ෂිතය.

මූල්‍ය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Finance)

මූල්‍ය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය හදාරන විද්‍යාර්ථීන්ට මූල්‍යකරණය පිළිබඳව ප්‍රවේශයකින් යුතුව ව්‍යාපාර හා ආයතනික ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදෙනු ලැබේ. එමඟින් මෙම පාඨමාලාව ඔස්සේ පරිපාලන ක්‍රියාවලිය ආශ්‍රිතව කාලීන වශයෙන් පැනනඟින පුළුල් අවස්ථාවන් හඳුනාගැනීමට හැකිවනු ඇත.

ආගන්තුක සත්කාර සහ විවේක කළමනාකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Hospitality and Leisure Management)

නවීන ලෝකයේ අපේක්ෂා සහගත විෂය ක්ෂේත්‍රයක් වශයෙන් ආගන්තුක සත්කාර විවේක කළමනාකරණය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද මෙම ක්ෂේත්‍රයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කරන අතර හෝටල්, සංචාරක කර්මාන්තය හා විවේක කළමනාකරණය ආදියෙහි ප්‍රවර්ධනය සඳහා නව ව්‍යාපෘතීන් ආරම්භ කර තිබේ. එබැවින් මෙම ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා රාශියක් විවර වී තිබේ. ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා දායක කර ගත හැකි ශාස්ත්‍රීය හැකියාවන්ගෙන් යුත් වෘත්තීමය කළමනාකරුවන් බිහි කිරීම මෙම උපාධි පාඨමාලාවේ අරමුණයි.

මානව සම්පත් කළමනාකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Human Resource Management)

යම් සංවිධානයක හෝ ආයතනයක අත්‍යවශ්‍යම අංගයක් ලෙස මානව සම්පත් කළමනාකරණය හඳුනාගැනීම මෙම පාඨමාලාවෙන් සිදු කෙරේ. මානව සම්පත් කළමනාකරණය මෙන්ම ඒ හා සම්බන්ධ සෙසු අංශ සමඟ ද සම්බන්ධ වීමට විද්‍යාර්ථීන්ට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම මෙම උපාධි පාඨමාලාවෙන් අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර ව්‍යාපාර - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in International Business)

අලෙවිකරණය, ගිණුම්කරණය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව හා නීතිය යන අංශයන්හි ගෝලීය ප්‍රවණතා හඳුනාගනිමින් ජාත්‍යන්තර ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂ දැනුමක් ලබා ගැනීමට මෙම පාඨමාලාවෙන් අවකාශය සැපයෙනු ඇත. තව ද මේ සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබාගැනීමට ද විද්‍යාර්ථීන්ට මෙමඟින් අවස්ථාව උදාවනු ඇත. විශේෂයෙන්ම, කළමනාකරණ උපාධිධාරීන් වශයෙන් තම අනන්‍යතාව පවත්වා ගනිමින් ජාත්‍යන්තර ව්‍යාපාර ක්‍රියාවලිය තුල විශේෂඥ දැනුමක් මෙමඟින් ලබාගත හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

අලෙවිකරණය - ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (BBA Honours in Marketing)

අලෙවිකරණය හා සම්බන්ධ පුහුණුව මඟින් අලෙවිකරණය සඳහා වන අවස්ථා හඳුනාගැනීමට අවශ්‍ය මගපෙන්වීම මෙම පාඨමාලාවෙන් ලබාදෙනු ලැබේ. එමෙන්ම මෙමඟින් පාරිභෝගිකයන්ගේ, ආයතනයේ සහ සමාජයේ අභිවෘද්ධිය සඳහා එම දැනුම උපයෝගී කරගැනීමට ද ආයතනය තුළ හා පිට සිටින අදාළ පාර්ශවයන් ඒකාබද්ධ කිරීමට ද අවශ්‍ය පුහුණුව විද්‍යාර්ථීන්ට ලබා දීමට අපේක්ෂිතයි.

වෛද්‍ය පීඨය

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදී උපාධිය (MBBS) සහ විද්‍යාවේදී භෞත චිකිත්ස ගෞරව උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රදානය කරනු ලැබේ. ඉහත කී උපාධි හැරුණු විට පීඨය විසින් ඩිප්ලෝමා, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා ද පවත්වනු ලැබේ. පීඨය දෙපාර්තමේන්තු දහනවයකින් හා 160 කට වැඩි ස්ථීර අධ්‍යයන කාර්යය මණ්ඩලයකින් සමන්විත වේ. දෙපාර්තමේන්තු වලට අමතරව, අත්‍යාවශ්‍ය සහ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, නිපුණතා විද්‍යාගාරය/ සමාකරණ මධ්‍යස්ථානය, ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ භාෂා ඒකකය ඇතුළු ශිෂ්‍යාය ඉගැන්වීම්වලට අදාළ ඒකක කිහිපයකින් ද සමන්විත වේ. පීඨයේ ප්‍රධාන ශික්ෂණ රෝහල් වන්නේ කොළඹ රෝහල් සමූහයයි. එයට ශ්‍රී

ලංකා ජාතික රෝහල, ද සොයිසා මාතෘ රෝහල, කාසල් වීදියේ කාන්තා රෝහල සහ රිජ්වේ ආර්යා ළමා රෝහල ඇතුළත් වේ. කොළඹ රෝහල් සමූහයේ විශ්වවිද්‍යාල ඉගැන්වීම් ඒකක සහ දෙපාර්තමේන්තු විසින් පශ්චාත් උපාධි පුහුණුව ලබා දෙනු ලැබේ. පර්යේෂණ සඳහා විශේෂිත වූ එනම් මානව ජාන විද්‍යාත්මක ඒකකය, දියවැඩියා පර්යේෂණ ඒකකය, පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකය, සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය, නිවර්තන වෛද්‍ය පර්යේෂණ ඒකකය, සර්ප විෂ විද්‍යා ඒකකය, සත්ව ඒකකය, ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය සහ සෞඛ්‍ය සංවර්ධන හා පර්යේෂණ ඒකකය යනාදී ඒකක කිහිපයක් පීඨය තුල පිහිටුවා ඇත. වෘත්තීය සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපනය යන අංශවල ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගීතා මධ්‍යස්ථාන දෙකක් මෙම පීඨය විසින් පවත්වනු ලැබේ.

වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදී උපාධිය

උපාධිය පූර්ණ කාලීන පාඨමාලාවක් ලෙස පිරිනමන අතර අධ්‍යයන කාලය අවුරුදු පහක් (05) වේ. විෂයමාලාව මූලික විද්‍යා ධාරාව, ව්‍යවහාරික විද්‍යා ධාරාව, ප්‍රජා ධාරාව, වෘත්තීයභාවය පිළිබඳ ධාරාව සහ සායනික විද්‍යා ධාරාව යන විෂය ධාරාවන් පහකට සංවිධානය කර ඇත. 1995 වන තෙක් MBBS පාඨමාලාව සාම්ප්‍රදායික ලෙස පැවැත්වූ අතර 2 වන MBBS, 3 වන MBBS විභාග වලින් පසු අවසන් MBBS විභාග යෙන් අවසන් විය. සායනික ඉගැන්වීම් බොහෝ දුරට තෘතීයික සත්කාර රෝහල් වන කොළඹ රෝහල් සමූහය තුළ සිදුවිය. මෙම සම්ප්‍රදායික පාඨමාලාව තුළ පවා, වසර ගණනාවක් තිස්සේ වෙනස්කම් සිදු කරන ලදී. වෛද්‍ය දැනුම හා හැකියාවන්හි දිනෙන් දින පුළුල් වන සීමාවන්ට අනුකූලව, පීඨය ශ්‍රී ලංකාවේ වෛද්‍ය විෂය මාලාවේ වෙනස්කම්වලට නායකත්වය දෙන ලදී. වසර හයක සැලසුම් කිරීමෙන් පසු 1995 දී MBBS විෂය මාලාව වෙනස් කරන ලදී. සංශෝධිත විෂය මාලාවේ ප්‍රධාන අරමුණු වනුයේ ඉගැන්වීමේ දේශන මඟින් අන්තර්ගතය සහ ඉගැන්වීමේ ප්‍රමාණය අඩු කිරීම සහ ඒ වෙනුවට ඉගෙනීම වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය හා ඒකාබද්ධ කිරීමය. ගැටළු මත පදනම් වූ ඉගෙනීම, කුඩා කණ්ඩායම් සාකච්ඡා, විවාද, අන්තර් විනය ක්‍රියාකාරකම්, ක්ෂේත්‍ර සම්බන්ධතා සහ පවුල් බැඳීම් වැනි ඉගැන්වීමේ ක්‍රම හඳුන්වා දී ඇත. සායනික කුසලතා පිළිබඳ පුහුණුව විශේෂිත සායනික නිපුණතා රසායනාගාරයක් භාවිතයෙන් ඔපමට්ටම් කරනු ලැබේ. ස්වයං ඉගෙන ගන්නෙකුවීමට මෙම ක්‍රම මඟින් ශිෂ්‍යයා දිරිමත් කරනු ලැබේ. ශරීර පද්ධතිය පදනම් කරගත් ඉගෙනීම, මානව ශාස්ත්‍රය හා වෘත්තීයභාවය සහ ප්‍රජාව මත අවධාරණය කිරීම විෂය මාලාවේ අනෙකුත් වැදගත් අංග වේ.

විද්‍යාවේදී භෞතචිකිත්ස ගෞරව උපාධිය

විද්‍යාවේදී භෞතචිකිත්ස ගෞරව උපාධිය යනු සම සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන අවුරුදු 4 ක වෘත්තීය ප්‍රවේශ මට්ටමේ අධ්‍යාපන පාඨමාලාවකි. එමඟින් ඉහළ ප්‍රමිතියක් සහිත භෞත චිකිත්ස ප්‍රතිකාර ලබාදීම හා ආබාධිත රෝගීන් පුනරුත්ථාපනය කිරීම මඟින් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප සහිත දක්ෂ භෞත චිකිත්සකවරයෙකු නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. මෙම පාඨමාලාව මඟින් සෞඛ්‍ය ප්‍රවර්ධනය, වැළැක්වීම, නඩත්තු කිරීම, ප්‍රතිකාර/ මැදිහත්වීම සහ පුනරුත්ථාපනය කිරීම යන සෞඛ්‍යය අංශවල සේවය කිරීම සඳහා උපාධිධාරීන් සන්නද්ධ කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ශාරීරික හා සමාජීය යහපැවැත්ම සහතික වනු ඇත.

ප්‍රතිඵල මත පදනම් වූ ප්‍රවේශයක් සහිතව උපාධිය සැලසුම් කර ඇති අතර අන්තර්ගතය, ධාරාවන්හි තිරස් සහ සිරස් අනුකලනය වීමෙන් සැකසී ඇත. සායනික ඉගෙනුම් පිළිබඳ මුල් හැඳින්වීමක් සමඟ ශිෂ්‍ය කේන්ද්‍රීය බහුවිධ ඉගැන්වීම් ක්‍රම මෙම පාඨමාලාවට ඇතුළත් වේ. වෘත්තීයභාවය, ආචාරධර්ම, සන්නිවේදන කුසලතා සහ පර්යේෂණ සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ. වෙනස් වන දැනුම හා අවශ්‍යතා මත විෂය මාලාව වරින්වර වෙනස් කර සංශෝධනය කරනු ලැබේ.

*විද්‍යා පීඨය

විද්‍යා පීඨය "මොඩියුල" පාඨමාලා ඒකක ක්‍රමයක් පවතී. සිසුන් ඔවුන්ගේ වෘත්තීය ඉලක්ක අනුව සුදුසු අනිවාර්ය (compulsory), වෛකල්පිත (elective) හා වැඩිදියුණු කිරීමේ (enhancement) පාඨමාලා සංයෝජකයක් හදාරනු ඇත. **සෑම විෂය ධාරා හතරටම අයත් විද්‍යාවේදී (BSc) උපාධි, පීඨය මඟින් ලබා දෙයි. උදා - ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍යය, ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව.**

- විද්‍යාවේදී (BSc) උපාධිය මුල් කරගත් තුන් අවුරුදු සාමාන්‍ය උපාධිය
- විද්‍යාවේද (BSc) උපාධිය මුල් කරගත් සිවු අවුරුදු ගෞරව උපාධිය (අධ්‍යයන ක්ෂේත්‍රය) (පළමු දෙවසරේ ප්‍රතිඵල මත තෝරා ගැනේ)

විද්‍යා පීඨයට ඇතුළත් වන සියලුම සිසුන්ට ඔවුන්ගේ විද්‍යා දැනුම වැඩිදියුණු කරගැනීම සඳහා සැලසුම් කළ පරිගණක විද්‍යා පාඨමාලා හැදෑරීමේ අවස්ථාව ලැබෙනු ඇත. මෙම පාඨමාලා ලබා දෙනු ලබන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලය (UCSC). භෞතීය විද්‍යා විෂය ධාරා සඳහා සිසුන් තෝරා ගැනීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැනට බලපවත්වන ඇතුළත් වීමේ ක්‍රියාපටිපාටිය පදනම් වනු ඇත.

ජෛවීය විද්‍යාව මෙන්ම ජීව රසායන විද්‍යාව හා අණුක ජීවවිද්‍යාව හදාරන සිසුන් සඳහා ඇත්තේ එක් සංකලනයක් (One combination) පමණි. තවදුරටත් ජෛවරසායනය පළමු දෙවසර තුළදී වෙනම විෂයක් ලෙස ලබා නොදෙයි.

පීඨයට ඇතුළත් වන සියලුම සිසුන් ඔවුන් තෝරාගත් විෂය සංකලනයන්ට අදාළ අනිවාර්ය පාඨමාලා (compulsory courses) හැදෑරිය යුතුය. ඊට අමතරව, මෙම විෂය ගණනාවක් අතුරෙන් වෛකල්පිත පාඨමාලා (elective courses) තෝරාගත හැකිය. සාමාන්‍ය උපාධි සඳහා ඇතුළත් වන සිසුන්ට තෙවන වසරේ දී සුදුසු පාඨමාලා ගණනාවක් ලබා දෙන අතර කර්මාන්ත සීමාවාසික පුහුණුවක් (industrial internship) ද ඇතුළත් වේ.

පළමු දෙවසර තුළදී විශිෂ්ටත්වයක් දක්වන සිසුන්ට පීඨය මගින් ලබා දෙන මූලික, අන්තර්විෂයීක, ව්‍යවහාරික හා කර්මාන්ත නැඹුරුවකින් යුත් ගෞරව උපාධිවලින් එකක් සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. සියලුම ගෞරව උපාධි සඳහා පර්යේෂණ සංරචකයක් අඩංගු වේ. කර්මාන්ත සඳහා නැඹුරු උපාධි පාඨමාලා සඳහා ද කාර්මික පුහුණු සංරචකයක් තිබේ.

එක් එක් ධාරාව යටතේ ඇති ගෞරව උපාධි පහත දැක්වේ.

භෞතීය විද්‍යාව - රසායන විද්‍යාව, පරිගණක රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණක භෞතික විද්‍යාව, ඉංජිනේරු භෞතික විද්‍යාව, ගණිතය, පරිගණක ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංඛ්‍යානය, දත්ත විද්‍යාව, න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණය, ව්‍යවහාර සංඛ්‍යානය, මූල්‍ය හා රක්ෂණය, විද්‍යාව හා කළමනාකරණය, න්‍යෂ්ටික තාක්ෂණය.

ජෛවීය විද්‍යාව - රසායන විද්‍යාව, පරිගණක රසායන විද්‍යාව, ජීව රසායන විද්‍යාව හා අණුක ජීවවිද්‍යාව, ඖෂධ විද්‍යාව, පාරිසරික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ප්‍රතිශක්තවේදය සහ සමෝධානික අණුක ජීවවිද්‍යාව, ශාක විද්‍යාව, ජෛව තොරතුරු තාක්ෂණය, ශාක ජෛව තාක්ෂණය, න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, ව්‍යාපාරය හා පරිසරය, විද්‍යාව හා කළමනාකරණය, උද්‍යාන විද්‍යාව හා තිරසාර භූමි නිර්මාණය, න්‍යෂ්ටික තාක්ෂණය.

(පරිගණක රසායන විද්‍යාව, පරිගණක භෞතික විද්‍යාව, ජෛව තොරතුරු තාක්ෂණය, සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව යන උපාධි කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල (UCSC) සමඟ එක්ව ලබාදෙන අතර, ඖෂධ විද්‍යා උපාධිය වෛද්‍ය පීඨයේ ඖෂධවේද අංශය සමඟ එක්ව ලබා දෙන බව සලකන්න).

කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය - කර්මාන්ත සංඛ්‍යානය, ගණිතමය මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, ව්‍යවහාර සංඛ්‍යානය, මූල්‍ය හා රක්ෂණය, ගණිතය.

ජීව රසායන විද්‍යාව හා අණුක ජීවවිද්‍යාව - ජීව රසායන විද්‍යාව හා අණුක ජීවවිද්‍යාව, රසායන විද්‍යාව (සීමිත අවස්ථාවන්), තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, අණුක ජීවවිද්‍යාව හා ජෛව තාක්ෂණය. මීට අමතරව ඉඩකඩ අනුව මේ සිසුන්ට ජෛවීය විද්‍යා ධාරාවේ සිසුන් සඳහා ලබා දෙන ගෞරව උපාධිය සඳහා ඇතුළත් වීමේ අවසරය ලැබේ.

හෙද පීඨය

හෙද පීඨය මගින් සාත්තු සේවාව (හෙද) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ සියලු වයස්වල රෝගීන් රැකබලා ගැනීම සඳහා පුළුල් පරාසයක විහිදුණු දැනුම, කුසලතා හා ආකල්පවලින් සමන්විත හා රෝග වළක්වා ගැනීම, සෞඛ්‍ය ප්‍රවර්ධනය හා නැවත ප්‍රතිශ්ඨාපනය හා පුනරුත්ථාපනය සඳහා සහය විය හැකි උපාධිලාභී හෙදියන් නිර්මාණය කිරීමය. මෙම උපාධිය වසර හතරකින් සමන්විත වන අතර පාඨමාලා ඒකක ක්‍රමයක් මත පදනම් වූ ශාස්ත්‍රීය පැය 127 කින් සමන්විත පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක වනු ඇත. සමස්ථ පාඨමාලාවම ඉංග්‍රීසි බසින් පැවැත්වේ. එමෙන්ම මෙම හෙද පාඨමාලාව ජාත්‍යන්තර මට්ටමෙන් ලබා ගත හැකි වෙනත් හෙද වැඩසටහන් හා සම වන ආකාරයට සකස් කර තිබේ. මෙම පාඨමාලාවෙහි විෂය නිර්දේශය සිසුන් හෙද වෘත්තීයෙහි නිරතවීමට අවශ්‍ය මූලික විද්‍යා හා සමාජ විද්‍යා මූලධර්ම පිළිබඳ ස්ථීර පදනමක් ලබා දෙන එමෙන්ම හෙද සේවාව පිළිබඳ වෘත්තීය හා හර පාඨමාලාවලින් සමන්විත නවතම තාක්ෂණයන් පිළිබිඹු වන ආකාරයට සකස් කර ඇත. මෙම පාඨමාලාව හෙද රැකවරණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ඉහළ කුසලතා සපිරි හෙද වෘත්තිකයන් මෙන්ම කැපකරු හෙද අධ්‍යාපනය සහ සෞඛ්‍ය හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට හැකි හෙදියන් බිහිකිරීමේ අරමුණින් සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව ප්‍රායෝගික දැනුම ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් ලබා දෙන අතර ඒ තුළින් සිසුන්හට සැබෑ ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන තත්වයන් විසඳා ගැනීමට අවශ්‍ය නිපුණතා අත්පත් කර ගැනීමට ඉඩ ප්‍රස්තාවක් සැලසේ. මෙම වැඩසටහන හෙද පර්යේෂණ හා සාක්ෂි මත පදනම් වූ පුහුණුවීමේ සංකල්ප මෙන්ම විවේචනාත්මක චින්තනය සහ ගැටලු විසඳාගැනීමේ හැකියාවන් සංවර්ධනය කිරීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. ප්‍රායෝගික පාදක ඉගෙනුම් කොළඹ හා ඒ අවට රෝහල් ගණනාවක මෙන්ම ප්‍රජා කොටස් ආශ්‍රිතව සිදු කෙරේ.

තාක්ෂණ පීඨය

සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා තුනක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත සුදුසුකම් සපුරනු ලබන සිසුන් තාක්ෂණ පීඨය සඳහා තෝරා ගනු ලැබේ. පහත සඳහන් උපාධි පාඨමාලා ශාස්ත්‍රීය පැය 120 කින් සමන්විතය.

1. මෙවලම් හා ස්වංක්‍රීය ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය
2. පාරිසරික ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය
3. කෘෂිකර්ම ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

මෙම බහුවිධ උපාධි වැඩසටහනෙහි විෂය නිර්දේශ සකස්ව ඇත්තේ සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම අනුසාරයෙන් අදාළ ක්ෂේත්‍රයන්හි නවීන තාක්ෂණය භාවිතා කිරීම සහ නව නිර්මාණකරණයට මංපෙත් විවර කරමින්ය. මෙම වැඩසටහන් හරහා වෘත්තීය නිපුණතාවයකින් යුත් තිරසාර ආර්ථික සංවර්ධනයකට හා පොදුජන සුභසිද්ධිය උදෙසා සෘජු දායකත්වයක් සපයන හා පරිසර හිතකාමී තාක්ෂණ උපාධිධාරීන් නිර්මාණය කිරීම අරමුණයි.

උපාධි පාඨමාලා මතු සඳහන් පුළුල් විෂය පථ වලින් සමන්විතය.

- මූලික විද්‍යා හා ගණිත විෂයයන්, මූලික තාක්ෂණ විෂයයන්, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා කළමනාකරණය හා ගණකාධිකරණය සහ සෞඛ්‍යය

- තාක්ෂණ විෂයයන් පිළිබඳ අදාළ දැනුම හා කුසලතා ලබා දීම සඳහා වූ තාක්ෂණික විෂයයන්,

මීට අමතරව, සෑම ශිෂ්‍යයෙකුම,

- නිශ්චිත කාල වකවානුවක් සඳහා වූ කර්මාන්ත පුහුණුව හා වාර්තාව
  හෝ
- උපාධි වැඩසටහන සඳහා අදාළ පර්යේෂණ ව්‍යාපෘති හා නිබන්ධනය ඉදිරිපත් කළ යුතුය.

මීට අමතරව පීඨයට ඇතුළු වන සියලුම සිසුනට ඔවුන්ගේ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පරිගණක, ඉලෙක්ට්‍රොනික හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණුව විද්‍යාගාර හා යාන්ත්‍රික වැඩපල හරහා ලබා දෙනු ඇත.

ශාස්ත්‍ර පීඨය

ප්‍රථම උපාධි පාඨමාලා

ශාස්ත්‍ර පීඨය පුළුල් පදනමක් සහිතව ප්‍රථම උපාධි පාඨමාලාව සිසුන්ට පිරිනමනු ලබයි.

1. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව (විෂය ධාරා - තුන් අවුරුදු පාඨමාලාව)

ව්‍යවහාරික ප්‍රජා විද්‍යාව; බැංකු සහ මුදල්; ව්‍යාපාරික සහ කළමනාකරණ ආර්ථික විද්‍යාව; ඉංග්‍රීසි අධ්‍යයනය; න්‍යාය සහ භාවිතය; භූගෝල විද්‍යාව සහ පරිසර කළමනාකරණය; සංස්කෘතික සහ උරුමය; ගැටුම් නිරාකරණය සහ සාමය; ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය; සිංහල අධ්‍යයනය; ව්‍යවහාරික සමාජ විද්‍යා අධ්‍යයනය; නාගරික සහ ප්‍රජා අධ්‍යයනය; බෞද්ධ අධ්‍යයනය; ඉංග්‍රීසි දෙවන බස ලෙස හැදෑරීම; සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලාව; ව්‍යවහාරික ඉස්ලාමීය අධ්‍යයනය; තොරතුරු තාක්ෂණය සහ සංවර්ධනය; ක්‍රීඩා අධ්‍යයනය.

2. ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව (සිව් අවුරුදු පාඨමාලාව)

බෞද්ධ අධ්‍යයනය; ප්‍රජා විද්‍යාව; ආර්ථික විද්‍යාව; ඉංග්‍රීසි; භූගෝල විද්‍යාව; ඉතිහාසය; ජාත්‍යන්තර සම්බන්ධතා; දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්තිය; සිංහල; සමාජ විද්‍යාව.

සියලුම උපාධි පාඨමාලාවන්හි ඉගැන්වීම් සහ අඛණ්ඩ ඇගයීම් සමාසික ක්‍රමය තුළ පැවැත්වේ. සෑම පාඨමාලා ඒකකයක් සඳහාම අදාළ සමාසිකය තුළ ඉගැන්වීම් සහ අඛණ්ඩ ඇගයීම් සිදු කෙරේ. සාමාසිකයක් සති 15 ක් වන අතර පාඨමාලා ඒකකයක් ඉගැන්වීම් සහ අධ්‍යයන ක්‍රියාවලිය පැය 150 ක් වේ. සාමාන්‍ය උපාධි පාඨමාලාව (විෂය ධාරා) වර්ෂ තුනක් තුළ සිදුවන අතර (සාමාසික හයක) විශේෂ උපාධි පාඨමාලා සිව් වසරක (සාමාසික අටක) අධ්‍යයන කාලයකට යටත් වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	-	S/T/E
නීතිය	-	E
කළමනාකරණය	-	S/T/E
වෛද්‍ය විද්‍යාව	-	E
දන්ත ශල්‍ය විද්‍යාව	-	E
පශු වෛද්‍ය විද්‍යාව	-	E
කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය	-	E
ආහාර විද්‍යාව හා තාක්ෂණය	-	E
ඉංජිනේරු විද්‍යාව	-	E
ජෛවීය විද්‍යාව	-	E
සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව	-	E
භෞතීය විද්‍යාව	-	E
සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	-	E
භෙද	-	E
ඖෂධ විද්‍යාව	-	E
වෛද්‍ය රසායනාගාර විද්‍යා	-	E
විකිරණ ශිල්පය	-	E
භෞත චිකිත්ස	-	E
භූගෝලීය තොරතුරු විද්‍යාව	-	E
සමාජකාර්යවේදය	-	E
ඉලෙක්ට්‍රොනික සහ බුද්ධිමය පද්ධති ඉංජිනේරු විද්‍යාව	-	E

කෘෂි විද්‍යා පීඨය

වර්ෂ 1948 දී ස්ථාපිත කරනු ලැබූ කෘෂි විද්‍යා පීඨය අවුරුදු 70 ක ශාස්ත්‍රීය උරුමයක් සහ ඉතා ඉහළ අධ්‍යාපනික අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයකින් සමන්විත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කෘෂි විද්‍යා පීඨය වේ. මෙම පීඨයේ ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 137 ක් සිටින අතර ඉන් 75% ක් පමණ ලොව වටා පිහිටි ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාලවලින් ආචාර්ය උපාධි ලබාගෙන ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් මහාචාර්යවරුන් වීම ද මෙම පීඨයේ විශේෂත්වයකි. පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු අටක් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සඳහා ඉඩකඩ ඇති, පහසු නවීන පංති කාමර සහ විද්‍යාගාරවලින් සමන්විතය. පීඨය තුළ ගැටලු පදනම් කරගත් ඉගෙනුම් ප්‍රවේශයක් සිසුනට ලබා දීම සඳහා පර්යේෂණ හා ප්‍රායෝගික පුහුණුව අරමුණු කොට ගෙන මහඉලුප්පල්ලම උප ඒකකය (MI), පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය සහ බෝග පර්යේෂණ මධ්‍යස්ථානය යන යටිතල පහසුකම් ඉදිකර ඇත. අධ්‍යයන වැඩසටහන් සහ බාහිර සමාජ ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානයක් (ABC), කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයක් (AgBC) සහ කෘෂිකර්ම අධ්‍යයන ඒකකයක් ද (AEU) සහ ප්‍රජා සංවර්ධන ඒකකයක් ද (CDU) පීඨය තුළ ස්ථාපිත කර ඇත.

කෘෂිකර්ම උසස් අධ්‍යාපනයේ පුරෝගාමියා ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය අද්විතීය වන්නේ:

- කෘෂිකර්මය හා අශ්‍රිත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණුව මෙන්ම, සමාජ හා ආර්ථික අවබෝධය, ජීවන නිපුණතාවය අරමුණ කරගත් වෘත්තීය මාර්ගෝපදේශනය හා නායකත්ව පුහුණුව සැපයීම සඳහා ඒකාබද්ධ අධ්‍යාපනයක් ලබා දීම.
- ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර පවතින ඉතා සමීප සම්බන්ධතාවය, ශිෂ්‍යයන් මඟින් ගුරුවරුන් ඇගයීමේ ක්‍රමය හඳුන්වාදීම, ප්‍රතිඵල පදනම් කරගත් ප්‍රවේශයක් සහිත ශිෂ්‍ය කේන්ද්‍රීය ස්වයං ඉගෙනුම් ක්‍රියාවලියකින් සමන්විත වීම.

- සිසුන් අතර සහයෝගීතාවය ඔපනැංවෙන වැඩසටහන් තුළින්, නිපුණතාවය, ධනාත්මක හා නීක්ෂණ චින්තනය, කණ්ඩායම් ක්‍රියාකාරකම්, කාර්යක්ෂම අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන් හා සමාජීය දැක්මකින් යුතු උපාධිධරයන් බිහි කිරීම.
- ලොව පිළිගත් ප්‍රමුඛ විශ්වවිද්‍යාල සමග එක්ව අන්තර්ජාතික ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ලොව ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල සඳහා අප පිරිනමනු ලබන අන්තර්ජාතිකව පිළිගත් විදෙස් අධ්‍යාපන වැඩසටහන් සහ අන්තර්ජාතික සිසුන් සමඟ සම්බන්ධවීමට අවස්ථාව ලබා දීම.
- සෑම වසරකම කුසලතා මෙන්ම අවශ්‍යතා පදනමින් 100 කට අධික මූල්‍යමය සහන සහ ශිෂ්‍යාධාර පිරිනැමීම.
- 100% ක් සේවයේ නියුක්ත උපාධිධාරීන් බිහි කිරීම. එමෙන්ම දැනට බිහිවී ඇති කෘෂිකර්ම උපාධිධාරීන් රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනයන්වල උසස් අධ්‍යාපන, කෘෂිකර්ම පර්යේෂණ, පරිපාලන හා කළමනාකරණ යන වෘත්තීය ක්ෂේත්‍රයන්හි රුකියාවන්ගේ නියුතු ප්‍රවීනයන් වීම.
- තිරසාර සමාජ පරිවර්තන හැකියාවන්ගෙන් යුතු නායකයින් බිහි කිරීම.
- උපාධි ලබා ගැනීමෙන් පසු අපගේ සිසුන්ට ඇමරිකාව, එංගලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය, නවසීලන්තය සහ යුරෝපීය රටවල පිළිගත් විශ්වවිද්‍යාල මඟින් පශ්චාත් උපාධි/ ආචාර්ය උපාධි ලබාගැනීම සඳහා පුළුල් ශිෂ්‍යත්ව රැසක් ලබා ගැනීමට ඇති හැකියාව.
- අප පීඨයේ සියලුම උපාධි පාඨමාලා සඳහා 2019/2020 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ගුණාත්මය සහතික කිරීමේ සභාව මඟින් සිදු කරන ලද උපාධි පාඨමාලා සමාලෝචනය යටතේ "A" ශ්‍රේණිය හිමිව තිබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර අප වෙබ් පිටුවට (http://agri.pdn.ac.lk) පිවිසෙන්න.

පීඨය ඉතිහාසය පුරාම කෘෂිකාර්මික උසස් අධ්‍යාපනයේ නව නිම් වලලු පුළුල් කිරීම සඳහා නිරන්තරයෙන්ම තම උපාධි පාඨමාලාවන් යාවත්කාලීන කිරීම සිදු කර තිබේ. ඉංග්‍රීසි භාෂාව මඟින් පීඨයේ සියලු අධ්‍යයන කටයුතු සිදු කරන අතර ඉංග්‍රීසි භාෂාව පුහුණු කිරීමේ ඒකකය මඟින් ශිෂ්‍යයන් හට ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

දැනට කෘෂි විද්‍යා පීඨය මඟින් සිව් අවුරුදු උපාධි පාඨමාලා 3 ක් පිරිනමනු ලබයි.

- කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය කෘෂි විද්‍යා පීඨය මඟින් ලබා දෙන ප්‍රධානතම උපාධි පාඨමාලාවයි. එය සාමාසික අටකින් යුක්ත සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනැමෙන මෙම උපාධිය සමාසිකයන් 8 කින් හා ඒකක සම්භාර 126 කින් සමන්විතය. අනාගත ලෝකයේ අභියෝග ජය ගැනීම උදෙසා අවශ්‍ය ශාස්ත්‍රීය කුසලතා ඉහළම මට්ටමේ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතාවයන් අනුව නිර්මාණය කර ඇති මෙම උපාධි පාඨමාලාව (i) බෝග සහ සත්ත්ව නිෂ්පාදන, (ii) කෘෂි නිෂ්පාදන සැලසුම් තාක්ෂණය, (iii) ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය, (iv) සමාජ ආර්ථික සංවර්ධනය හා ව්‍යාපාර කළමනාකරණය, (v) වෘත්තීය, ආකල්ප හා ආත්ම විශ්වාස වර්ධනය යන පුළුල් තේමා පහක් ඔස්සේ විහිදී ඇත. ත්‍රෛභාෂා ශක්‍යතාවය මඟින් නව රැකියා අවස්ථාවන් ලොව විවර කරන හෙයින් සිංහල සිසුන් සඳහා ද්‍රවිඩ භාෂාව ද, ද්‍රවිඩ සිසුන් සඳහා සිංහල භාෂාව ද පුහුණු කිරීමේ අවස්ථාව ද මෙම පාඨමාලාව තුළ ලබා දේ.

මෙම උපාධි පාඨමාලාව විද්‍යා හා තාක්ෂණ ලෝකය මෙන්ම කළමනාකරණ ලෝකය ජය ගැනීම සඳහා සිසුනට අවශ්‍ය ප්‍රායෝගික (විද්‍යාගාර හා ක්ෂේත්‍ර) මෙන්ම සිද්ධාන්තමය දැනුම් සංරචකයන් මනා සංකලනයකින් යුක්ත පාඨමාලාවකි. උපාධි පාඨමාලාවේ විෂයමාලාව (අ) මූලික පාඨමාලාව සහ (ආ) විශේෂඥතා පාඨමාලාව යන සංරචක දෙකකින් සමන්විතය. මූලික පාඨමාලාවේදී සිසුන් හට පීඨයේ දෙපාර්තමේන්තු අට විසින්ම ඉදිරිපත් කර ඇති විෂයන් හැදෑරීමට අවස්ථාව හිමි වේ. මෙම මූලික පාඨමාලාව මඟින් බහුනිපුණ සහ බහුකුසලතාවලින් පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීමට ස්ථීර අඩිතාලමක් දැමීම සිදු කෙරේ. විශේෂඥතා පාඨමාලාව තුළදී උපාධි අපේක්ෂකයන් හට දෙපාර්තමේන්තු අටකින් පිරිනමන විශේෂ මොඩියුලයන් දොළහක් ඔහුගේ හෝ ඇයගේ ස්ව කැමැත්ත මත තෝරා ගත හැකි වේ. මෙය අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව හැදෑරූ සිසු සිසුවියන්ට ඔවුන්ගේ උසස් පෙළ තුළින් අහිමි වූ විෂයයන් හැදෑරීමට හිමිවන ඉතා දුර්ලභ අවස්ථාවක් වන අතර එහිදී විවිධ වූ විෂය පථයන් ඔස්සේ ඔහුට හෝ ඇයට අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවස්ථාව හිමි වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මනා අධීක්ෂණය යටතේ අවසන් සමාසිකය තුළදී සෑම උපාධිධරයෙක්ම පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කර නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය. මෙවැනි විවිධත්වයෙන් යුතු උපාධි පාඨමාලාවක් උසස් අධ්‍යාපන අවස්ථා තුළ පැවතීම හේතුවෙන් උපාධි සම්පූර්ණ කරන ලද

උපාධිධාරීන් කාර්ය ශූරත්වයෙන් හා වෘත්තීය සුදුසුකම්වලින් අග තැම්පත් වන අතර දේශීය සහ විදේශීය වශයෙන් ඔවුන් කීර්තියක් අත් කරගෙන ඇත. කෘෂි තාක්ෂණ හා කළමනාකරණ උපාධියට හිමිකම් කියන උපාධිධාරීන්ගේ අනාගතය දීප්තිමත් හා අපේක්ෂා සහිත එකක් වන්නේය. ඉහත සඳහන් පරිදි පාඨමාලාවේ පුළුල් බව හා බහු ක්ෂේත්‍රමය ස්වභාවය කවර ආකාරයක හෝ වෘත්තීය ක්ෂේත්‍රයක විශිෂ්ටත්වයකින් යුතුව කටයුතු කළ හැකි සුදුසුකම් සහිත උපාධිධාරීන් බිහි කරනු ලබන අතර ඔවුන්ට විවිධ විෂය ධාරා ඔස්සේ විශිෂ්ට දැනුමක් ලබා ගැනීමේ දුර්ලභ අවස්ථාවක් සඳහා ඉඩ සළසා දී ඇත. මෙම උපාධි පාඨමාලාවට 2019/2020 උපාධි පාඨමාලා සමාලෝචනය යටතේ උපාධි පාඨමාලාවකට ලැබිය හැකි ඉහළම "A" ශ්‍රේණිය ලැබී ඇත.

ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සමාසික අටකින් යුක්ත සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනැමෙන මෙම උපාධිය මඟින් විද්‍යාත්මක කෘෂි සැලසුම් සංකල්ප, ආහාරයේ භෞතික, රසායනික සහ සංවේදක ඇගයීම, ආහාරයේ ගුණාත්මකභාවය හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, ආහාරවල ජෛව රසායනික සහ කෘත්‍යමය ස්වභාවය පිළිබඳ විමසීම, ආහාරවල පෝෂණ කාර්යය, මානව පෝෂණය හා මානව යහපැවැත්ව සඳහා දායකත්වය, වෘත්තීය ආකල්ප සහ විශ්වාසනීයත්වය වර්ධනය කිරීම, පුද්ගල කළමනාකරණ හැකියාව හා නායකත්ව පුහුණුව ඇති උපාධිධාරීන් බිහි කිරීම සිදු කෙරේ. ඉහත සඳහන් දැනුම, හැකියාව සහ ආකල්ප, අධ්‍යයන සම්භාර අගයයන් 126 කින් යුක්ත වූ අද්විතීය සිද්ධාන්ත දැනුම හා ප්‍රායෝගික පුහුණුව සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩලයක් මඟින් සපයනු ලැබේ. සිද්ධාන්ත දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීමේදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන ක්‍රමවේදය භාවිතය නිසා ආත්ම විශ්වාසය ගොඩනැගීමත්, නවීන තාක්ෂණික විද්‍යාගාර භාවිතයට හුරු කිරීමෙන් තාක්ෂණික නිපුණතා දියුණු කිරීමත්, ආහාර ආශ්‍රිත කර්මාන්තවලට නිරාවරණය වීම මඟින් එම පරිසරයන්ට සහ පරිපාලන තත්ත්වයනට හැඩ ගැසුනු අය බිහි වීමත් සිදුවේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මනා අධීක්ෂණය යටතේ අවසන් සමාසිකය තුළදී සෑම උපාධිධරයෙක්ම පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කර නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමත් සමඟ උපාධිධරයන් දේශීය සහ විදේශීය ආහාර සහ ආහාර ආශ්‍රිත කර්මාන්ත සහ ව්‍යවසායක අංශයන් කෙරෙහි අර්ථාන්විත දායකත්වයක් දක්වනවාට කිසිදු සැකයක් නැත.

සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සමාසික අටක් පුරා විහිදෙන අතර එය සත්ත්ව නිෂ්පාදනය සහ කළමනාකරණයට අමතරව මූලික කෘෂිතාක්ෂණික දැනුම, නිෂ්පාදන පිරිසැකසුම, ආර්ථික විද්‍යාව සහ කෘෂිව්‍යාප්තිය යන විෂයයන්ගෙන් සමන්විත වේ. පළමු සමාසික දෙක තුළ සියලුම සිසුන් සඳහා අනිවාර්යය පාඨමාලාවන් ඇතුළත් වේ. ඉතිරි සමාසික හය අනිවාර්ය පාඨමාලා සමඟ වෛකල්පිත පාඨමාලා ඇතුළත් වේ. මේ සමඟ සිසුනට ස්වයං අධ්‍යයන අවස්ථා බොහොමයක් ලබා දෙයි. අවසාන සමාසිකය සත්ත්ව පාලනය, මත්ස්‍ය විද්‍යාව හා අනෙකුත් අදාළ අංශවලට අදාළව පරිපූර්ණ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා වෙන් කරනු ලැබේ. මේ අතරතුර සිසුන්ට සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව ආශ්‍රිත කර්මාන්ත හා සම්බන්ධ වී අත්දැකීම් සහ යාබද වැඩ පරිසරවලට හුරුවීමට අවස්ථාව ලබා දේ. උපාධි පාඨමාලාව අවසන් කළ පසු, සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව සහ නොයෙකුත් අංශ පිළිබඳව සිද්ධාන්තමය දැනුම, ප්‍රායෝගික කුසලතාවය සහ වැඩදායක ආකල්පවලින් සමන්විත උපාධිධරයෙකු බිහිවන නිසා ඔවුන්ට අධ්‍යයන, පර්යේෂණ, පරිපාලන, සැලසුම්කරණය සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවසායකත්වයන් යන ක්ෂේත්‍රවල රැකියා ලබා ගැනීමේ අවස්ථාවන් උදාවේ.

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

වර්තමානය වනවිට ප්‍රථම උපාධි පාඨමාලා පහක් (05) මෙම පීඨයෙන් පිරිනැමේ.

වෛද්‍ය රසායනාගාර විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී උපාධිය

මෙය පෙර ලියාපදිංචිවීමේ සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් වන අතර එය සැලසුම් කර ඇත්තේ වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් බිහිකිරීම සඳහාය. ශාස්ත්‍රීය අගය 120 (120 Credits) කින් සමන්විත වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ විෂය නිර්දේශය වෛද්‍ය රසායනාගාර තාක්ෂණයන් සඳහා වෛද්‍ය විද්‍යාත්මක පදනමක් සපයන අතර ඒ තුළින් ගුණාත්මක රසායනාගාර සේවාවක් මහජනතාවට සැපයීම සඳහා අවශ්‍ය යාවත්කාලීන හා න්‍යායාත්මක වූ දැනුම හා කුසලතා දියුණුකර ගැනීමට සිසුවා යොමු කරවයි. තව ද, මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ අදාළ ජීව වෛද්‍ය ක්ෂේත්‍රයන්හි පවතින නව තාක්ෂණික දැනුම ලබා ගැනීමට සිසුන් දිරි ගැන්වීම සඳහා වන අතර ඒ තුළින් සිසුන්ට වෛද්‍ය රසායනාගාර පර්යේෂණවල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමට, වැරදි සිදුවිය හැකි මූලාශ්‍ර අවබෝධ කර ගැනීමට හා ගැටළු විසඳා ගැනීමට හැකියාව ලැබේ.

හෙද විද්‍යාවේදී උපාධිය

හෙද විද්‍යාවේදී උපාධිය පෙර ලියාපදිංචි කිරීමේ උපාධි පාඨමාලාවකි. එය සැලසුම් කරන ලද්දේ පවුල් සෞඛ්‍ය, කාන්තා හා ළමා සෞඛ්‍ය හා ප්‍රජා සෞඛ්‍ය වැනි විවිධ අංශවල උසස් තත්ත්වයකින් යුතු ආරක්ෂිත හා ඵලදායී හෙද සේවයක් ලබාදිය හැකි හෙද වෘත්තියේ නියැලෙන්නන් පිරිසක් බිහිකිරීම සඳහාය. මෙහි විෂය නිර්දේශය හෙද වෘත්තියේ නියැලීම සඳහා වැදගත් විද්‍යාත්මක හා මානවවාදී පදනමක් ලබාදෙයි. මෙතුළින් රෝග නිවාරණය, රෝග පාලනය, රෝග සුව කිරීම, සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සම්බන්ධ වූ හෙද සත්කාර සේවයක් ලබාදීම සඳහා අවශ්‍ය හැකියාවන්/ නිපුණතාවයන් දියුණු කර ගැනීමට සිසුන් යොමු කරවයි.

තව ද මෙම සේවය ප්‍රසව සහ නාරිවේදී හෙද සේවය, හදිසි සහ ආපදා හෙද සේවය යනාදී වූ විවිධ අංශ වලින් තම සේවය තවදුරටත් ලබාදේ. තව ද, ඔවුන් ස්වාධීන වෘත්තිකයන් වශයෙන් හෙද සේවයේ/ වෘත්තියේ නියැලීමටත් එහි දියුණුව සඳහාත්, සෞඛ්‍ය සේවයේ අනෙකුත් ක්ෂේත්‍ර වලට එයින් ලැබෙන ක්‍රමික දායකත්වයේ කොටස්කරුවන් වීමටත් අවැසි විශ්වාසය ලබාගනී.

මෙම වැඩසටහනේ මුල් අවධියේ සිටම හෙද සේවයට/ වෘත්තියට අනන්‍ය වූ න්‍යායාත්මක හා විද්‍යාත්මක පදනමක් මත වූ පුහුණු වීමේ සංකල්පයක් ද හඳුන්වාදෙනු ඇත. මෙහිදී වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ උපාධි අපේක්ෂකයන් තුළ විචක්ෂණශීලී පරිකල්පන හැකියාව, නිවැරදි හා ඉක්මන් තීරණ ගැනීමේ හැකියාව හා සමාජ නිපුණතාවන් යනාදී හැකියාවන් දියුණු කිරීම මෙන්ම වෘත්තීය සාරධර්ම හා ආචාරශීලී නිපුණතාවයන් දියුණු කිරීම වේ. උපාධි අපේක්ෂකයන් සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව රෝහල් තුළින් හා ප්‍රජා කොටස් අතර සිට ලබන පුහුණුව මත පදනම් වූ ඉගෙනුම් ක්‍රමයක් අනුගමනය කෙරේ. න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත් සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් තුළින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් හෙද වෘත්තියධරයකු බිහි කිරීම මෙම උපාධි පාඨමාලාවේ මූලික අරමුණයි.

කායික චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (භෞත චිකිත්ස)

මෙම වැඩසටහන ද සිව් අවුරුදු විෂය මාලාවකින් සමන්විත පෙර ලියාපදිංචි කිරීමේ උපාධි පාඨමාලාවකි. ශ්‍රී ලංකාවේ හෝ විදෙස් රටවල විවිධ ක්ෂේත්‍රයන්හි උසස් තත්ත්වයේ කායික චිකිත්සාවක් හා පුනරුත්ථාපනයක් සැපයීමට හැකි කායික චිකිත්සකයන් පිරිසක් බිහිකරලීම සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. සම සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රයට අයත් ශාඛාවන්වල සීඝ්‍රයෙන් වර්ධනය වන නූතන සංකල්පවලින් හා පුහුණුවකින් මෙම පාඨමාලාව සමන්විත වේ. කායික චිකිත්සාව හා පුනරුත්ථාපනය නිර්ණය කිරීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට මෙන්ම එහි ප්‍රතිඵල ඇගයීමට මෙම උපාධිධරයන්ට හැකිවනු ඇත. මෙම පාඨමාලාවෙන් මෙම උපාධිධරයන් තුළ ආරක්ෂිත චිකිත්සක පුහුණුවක් සහතික කෙරෙන අතර ඉදිරියේදී කායික චිකිත්සක ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පුහුණුවක් ලබාගැනීමට ද මෙම උපාධිධරයන්ට හැකියාව ලැබේ.

ඖෂධ විද්‍යාව පිළිබඳ උපාධිය

මෙය ද සිව් අවුරුදු විෂය මාලාවකින් සමන්විත, ඖෂධ විද්‍යාව පිළිබඳ උපාධිය පිරිනමනු ලබන, පෙර ලියාපදිංචි කිරීමේ පාඨමාලාවකි. ඖෂධ විද්‍යාව සෞඛ්‍ය විද්‍යාවේ ශාඛාවකි. එහි සීමාව අමුද්‍රව්‍යවල සිට ඖෂධ නිෂ්පාදනය දක්වාත් එම ඖෂධ පරිහරණය තුළින් රෝගීන් තුළ ඇතිවන ප්‍රතික්‍රියා නිරීක්ෂණය දක්වාත් විහිදේ. ඖෂධ හා සම්බන්ධ පහත සඳහන් අංශවලට මෙය ඇතුළත් වේ. නිෂ්පාදනය, තත්ත්ව සහතික කිරීම, පරීක්ෂණ හා සංවර්ධන කටයුතු, නියාමන කටයුතු, ආරෝග්‍යශාලා හා චිකිත්සන ඔසුවේදය, නීති පැනවීම හා නීති ක්‍රියාමාර්ග ගැනීම, ශාස්ත්‍රීය, බෙදාහැරීම, ප්‍රවර්ධනය, මිලදී ගැනීම, ගබඩා කිරීම, ප්‍රජා සේවාව, තොරතුරු සැපයීම හා නිරීක්ෂණය යනාදියයි. මෙම විෂය නිර්දේශය ඖෂධ විද්‍යාවේදයේ නියැලීම සඳහා විද්‍යාත්මක හා සේවය මුල්කරගත් පදනමක් සපයයි. එතුළින් උපාධිධරයන්ට වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ඖෂධවේදීන් ලෙස ස්වාධීනව නියැලීමට අවශ්‍ය හැකියාවන් දියුණු කර ගැනීමට මඟපෑදෙනු ඇත. තව ද, ඔවුන් ස්වාධීන වෘත්තිකයන් වශයෙන් සේවයේ නියැලීමටත්, එහි දියුණුව සඳහාත්, සෞඛ්‍ය සත්කාරයේ අනෙකුත් ක්ෂේත්‍රවලට එයින් ලැබෙන ක්‍රමික දායකත්වයේ කොටස්කරුවන් වීමටත් අවශ්‍ය විශ්වාසය ලබාගනී. මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ස්වයං අධ්‍යයනය තුළින් දැනුම හා ප්‍රතිවේදය ලබාගැනීමට හා නව එළඹුම් කරා උපාධිධරයන් තවදුරටත් පෙළඹවීම සඳහාය. විශ්ලේෂණාත්මක නිපුණතාවන් උසස් ලෙස දියුණු කළ හා උසස් චිකිත්සක හැකියාවක් සමඟ නායකත්ව විභව්‍යතාවක් ඇති උපාධිධරයන් බිහිකිරීම ද මෙම වැඩසටහනේ ඉලක්කයකි. උපාධි අපේක්ෂකයන් තුළ විවේචනාත්මක හා කල්පනාකාරී චින්තනය, ගැටළු විසඳීම හා සමාජ නිපුණතාවන් දියුණුකිරීමට මෙන්ම වෘත්තීය, සාරධර්ම හා ආචාරශීලී නිපුණතාවන් දියුණු කිරීම සඳහාත් මෙහිදී වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත.

විකිරණවේදය හා විකිරණ චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

මෙම උපාධි පාඨමාලාව ද සිව් අවුරුදු විෂය මාලාවකින් සමන්විත පෙර ලියාපදිංචි කිරීමේ පාඨමාලාවකි. විකිරණවේදය හා විකිරණ චිකිත්සාව මිනිස් ශරීරයේ අභ්‍යන්තර පටක, අවයව, අස්ථි ආදිය දැකීමට හා පිළිකා වැනි රෝග සඳහා ප්‍රතිකාර ක්‍රමයක් ලෙස සායනික පරිසරයක විකිරණ භාවිතා කරන වෘත්තීන්ය. මෙම ඉල්ලුමක් සහිත තාක්ෂණික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයට යහපත් පුද්ගල ගුණධර්ම අවශ්‍ය වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ සංතෘෂ්ටියක් සහිත නම්‍යශීලී වෘත්තියක් හිමිවේ. විකිරණවේදය හා විකිරණ චිකිත්සාව

සායනික පරිසරයක විද්‍යාව හා තාක්ෂණය යෙදීමට කැමැත්තක් දක්වන පුද්ගලයන්ට යෝග්‍ය වෘත්තීන් ය.

ශාස්ත්‍ර පීඨය

ප්‍රථම උපාධි වැඩසටහන : පීඨය එහි සිසුන්ට පුළුල් පදනමක් මත ප්‍රථම උපාධි අධ්‍යාපනය පිරිනමනු ලබයි. පීඨය මඟින් පිරිනැමෙන ප්‍රථම උපාධි වැඩසටහන් පහත දැක්වේ.

- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය
- ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
- නීතිවේදී උපාධිය

උපාධි වැඩසටහන් පවත්වනු ලබන්නේ සමාසික ක්‍රමය මත පදනම් වූ ඉගැන්වීම් හා අඛණ්ඩ ශිෂ්‍ය ඇගයීම මතය. එක් පාඨමාලාවක් සමාසිකයක් තුළ උගන්වා පරීක්ෂණයට ලක් කෙරේ. සමාසිකයක් අධ්‍යයන වැඩ සති පහළවකින් (15) යුක්තවන අතර එක් පාඨමාලාවකට පැය හතලිස් පහක් (45) අයත් වේ.

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (සමාසික හයක් ඇතුළත්) වර්ෂ තුනක කාල පරිච්ඡේදයකින් සමන්විත වන අතර ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සහ සමාජකාර්යවේදී ගෞරව උපාධියට (සමාසික 08 ක් ඇතුළත්) වර්ෂ හතරක කාල පරිච්ඡේදයක් හිමි වේ.

නීතිවේදී උපාධිය

තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය - විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.8.10 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් පිළිගෙන ඇති පාඨමාලා ඒකක ක්‍රමයට අනුව දියුණු කරන ලද නීතිය පිළිබඳ සිව් අවුරුදු ගෞරව උපාධි වැඩසටහනකි. අධ්‍යයන වැඩසටහනේ ප්‍රථම වසරේදී සිසුන් නීතිවේදයේ හා තෝරාගත් සමාජ විද්‍යා පාඨමාලාවල මූලිකාංග පිළිබඳ හදාරනු ඇත. දෙවන, තෙවන සහ සිව්වන වසර වලදී ජාත්‍යන්තර නීතිය, පවුල් නීතිය, නීති ක්‍රමය, අපරාධ නීතිය, ගිවිසුම් නීතිය, දේපල නීතිය ඇතුළත් නීතිවේදයේ ස්වාධීන ප්‍රදේශයන් ආවරණය කෙරෙනු ඇත. තෙවන වසරේ සිට සිසුන්ට සංස්ථාපිත නීතිය, මානව හිමිකම් හා පරිසර නීතිය, ජාත්‍යන්තර නීතිය, අපරාධ නීතිය හෝ අර්බුද නිරාකරණය පිළිබඳ ගෞරව උපාධියට සූදානම් විය හැක.

භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය - විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.8.34 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

උපාධි වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක්
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන මෙම සිව් අවුරුදු ගෞරව උපාධි වැඩසටහන පවත්වනු ලබනනේ සමාසික ක්‍රමයට අනුවය. මෙම වැඩසටහනෙහි ඉලක්කය වනුයේ ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන කටයුතුවලට අවශ්‍ය අවකාශීය විශ්ලේෂණ කටයුතුවලට ආධාර කළ හැකි ආකාරයේ උපාධිධාරීන් කොටසක් බිහිකිරීමය. දැනට පවතින භූගෝල විද්‍යා ගෞරව උපාධිය සඳහා ඇති පාඨමාලා කිහිපයක්, ශාස්ත්‍ර පීඨය මඟින් ඉදිරිපත් කරන මූලික පාඨමාලා සහ භූගෝලීය තොරතුරු විද්‍යාව සඳහාම සකස් කළ නව පාඨමාලා කිහිපයකින් මෙම වැඩසටහන සමන්විත වේ. මෙහි ඇති බොහොමයක්ම පාඨමාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිපුණතා වැඩි දියුණු වන ආකාරයට පන්ති සහ විද්‍යාගාර හා ක්ෂේත්‍ර පදනම් කරගත් ඇගයීම්වලින් සමන්විත වේ. නිපුණතා සහ වෘත්තීය හැකියාවන් වර්ධනය සඳහා අවසාන වසරේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් උපාධි නිබන්ධනයක් කිරීම හා සීමාවාසික පුහුණුවක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

සමාජකාර්යවේදී ගෞරව උපාධිය

තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය - විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.1.2 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

උපාධි වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක්
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පිරිනමන සමාජකාර්යවේදී උපාධිය වසර හතරකදී සම්පූර්ණ කළ යුතු ගෞරව උපාධියක් වේ. පුද්ගල හා සමාජ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා පුද්ගයා, පවුල, කුඩා කණ්ඩායම් සහ ප්‍රජාව වැනි සමාජ ඒකකයන් සමඟ විවිධ ආයතනික සංදර්භයන් තුළ වෘත්තීමය ලෙස ක්‍රියා කරමින් දායකවිය හැකි නිපුණතාවයකින් හා ශක්‍යතාවයකින් යුක්ත වෘත්තිකයින් පුහුණු කිරීම මෙම පාඨමාලාවේ කේන්ද්‍රගත අරමුණ වේ. එය සමාජ විද්‍යාව, මනෝවිද්‍යාව, ආර්ථික විද්‍යාව, ප්‍රජා සෞඛ්‍ය, ප්‍රජා වෛද්‍ය වැනි පාඨමාලාවන්ගෙන් දායකව විෂයන් ද සහිතව බහු පාඨමාලා ආකෘතියකින් ඉදිරිපත් කෙරේ. ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණුව මෙම විෂයේ අනිවාර්ය අංගයක් වන අතර, සිසුන් තෙවන හා සිව්වන වසරවල දෙවන සාමාසිකය පුරා කෙරෙන පූර්ණ කාලීන ක්ෂේත්‍ර පුහුණුවක් කෘතහස්ත වෘත්තිකයෙකුගේ අධීක්ෂණය යටතේ රාජ්‍ය, පුද්ගලික හෝ රාජ්‍ය නොවන ආයතනයකදී ලබා ගනු ඇත. මේ අනුව සමස්ථ පාඨමාලාව මඟින් සමාජකාර්යවේදී විෂය ආවරණය කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට

අනුකූලවන ආකාරයේ වෘත්තීමය සේවාවක් ජාතික මෙන්ම ජාත්‍යන්තර සමාජ තලයන්හිදී සැපයීම සඳහා සිසුන් පුහුණුකර සූදානම් කිරීමක් කරනු ලබයි.

භූගෝල විද්‍යා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය දෙවන වසරේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

කළමනාකරණ පීඨය

කළමනාකරණ පීඨය විසින් එහි අධ්‍යයනාංශ පහ ඔස්සේ ගෞරව උපාධි කෙරෙහි උපස්ථම්භක වන පරිදි පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලා පිරිනමනු ලබයි. මෙම සියළු උපාධි පාඨමාලා සමාසික සහ පාඨමාලා ඒකක ක්‍රමය පදනම් කොට ගෙන පිරිනමනු ලබන අතර එක් සමාසිකයක් සති පහළොවකින් සමන්විත වේ. ඒ ඒ උපාධි පාඨමාලාව අර්ඝ (credits) 120 ක අගයකින් යුක්ත වන අතර පාඨමාලා කාල සීමාව සමාසික අටක් හෙවත් සිව් වසරකින් සමන්විත වේ.

ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනමනු ලබන මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව සඳහා වාණිජ විෂය ධාරාවෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති සිසුන් ඇතුළත් කරගනු ලැබේ. ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස ඇතුළත් කරගනු ලබන සිසුන්හට එක් අවුරුදු පොදු පාඨමාලාවක් හැදෑරිය යුතු වන අතර ඉන් පසුව තවත් අවුරුදු තුනක් පහත සඳහන් විශේෂීකරණ ක්ෂේත්‍ර අතුරින් එකක් සිය අභිමතය සහ පොදු පාඨමාලාවේ කාර්ය සාධනය මත පදනම්ව තෝරාගෙන හැදෑරිය යුතු වේ.

- ගණකාධිකරණය සහ මූල්‍ය
- මානව සම්පත් කළමනාකරණය
- අලෙවි කළමනාකරණය
- මෙහෙයුම් කළමනාකරණය
- සංවිධාන කළමනාකරණය

වාණිජවේදී ගෞරව උපාධිය

මෙම ඒකාබද්ධ උපාධි පාඨමාලාව ශාස්ත්‍ර පීඨයේ අනුග්‍රාහකත්වයෙන් පිරිනමනු ලැබේ. ශාස්ත්‍ර පීඨයට ඇතුළත් කරගනු ලබන සිසුන් හට වාණිජවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස අයදුම් කළ හැකි වන අතර පළමු වසර තුළ ඔවුන් විසින් හදාරනු ලබන කළමනාකරණ විෂයයන් සඳහා ලබාගන්නා සාමාර්ථ පදනම් කොටගෙන සුදුසුකම් ලබන සිසුන් මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ. සිසුන්ගේ අභිමතය පරිදි මෙම උපාධි පාඨමාලාව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන එක් මාධ්‍යයකින් හැදෑරිය හැකි වේ. (වාණිජවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන සිසුන් පළමුව ශාස්ත්‍ර පීඨයට ඇතුළත් විය යුතුය.)

දන්ත වෛද්‍ය පීඨය

දන්ත වෛද්‍ය පීඨය දන්ත වෛද්‍ය උපාධියට වැදගත්වන ප්‍රථම උපාධි පාඨමාලාවක් පිරිනමනු ලබයි. මෙම පාඨමාලාවේ කාල පරිච්ඡේදය අධ්‍යයන වර්ෂ පහකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු සිදු කෙරේ.

ඉංජිනේරු පීඨය

ඉංජිනේරු පීඨය මඟින් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනැමෙන සිව් වසරක පූර්ණකාලීන ඉංජිනේරු විද්‍යාවේදී උපාධි (BScEngHons) පාඨමාලාවක් පැවැත්වේ. එක් සමාසිකයකට සති 15 ක කාල පරිච්ඡේදයක් අයත් වන සමාසික ක්‍රමය මත පදනම් වූ පාඨමාලා ඒකක ක්‍රමය පීඨය අනුගමනය කරයි. පාඨමාලා වැඩ (රසායනාගාර, සැලසුම් හා ක්ෂේත්‍ර වැඩ) හා කාර්මික අංශයේ පුහුණුව ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාවට අන්තර්ගත වේ. මෙම උපාධිය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) මඟින්, වොශිංටන් ගිවිසුම (Washington Accord) යටතේ පිළිගැනීමට ලක්කර ඇත. ඉංජිනේරු විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා ඇතුළු වන සියලුම සිසුන් ප්‍රථම වසර තුළදී සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාව (GPE) හැදෑරිය යුතු වන අතර එය සතුටුදායක අයුරින් සම්පූර්ණ කරනු ලබන සිසුන්ට විශේෂිකරණ ඉංජිනේරු පාඨමාලා (SPE) සඳහා ප්‍රවේශය ලබාගත හැකි වේ. ශිෂ්‍යයා සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාවේ දැක්වූ කුසලතාවය සහ ඔහුගේ/ ඇයගේ කැමැත්ත මත විශේෂිකරණ ඉංජිනේරු පාඨමාලාවේදී විශේෂිකරණ විෂයධාරා හයෙන් එකක් හැදෑරීමට සිසුන්ට නියම වේ. විශේෂිකරණය යටතේ පහත සඳහන් පාඨමාලාක් හැදෑරිය හැකිය.

i රසායන හා සැකසුම් ඉංජිනේරු ශිල්පය

ii සිවිල් ඉංජිනේරු ශිල්පය

iii පරිගණක ඉංජිනේරු ශිල්පය

iv විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය

v නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු ශිල්පය

vi යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය

සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාවට සියලු සිසුන් හැදෑරිය යුතු අනිවාර්යය පාඨමාලා ඒකක අඩංගු වේ. විශේෂිකරණ ඉංජිනේරු පාඨමාලාවේ විෂයන් හර විෂයන්, තාක්ෂණික වෛකල්පිත විෂයන් හා සාමාන්‍ය වෛකල්පිත විෂයන් ලෙස කාණ්ඩ තුනකට වර්ග කෙරේ.

හර විෂයයන් අදාළ විශේෂිකරණ විෂය ධාරාවේ සියලු සිසුන්ට අනිවාර්ය වේ. තාක්ෂණික වෛකල්පිත විෂයන් තාක්ෂණික ස්වභාවයක් ගන්නා අතර ඒවායින් හර විෂයන් හෝ අතිරේකව තෝරාගත් අංශයන් වලට සම්බන්ධ විෂයන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දේ. සාමාන්‍ය වෛකල්පිත විෂයන් තාක්ෂණික ස්වභාවයක් නොගන්නා අතර ඒවායින් සිසුන්ට වෘත්තිකයෙක් මෙන්ම වගකිවයුතු පුරවැසියෙක් වශයෙන් තමන්ගේ කාර්යයන් පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගැනීමට මඟ සැලසේ.

වෛද්‍ය පීඨය

උපාධි අපේක්ෂක වැඩසටහන

වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදී උපාධිය (MBBS), මෙම පීඨයෙන් පිරිනැමේ.

මෙම පාඨමාලාවේ කාලපරිච්ඡේදය වසර පහක් (05) පුරා පැතිරුණ වාර 14 කි. 2005 වසරේ සිට "වසර 2004 න් එහා" නමින් හැඳින්වෙන, සමාසිකයක් මොඩියුල පහක් මත පදනම් වූ විෂය නිර්දේශ සංශෝධනයක් පීඨය ආරම්භ කළේය. "වසර 2004 න් එහා" නම් වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විෂය නිර්දේශයට නූතන ලෝකයේ අවශ්‍යතා හා ඉල්ලුම තහවුරු කරමින් "2003 වෛද්‍ය අධ්‍යාපනයේ ලෝක සමුළුවේදී" යෝජනා කරන ලද වෙනස්කම් ඇතුළත් කරන ලදී. මෙම නව විෂය නිර්දේශය ප්‍රථම වතාවට 2005 වර්ෂයේදී වෛද්‍ය පාසලට ඇතුළත් වූ 2004/ 2005 ශිෂ්‍ය කණ්ඩායමට හඳුන්වා දෙන ලදී. සම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට පටහැනිවූ මෙම නව විෂය නිර්දේශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ මුල් කාලීන සායනික අදාළත්වයක්, ස්වයං අධ්‍යයනය, වෘත්තීය සංවර්ධනය හා ප්‍රජා මූලික අධ්‍යයනයක් පිළිබඳවය.

මෙම වැඩසටහන පහත සඳහන් විෂය ධාරාවන් පහකින් යුක්ත වේ. (පළමු සමාසික 8 ක කාලය තුළ)

- SBM - වෛද්‍ය විද්‍යාවේ විද්‍යාත්මක පදනම - සායනික, රසායනාගාර කළමනාකරණ කටයුතු ඉටු කිරීමට පාදක වන දැනුම ලබාදේ.
- CLM - සායනික රසායනාගාර කළමනාකරණය - සායනික, රසායනාගාර හා රෝගී කළමනාකරණ කුසලතා ලබාදේ.
- CLR - සන්නිවේදනය, ඉගෙනීම හා පර්යේෂණ - සන්නිවේදන කුසලතා වර්ධනය, ඉංග්‍රීසි භාෂා හැකියාව, වෙබ් පදනම් කරගත් ඉගෙනුම හා පර්යේෂණ කුසලතා දියුණු කිරීම.
- DIS - සමාජයීය වෛද්‍යවරයා - ජනගහන ගැටළු හා විවේචනාත්මක සෞඛ්‍ය ගැටළු හා සම්බන්ධ සමාජ කර්තව්‍ය පිළිබඳව වෛද්‍යවරුන් සවිබල ගැන්වීම.
- HCT - ආරෝග්‍යශාලා ප්‍රජාව පදනම් කරගත් පුහුණුව.

විද්‍යා පීඨය

මෙම පීඨය අධ්‍යනාංශ අටකින් සමන්විත වේ. ඒවා, උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව, භූ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණය, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන නම් වලින් හැඳින්වෙන අතර විද්‍යා අධ්‍යාපන ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකක නමින් ඒකක දෙකක් ද වේ. පහත වගුවේ විස්තර වනුයේ පීඨයෙන් පිරිනැමෙන උපාධි වැඩසටහන්ය.

උපාධි වැඩසටහන	කාලය	විස්තරය
විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය	අවුරුදු 03	ජීව විද්‍යාව හා භෞතික විද්‍යා යන විෂයධාරා දෙකේම වැඩසටහන් පිරිනැමේ.
ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු 04	සිසුන්ගේ 100 හා 200 මට්ටමේ කාර්යය සාධනය සැලකිල්ලට ගෙන තරඟකාරී පදනම මත තෙවන වසර ආරම්භයේදී සීමිත සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කෙරේ. සිසුන් විශේෂ විෂයේ පාඨමාලා ඒකක හා අදාළ අධ්‍යනාංශ වලින් නිර්දේශිත පාඨමාලා ඒකක හදාරන අතර අවසන් වසරේදී පර්යේෂණ ව්‍යාපෘතියක් ද කරනු ලබයි.
ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු 04	සිව්වන වසරට ද තමන්ගේ අධ්‍යයන පාඨමාලාව පවත්වාගෙන යෑමේ විකල්පය සිසුන්ට ලබාදී ඇත. මෙම අවස්ථාව ලැබෙනුයේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ අවශ්‍යතා සාර්ථකව සපුරා ඇති සිසුන්ටය. සිව්වන වසරේදී ඔවුන් ව්‍යවහාරික හා කාර්මික අංශය හා සම්බන්ධ වූ පාඨමාලා හා සති 16 ක කාර්මික අංශය හා සම්බන්ධව කටයුතු කිරීමක් සහිත කුසලතා සංවර්ධන වැඩසටහනක් අධ්‍යයනය කළ යුතු වේ.
සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු 04	--

පීඨය උපාධි අපේක්ෂකයින්ට සියලු අංගෝපාංගවලින් සමන්විත විද්‍යාගාරයක්, පරිගණක හා පුස්තකාල පහසුකම් සහිත අතිවිශිෂ්ඨ අධ්‍යයන පරිසරයක් ලබාදෙයි. පීඨයේ සියලු අධ්‍යයන වැඩසටහන් අධ්‍යයන වර්ෂයේ සමාසිකයන් දෙකක් තුළ පාඨමාලා ඒකක ක්‍රමය මත 100, 200, 300 හා 400 යන මට්ටම් හතරේදී පවත්වනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වේ. නම්‍යශීලී වූ උසස් උපාධියක් ලබාදීමේ අටියෙන් සැලසුම් කළ විවිධ විෂයන් සමූහයක් පීඨයෙන් පිරිනැමේ. එනමුදු වෙනත් විෂයන් වලට වඩා විශේෂිත විෂයන් වලට ප්‍රවේශය ලබා ගැනීම සඳහා විශාල තරඟයක් පවතී.

පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය ශ්‍රී ලංකාව තුළ පශු වෛද්‍ය විද්‍යාව උපාධිය පිරිනමන එකම ආයතනය වේ. ඉංග්‍රීසි භාෂාවෙන් පිරිනැමෙන මෙම උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ පහකින් (සමාසික දහයකින්) සමන්විත වේ. මූලික පශු විද්‍යා දෙපාර්තමේන්තුව, පශු ව්‍යාධීවේද දෙපාර්තමේන්තුව, පශු මහජන සෞඛ්‍ය හා ඖෂධවේදී දෙපාර්තමේන්තුව, පශු සායනික විද්‍යා දෙපාර්තමේන්තුව සහ ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන අධ්‍යයන දෙපාර්තමේන්තු පහක් සහභාගීත්වයෙන් මෙම

උපාධි පාඨමාලාව පිරිනැමේ.

2020 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද පස් අවුරුදු නව විෂය මාලාව පාඨමාලා ඒකක ක්‍රමය අනුව සිදු කෙරෙන අතර උපාධිය ලබා ගන්නා අවස්ථාවේදී සිසුන්ට ඔවුන් ලබා ගන්නා ශ්‍රේණියේ සමුච්චිත ලකුණු සාමාන්‍යය ලබා ගැනීමේ හැකියාව ලැබේ. සියලු දේශන සහිත ඉගැන්වීම් සිව්වන වසර අවසානය වන විට නිම කෙරෙන අතර පස් වන වසර දේශන රහිත සායනික පුහුණුව සඳහා පමණක් කැප වූ වසරක් වේ. පස් වන වසර තුල සිසුන් පශු වෛද්‍ය ශික්ෂණ රෝහල් දෙකෙහි (සුරතල්, වන හා සත්වෝද්‍යාන සතුන් සඳහා වන රෝහල් හා ගොවිපල සත්ත්ව රෝහල) පශු ශික්ෂණ ගොවිපලෙහි හෝ රජයේ හෝ පෞද්ගලික විශ්වවිද්‍යාලයෙන් පරිභාහිර ස්ථාන වල හෝ ස්ථානගත කෙරෙනු ලැබේ.

උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව සියලු උපාධිධාරීන් විසින් සය මාසික සීමාවාසික පුහුණුවක් ලැබිය යුතු අතර ඉන් අනතුරුව පශු වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගත හැකි වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	-	S
ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	-	E
කලා - තොරතුරු තාක්ෂණය	-	E
ජෛවීය විද්‍යාව	-	E
භෞතීය විද්‍යාව	-	E
ආහාර විද්‍යාව හා තාක්ෂණය	-	E
භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	-	E
ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	-	E
බහු අවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය	-	E
කළමනාකරණය	-	S/E
කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රතිපත්ති	-	S/E
වාණිජ්‍යය	-	S/E
දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	-	S/E
ව්‍යාපාර තොරතුරු පද්ධති (ගෞරව) (BIS)	-	S/E
වෛද්‍ය විද්‍යාව	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
ඉංජිනේරු විද්‍යාව	-	E
හෙද	-	E
ඖෂධ විද්‍යාව	-	E
වෛද්‍ය රසායනාගාර විද්‍යා	-	E
දෘෂ්ටිමිතිය	-	E
දන්ත ශල්‍ය විද්‍යාව	-	E
ජලජ ජෛවසම්පත්	-	E
නාගරික ජෛවසම්පත්	-	E
පරිගණක විද්‍යාව	-	E
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	-	E
තොරතුරු පද්ධති	-	E
මූල්‍ය ආර්ථික විද්‍යාව	-	E
නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය	-	S/E
සංගීතය	-	S/E
සමාජකාර්යවේදය	-	E

මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය විසින් එහි උපාධි අපේක්ෂකයන් උදෙසා පුළුල් අධ්‍යයන ක්ෂේත්‍ර ඔස්සේ පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. මෙම පීඨයේ උපාධි පාඨමාලා සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම ප්‍රදානය කරනු ලබන අතර දේශන, අබණ්ඩ ඇගයීම් හා වාර අවසාන ඇගයීම් සඳහා මිශ්‍ර ක්‍රමවේදයක් (Blended Method) (මුහුණට මුහුණ හෝ ඉලෙක්ට්‍රොනික් මෙවලම් මගින්) අනුගමනය කෙරේ.

මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි උපාධි පාඨමාලා ක්‍රියාත්මක වන්නේ අර්ධ වාර්ෂික පාඨමාලා ඒකක ක්‍රමයට අනුව ය. එක් පාඨමාලාවක් ඉගැන්වීම් පැය 45 කින් සමන්විත වන අතර, අධ්‍යයන සති 15 ක කාල පරිච්ඡේදයක් තුළ ඉගැන්වීම් සහ පරීක්ෂණ කටයුතු සිදු කෙරේ.

පීඨය මගින් පහත දැක්වෙන උපාධි පාඨමාලා ප්‍රධානය කරනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (SLQF 5)
2. ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව (SLQF 6)
3. විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව (SLQF 6)
4. සමාජකාර්යවේදී ගෞරව උපාධි පාඨමාලාව (SLQF 6)

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව සඳහා නියමිත කාලය වසර 3 ක් වන අතර ගෞරව උපාධි පාඨමාලාව සඳහා නියමිත කාලය වසර 4 කි.

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව ප්‍රධානය කෙරෙන්නේ මානව විද්‍යාව, පුරාවිද්‍යාව, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ දර්ශනය, බෞද්ධ උරුමය හා සංචාරක කර්මාන්තය, චීන භාෂාව, අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය, නර්තනය හා සංස්කෘතික අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, ප්‍රංශ, භූගෝල විද්‍යාව, භූ අවකාශීය තාක්ෂණය, හින්දි, ඉතිහාසය, තොරතුරු තාක්ෂණය, ජපන්, ජන සන්නිවේදනය, කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය, පාලි, දර්ශනය, මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව, නාට්‍ය හා රංග කලාව, සමාජ කටයුතු සහ සමාජ සංඛ්‍යානය යන විෂයයන් සඳහා ය.

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලාව ප්‍රධානය කෙරෙන්නේ මානව විද්‍යාව, පුරාවිද්‍යාව, බෞද්ධ ශිෂ්ටාචාරය, ව්‍යාපාර සංඛ්‍යානය, බෞද්ධ දර්ශනය, බෞද්ධ උරුමය හා සංචාරක කර්මාන්තය, චීන භාෂාව, අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය, නර්තනය හා සංස්කෘතික අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, ප්‍රංශ, භූගෝල විද්‍යාව, භූ අවකාශීය තාක්ෂණය, හින්දි, ඉතිහාසය, තොරතුරු තාක්ෂණය, ජපන්, ජනසන්නිවේදනය, කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය, පාලි, දර්ශනය, මනෝවිද්‍යාව, දේශපාලන විද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජවිද්‍යාව, සමාජ කටයුතු සහ සමාජ සංඛ්‍යානය යන විෂයයන් සඳහා ය.

ඊට අමතරව පීඨය විසින් සෘජු කවුළුවක් මඟින් බඳවාගන්නා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවකට පහත සඳහන් විශේෂ උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලැබේ.

- නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය - ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව
- මූල්‍ය ආර්ථික විද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව
- තොරතුරු තාක්ෂණය - ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව
- ශාස්ත්‍රවේදී ගෞරව ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම උපාධි පාඨමාලාව

පීඨයේ ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයකුම ඉංග්‍රීසි, සමාජය හා සංස්කෘතිය, තොරතුරු තාක්ෂණය, ප්‍රමාණාත්මක විශ්ලේෂණය සහ ආයතනික දැනුවත්භාවය හා ව්‍යවසායකත්ව සංවර්ධනය යන පොදු පාඨමාලා හැදෑරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම සියලු පාඨමාලාවන් ශ්‍රී ලංකා තත්ත්ව සහතික කිරීමේ නිර්ණායකවලට (SLQF) අනුව ද, විෂය මිනුම් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කොට තිබේ.

ව්‍යවහාරික විද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි පාඨමාලාවල මාධ්‍යය ඉංග්‍රීසි මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

මූලික විද්‍යා විෂයයන් වන රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය යන විෂයයන් පළමු වර්ෂයේ දී පමණක්, සිංහල පැහැදිලි කිරීම් සහිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එම විෂයයන් දෙවන වර්ෂයේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ද, අනෙකුත් විෂයයන් පළමු වර්ෂයේ සිටම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද හැදෑරිය යුතුය.

සියලුම සිසුන් අනිවාර්ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාර්ථයක් ලබා ගැනීම, උපාධිය ලබා ගැනීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් වන්නේය.

ආහාර විද්‍යාව හා තාක්ෂණය, ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය සහ බහුඅවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය යන උපාධි සඳහා සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙනමම ලියාපදිංචි කරනු ලැබේ.

එම ආහාර විද්‍යාව හා තාක්ෂණය, ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය සහ බහුඅවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය යන විෂය ධාරාවන්ට ලියාපදිංචිවන සිසුන් හැර අනෙකුත් සියලුම සිසුන් පහත සඳහන් විෂය සංකලන සහිත පාඨමාලාවක් තෝරාගත යුතුය.

සිසුන්ට ජෛවීය විද්‍යාව, භෞතීය විද්‍යාව යන පාඨමාලාවන්ට අයත් වන මතු දැක්වෙන විෂයයන් ගෙන් සමන්විත විෂය සංකලන හැදෑරීම සඳහා අවස්ථාව සලසා ඇත.

විෂය සංකලන

ජෛවීය විද්‍යා

කේත අංකය	විෂයයන්	මාධ්‍යය
B 01	රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව	E
B 02	රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය/ ශාක ජීව විද්‍යාව/ ක්ෂුද්‍ර ජීව විද්‍යාව	E
B 04	රසායන විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය/ ශාක ජීව විද්‍යාව/ ක්ෂුද්‍ර ජීව විද්‍යාව	E
B 05	රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය	E
B 07	රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය/ ශාක ජීව විද්‍යාව/ ක්ෂුද්‍ර ජීව විද්‍යාව	E
B 08	රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
B 09	රසායන විද්‍යාව, ආහාර විද්‍යාව, ජීව විද්‍යාව	E
B 12	රසායන විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, කළමනාකරණ විද්‍යාව	E
B 14	රසායන විද්‍යාව, ප්‍රවේණි හා අණුක ජීව විද්‍යාව, ජීව විද්‍යාව	E
B 15	රසායන විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව	E
B 16	සත්ත්ව විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, කළමනාකරණ විද්‍යාව	E
B 17	රසායන විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හා කාවැද්දුම් පද්ධති	E

භෞතීය විද්‍යා

කේත අංකය	විෂයයන්	මාධ්‍යය
P 01	ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව	E
P 02	ගණිතය, රසායන විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව	E
P 03	ගණිතය, භෞතික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව	E
P 04	ගණිතය, රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව	E
P 05	ගණිතය, භෞතික විද්‍යාව, කළමනාකරණ විද්‍යාව	E
P 06	ගණිතය, පරිගණක විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව	E
P 07	ගණිතය, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව	E
P 08	ගණිතය, සංඛ්‍යාන විද්‍යාව, ආර්ථික විද්‍යාව	E
P 12	ගණිතය, ව්‍යවහාරික ගණිතය, පරිගණක විද්‍යාව	E
P 13	ගණිතය, භෞතික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හා කාවැද්දුම් පද්ධති	E
P 14	ගණිතය, ව්‍යවහාරික ගණිතය, කළමනාකරණ විද්‍යාව	E

පොදු විෂය සංකලන

(ජෛවීය විද්‍යා හා භෞතීය විද්‍යා විෂයයන් සඳහා)

ක්ෂේත්‍ර අංකය	**විෂයයන්**	**මාධ්‍යය**
C 01	රසායන විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව	E
C 02	රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය	E

විද්‍යාවේදී උපාධි පාඨමාලාව [BSc Degree Programme (90 Credits - SLQF Level 5)]

මෙම තුන් අවුරුදු උපාධි පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ, විවිධ ක්ෂේත්‍රවල තීරණ ගැනීමේ සහ නායකත්වය සඳහා උපාධිධාරීන් පුහුණු කිරීම අරමුණු කරගෙනය. මෙම උපාධි පාඨමාලාවලදී සියලුම සිසුන් පළමු වසර දෙක තුළදී ඔවුන් තෝරාගත් විෂයයන්වලට අදාළ මූලික ඒකක (Course Units) හැදෑරීම අත්‍යවශ්‍ය වේ. ජාතික විද්‍යා හා තාක්ෂණ අවශ්‍යතා සහ රැකියා අවශ්‍යතා සඳහා උචිත විවිධ විෂයයන් තෙවන වසරේදී හදුන්වා දී ඇත.

විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව (120 Credits - SLQF Level 6)
BSc Honours in Specializing Field, උදා : BSc Honours in Chemistry

තෝරාගත් විෂයකට අදාළව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, පර්යේෂකයන් සහ වෘත්තියවේදීන් වීමට අපේක්ෂා කරන සිසුන් සඳහා, සිව් වසරක ගෞරව උපාධි පාඨමාලා ඉදිරිපත් කර ඇත. මෙහිදී පළමු වසර දෙක තුළදී ඉහළ කුසලතා දක්වන සිසුන් පහත සඳහන් විෂයයන්ට අදාළ ගෞරව උපාධි පාඨමාලා සඳහා තෝරාගනු ලැබේ.

එම විෂයයන් නම් රසායන විද්‍යාව, බහු අවයවික විද්‍යාව, කර්මාන්ත රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, පරිගණක විද්‍යාව, පාරිසරික කළමනාකරනය හා වන විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය, ශාක ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය, සංඛ්‍යාන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව වේ.

ඊට අමතරව ආහාර විද්‍යාව හා තාක්ෂණය, ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය සහ බහුඅවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය පාඨමාලා ද මේ යටතට ගැනේ.

විස්තාරිත උපාධි පාඨමාලාව (120 Credits - SLQF Level 6)
BSc Honours in Applied Sciences

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ සිසුන්ට අදාළ කර්මාන්ත සඳහා ඇතුළත් වීම ඉලක්ක කර ගෙනයි.

පළමු තුන් වසර තුළදී ඉහළ කුසලතා දක්වන සිසුන්ට හතරවන වසරේදී මෙම ගෞරව උපාධි පාඨමාලාවට ඇතුළත් විය හැක. හතරවන වසරේ දෙවන වර්ෂාර්ධය අවසාන වන විට පහත විෂයන්ට අදාළව සහ අනිවාර්ය Inplant Training / Internship හෝ පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතුය.

එම විෂයයන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT), බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය (PST), කළමනාකරණ විද්‍යාව, ආර්ථික විද්‍යාව, ජීව විද්‍යාව, ශාක ජීව විද්‍යාව (PBT), ගණිතය, සංඛ්‍යාන විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, පාරිසරික කළමනාකරණය සහ වන විද්‍යාව (EMF), ජලජ සම්පත් කළමනාකරණය සහ සත්ත්ව විද්‍යාව වේ.

විද්‍යාවේදී භෞතික විද්‍යා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය (PICT) උපාධිය (90 Credits - SLQF Level 5)

භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වර්ගීකරණය යටතේ අ.පොෙ.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (PICT), හැදෑරූ සිසුන්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ තුන් අවුරුදු විද්‍යාවේදී භෞතික විද්‍යා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපාධියට ඇතුළත් කෙරේ. මෙම සිසුන්ට පහත සඳහන් විෂය සංකලන එකක් හැදෑරීමට අවස්ථාව හිමිවේ.

මෙම සිසුන් පොදු විෂය ධාරාව යටතේ ගණිතය සහ භෞතික විද්‍යාව හදාරන හෙයින් කුසලතා මත ගණිතය සහ භෞතික විද්‍යාව ගෞරව උපාධිය හැදෑරීමට අවස්ථාව හිමි වන්නේය.

භෞතික විද්‍යා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය

ක්ෂේත්‍ර අංකය	විෂයයන්	මාධ්‍යය
I01	ගණිතය, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	E
I02	ගණිතය, භෞතික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හා කාවැද්දුම් පද්ධති	E

වැඩි විස්තර පහත දැක්වෙන වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.
http://science.sjp.ac.lk

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

- ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව
- කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රතිපත්ති - විද්‍යාවේදී ගෞරව
- වාණිජවේදී ගෞරව
- දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය - විද්‍යාවේදී ගෞරව
- ගණකාධිකරණය - විද්‍යාවේදී ගෞරව
- අලෙවි කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව
- මානව සම්පත් කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව
- මූල්‍ය - විද්‍යාවේදී ගෞරව
- ව්‍යාපාර ආර්ථික විද්‍යාව - ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව
- මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව
- ව්‍යාපාර තොරතුරු පද්ධති - විද්‍යාවේදී ගෞරව
- ව්‍යවසායකත්ව - විද්‍යාවේදී ගෞරව

ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියා වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පෙරලිකාරී ගමන 1959 දී ආරම්භ විය. ආරම්භයේ සිටම දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද විශිෂ්ඨත්වයට පත් ආදර්ශවත් විද්‍යාර්ථීන් සහ නායකයින් දහස් ගණනක් පීඨය විසින් බිහි කර ඇත.

දැනට අධ්‍යයනාංශ 12 කින් සමන්විත අංගසම්පූර්ණ කළමනාකරණ පීඨයක් වන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය කළමනාකරණයට අදාළ සියලු ක්ෂේත්‍ර නියෝජනය කරන ආචාර්ය උපාධිධාරීන් 100 කට අධික සංඛ්‍යාවක්, 60 කට අධික මහාචාර්යවරුන් සංඛ්‍යාවක් ඇතුළුව අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයන් 250 කට අධික සංඛ්‍යාවකින් සමන්විත වේ. කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය ලෙස හැඳින්වෙන මෙම පීඨය, ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය සඳහා වැඩිම ඉල්ලුමක් ඇති පීඨයයි. අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 5000 කට වැඩි පිරිසකට සහ පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් 750 කට අධික සංඛ්‍යාවකට පීඨය මඟින් සිය සේවා සැපයේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ විශාලතම කළමනාකරණ පීඨය ලෙස ද සැලකෙන්නේ ද මෙම පීඨයයි.

"කළමනාකරණ අධ්‍යාපනය තුළින් ජීවිත සමෘද්ධිමත් කිරීමේ" උපාය මාර්ගික අභිප්‍රායයෙන් මෙහෙයවනු ලබන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, සමස්ථයක් ලෙස රටෙත් ලෝකයේත් සංවර්ධනයට දායක වීමේ හැකියාව සහිත වූත්, ඒ සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, නිවැරදි ආකල්පවලින් සහ ශ්‍රී ලංකාවේ සමාජ -ආර්ථික හා සංස්කෘතික පරිසරය පිළිබඳ මනා අවබෝධයකින් සන්නද්ධ වූත් උපාධිධාරීන් බිහි කිරීමට කැපවී සිටී.

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

ගණකාධිකරණය - විද්‍යාවේදී ගෞරව

1991 දී හඳුන්වා දුන් ගණකාධිකරණය- විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාවේ අරමුණ වන්නේ, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ ආශ්‍රිත ක්ෂේත්‍රවල කළමනාකරණ තනතුරු දැරීමට හැකියාව ඇති සම්පත්දායක සහ තාක්ෂණිකව දක්ෂ උපාධිධාරීන් බිහි කිරීමයි. මෙම උපාධි පාඨමාලාව මඟින් මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, විගණනය සහ සහතිකකරණය, බදුකරණය, ගිණුම්කරණ තොරතුරු පද්ධති සහ SAP S/4HANA මත පදනම් වූ ආයතනික සම්පත් සැලසුම්කරණ පද්ධති (ERP Systems), පරිගණකගත ගිණුම්කරණය, ගිණුම්කරණය සහ මූල්‍ය ආකෘති නිර්මාණය (Accounting and Financial Modeling), ගිණුම්කරණය පිළිබඳ කෘතීම බුද්ධිය සහ දත්ත විශ්ලේෂණය (Artificial Intelligence and Data Analytics in Accounting), ආයතනික යහපාලනය (Corporate Governance), ආයතනික තිරසාර ගිණුම්කරණය (Corporate Sustainability Accounting) සහ ගිණුම්කරණය පිළිබඳ පර්යේෂණ කුසලතා මත පදනම් වූ

ගිණුම්කරණය සම්බන්ධ ප්‍රධාන සහ උපකාරක ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් වරණයක් සපයනු ලැබේ. එමෙන්ම මෙම උපාධි පාඨමාලාව මඟින් නායකත්වය, පුද්ගලික ධාරිතාව සහ සන්නිවේදනය තුළ සිසුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. මීට අමතරව, ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ වසර දෙකක අනිවාර්ය ප්‍රායෝගික පුහුණු වැඩසටහන මඟින් සිසුන්ට ප්‍රායෝගික වැඩ පසුබිමක න්‍යායාත්මක දැනුම යෙදවීමට අවස්ථාව හිමි වන අතර එමඟින් ඔවුන්ගේ දේශීය හා විදේශීය රැකියා අවස්ථා වැඩිදියුණු වේ. මෙම උපාධි වැඩසටහන හදාරන සිසුන්ට දේශීය හා ජාත්‍යන්තර වෘත්තීය ගිණුම්කරණ ආයතන විසින් පවත්වනු ලබන විභාගවලදී බොහෝ නිදහස් කිරීම් (Exemptions) ද භුක්ති විඳිය හැකිය.

ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව

පුරා 60 වසරකට අධික අධ්‍යයන ඉතිහාසයක් ඇති, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පුරෝගාමී සහ ප්‍රමුඛතම කළමනාකරණ අධ්‍යයන පාඨමාලාවක් ලෙස ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව ශාස්ත්‍රාලිකයින් අතර පමණක් නොව සිසුන් සහ ව්‍යාපාරික ප්‍රජාව අතර ද ඉහළ ජනප්‍රියතාවයක් සහ පිළිගැනීමක් ඇති පාඨමාලාවකි. මෙම උපාධි පාඨමාලාව, සිසුන්ට ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ 'දැනුම' සහ පුළුල් සමාජයීය හා ආයතනික ලෝකයේ අපේක්ෂාවන් සහ ගතිකත්වයන් මඟින් ඉස්මතු කරන 'නිපුණතා' ලබා දෙන ආකාරයෙන් සැලසුම් කර, යාවත්කාලීන කරන ලද පාඨමාලා වලින් සමන්විත වේ. මේ අනුව, මෙම උපාධි පාඨමාලාව ගතික ව්‍යාපාර පරිසරයේ ආචාර ධර්ම සහ සමාජ-ආර්ථික යථාර්ථයන්ට සංවේදී වන දක්ෂ නායකයින් වීම සඳහා සිසුන්ට මග පාදයි. ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව උපාධිය ව්‍යාපාර කළමනාකරණයේ මූලික සහ වරණීය විෂයන්ගෙන් ඒකාබද්ධ වන අතර කළමනාකරණ සීමාවාසික පුහුණුවකින් (සිසුන්ගේ වරණය පරිදි වසරක් දක්වා දීර්ඝ වූ), පර්යේෂණ ව්‍යාපෘතියකින් හා නිපුණතා සංවර්ධනයෙන් ද සමන්විත වේ. මෙම උපාධි පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට ව්‍යාපාර කළමනාකරණ න්‍යාය සම්බන්ධයෙන් ස්ථාවර පදනමක් මෙන්ම තත්කාලීන ව්‍යාපාර පරිචයන් සම්බන්ධයෙන් අත්දැකීම් ලබාගැනීමට අවස්ථාවන් පවතින නිසා ව්‍යාපාරික ලෝකය තුළ විවිධ රැකියා රැසකට යොමු වීමේ අවස්ථාව හිමිවේ.

ව්‍යාපාර ආර්ථික විද්‍යාව - ව්‍යාපාර පරිපාලනය - විද්‍යාවේදී ගෞරව

ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ විෂයයන්හි සුසංයෝගිත විෂය මාලාවක් සඳහා වූ දැඩි අවශ්‍යතාව හඳුනා ගනිමින්, 2002 වර්ෂයේදී මෙම උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදී. මෙහි අරමුණ වනුයේ, ව්‍යාපාරයන් කළමනාකරණය කිරීමේදී, ආර්ථික විද්‍යා න්‍යායන් සහ එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුමෙන් සිසුන් සුපෝෂණය කිරීම මෙන්ම විශ්ලේෂණ, විචාරාත්මක, නායකත්ව, කණ්ඩායම් වැඩ සහ සන්නිවේදන කුසලතාවයන්ගෙන් ඔවුන් සන්නද්ධ කිරීමයි. බැංකුකරණය, සංවර්ධන අධ්‍යයනය, ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර සහ දත්ත විද්‍යාව (Data Science for Economics) යන විශේෂතා ක්ෂේත්‍ර හතරක් පිරිනැමීමෙන් මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට වැඩි නම්‍යශීලී බවක් ලබා දේ. මෙම උපාධි පාඨමාලාව කළමනාකරණ ආර්ථික විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය, ආර්ථිකමිතිය, මූල්‍ය ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර වෙළඳාම් සහ ගෙවීම්, මුදල් ආර්ථික විද්‍යාව, උසස් ආර්ථික විද්‍යාව, ගණිතමය ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, පයිතන් (Programming in Python) සහ මහා පරිමාණ දත්ත විශ්ලේෂණය (Big Data Analytics for Economics) වැනි ඉහළ ඉල්ලුමක් ඇති විෂයයන්ගෙන් සමන්විත වේ. තව ද, මෙම උපාධි පාඨමාලාව අනිවාර්ය සීමාවාසික පුහුණුවක්, ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ස්වාධීන අධ්‍යයනයක් සහ මෘදු කුසලතා සහ සන්නිවේදන කුසලතා සංවර්ධන වැඩසටහන්ගෙන් සමන්විත වේ. උපාධි පාඨමාලාව සාර්ථකව නිම කරන සිසුන්ට බැංකු, ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම්, ව්‍යාපාර කළමනාකරණය, පර්යේෂණ, මූල්‍ය, රක්ෂණ, වෙළඳාම සහ ජාත්‍යන්තර ව්‍යාපාර වැනි ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ වෘත්තීය අවස්ථාවන්ට පිවිසීමට ඇති හැකියාව සහතික කෙරේ. එසේම, අපගේ වත්මන් උපාධිධාරීන් දේශීය මෙන්ම ජාත්‍යන්තර පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල සේවයේ නිරත වේ.

වාණිජවේදී ගෞරව

මෙම උපාධි පාඨමාලාව 1973 වර්ෂයේ සිට පුරා දශක පහකට වැඩි කාලයක් පවත්වාගෙන එන්නකි. මේ උපාධි පාඨමාලාවෙහි අරමුණ වනුයේ දැඩි තරඟකාරීත්වයෙන් යුත් ගෝලීය සහ දේශීය ආර්ථික පරිසරය හමුවේ නවීන ව්‍යාපාර සංවිධානයන්හි අභියෝග වලට මුහුණදීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප වලින් සන්නද්ධ උපාධිධාරීන් බිහිකිරීමයි. වාණිජවේදී උපාධිධාරියෙකු තමන් අධ්‍යයනය කරනු ලබන ක්ෂේත්‍රයේ පුළුල් සංකල්පමය සහ න්‍යායාත්මක දැනුම් සම්භාරයකින් මෙන්ම අන්තර්ජාතික දැක්මකින් හෙබි ප්‍රවීණයෙකු විය යුතුය. එසේම, වාණිජවේදී උපාධිධාරියෙකු සතුව න්‍යායන් හා ඒවාට පාදක වූ උපකල්පන ඇගයීමට හා භාවිතා කිරීමට, ගැටළු හඳුනා ගැනීමට, ඒවා විසඳීම සඳහා සුදුසු ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට සහ උපාය මාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි යෙදීමට ඇති හැකියාව ඇතුළුව විවේචනාත්මක, සංකල්පීය සහ පරාවර්තක චින්තනය සහ විමර්ෂණය කිරීමේ හැකියාව තිබිය යුතුය. සිව් වසරකින් යුත් මෙම උපාධි පාඨමාලාවෙහි අවසන් අධ්‍යයන වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිත පර්යේෂණ නිබන්ධනය (Research dissertation) සහ සය මසක ප්‍රායෝගික පුහුණු වැඩසටහන (Internship), තුළින් ශිෂ්‍යයාට න්‍යායාත්මක හා එහි ප්‍රායෝගික භාවිතාව පිළිබඳව ඉගෙනීම සඳහා අවස්ථාව උදාකර තිබේ. වාණිජවේදී ගෞරව උපාධි

පාඨමාලාව ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, අන්තර්ජාතික වෙළඳාම සහ මූල්‍ය, තීරණ විද්‍යාව, විද්‍යුත්-වාණිජ්‍යය (E-Commerce), තොරතුරු තාක්ෂණය, බැංකුකරණය, රක්ෂණ සහ වාණිජ නීති යනාදිය ඇතුළත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රධාන විෂයයන්ගෙන් මනා සංකලනයකින් යුක්ත වේ. එසේම, විෂය මාලාව වාණිජ ක්ෂේත්‍රයේ විෂයන්ගෙන් හා පුළුල් පරාසයකින් යුත් වූ වරණය මත තෝරා ගතහැකි වෛකල්පිත විෂය ක්ෂේත්‍රවලින් ව්‍යුහගත කර තිබේ. මෙම විෂය මාලාවේ සාකල්‍ය ප්‍රවේශය (Holistic approach) නිසා උපාධිධාරීන්ට දේශීය හා විදේශීය ආයතනවල කළමනාකරණ සහ විධායක තනතුරු ලබා ගැනීමට හැකියාව උදාවේ. සංකීර්ණ, තරඟකාරී සහ ගතික ගෝලීය ව්‍යාපාරික පරිසරයක් තුළ සාර්ථක වීමට දැඩි අධිෂ්ඨානයක් ඇති අපේක්ෂකයන් සඳහා මෙම උපාධි පාඨමාලාව යෝග්‍ය වේ.

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය - විද්‍යාවේදී ගෞරව

වර්ෂ 1972 දී ආරම්භ වූ මෙම උපාධි පාඨමාලාව දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණයට සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි දැනුම මෙන්ම මනා පුහුණුවක් ද ලබා දෙන ශ්‍රී ලංකාවේ පුරෝගාමී සහ එකම උපාධි පාඨමාලාව වේ. මෙම පාඨමාලාවෙහිදී පුළුල් පරාසයක විෂයන් යටතේ සිදුකරනු ලබන දේශන, ප්‍රායෝගික අභ්‍යාස සහ ව්‍යාපෘති මඟින් තක්සේරුකරණය, දේපළ කළමනාකරණය, නාගරික හා ප්‍රාදේශීය සැලසුම්කරණය, නාගරික ඉඩම් පිළිබඳ ආර්ථික විද්‍යාව, දේපළ අලෙවිකරණය හා දේපළ මූල්‍යධනය යන අංශ ආවරණය වන අතර ස්වාධීන පර්යේෂණ වාර්තා පිළියෙළ කිරීම හා අදාළ ආයතනයන්හි විෂයානුබද්ධ පුහුණුවක් ද සිදුකරනු ලබයි. එමඟින් උපාධිධරයන්ගේ සංකීර්ණ දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණය කිරීම, ගැටලු විසඳීම, ඵලදායී සන්නිවේදනය, කණ්ඩායම් වැඩ, නායකත්වය, තාක්ෂණය භාවිතය, න්‍යාය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම, සබඳතා ගොඩනඟා ගැනීම, නව ව්‍යාපාර උත්පාදනය කිරීම සහ ගනුදෙනුකරුවන්, අනෙකුත් වෘත්තිකයන් මෙන්ම සාමාන්‍ය ජනතාව සමඟ කටයුතු කිරීම සම්බන්ධ දැනුම, කුසලතා සහ ආකල්පයන් වැඩි දියුණු කිරීම මඟින් ඔවුන්ගේ වෘත්තීය ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මඟ පෙන්වීම සිදුකරනු ලබයි.

මෙම උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය (IVSL), වරලත් මිනින්දොරුවරුන්ගේ රාජකීය ආයතනය එක්සත් රාජධානිය (RICS UK) විසින් පිළිගත් උපාධි පාඨමාලාවක් වන අතර නියමිත වෘත්තීය නිපුණතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක සපුරා ඇති උපාධිධාරීන් එම වෘත්තීය ආයතනයන්හි වරලත් තක්සේරුකරුවන් සහ වරලත් දේපළ කළමනාකරුවන් ලෙස සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබයි. පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ උපාධිධාරීන් හට ඉහළ ඉල්ලුමක් පවතින අතර ඔවුන්ට දේශීය මෙන්ම ජාත්‍යන්තර සහ රාජ්‍ය අංශයේ ආයතනවල ද තක්සේරුකරණය, දේපළ සංවර්ධන සහ කළමනාකරණ ක්ෂේත්‍රවල මෙන්ම කළමනාකරණ සහ පරිපාලන තනතුරුවල වෘත්තීන් හැදෑරීමේ හැකියාව පවතී. එමෙන්ම, මෙම පාඨමාලාව දේපළ අධ්‍යයනය හා තක්සේරුකරණය විෂය ක්ෂේත්‍රයෙහි දේශීය හා විදේශීය පශ්චාත් (Postgraduate) උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් ද සපුරාලනු ලබයි. පාඨමාලාවේ ප්‍රවේශ සුදුසුකම් වලට අමතරව ගණිතය විෂයන් සඳහා වැඩි නැඹුරුවක් ඇති එමෙන්ම පුළුල් ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් ඉගෙනීමට කැමැත්තක් දක්වන සිසුන් සඳහා මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

මූල්‍ය - විද්‍යාවේදී ගෞරව

2001 වර්ෂයේදී හඳුන්වා දුන් මූල්‍ය - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව, බැංකුකරණය, ආයෝජනයන්, වත්කම් කළමනාකරණය, මූල්‍ය පර්යේෂණ සහ සාංගමික මූල්‍ය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීයවේදීන්ට අත්‍යවශ්‍ය මූල්‍ය, සංඛ්‍යාත්මක සහ විශ්ලේෂණාත්මක කුසලතාවයන් පූර්ණ ලෙස උපාධිධාරීන්ට ලබාදේ. මෙම උපාධිය තුළ සාංගමික මූල්‍ය, ආයෝජනයන්, මූල්‍ය වෙළඳපොළ සහ ආයතන, තාක්ෂණික මූල්‍ය යන ප්‍රධාන ක්ෂේත්‍රයන් අධ්‍යයනය කෙරේ. අඛණ්ඩ ඉගෙනීම ප්‍රවර්ධනය කරන උපාධියක් ලෙස මෙය ආචාර ධර්ම, තිරසාර සම්මතයන් සහ නියාමනයන්ට අනුව තීරණ ගැනීම කෙරෙහි අවධානයක් යොමු කරයි. විද්‍යාවේදී මූල්‍ය ගෞරව උපාධිය තුළ ස්වාධීන පර්යේෂණ අධ්‍යයනයක් අවශ්‍ය වන අතර මූල්‍ය ක්ෂේත්‍රයන්හි මාස තුනකට නොඅඩු ආයතනික පුහුණුවක් ලබාදේ. මෙම උපාධි පාඨමාලාව වරලත් මූල්‍ය විශ්ලේෂකයන් (CFA) සමඟ අනුබද්ධව කටයුතු කරන අතර ඔවුන් විසින් වෘත්තීය අධ්‍යයනයන් සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්වයන් ද ප්‍රධානය කරනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, CIMA සහ ACCA යන වෘත්තීය ආයතන විසින් ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් සඳහා නිදහස් කිරීම් ද පිරිනමා ඇත.

මානව සම්පත් කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව

මානව සම්පත් කළමනාකරණ උපාධිය හඳුන්වා දෙන ලද්දේ 1994 වර්ෂයේ වන අතර එහි අරමුණ වනුයේ මානව සංවර්ධනය, ආයතන සංවර්ධනය හා ස්වයං සංවර්ධනය සඳහා අදාළ, වැදගත් සහ අද්විතීය දායකත්වයක් ලබා දීමට අවශ්‍ය ගුණාංග සතු මානව සම්පත් කළමනාකරණ උපාධිධරයන් උත්පාදනය කිරීමයි. මෙම පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ විෂය පථය ද ඇතුළත්ව පොදු කළමනාකරණය, මානව සබඳතා, තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, පුද්ගල කළමනාකරණය සහ පුද්ගල ගුණත්ව වර්ධනය යන පුළුල් පැතිකඩයන් හතක් සම්බන්ධයෙන් නිවැරදි දැනුම, කුසලතා හා ආකල්ප සපයයි. මෙයින් දිගුකාලීන

ඉගෙනීම හා ස්වයං සංවර්ධනය සඳහා වූ මානසික හා කායික සූදානමත් ආශාවත් ඇති කර ගනිමින් උපාධිධරයෝ කාර්යක්ෂම හා සඵලදායි මානව සම්පත් කළමනාකරණ වෘත්තිකයන් වීමට අවශ්‍ය විභවතාව වර්ධනය කර ගනිති. උපාධි පාඨමාලාව සිව් වසරක කාල සීමාවක් වන අතර එයට වසරක අනිවාර්ය මානව සම්පත් කළමනාකරණ සීමාවාසික පුහුණුවක් සමඟ ස්වාධීන පර්යේෂණ අධ්‍යයනයක් ඇතුළත් වේ. ශිෂ්‍යයාට මානව සම්පත් කළමනාකරණ සංසිද්ධියකට අනුව ක්‍රමානකූල සහ/හෝ විද්‍යාත්මක විමර්ශනයක නියැලෙන අතරතුර ආයතනයක විවිධ මානව සම්පත් කළමනාකරණ පැතිකඩයන්හි ප්‍රායෝගික නිරාවරණයක් ලබා ගැනීමට මෙයින් හැකියාව ලබා දේ. මේ තුළින් සදාචාර සංවර්ධනය, සදාචාරාත්මක සහ සමාජ කාර්යසාධනය, ස්වභාවික පරිසරය වැඩි දියුණු කිරීම හා ස්වයං කළමනාකරණය පිළිබඳ ශිෂ්‍යයින්ව දැනුවත් කරනු ලබයි. මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත්තේ විධායකයින්, කළමනාකරුවන්, උපදේශකයින්, නායකයින්, පරිපාලකයින්, පුහුණුකරුවන්, ගුරුවරුන්, ශාස්ත්‍රාලිකයින් වශයෙන් කටයුතු කිරීමට දක්ෂ උපාධිධරයන් සංවර්ධනය කිරීමටය. මෙම පාඨමාලාව යෝග්‍ය වනුයේ සැබෑ මානව සම්පත් කළමනාකරණ උත්ප්‍රේරකයන් වීමට අවශ්‍ය හැකියාව සහ අභිප්‍රේරණය සතු පුද්ගලයන්ට සහ ආයතන දියුණුව සහ තිරසාරභාවය උදෙසා තනි හා සාමූහික වශයෙන් උපරිම දායකත්වය ලබා දෙන යෝග්‍ය සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සැපයීමට මූලික වන වෘත්තිකයන් සඳහාය.

අලෙවි කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව

අලෙවි කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව 1994 දී ආරම්භ කරන ලද්දේ පර්යේෂණවල දායකත්වය අගය කරමින් ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත්ව, අලෙවිකරණය සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ ගැඹුරු, සුසංයෝගී සහ පුළුල් දැනුමක් ලබා දෙමින් දේශීය හා ගෝලීය ආයතනික අංශයේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීමේ අරමුණෙනි. මෙම පාඨමාලාව අනිවාර්ය සහ තෝරාගත හැකි විෂයයන් සහිතව මනා සංයෝජනයකින් යුක්තව සැලසුම් කර ඇත. අලෙවිකරණ ක්ෂේත්‍රය තුළ විශේෂිත වූ වෘත්තීය දිශානතියන්ට යොමු කිරීම උදෙසා අවශ්‍ය කරන දැනුම, කුසලතා, ආකල්ප වටිනාකම් සහ වෘත්තීයභාවය ඇතුළු විවිධ ඉගෙනුම් අංශ වලින් මෙම පාඨමාලාව සමන්විත වේ. ආයතන සහ සමස්ථයක් වශයෙන් සමාජයට වටිනාකමක් ලබා දීම සඳහා නව්‍ය, නිර්මාණශීලි සහ ක්‍රියාශීලි උපාධිධරයන් නිර්මාණය කිරීමට අවශ්‍ය නවීන පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ ඉගෙනුම් පරිසරයක් තුළ ඉහළ සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් විසින් මෙම උපාධි පාඨමාලාව මෙහෙයවනු ලබයි.

කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රතිපත්ති - විද්‍යාවේදී ගෞරව

මෙම උපාධි පාඨමාලාව තුළින් දේශීය හා ගෝලීය වශයෙන් රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල කළමනාකරුවන් සහ පරිපාලකයින් ලෙස විශිෂ්ඨව කටයුතු කිරීමට හැකිවන පරිදි අදාළ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම, කුසලතා සහ ආකල්ප සහිත ගතික උපාධිධාරීන් බිහිකිරීම අරමුණු කරගෙන ඇත. අන්තර්විෂයයීය හා බහුවිධවිෂයයීය විෂයන්ගෙන් සම්මිශ්‍රණය වූ සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. උපාධි පාඨමාලාව තුළ සිසුන්ගේ ස්වාධීන තාර්කික චින්තනය සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංගයක් ඇතුළත් කර ඇති අතර අවශ්‍ය කළමනාකරණ කුසලතා සිසුන්ට ලබාදීම සඳහා ප්‍රායෝගික පුහුණුක් (සීමාවාසික පුහුණුව) ලබාදෙනු ලැබේ. පළමු හා දෙවන වසරවලදී උපාධි පාඨමාලාවේ ඉගැන්වීමේ මාධ්‍යය ද්විභාෂා (සිංහල සහ ඉංග්‍රීසි) වන අතර තෙවන හා සිව්වන වසරවලදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් වේ. උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ සමාජයේ ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා විවිධ අංශ හා විවිධ භූමිකාවන් හා වගකීම් සහිතව කටයුතු කිරීමට අපේක්ෂා කරන සිසුන් සඳහා වේ.

ව්‍යාපාර තොරතුරු පද්ධති - විද්‍යාවේදී ගෞරව

කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ යන දෙඅංශයෙන්ම ඉහළ දැනුමක් ඇති තාක්ෂණිකව ශක්තිමත් අනාගත උපාධිධාරියෙකු බිහි කිරීමේ අරමුණින් වර්ෂ 2001 දී ව්‍යාපාර තොරතුරු පද්ධති - විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන හඳුන්වා දෙන ලදී. කළමනාකරණ අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණයේ විශේෂිත නිරාවරණයෙන් ඒකාබද්ධ කරන මෙවැනි ආකාරයේ ප්‍රමුඛතම සහ එකම උපාධිය වන බැවින් මෙම උපාධි පාඨමාලාව අද්විතීය වේ. මෙම උපාධි පාඨමාලාව; දැනුම, කුසලතා, ආකල්ප, සාරධර්ම, වෘත්තීයභාවය සහ 'මනස - සැකසුම හා ආදර්ශනය' පාදක කරගත් ඉගෙනුම් ප්‍රතිඵල ආවරණය වන අත්‍යවශ්‍ය මෘදු කුසලතා සහ ඩිජිටල් ලෙස සක්‍රීය සේවා පරිසරය තුළ කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා ආවරණය වන පරිදි ඒකාබද්ධ කළ අනිවාර්ය හා තෝරාගත් විෂයයන් ගෙන් සමන්විත වේ. ඒ සඳහා අවශ්‍ය න්‍යායාත්මක දැනුම මෙන්ම කළමනාකරණය, තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ද මේ හරහා සිසුන්ට ලබා දේ. මෙය ගෝලීය ආර්ථිකයේ පාරිභෝගික යථාර්ථයන් වෙත සිසුන් නිරාවරණය කරමින් මාස හයක කාලයක් දක්වා විහිදෙන සීමාවාසික පුහුණුවට අතිරේකව තොරතුරු පද්ධති සංවර්ධන පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ තොරතුරු පද්ධති ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයනයක් ද ඇතුළත් සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසුව එම උපාධිධාරීන්ට දේශීය හා විදේශීය, රාජ්‍ය හෝ පෞද්ගලික යන දෙඅංශයේම කළමනාකරණ සහ විධායක ශ්‍රේණින් හි තනතුරු ලබා ගැනීමේ හැකියාව පවතී. තව ද, මෙම උපාධිධාරීන්ට මෘදුකාංග සංවර්ධන කර්මාන්තයේ නව ව්‍යාපාරික මාර්ගයන් ආරම්භ කරමින් ව්‍යවසායකත්ව හැකියාවන් තුළ ක්‍රියාත්මක වීමට ද හැකියාව හිමිවේ. තොරතුරු පද්ධති සහ තොරතුරු

තාක්ෂණය කෙරෙහි උනන්දුවක් දක්වන ගතික, නිර්මාණාත්මක සහ විවිධාකාර ව්‍යාපාරික වෘත්තිකයන්, නායකයන් සහ වෙනස් කිරීමේ නියෝජිතයන් වීමට දැඩි උද්යෝගයක් දක්වන පාර්ශවයන් හට මෙම උපාධි පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව

කළමනාකරණ ක්ෂේත්‍රයට පළමුවෙන්ම වර්ෂ 2008 දී හඳුන්වාදෙනු ලැබූ මෙම මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය වර්තමාන ව්‍යාපාර ක්ෂේත්‍රයට ඉතා යෝග්‍ය වන සහ වඩාත් ඉල්ලුමක් පවතින පුරෝගාමී උපාධි පාඨමාලාවකි. මෙහෙයුම් කළමනාකරුවන්, තත්ත්ව කළමනාකරුවන්, සැපයුම් දාම කළමනාකරුවන්, ව්‍යාපාර විශ්ලේෂකයන් සහ ව්‍යාපාරික උපදේශකයන් ඇතුළු විවිධ වෘත්තීන් සඳහා සුදුසු උපාධිධාරීන් බිහි කිරීම උදෙසා මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත.

පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරමින් සකස්කර ඇති මෙම පාඨමාලාව, මෙහෙයුම් කළමනාකරණය, සැපයුම් දාම කළමනාකරණය, සේවා කළමනාකරණය, තත්ත්ව කළමනාකරණය, තාක්ෂණ කළමනාකරණය, මෙහෙයුම් පද්ධති සැලසුම් කළමනාකරණය, ව්‍යාපාර විශ්ලේෂණ සහ සංකාර්ය පර්යේෂණ යන ප්‍රධාන විෂයයන්ගෙන් සමන්විත වේ. මීට අමතරව, උපාධි වැඩසටහන ගිණුම්කරණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය සහ ආර්ථික විද්‍යාව වැනි කළමනාකරණයට අදාළ අනෙකුත් විෂයයන් ද ආවරණය කරයි. උපාධි වැඩසටහන යටතේ පෞරුෂ හා නිපුණතා සංවර්ධන විෂයයන් ගණනාවක් ද පිරිනමනු ලැබේ. උපාධිධාරීන් රැකියා ලෝකයට සූදානම් කිරීම සඳහා ඔවුන්ගේ අවසාන වසරේ අධ්‍යයන කාලය තුළ සීමාවාසික පුහුණුවක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

තව ද උපාධිධාරීන්ට ඔවුන්ගේ විශ්ලේෂණ කුසලතා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කිරීමට අවස්ථාවන් ඇතිවන අයුරින් මෙම පාඨමාලාව සකස් කර ඇත. තීරණ විද්‍යා අධ්‍යයනාංශය සතු නවීනතම මෘදුකාංග ඇතුළත් අංග සම්පූර්ණ පරිගණක මධ්‍යස්ථානය මෙම කුසලතා වර්ධනය කිරීමට මනාව උපකාරී වේ. අධ්‍යයනාංශය, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම් ගණනාවක් සමඟ අවබෝධතා ගිවිසුම් තුළින් ව්‍යාපාරික සබඳතා ගොඩනගාගෙන ඇති අතර අධ්‍යයනාංශයේ සම්පත් මධ්‍යස්ථානය මඟින් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින්නන්ගේ සහයෝගය ද ඇතිව බොහෝ පර්යේෂණ සිදු කරයි.

ඉගැන්වීමේ ප්‍රවේශය දේශන, ක්ෂේත්‍ර චාරිකා, බාහිර පුහුණු වැඩසටහන් සහ කර්මාන්ත - ශාස්ත්‍රීය සහයෝගීතා වැඩසටහන් වලින් සමන්විත වේ. මෙම විස්තීර්ණ විෂය මාලාව උපාධිධාරීන්ට න්‍යායික දැනුම පිළිබඳ මනා දැනුමක් පමණක් නොව, ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමත්, මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණය යන ගතික ක්ෂේත්‍රයේ ප්‍රායෝගික අත්දැකීම් තුළින් සාර්ථකත්වය සඳහා ඔවුන් සූදානම් කිරීමත් සහතික කරයි.

ව්‍යවසායකත්වය - විද්‍යාවේදී ගෞරව

ව්‍යවසායකත්වය - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සෙසු පාඨමාලාවන් අතරින් සුවිශේෂී පාඨමාලාවකි. එය ආර්ථික හා සමාජ තිරසාරත්වය හා බැඳි ගෝලීය උපනිතීන් අනුව නිර්මාණය වී ඇත. මෙම පාඨමාලාවෙහි අරමුණ වන්නේ ව්‍යවසායකත්ව යොමුවකින්, නව හා පවතින ව්‍යාපාර ගොඩනංවා පවත්වාගෙන යා හැකි අනාගත ව්‍යාපාරික ව්‍යවසායකයින් හා ව්‍යවසායක කළමනාකරුවන් බිහිකිරීමයි. මෙම පාඨමාලාව ව්‍යාපාර කළමනාකරණය හා ව්‍යවසායකත්වය යන මූලික ක්ෂේත්‍රයන්හි දැනුම කේන්ද්‍ර කොට ගෙන නිර්මාණය වී ඇති අතර, ගෝලීය ව්‍යාපාරික ලෝකය ජයගැනීම සඳහා සුදුසු වන උපාධිධාරියෙකු බිහිකිරීම සඳහා දැනුම, කුසලතා, ආකල්ප හා මනෝස්වභාවය ඇසුරෙන් සමන්විත දැනුම් ප්‍රතිඵලයන් සංයෝජනය කරයි.

තව ද මෙම සිව් වාර්ෂික පාඨමාලාව තුළ අනිවාර්ය සීමාවාසික පුහුණුවක් අන්තර්ගතවන අතර, එහිදී තමන්ගේම ව්‍යාපාරයක් ඇරඹීමට කැමති උපාධි අපේක්ෂයන් හට ඊට අවස්ථාව ලබා දෙන අතර, ව්‍යවසායක කළමනාකරුවෙකු වීමට කැමැත්ත ඇත උපාධි අපේක්ෂයින්ට කළමනාකරණ පුහුණුකරුවෙකු ලෙස ආයතනයක සේවය කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා ඇත. එමෙන්ම මෙම පාඨමාලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පරිචයන් මුසු කරමින් පර්යේෂණයක නිරතවීමට ද අවකාශය ඇත. මෙම පාඨමාලාවේ ඉතා වැදගත් ලක්ෂණය වන්නේ, පාඨමාලාව හදාරන සිසුන් සඳහා ව්‍යවසායකත්ව මනෝස්වභාවය හා හැකියාවන් ඔවුන් තුළ ගොඩනංවන අතර එහිදී ආත්ම විශ්වාසය, නිර්මාණශීලීත්වය, අවදානම් දැරීම, නොපසුබස්නා උත්සාහය, ''කළ හැකිය'' යන සුබවාදී ආකල්පය, දැක්මක් සහිත බව, අවස්ථා උකහා ගැනීම, සමාජ අවබෝධය, බුද්ධිය, පූර්ව ප්‍රතිචාරී බව යන ව්‍යවසායකත්ව ලක්ෂණ ඔවුන් තුළ ජනිත කරවීමට දායක වීමයි. මේ හේතුව නිසාම මෙම පාඨමාලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට සාඩම්බර ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන් ලෙස අන් අය සඳහා රැකියා නිර්මාණය ද කළ හැකිය. මෙම පාඨමාලාව හැදෑරීමට වඩාත් සුදුසු වන්නේ අනාගතයේ තමන්ගේ ව්‍යාපාරයක් කිරීමට කැමති පුද්ගලයින් හා ව්‍යවසායක හැසිරීම තුළින් වෙනත් ආයතනයක ඵලදායී වෙනස්කමක් කිරීමට කැමැත්තක් දක්වන වෘත්තීමය ව්‍යවසායකත්ව කළමනාකරුවන් ලෙස සේවය කිරීමට අපේක්ෂා කරන පිරිස් වේ.

වෛද්‍ය විද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය 1993 වර්ෂයේ ස්ථාපිත කරන ලද අතර මෙම පීඨය මඟින් වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය සහ විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනමනු ලැබේ.

පීඨය අධ්‍යයනාංශ 17 කින් සමන්විත අතර 103 කට අධික ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. මෙම අධ්‍යයනාංශ වලට අමතරව ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා සහය වන තොරතුරු තාක්ෂණ හා භාෂා ඒකකය සහ ප්‍රායෝගික කුසලතා සඳහා නිර්මාණය කළ ඒකකය ඇතුළු ඒකක කිහිපයක් ද පීඨය තුළ ඇත. පීඨයේ සායනික පුහුණු කටයුතු සඳහා දකුණු කොළඹ ශික්ෂණ රෝහල, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, හෝමාගම මූලික රෝහල සහ අපේක්ෂා රෝහල යොදා ගනු ලැබේ. පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය පුහුණු කිරීම් අදාළ අධ්‍යයනාංශ මඟින් සහ දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ඒකක මඟින් ලබා දෙනු ලැබේ.

වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය

වසර 5 ක පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම උපාධි පාඨමාලාවේ එක් එක් අධ්‍යයන වර්ෂයක් සති 10 බැගින් වන අධ්‍යයන වාර 03 කින් සමන්විත වේ. සම්පූර්ණ පාඨමාලාව කොටස් (Phases) තුනකට බෙදා ඇත. තෙවන අධ්‍යයන වර්ෂයේදී සායනික පුහුණුව ආරම්භ වන අතර අවසන් වසර සම්පූර්ණයෙන්ම රෝහල් ආශ්‍රිතව අධ්‍යයන කටයුතු සිදු කෙරේ.

විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව උපාධිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විද්‍යා පීඨ වලින් පළමු වසරේ අධ්‍යයන කටයුතු අවසන් කළ සිසුන්ට මෙම පාඨමාලාවට ලියාපදිංචි විය හැක. මෙම පාඨමාලාවට අයදුම් කළ හැක්කේ ප්‍රථම වසරේදී සාමාන්‍ය “B” ශ්‍රේණියක් හෝ ඉහළ ප්‍රතිඵලයක් ලබාගත් සිසුන්ට පමණි. පාඨමාලාව සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. කාය ව්‍යවච්ඡේද, ජීව රසායන, ආහාර හා පෝෂණය, ප්‍රතිශක්ත විද්‍යාව සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව විෂය ක්ෂේත්‍ර වලින් තෝරාගත් ක්ෂේත්‍රයක විශේෂ උපාධිය හැදෑරීමට හැකියාව පවතී.

තාක්ෂණ පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය, අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ (අ.පොස.උ.පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දීමෙන් පසු 2016 වසරේදී ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම අංගසම්පූර්ණ තාක්ෂණ පීඨය වේ. මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය, තාක්ෂණය පදනම් කරගත් අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදනය යන ක්ෂේත්‍ර ඉදිරියෙන්ම සිටී. ශ්‍රී ලාංකේය තරුණ තරුණියන්ගේ දක්ෂතා ප්‍රවර්ධනය කර, අනාගත සංවර්ධන විෂය ක්ෂේත්‍රවල තාක්ෂණයේ උපයෝගීතාවය ග්‍රහණය කර ගැනීමටත්, නිපුණතා ඇතුළත් සමාජයේ අවශ්‍යතා සපුරාලන දැනුම ලබා දෙමින් ආර්ථිකය තිරසාර ලෙස මෙහෙයවීමටත් හැකි පරිපූර්ණ තාක්ෂණවේදීන් දැයට දායාද කිරීමට පීඨය පූර්ණ වශයෙන් කැපවී සිටී.

ඉංජිනේරු සහ ව්‍යවහාරික විද්‍යාවන් පදනම් කර ගනිමින් සංගෘහිත තාක්ෂණවේදී උපාධි තුනක් දැනට තාක්ෂණ පීඨය පිරිනමනු ලබන අතර මෙම උපාධි පාඨමාලා ත්‍රිත්වය අවම වශයෙන් ශාස්ත්‍රීය අගය 120 ක් සහිත සිව් අවුරුදු ගෞරව උපාධි වේ. ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන ඉගැන්වීමේ මාධ්‍යය වන අතර උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ සිසුන් ඔවුන්ගේ අභිමත පරිදි විශේෂවේදී අධ්‍යයන ධාරාවක් කේන්ද්‍ර කර ගනිමින් ද ඔවුන්ගේ නිශ්චිත අවශ්‍යතා ගවේෂණය කරමින් ද විෂය කේන්ද්‍රීය තාක්ෂණය මත පදනම්ව සාර්ථකව අධ්‍යයන කටයුතු සම්පූර්ණ කල යුතු වෙයි.

එක් එක් උපාධි පාඨමාලාවන් සහ අදාළ විෂය ක්ෂේත්‍ර පහත පරිදි වේ.

ජෛව තාක්ෂණවේදී ගෞරව (BBST) උපාධිය
- කෘෂිකාර්මික හා පාරිසරික තාක්ෂණවේදය
- ආහාර සැකසුම් තාක්ෂණවේදය
- කාර්මික ජෛව පද්ධති තාක්ෂණවේදය

ඉංජිනේරු තාක්ෂණවේදී (BET) ගෞරව උපාධිය
- මෝටර් රථ තාක්ෂණවේදය
- ඉදිකිරීම් සහ ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය
- බලශක්ති සහ පාරිසරික තාක්ෂණවේදය
- භූ තාක්ෂණවේදය
- මෙකාට්‍රොනික තාක්ෂණය
- බහු අවයවික සැකසුම් තාක්ෂණවේදය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී (BICT) ගෞරව උපාධිය

- බහුමාධ්‍ය තාක්ෂණවේදය
- ජාලකරන තාක්ෂණවේදය
- මෘදුකාංග තාක්ෂණවේදය

සියලුම විෂයමාලා සඳහා අධ්‍යයන න්‍යාය, තාක්ෂණික හා කාර්මික දැනුම සහිත සයමාසික වෘත්තීය පාදක සීමාවාසික පුහුණුවක් සහ වසරක පර්යේෂණ සහ සැලසුම් ව්‍යාපෘතියක් අන්තර්ගත වන අතර, ඒ තුළින් සිසුන්ට අධ්‍යයන හා වෘත්තීමය විශිෂ්ඨත්වය සඳහා මඟ පෙන්වයි. පීඨය වර්තමාන සහ නවීන මෙවලම් හා තාක්ෂණයෙන්, අති නවීන පර්යේෂණ උපකරණ, අංගසම්පූර්ණ රසායනාගාර සහ වැඩමුළු පහසුකම්වලින් සමන්විත වෙයි. එසේම තාක්ෂණවේදී උපාධිධාරීන්ට අවශ්‍ය ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමටත්, විශ්ලේෂණාත්මකව ගැටළු විසඳීමටත්, ව්‍යවසායක කුසලතා සහ දේශීය සහ ගෝලීය වශයෙන් වර්තමාන සහ අනාගත වෘත්තීය ක්ෂේත්‍රවල පුළුල් අවකාශයන් සඳහා ඔවුන් සූදානම් කිරීමටත් අවශ්‍ය සියලු පහසුකම්වලින් මෙම පීඨය පරිපූර්ණ වේ.

ඉංජිනේරු පීඨය

ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය වසර හතරක පාඨමාලා කාලයකින් යුක්තය. මෙම උපාධි පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගනු ලබන්නේ, ඉංජිනේරු විද්‍යා කාණ්ඩය යටතේය. මෙම උපාධි වැඩසටහන සති 24 ක කාර්මික පුහුණු වැඩසටහනකින් ද සමන්විත වේ. පොදු විෂය ධාරාව අවසානයේදී එක් එක් සිසුවාගේ කැමැත්ත සහ අධ්‍යයන කුසලතා මත ශිෂ්‍යයින් විෂය ක්ෂේත්‍ර මාලා හතර (4) සඳහා වෙන් වෙන්ව තෝරා ගනු ලැබේ. විශේෂිත විෂය මාලා සඳහා නිර්දේශිත ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් වන්නේ:

(i) සිවිල් ඉංජිනේරු
(ii) පරිගණක ඉංජිනේරු
(iii) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු
(iv) යාන්ත්‍රික ඉංජිනේරු

සෑම ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් සඳහා වූ විෂය මාලා මනා අධ්‍යයනයකින් පසු දේශීය හා අන්තර්ජාතික ඉංජිනේරු අධ්‍යයන ප්‍රමිතීන්ට අනුකූලව සහ සිසුන්ට, තමන්ට හැදෑරිය හැකි අන්දමේ අධ්‍යයන කටයුතු වලින් සමන්විත වන පරිදි සකසා ඇත.

වැඩි විස්තර සඳහා පීඨ වෙබ් අඩවියට පිවිසෙන්න.

වෙබ් අඩවිය - http://eng.sjp.ac.lk

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

විද්‍යාවේදී හෙද උපාධිය

විද්‍යාවේදී හෙද උපාධිය ශාස්ත්‍රීය අගය 120ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. රෝහල් පදනම් කරගත් සායනික හෙද පුහුණුව පළමු වසරේ සිට ආරම්භ වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය

විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය ශාස්ත්‍රීය අගය 120 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. රෝහල් පදනම් කරගත් රසායනාගාර පුහුණුව දෙවන වසර යටතේ ආරම්භ වන අතර උපාධි පාඨමාලාවට පර්යේෂණ ව්‍යාපෘතියක් ද ඇතුළත් වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

ඖෂධ විද්‍යාව උපාධිය

විද්‍යාවේදී ඖෂධ විද්‍යාව උපාධි පාඨමාලාවේ උපාධිය ශාස්ත්‍රීය අගය 120 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. උපාධි පාඨමාලාවට ඉගැන්වීම්, ප්‍රායෝගික පන්ති සහ පර්යේෂණ ව්‍යාපෘති මෙන්ම රාජ්‍ය අංශයේ ආයතන මඟින් සපයනු ලබන ප්‍රායෝගික පුහුණුවක් ද ඇතුළත් වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

දන්ත ශල්‍යවේදී (BDS) උපාධිය

දන්ත ශල්‍යවේදී උපාධි පාඨමාලාව, සෑම අධ්‍යයන වර්ෂයක් සඳහාම සති 10 කින් යුතු වාර තුනකින් සමන්විත අධ්‍යයන වර්ෂ පහක පාඨමාලාවකි. අදියර I, අදියර II සහ අදියර III යනුවෙන් බෙදා ඇති මෙම පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු විෂය පද්ධති පදනම් මත ඒකාබද්ධ කර ඇත. අදියර I වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය සිසුන් සමඟ එක්ව මිනිස් සිරුරේ සාමාන්‍ය ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය උගන්වන ප්‍රධාන විෂයයන් හතරකින් සමන්විත වේ. අදියර II පරිපූරක වෛද්‍ය විෂයයන්ගෙන් සමන්විත වන අතර, මිනිස් සිරුරට බලපාන විවිධ රෝග සහ ඒ ආශ්‍රිත අසාමාන්‍ය කායික ව්‍යුහය සහ එක් එක් තත්ත්වය තුළ ක්‍රියාකාරීත්වය ඉගැන්වීම සහ ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව සහ දන්ත ප්‍රතිකාර ද්‍රව්‍ය පිළිබඳව ද ඉගැන්වේ. අදියර IIIහි සායනික දන්ත වෛද්‍ය විද්‍යාව උගන්වන අතර I වන කොටස සහ II වන කොටස යන කොටස් දෙකකින් සමන්විත වේ. I වන කොටස යටතේ ශිෂ්‍යයා දන්ත වෛද්‍ය විද්‍යාවේ ප්‍රධාන විෂයයන් 8 ක් පිළිබඳව ඉගෙන ගන්නා අතර එම ක්ෂේත්‍රයන්හි කුසලතා වර්ධනය කරගනු ඇත. අවසාන වසර තුළ, ප්‍රතිකාර පටිපාටි සමඟ දන්ත රෝග කළමනාකරණය පිළිබඳව සම්පූර්ණ මෙන්ම උසස් දැනුමක් ලබාදෙනු ඇත. මෙම පාඨමාලාව ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි වේ.

නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය

නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට එකතු වූ නවතම පීඨයයි. රටට අත්‍යවශ්‍ය නීලහරිත ජෛව ආර්ථිකයක් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, දැනට තිබෙන සහ අනාගතයේදී ඇතිවිය හැකි අභියෝගයන්ට මුහුණ දිය හැකි තරම් ශක්තිමත්, වෘත්තීය සුදුසුකම් ලත් උපාධිධාරීන් සහ පශ්චාත් උපාධි ශ්‍රම බලකායක් බිහි කිරීමේ අරමුණින් මෙම පීඨය පිහිටුවන ලදී.

මෙම පීඨය මඟින් පහත සඳහන් පරිදි පූර්ණකාලීන උපාධි අධ්‍යයන පාඨමාලා (විද්‍යාවේදී හා විද්‍යාවේදී ගෞරව) හතරක් පවත්වනු ලබයි.

- විද්‍යාවේදී ජලජ ජෛව සම්පත් උපාධි පාඨමාලාව
- විද්‍යාවේදී ජලජ ජෛව සම්පත් ගෞරව උපාධි පාඨමාලාව
- විද්‍යාවේදී නාගරික ජෛව සම්පත් උපාධි පාඨමාලාව
- විද්‍යාවේදී නාගරික ජෛව සම්පත් ගෞරව උපාධි පාඨමාලාව

ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගය සමත් වූ සිසුන් හට මෙම උපාධි පාඨමාලා සඳහා අයදුම් කළ හැකි අතර සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබයි.

නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය මඟින් පවත්වනු ලබන විද්‍යාවේදී උපාධි පාඨමාලාව සමාසික හයක (six semesters) කාලයකින් යුක්ත වන අතර විද්‍යාවේදී ගෞරව උපාධි අධ්‍යයන පාඨමාලාව සමාසික අටක (eight semesters) කාලයකින් යුක්ත වෙයි. එක් සමාසිකයක් සති 15 කි. සෑම උපාධි අධ්‍යයන පාඨමාලාවක් තුළදීම සිසුන් හට ජෛව සම්පත් ආශ්‍රිත ක්ෂේත්‍ර හා වෘත්තීය පුහුණුවක් (industrial training) ලබාගැනීමට සහ විෂය සමගාමී ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා (field visits) සඳහා සහභාගි වීමට අවස්ථා ලැබේ. මීට අමතරව ගෞරව උපාධි සිසුන් හට ජෛව සම්පත් ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයකින් පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීමට ද අවස්ථාව ලැබේ.

***ජලජ ජෛව සම්පත් විද්‍යාවේදී උපාධි අධ්‍යයන පාඨමාලා* (BSc in Aquatic Bioresources)**
(Bachelors: 90 credits/SLQF level 5, Honours: 120 credits/SLQF level 6)

මෙහි ප්‍රධාන විෂය ක්ෂේත්‍ර ලෙස සාගර ජලජීවී වගාව (Mariculture), මුහුදු පැළෑටි වගාව (Seaweed Production), ජල ජීවී රෝග පාලනය (Aquatic Animal Health), ජලජ ජෛව සම්පත් සඳහා ජෛව තාක්ෂණය (Biotechnology for Aquatic Bioresources), සුහුරු ජලජීවී වගාව (Smart Aquaculture), විසිතුරු මත්ස්‍ය වගාව හා අභිජනනය (Ornamental Fish Culture and Breeding), මත්ස්‍ය ආහාර තාක්ෂණය (Fish Feed Technology) ඇතුළුව තවත් විෂය ක්ෂේත්‍ර ආවරණය වේ.

***නාගරික ජෛව සම්පත් විද්‍යාවේදී උපාධි අධ්‍යයන පාඨමාලා* (BSc in Urban Bioresources)**
(Bachelors: 90 credits/SLQF level 5, Honours: 120 credits/SLQF level 6)

මෙහි ප්‍රධාන විෂය ක්ෂේත්‍ර ලෙස හරිත ගොඩනැගිලි හා තිරසාර නාගරික සංවර්ධන (Green Buildings and Sustainable Urban Development), නාගරික ජෛව සම්පත් සඳහා ජෛව තාක්ෂණය (Biotechnology in Urban Bioresources), කොම්පෝස්ට් නිෂ්පාදනය හා කළමනාකරණය (Urban Composting, Soil and Fertilizer Management), බොන්සායි වගාව (Bonsai and Bottle Gardening), සුහුරු ගොවිපලකරණය (Smart Farming), පරිසරය සහ ජෛව ශක්තිය (Environment and Bioenergy), නාගරික සත්ත්ව

නිෂ්පාදනය (Urban Livestock Production) ඇතුළුව තවත් විෂය ක්ෂේත්‍ර ආවරණය වේ.

මෙයට අමතරව පීඨයේ සියලුම සිසුන් හට සිය උපාධි අධ්‍යයන පාඨමාලා සාර්ථකව හැදෑරීමට අවශ්‍ය මූලික දැනුම සපයමින් විශ්ලේෂණ උපකරණ (Analytical Instruments), තොරතුරු තාක්ෂණය (Information Technology), ව්‍යවසායකත්ව හා ව්‍යාපාර සංවර්ධනය (Entrepreneurship and Business Development), මෘදු කුසලතා සංවර්ධනය (Soft Skills Development), සහ මූලික ගණිතය (Basic Mathematics) වැනි විෂයයන් ද විෂය මාලාවට ඇතුළත් කර ඇත.

පරිගණක පීඨය

පරිගණක පීඨය විසින් ප්‍රදානය කරනු ලබන පරිගණකවේදී ගෞරව උපාධි වසර හතරක පූර්ණ කාලීන ප්‍රථම උපාධි පාඨමාලා වේ. පරිගණක විද්‍යාවේ ප්‍රධාන උප විෂයයන් තුනක උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කරගනු ලැබේ. සම්පූර්ණ පාඨමාලාව අධ්‍යයන සමාසික අටකින් (08) සමන්විත වේ. සිසුන් ඇගයීම සඳහා වෙන් කර ඇති කාලය ද ඇතුළුව සෑම අධ්‍යයන සමාසිකයක්ම සති 20 ක කාලයක් පුරා පැවැත්වේ.

පරිගණක පීඨය විසින් පරිගණක විද්‍යාවේ උප විෂයයන් තුනක් යටතේ පිරිනමනු ලබන ගෞරව උපාධි පාඨමාලා වන්නේ

i පරිගණක විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
ii මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
iii තොරතුරු පද්ධති පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් උසස් ප්‍රමිතීන්ට අනුකූලව, පරිගණක විද්‍යා ක්ෂේත්‍රයේ උප විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හා පර්යේෂණ ව්‍යාපෘතියකින් සහ අවම වශයෙන් සති 20 ක පරිගණක ක්ෂේත්‍ර වෘත්තීය පුහුණුවක් ද ඇතුළත් වන පරිදි මෙම උපාධි අධ්‍යයන පාඨමාලා සැලසුම් කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
කථන හා ශ්‍රවණ විද්‍යා	-	E
වෘත්තීය චිකිත්සාව	-	E
කලා	-	S
සාමය හා ගැටුම් නිරාකරණය	-	E
කළමනාකරණය	-	E
වාණිජ්‍යය	-	E
කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)	-	E
ජෛවීය විද්‍යාව	-	E*
භෞතීය විද්‍යාව	-	E*
පරිසර සංරක්ෂණය හා කළමනාකරණය	-	E
පරිවර්තන අධ්‍යයනය	-	E/S
මෘදුකාංග ඉංජිනේරු	-	E
සිනමා හා රූපවාහිනී අධ්‍යයන	-	S
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය[1]	-	E*
ව්‍යවහාරික රසායන විද්‍යාව	-	E
ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා පරිගණක විද්‍යාව	-	E
ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	-	E
පරිගණක විද්‍යාව	-	E
මූල්‍ය ඉංජිනේරුකරණය	-	E
ගිණුම්කරණ තොරතුරු පද්ධති	-	E
ක්‍රීඩා විද්‍යාව	-	E*
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E

[1] උපාධි පාඨමාලාව භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාවේදී උපාධිය ලෙස පිරිනමනු ලැබේ.

* පළමු වසරේ පළමු සමාසිකයේ දී පාඨමාලා සිංහල/ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර දෙවන සමාසිකයේ සිට පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

පාඨමාලා පරීක්ෂණවලින් අවසන්වන සමාසික දෙකක් ඇතුළත් අධ්‍යයන වර්ෂයක් තුළ පාඨමාලා ඒකක ක්‍රමය මත එනම් අධ්‍යයන ඒකක ක්‍රමය මත කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක වේ. විෂයයන් තෝරා ගැනීම සඳහා උපරිම නම්‍යශීලීතාවය සැලසීමේ අරමුණු ඇතිව විවිධ පාඨමාලා විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබයි.

පාඨමාලා ඒකකයක් යනු අධ්‍යයන ඒකක වටිනාකමක් ඇති විෂය මොඩියුලයකි. අධ්‍යයන ඒකකයක් යනු සාමාන්‍ය ලකුණු ප්‍රමාණය ගණන් බැලීමේ දී භාවිත කරනු ලබන කාලය මත පදනම් වූ ප්‍රමාණාත්මක මිම්මකි. ස්තර හතරකින් එනම් 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි ස්තර වශයෙන් පාඨමාලා මොඩියුල සංවිධානය කරනු ලැබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරන සිසුන් විසින් පාඨමාලා මොඩියුල 1, 2 සහ 3 ස්තර හැදෑරිය යුතුය. වෛකල්පිත සහ/ හෝ අතිරේක පාඨමාලා ඒකක සමඟ විෂය සංයෝජන තුනක් හෝ වෛකල්පිත සහ/ හෝ අතිරේක පාඨමාලා ඒකක සමඟ විෂයය සංයෝජන දෙකක් හෝ ඇත. මේ හැරුණුවිට, සියලුම ශිෂ්‍යයන් විසින් යම් විෂය ධාරාවක සියලුම අනිවාර්යය පාඨමාලා ඒකක හැදෑරිය යුතුය. අනෙකුත් පීඨවලින් අධ්‍යයන වාරයකට අධ්‍යයන ඒකක දෙකකට නොවැඩිව උපරිම අධ්‍යයන ඒකක 6 ක් දක්වා ශිෂ්‍යයෙකුට පාඨමාලා ඒකකයක් හැදෑරිය හැකිය. එක් එක් වර්ෂයකට ශිෂ්‍යයෙකු අවම වශයෙන් අධ්‍යයන ඒකක 30 ක පාඨමාලා ඒකක හැදෑරිය යුතුය.

තුන් වසරක සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ සමුච්චිතව ඇති සියලු ම අධ්‍යයන ඒකක උපාධිය පිරිනැමීම සඳහා සළකා බලනුලැබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධි පාඨමාලා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ දෙක මඟින් පවත්වාගෙන යනු ලැබේ. කලා උපාධි පාඨමාලා සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පසු අ.පොෂ. (උසස් පෙළ) සඳහා හදාරනු ලැබූ විෂයයන් සහ Z-Score අගය පදනම් කරගෙන පීඨ දෙකට සිසුන් වෙන් කරනු ලැබේ. ශිෂ්‍යයා අයත් වන පීඨයෙන් උපාධිය සඳහා අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගැනීම අනිවාර්ය වේ.

මානවශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි හා ගෞරව උපාධි සඳහා පහත සඳහන් විෂයන් ඉදිරිපත් කෙරේ.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය	- ඉංග්‍රීස
නූතන භාෂා අධ්‍යයනාංශය	- චීන, ප්‍රංශ, ජර්මන්, ජපන්, රුසියන්, කොරියන්, ස්පාඤ්ඤ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය	- පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ මනෝවිද්‍යාව
බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයනාංශය	- බටහිර සම්භාව්‍ය සංස්කෘතිය (ග්‍රීක සහ රෝම සංස්කෘතිය), ක්‍රිස්තියානි සංස්කෘතිය
ලලිත කලා අධ්‍යයනාංශය	- දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය (චිත්‍ර සහ ග්‍රැෆික්) ප්‍රාසාංගික කලා - නර්තනය, ප්‍රාසාංගික කලා - සංගීතය (හින්දුස්ථානි සහ බටහිර)
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයනාංශය	- ප්‍රතිබිම්භ කලා (ඡායාරූපකරණය), නාට්‍ය හා රංග කලාව, සිනමා හා රූපවාහිනී අධ්‍යයනය
වාග් විද්‍යා අධ්‍යයනාංශය	- වාග් විද්‍යාව, භාෂා පරිවර්තන ක්‍රම*, දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව*
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය	- සංස්කෘත, හින්දු දර්ශනය, වාස්තුශාස්ත්‍ර
සිංහල අධ්‍යයනාංශය	- සිංහල, සාහිත්‍ය විචාරය
හින්දි අධ්‍යයනාංශය	- හින්දි
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය	- දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL)

*** පරිවර්තන ක්‍රම සහ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව යන විෂයන් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා පමණක් ඉදිරිපත් කෙරේ.**

මානවශාස්ත්‍ර පීඨයේ විෂයන් තෝරා ගැනීමේදී පූර්ව අවශ්‍යතා වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණ කර තිබිය යුතුය.

- ❖ ප්‍රාසාංගික කලා (සංගීතය/ නර්තනය) විෂයන් හැදෑරීම සඳහා අ.පොෂ. (උසස් පෙළ) විභාගයෙන් එම විෂයය සමත් වීම.
- ❖ ඉංග්‍රීසි විෂයය හැදෑරීම සඳහා අ.පොෂ. (උසස් පෙළ) විභාගයෙන් එම විෂය සඳහා අවම වශයෙන් S සාමාර්ථයක් ලබා තිබීම.
- ❖ ප්‍රංශ සහ ජපන් භාෂාව හැදෑරීම සඳහා අ.පොෂ. (උසස් පෙළ) විභාගයෙන් එම විෂයන් සමත් වී තිබීම හෝ අධ්‍යයන අංශය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.
- ❖ භාෂා පරිවර්තන ක්‍රම සහ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව යන විෂයයන් හැදෑරීම සඳහා අධ්‍යයන අංශය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.
- ❖ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) හැදෑරීම සඳහා අ.පොෂ. (උසස් පෙළ) විභාගයේදී

ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් S සාමාර්ථයක් ලබා තිබීම.

අනෙකුත් විෂයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත.

සමාජීය විද්‍යා පීඨය

1. **ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (තුන් අවුරුදු)** - මානව විද්‍යාව, පුරා විද්‍යාව, සංවර්ධන අධ්‍යනය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, ඉතිහාසය, ජාත්‍යන්තර අධ්‍යයනය, පුස්තකාල හා විඥාපන විද්‍යාව, ජන සන්නිවේදනය, දර්ශනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය, සමාජ සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ක්‍රීඩා හා විස්‍රාන්ති කළමනාකරණය, සංචාරක හා සංස්කෘතික සම්පත් කළමනාකරණය යන විෂයයන්.
2. **ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා** - ඉහත අංක 1 යටතේ ඇති මානව විද්‍යාව හැර අනෙකුත් සියලුම විෂයයන්, සංවර්ධන අධ්‍යයනය සහ භූගෝල විද්‍යා උපාධි වැඩසටහන් සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය ද්විත්වයෙන් පැවැත්වේ.
3. **සාමය හා ගැටුම් කළමනාකරණය (සිව් අවුරුදු) ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව** - විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම්, සපුරා ඇති අ.පොෙ.ස. (උසස් පෙළ) විෂයයන් තුනක් සමත් අය මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. මෙම ගෞරව උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබයි.
4. **ජාත්‍යන්තර අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව** - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබයි.

සමාජීය විද්‍යා පීඨයේ විෂයයන් තෝරා ගැනීමේදී පූර්ව අවශ්‍යතා වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණ කර තිබිය යුතුය.

1. සමාජ සංඛ්‍යානය විෂය සඳහා අ.පොෙ.ස. (සාමාන්‍ය පෙළ) විභායෙන් ගණිතය විෂයට සම්මාන සාමාර්ථ ලබා තිබීම.

2. භූගෝල විද්‍යා විෂය සඳහා අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගයෙන් එම විෂය සමත් වී තිබීම.

අනෙකුත් විෂයයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත.

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා යන පීඨ දෙක මඟින් ඉදිරිපත් කරන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ 3 කින් ද ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ 4 කින් ද සමන්විත වේ.

එක් අධ්‍යයන වර්ෂයක් අධ්‍යයන වාර 2 කින් හෙවත් අර්ධ වාර්ෂික දෙකකින් සමන්විත වන අතර එම අධ්‍යයන වාරයක් සති 15 කින් සමන්විත වේ. ශාස්ත්‍රවේදී හා ගෞරව උපාධි පාඨමාලා විෂය ඒකක ක්‍රමය මත පදනම් වේ. විෂය ඒකකයක් යනු කිසියම් අධ්‍යයන සම්භාර (Credit) වටිනාකමක් ඇති විෂයය කොටසකි.

උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට නියමිත අධ්‍යයන සම්භාර (Credit) ප්‍රමාණයක් ඇත. එම ප්‍රමාණය ඇතුළත් වන පරිදි පාඨමාලා ඒකක තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට අවකාශය ලැබේ.

ප්‍රධාන විෂයයන් 2 ක ධාරාව යටතේ හෝ ප්‍රධාන විෂයයන් 3 ක ධාරාව යටතේ ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරීමට හැකියාව ඇත. තම විෂය සංකලනයේ අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීමට අතිරේකව, මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන සහ විද්‍යා යන සෙසු පීඨයන් මඟින් ඉදිරිපත් කරනු ලබන ඇතැම් පාඨමාලා ඒකක ද තම රුචිය පරිදි තෝරා ගෙන හැදෑරීමට මෙම ක්‍රමය මඟින් අවකාශ සලසා තිබේ.

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රථම වසර අවසාන පරීක්ෂණයෙන් ඉහළ සාමාර්ථයක් ලබා ගත යුතුය.

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගය සඳහා වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටි සිසුන් සඳහා සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ. පිරිනමනු ලබන උපාධි පාඨමාලාවන් වනුයේ වාණිජවේදී ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව, බැංකුකරණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, රක්ෂණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව සහ ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව යන පාඨමාලාවන්ය. වාණිජ විද්‍යා උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සිසුන් වාණිජ හා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවට සෘජුවම අනුයුක්ත කෙරෙන අතර කළමනාකරණ සිසුන් අනෙකුත් දෙපාර්තමේන්තු මඟින් පවත්වන පාඨමාලා සඳහා තෝරා ගනු ලබන පදනම ඔවුන්ගේ Z - අගය, කැමැත්ත සහ ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුළත්වන ප්‍රදේශය මතය.

වාණිජවේදී ගෞරව

නූතන ලෝකයේ ව්‍යාපාර සංවිධාන බහුල වශයෙන් තොරතුරු තාක්ෂණයේ බලපෑමට ලක්ව ඇති අතර එමඟින් මෙතෙක් පැවති සාම්ප්‍රදායික ව්‍යාපාර ක්‍රියාවලි වෙනුවට විද්‍යුත් ව්‍යාපාරකරණය, විද්‍යුත් වාණිජය, විද්‍යුත් මූල්‍යකරණය, විද්‍යුත් අලෙවිකරණය සහ ව්‍යාපාරික සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධති භාවිතය දක්වා ප්‍රභල වශයෙන් නැඹුරු වී ඇත. මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ මෙවන් නූතන ව්‍යාපාර සංවිධානවල අභියෝග වලට මුහුණදීමට සහ නූතන ව්‍යාපාරික ලෝකයේ පවතින අවස්ථා හඳුනාගෙන තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප වලින් සන්නද්ධ වෘත්තීමය නිපුණත්වයෙන් හෙබි උපාධිධරයෙකු බිහි කිරීමයි. නූතන ව්‍යාපාර ලෝකයේ පවතින විකල්ප අංශ කෙරෙහි ශිෂ්‍යයින්ගේ ඇති කැමැත්ත තෘප්තිමත් කිරීම සඳහා වාණිජ හා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයන පාඨමාලා හතරක් (4) හඳුන්වා දී ඇත.

- වාණිජවේදී ගෞරව
- වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව
- වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණය ගෞරව
- වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව

උපාධි පාඨමාලාවන් හතර (4) සඳහාම පළමු වසර පොදු වන අතර සිසුනට ඔවුන්ගේ තෝරා ගත් අංශ මඟින් විශේෂිකරණය වීමට දෙවන වසර සිට අවස්ථාව ලැබේ. දෙවන වසර ආරම්භයත් සමඟ අධ්‍යයනාංශ විසින් සිසුන් අදාළ උපාධි පාඨමාලාවන්ට බෙදා වෙන් කරනු ලබන අතර එය සිදුකරනු ලබන්නේ පෙර තීරණය කරගත් විධිමත් තීරණ උපමානයන් අනුව වේ. සෑම වසර හතරකට (4) වරක් සියලුම විෂය නිර්දේශයන් යාවත්කාලීන කරනු ලබන අතර සෑම උපාධි පාඨමාලාවක්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. සිව්වන වසරේදී සිසුන් ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රය අනුව ප්‍රායෝගික පුහුණුවකට යොමු කරන අතර, එම කාලය තුළ දිවා කාලයේ දේශනවලින් නිදහස් කරනු ලැබේ.

වාණිජවේදී ගෞරව

වාණිජවේදී ගෞරව පාඨමාලාව පුළුල් වාණිජ විෂය ක්ෂේත්‍රයන් රැසක් ආවරණය වන පරිදි ගොඩනගා ඇත. වාණිජ හා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික හා න්‍යායික පරිචයන්ගේ දැනුම ලබා ගත හැකි පරිදි විෂය ක්ෂේත්‍රය සකසා ඇති අතර, එමගින් දේශීය හා විදේශීය තරඟකාරීත්ව ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය වන වෘත්තිකයන් බිහි කිරීම අපේක්ෂා කෙරේ.

වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව

වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව පාඨමාලාව ගොඩනගා ඇත්තේ ශ්‍රී ලංකාවේ නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමටත් ක්‍රියාවෙහි යෙදවීමටත් ඒ තුළින් තනි පුද්ගල හා සංස්ථාපනික ව්‍යවසායකත්ව සංස්කෘතියක් ප්‍රචලිත කිරීමටත් ය. මෙම අවකාශය තවත් පුළුල් කරමින්, මෙම අධ්‍යයන පාඨමාලාව නව ව්‍යාපාර ආරම්භ කිරීමේ ක්‍රියාවලිය හා සංස්ථාපිත සංස්ථාපනික නායකයන් ලෙසින් විශාල ව්‍යවසායකත්ව සමාගම් කළමනාකරණය කිරීමත් පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම් හැකියාවන් සිසුනට ලබාදේ.

වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණය ගෞරව

වර්තමාන ව්‍යාපාරික ලෝකය තාක්ෂණය හා නිතැතින්ම බැඳී පවතී. මෙම සබැඳී පවතින විද්‍යුත් වාණිජ්‍ය, විද්‍යුත් ව්‍යාපාරකරණය, විද්‍යුත් අලෙවිකරණය, ව්‍යාපාර විශ්ලේෂණය, නවෝත්පාදන හා නව නිෂ්පාදන බිහිකිරීම, සැපයුම්දාම කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා දේශීයව හා ජාත්‍යන්තරව ඉතා ඉහල ඉල්ලුමක් ඇත. ඒ හා අනුගත වෙමින් ශ්‍රී ලංකාවේ නූතන ව්‍යාපාර උපාධියකට අවශ්‍ය සියලුම නිපුණතා කරුණු ගෙනහැර දක්වන උපාධි පාඨමාලාවක් ලෙස වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණ ගෞරව පාඨමාලාව හැඳින්විය හැකිය. එම නිසා මෙම උපාධිය නවීන ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා වූ උපාධියක් ලෙස හඳුන්වනු ලබන අතර සිසුනට නූතන වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ අංශයේ දැනුමට අමතරව, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ නිපුණතාවයන් ලබාදීම මෙයින් අපේක්ෂා කරයි.

වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව

ගිණුම්කරණ හා මූල්‍ය වෘත්තිකයන්ගේ දේශීය සහ විදේශීය වශයෙන් වර්ධනය වන ඉල්ලුම් සපුරාලීම සඳහා වෘත්තිකයන් පුහුණු කිරීමට වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව පාඨමාලාව හදුන්වා දී ඇත. මෙම ක්ෂේත්‍රයේ අති දක්ෂ ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය වන සියලුම විෂයන් මෙම පාඨමාලාවට ඇතුළත් කර ඇත. තව ද මෙම සමස්ත පාඨමාලාව නිමවා ඇත්තේ සිසුනට අවශ්‍ය ක්ෂේත්‍රය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම් ලබාදෙන ආකාරයටයි.

ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව

මෙරට පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි උපක්‍රමික අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස, විභව මානව සම්පත් හඳුනා ගැනීම හා සංවර්ධනය කිරීමේ මූඛ්‍ය පරමාර්ථය පෙරදැරිව, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය වර්ෂ 1999 සිට මානව සම්පත් ගෞරව උපාධිය දැයේ දූ දරුවන් හට පිරිනමනු ලබයි. එහි ආචාර්ය මඩුල්ල හා සිසු දරුවන් අධ්‍යයන අංශයේ දැක්ම වන ***ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම මිනිස් බල විසඳුම් සැලසන්නා බවට පත්වීම*** හා මෙහෙවර වන ***මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත පර්යේෂණ, උපදේශන සේවා හා රැකියා වෙළඳපොළේ මානව සම්පත් ක්ෂේත්‍රයේ රැකියා හා වෘත්තීමය සේවා සම්බන්ධයෙන් විශ්වාසනීයම විකල්පය වීම*** වටා එක්රොක් වී පොදු අරමුණකින් ඉගැනීම්, පර්යේෂණ හා විෂය බාහිර ක්‍රියාකාරකම් වල නියැලේ.

ව්‍යාපාර කළමනාකරණ රාමුවේ ප්‍රධාන ශ්‍රිතයන් වන මූල්‍ය කළමනාකරණය, අලෙවි කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය, සමස්ත තත්ත්ව කළමනාකරණය, ව්‍යාපාර හා කම්කරු නීතිය මෙන්ම ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ දැනුම සිසු දරුවන්ට ලබා දෙමින් එහි හර විෂය වන මානව සම්පත් කළමනාකරණය වෙත තියුණු අවධානයක් යොමු කරමින් මානව සම්පත් අභිමුඛ වූ සමස්ත ව්‍යාපාර කළමනාකරණ දැනුමින් සිසු දරුවන් සන්නද්ධ කරනු ලබයි. හුදෙක් දැනුමට පමණක් සීමා නොවී ගතික ව්‍යාපාර පරිසරයට ගැළපෙන නව කුසලතා හා වටිනාකම් වලින් පිරිපුන් විද්‍යාර්ථීන් බිහි කිරීමට අධ්‍යයන අංශ නිරන්තරයෙන් බැඳී සිටියි. අනාගත ලෝකයට අවැසි විවිධ මෘදු කුසලතා සංවර්ධනය කර ගැනීමට වේදිකාවක් සකසමින්, මානව සම්පත් තොරතුරු පද්ධති (Human Resource Information Systems) සම්බන්ධ නව දැනුම විද්‍යාර්ථීන් හට ලබා දෙනු පිණිස පෞද්ගලික අංශයේ ආයතනයක් හා එක්ව උසස් සහතික පත්‍ර පාඨමාලාවක් පිරිනමනු ලබයි. මීට අමතරව තවත් පෞද්ගලික ආයතනයක් හා සබැඳිව " Skills For Work" උසස් සහතික පත්‍ර පාඨමාලාවක් ද සිසු දරුවන්ට නොමිලේම පිරිනමනු ලබයි.

මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයෙන් තම උසස් අධ්‍යයාපනය තෝරා ගැනීමෙන් මෙහි පැමිණෙන යම් විද්‍යාර්ථීයෙක් එම අංශයටම සීමා වීමක් අදහස් නොකෙරේ. මන්ද මෙම අධ්‍යයනාංශයේ යම් විද්‍යාර්ථීයෙක් හට මානව සම්පත් කළමනාකරණයෙන් ඉගෙනීමේ කටයුතු කරන අතරවාරයේදීම, මූල්‍ය හා විගණනය, අලෙවි කළමනාකරණය, කළමනාකරණ තොරතුරු පද්ධති හෝ නීති යන අංශ වලින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට පහසුකම් සලසයි. සියලුම විද්‍යාර්ථීන් ඇගයීම සිදු කරනු ලබන්නේ අධීක්ෂණය කරන ලද පර්යේෂණ නිබන්ධන හා අනිවාර්ය පැය 600 කින් සමන්විත ආයතනික ප්‍රායෝගික පුහුණුව පදනම් කරගෙනය.

මානව සම්පත් ගෞරව උපාධියට පමණක් සීමා නොවී, මෙම අධ්‍යයන අංශය මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය සහ මානව සම්පත් කළමනාකරණ උසස් ඩිප්ලෝමාව ද ප්‍රධානය කරයි. වර්ෂ 2005 සිට අධ්‍යයන අංශයේ බාහිර උපාධිය වන ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය දැයේ සිසු සිසුවියන් හට ප්‍රදානය කරනු ලබයි.

ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව

ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රය තුළ රැකියා බලාපොරොත්තු වන සිසුන් සඳහා විශේෂයෙන් නිර්මාණය වී ඇති මෙම පාඨමාලාව ගිණුම්කරණය හා සම්බන්ධ ප්‍රධාන විෂයයන් මෙන්ම උපකාරක ක්ෂේත්‍රයන් පිළිබඳව ද පුළුල් දැනුමක් ලබාදේ. එක් වසරක ප්‍රායෝගික පුහුණු වැඩසටහන අනිවාර්ය විෂයය ඒකකයක් වන අතර එමඟින් පුළුල් පළපුරුද්දක් හා රැකියා අවස්ථා ලබා ගැනීමට මඟ පෑදේ.

මෙම උපාධි පාඨමාලාවෙහි විෂයය නිර්දේශයෙහි අරමුණු යාවත්කාලීන විෂයය දැනුම ශිෂ්‍යයාට ලබාදීම සහ ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමයි. අධ්‍යයන ක්‍රියාවලිය තුළදී උසස් තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීමට ශිෂ්‍යයන්ට අවකාශය සැලසෙන අතර වර්තමානයේ ආයතන විසින් අපේක්ෂා කරනු ලබන ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (විගණනය සහ වෝහාරික ගිණුම්කරණ)

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින මූල්‍ය වංචා මඟින් වෝහාරික ගිණුම්කරණය කෙරෙහි පවතින ඉල්ලුම වැඩි වී ඇති අතර එහි වැදගත්කම ද වර්ධනය වෙමින් පවතී. මෙය ගෝලීය ඉල්ලුමක් පවතින රැකියා ක්ෂේත්‍රයක් බවට පත් වෙමින් පවතින බැවින් ගණකාධිකරණ අධ්‍යයන අංශය විසින් ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව විගණනය සහ වෝහාරික ගිණුම්කරණ පාඨමාලාව හඳුන්වා දී තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයක් මඟින් මෙම උපාධිය පිරිනැමෙන ප්‍රථම අවස්ථාව මෙය වන අතර ගිණුම්කරණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සංකීර්ණභාවය සහ රැකියා වෙළඳපොළෙහි ඇති තරඟකාරීත්වය හමුවේ ජය ලැබීමට උපාධිධරයෙකු හට ලැබෙන සුවිශේෂී සුදුසුකමක් ලෙස මෙම උපාධිය සැලකිය හැකිය.

ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ගිණුම්කරණ තොරතුරු පද්ධති

ගෝලීයකරණය සමඟ තොරතුරු තාක්ෂණයේ වේගවත් පරිණාමය සහ තරඟකාරීත්වය සෑම ව්‍යාපාරයක්ම වෙන කවරදාටත් වඩා වේගයෙන් වෙනස් කරමින් පවතී. එමෙන්ම, වර්තමානයේදී ශ්‍රී ලංකාව ව්‍යාපාර ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීම සඳහා ප්‍රසිද්ධ ගමනාන්තයක් බවට පත්ව ඇත. මේ අනුව වාණිජ විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත්වන සිසුන් තුල තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගිණුම්කරණ සහ කළමනාකරණ අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට ඇති උනන්දුවෙහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබේ.

ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධි වැඩසටහන මඟින් තොරතුරු පද්ධති සහ කළමනාකරණ හැකියාවන් සමඟ ගිණුම්කරණ විෂය පිළිබඳ උසස් අධ්‍යාපනය සඳහා සිසුන්ට ඒත්තු ගැන්වීමට අවස්ථාවක් ලබා දේ. ඒ අනුව මෙම දෙමුහුන් උපාධි වැඩසටහන ගිණුම්කරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ උනන්දුව දක්වන සිසුන්ට මහගු පිටුවහලක් වනු ඇත. ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයක් මඟින් මෙම උපාධිය පිරිනැමෙන ප්‍රථම අවස්ථාව මෙය වන අතර ගිණුම්කරණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සංකීර්ණභාවය සහ රැකියා වෙළඳපොළෙහි ඇති තරඟකාරීත්වය හමුවේ ජය ලැබීමට උපාධිධාරියෙකු හට ලැබෙන සුවිශේෂී සුදුසුකමක් ලෙස මෙම උපාධිය සැලකිය හැකිය.

ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධිය

ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධිය පිරිනමනු ලබන කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යයන අංශය ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය විසින් පිරිනමනු ලබන ISO 9001:2015 තත්ව සහතිකය හිමිකරගෙන ඇත. මීට අමතරව මෙම අධ්‍යයනාංශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පවත්වනු ලබන ස්වයං ඇගයීම් වාර්තාව සඳහා 2013-2018 කාලපරිච්ඡේදය සඳහා "A" සාමාර්ථයක් හිමිකරගෙන ඇත.

ශ්‍රී ලංකාව හා ගෝලීය සන්දර්භය තුළ මූල්‍ය සේවා සඳහා පවතින දැඩි ඉල්ලුම සහ වර්ධනයට සරිලන පරිදි මෙම මූල්‍ය ගෞරව උපාධිය නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව තුළ මූලික වශයෙන් ආයතනික මූල්‍ය, කළඹ කළමනාකරණය, ධනය සැලසුම්කරණය, කළමනාකරණ ආර්ථික විද්‍යාව, ආර්ථිකමිතික, මූල්‍ය ආර්ථික විද්‍යාව යන විෂයන් අන්තර්ගතව ඇත. එසේම මෙම පාඨමාලාව ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA-USA) වෘත්තීය ආයතනයේ පිළිගත් උපාධි පාඨමාලාවකි. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ ශිෂ්‍යයන්ට දොරටු විවර කර ගැනීමට හා කර්මාන්ත හවුල්කරුවන් සමඟ යහපත් සබඳතාවයන් පවත්වා ගැනීමට CFA-USA ආයතනයේ පිළිගැනීමට හේතු වී ඇත. තෙවන වසරේ දෙවන සමාසිකයේ සිට සීමාවාසික පුහුණුව ලබා ගැනීමට සිසුන්ට අවසර ලබා දී ඇති අතර එමඟින් උපාධි අපේක්ෂකයන්ට වැඩ ලෝකය තුළ අත්දැකීම්, ප්‍රායෝගික සේවා පරිසරය, දැනුම හා මූල්‍ය සේවා අංශයේ නව ප්‍රවනතා පිළිබඳව, වෘත්තීය අවස්ථා පිළිබඳව දැනුම ලබා ගැනීමට අවශ්‍ය කරන ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි. මීට අමතරව සංකල්පීයකරණය, මෙහෙයුම්කරණය හා ක්‍රමවේද කුසලතා පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීම සඳහා අවසාන වසරේ උපාධි අපේක්ෂකයන් නිබන්ධනය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. මූල්‍ය අධ්‍යයන අංශය තවදුරටත් තම සේවය පුළුල් කරමින් නව උපාධි පාඨමාලා 03 ක් හඳුන්වා දී ඇත.

- රක්ෂණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය
- බැංකුකරණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය
- ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධිය

රක්ෂණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය

ශීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාරික ලෝකයේ රක්ෂණීය අවශ්‍යතා සපුරාලීම සඳහා රක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින් මෙම උපාධි පාඨමාලාව, මූල්‍ය අධ්‍යයන අංශය 2018 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. මෙම උපාධි පාඨමාලාව තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ විෂයයන් වන ප්‍රාරක්ෂණය, රක්ෂණ හිමිකම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය හා තක්සේරුකරණය ආදී විෂයයන් අන්තර්ගත වෙයි. අනාගත රක්ෂණ වෘත්තිකයන්ට අවශ්‍ය කරන දැනුම, කුසලතා, ආකල්ප හා පුහුණුව ලබා දීම මූලික කොටගෙන මෙම පාඨමාලාවේ විෂය මාලාව සකස්කර ඇත. වසර එකහමාරක සීමාවාසික පුහුණුව හා නිබන්ධනය අනිවාර්ය වන අතර ඒ හරහා සමාජීය හා ආයතනික වටිනාකමක් නිර්මාණය කර ගැනීම අපේක්ෂිතය.

මීට අමතරව අධ්‍යනාංශය පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී, එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්/ එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී යන ආයතන සමඟ, රක්ෂණ උපාධි අපේක්ෂකයන් සඳහා රන් පදක්කම් පිරිනැමීම හා සීමාවාසික පුහුණු අවස්ථා පිරිනැමීම වෙනුවෙන් හවුල්කාරීත්වයට ගිවිසුම් අත්සන් කර ඇත.

බැංකුකරණය සහ මූල්‍ය - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය

බැංකු ක්ෂේත්‍රයේ නව්‍ය අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර හතරක් පුරා රැස් කරගන්නා ලද දැනුම, කුසලතා, ආකල්ප, පුහුණුව හා ගැඹුරු ප්‍රාමාණික දැනුම උපයෝගී කර ගනිමින් අනාගත බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ හැකි බැංකු වෘත්තිකයන් දේශීය හා ගෝලීය වශයෙන් සකස් කිරීම මෙම උපාධි පාඨමාලාවේ අරමුණයි. මීට අමතරව වසර එකහමාරක සීමාවාසික පුහුණුව (බැංකු ක්ෂේත්‍රය) තුළ ලබා ගැනීමටත් උපාධි නිබන්ධනය සම්පූර්ණ කිරීම සඳහාත් අවසන් වසර උපාධි අපේක්ෂකයන්ට අවස්ථාව ලබා දී ඇත. මූලික වශයෙන් ණය කළමනාකරණය, මුදල් කළමනාකරණය, බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර, ආයෝජන හා සංවර්ධන බැංකුකරණය, ඩිජිටල් බැංකුකරණය යනාදී ප්‍රධාන විෂය ඒකකයන් මෙම පාඨමාලාව තුළ අන්තර්ගත වේ.

එසේම, බැංකුකරණ ගෞරව උපාධිය සඳහා රන් පදක්කම් පිරිනැමීම වෙනුවෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය (APB) සමඟ අධ්‍යනාංශය ගිවිසුම් ගත වී ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධිය

නිරන්තරව වෙනස්වන මුල්‍ය සේවා කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීමත් මූල්‍ය ඉංජිනේරුකරණ විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති උපාධිධාරීන් බිහි කිරීම මූලික කොටගෙන මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. විෂය මාලාව තුළ අවදානම් කළමනාකරණය මූල්‍ය ආදර්ශ ගොඩනැගීම සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නිපුණතා වලින් සපිරි වෘත්තිකයන් බිහිකිරීමට අවශ්‍ය අඩිතාලම ලබා දී ඇත. මෙම උපාධි පාඨමාලාව මූල්‍ය ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන ක්ෂේත්‍ර වන මූල්‍ය ගණිතමය ආකෘති නිර්මාණය මූල්‍ය සමාකරණ ශිල්පීය ක්‍රම, ගණිත ශිල්පීය ක්‍රම සහ ප්‍රශස්තකරණය යන මූලික විෂයන්ගෙන් සමන්විත වෙයි. එසේම මෙම උපාධි පාඨමාලාව ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA-USA) වෘත්තීය ආයතනය විසින් පිළිගත් පාඨමාලාවකි. මූල්‍ය ඉංජිනේරු විද්‍යාර්ථීන්ට වසර එකහමාරක සීමාවාසික පුහුණුව හරහා ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබාගැනීමට හා අවසාන වසර නිබන්ධනය සම්පූර්ණ කිරීම අනිවාර්ය කාරණාවකි. මූල්‍ය ඉංජිනේරුකරණ උපාධි අපේක්ෂකයන්ට NDB Capital Limited, Acquity Knowledge Partners සහ KPMG Deal Advisory ආයතන සමඟ අධ්‍යනාංශය ගිවිසුම් අත්සන් කර ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධිය

ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධිය පිරිනමනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ පවත්නා කළමනාකරණ අධ්‍යයන අංශයන් අතරින් ප්‍රථම වරට ISO 9001:2015 තත්ව සහතිකයෙන් පිදුම්ලත් සහ පවත්වාගෙන යනු ලබන ප්‍රථම අධ්‍යයන අංශය වන අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය මඟින් ය.

තරඟකාරී ව්‍යාපාර පරිසරයක් තුල විශිෂ්ටත්වයට පත්විය හැකි දක්ෂ අලෙවිකරණ උපායමාර්ගිකයෙකු නිර්මාණය කිරීම මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණයි. මූලික කුසලතා, ව්‍යාපාර කුසලතා, මෘදු කුසලතා සහ බහුකාර්ය කුසලතා යන ප්‍රධාන නිපුණතා ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම උපාධි පාඨමාලාවේ විෂය මාලාව ව්‍යූහගත කර ඇත. මෙම සුවිශේෂී ප්‍රවේශය මඟින් අලෙවිකරණ ක්ෂේත්‍රයේ පරිපූර්ණ උපායශීලි කළමනාකරුවෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම, උපාය මාර්ගික චින්තනය සහ නව්‍ය හැකියාවන්ගෙන් උපාධිධාරීන් සන්නද්ධ කරයි.

මෙම උපාධි පාඨමාලාව සමඟින් උපාධි අපේක්ෂකයින්ට ඔවුන් වෘත්තීය කළමනාකරුවන් බවට පත් කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් ව්‍යාපාර සම්පත් සැලසුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in ERP - DERP) සහ පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in People Skills - DPS) හැදෑරීමට අවස්ථාව ලබාදී ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධිය, ව්‍යාපාර සම්පත් සැලසුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DERP) සහ පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DPS) සාර්ථකව සම්පූර්ණ කරන උපාධිධාරීන් "Certified Professional Marketing Graduate (CPMG)" යන විශේෂිත උද්ධෘතයෙන් හඳුනාගනු ලැබේ. CPMG යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඉහළ කාර්යසාධනයක් ඇති සුවිශේෂී අලෙවිකරණ උපාධිධාරීන් සඳහා පිරිනමන උපාධි උද්ධෘතයයි (title). මෙම උද්ධෘතය ලබා ගැනීම උදෙසා තරඟකාරී වෘත්තීය ඇගයීම් පටිපාටියක් හඳුන්වාදී ඇති අතර ඒ සඳහා අධ්‍යයන සහ ආයතනික යන දෙඅංශයෙන්ම සමන්විත සහතික කිරීමේ කමිටුවක් පිහිටුවා ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව

ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව උපාධිය පිරිනමනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ පවත්නා කළමනාකරණ අධ්‍යයන අංශයන් අතරින් ප්‍රථම වරට **ISO 9001 : 2015** තත්ව සහතිකයෙන් පිදුම්ලත් සහ පවත්වාගෙන යනු ලබන ප්‍රථම අධ්‍යයන අංශය වන අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය මඟින්ය.

තරඟකාරී ව්‍යාපාර පරිසරයක් තුළ නවීන ඩිජිටල් මෙවලම් සහ ශිල්පීය ක්‍රම සමඟ ව්‍යාපාරික දැනුම

සංස්ලේෂණය කිරීමට හැකියාව ඇති දක්ෂ, පරිපූර්ණ ඩිජිටල් අලෙවිකරණ උපායමාර්ගිකයෙකු නිර්මාණය කිරීම මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණයි. මූලික කුසලතා, ව්‍යාපාර කුසලතා, මෘදු කුසලතා සහ බහුකාර්ය කුසලතා යන ප්‍රධාන නිපුණතා ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම උපාධි පාඨමාලාවේ විෂය මාලාව ව්‍යුහගත කර ඇත. මෙම සුවිශේෂී ප්‍රවේශය මඟින් ඩිජිටල් අලෙවිකරණ ක්ෂේත්‍රයේ පරිපූර්ණ උපායශීලි කළමනාකරුවෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම, උපාය මාර්ගික චින්තනය සහ නව්‍ය හැකියාවන්ගෙන් උපාධිධාරීන් සන්නද්ධ කරයි.

මෙම උපාධි පාඨමාලාව සමඟින් උපාධි අපේක්ෂකයින්ට ඔවුන් වෘත්තීය කළමනාකරුවන් බවට පත් කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් ව්‍යාපාර සම්පත් සැලසුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව **(Diploma in ERP - DERP)** සහ පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව **(Diploma in people Skills - DPS)** හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව උපාධිය ව්‍යාපාර සම්පත් සැලසුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව **(DERP)** සහ පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව **(DPS)** සර්ථකව සම්පූර්ණ කරන උපාධිධාරීන් **"Certified Professional Marketing Graduate (CPMG)"**යන විශේෂිත උද්ඝෘතයෙන් හඳුනාගනු ලැබේ. **CPMG** යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඉහළ කාර්යසාධනයක් ඇති සුවිශේෂී අලෙවිකරණ උපාධිධාරීන් සඳහා පිරිනමන උපාධි උද්ඝෘතයයි **(title)**. මෙම උද්ධෘතය ලබා ගැනීම උදෙසා තරඟකාරී වෘත්තීය ඇගයීම් පටිපාටියක් හඳුන්වා දී ඇති අතර ඒ සඳහා අධ්‍යයන සහ ආයතනික යන දෙඅංශයෙන්ම සමන්විත සහතික කිරීමේ කමිටුවක් පිහිටුවා ඇත.

විද්‍යා පීඨය

මෙම පීඨය මඟින් විද්‍යාවේදී උපාධි 3 ක් වසර 3 ක කාලයක් සඳහා පිරිනමනු ලබන අතර වසර 4 ක කාලයක් සඳහා පිරිනමනු ලබන විද්‍යාවේදී ගෞරව උපාධි 20 ක් පහත පරිදි වර්ගීකරණය කර ඇත.

(i) විද්‍යාවේදී හා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

(ii) පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී සහ පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව

(iii) භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාවේදී

(iv) ව්‍යවහාරික රසායන විද්‍යාව - විද්‍යාවේදී

(v) ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව - විද්‍යාවේදී

(vi) තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව/ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව

(vii) මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

(viii) ක්‍රීඩා විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

1. විද්‍යාවේදී හා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා

විද්‍යාවේදී උපාධි පාඨමාලාව වසර 3 ක කාලයක් සඳහා පහත සඳහන් විෂය සංකලන අනුව ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් සහ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් පිරිනමනු ලැබේ.

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
ජෛවීය විද්‍යාව	ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව	E *
	ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - ශාක ජීව විද්‍යාව	E *
	ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - සත්ත්ව විද්‍යාව	E *
	රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය - ශාක ජීව විද්‍යාව	E *
	රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය - සත්ත්ව විද්‍යාව	E *
	රසායන විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව - සත්ත්ව විද්‍යාව	E *
	රසායන විද්‍යාව - ශාක ජීව විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව	E *
	රසායන විද්‍යාව - ශාක ජීව විද්‍යාව - සත්ත්ව විද්‍යාව	E *

භෞතීය විද්‍යාව	ව්‍යවහාරික ගණිතය - රසායන විද්‍යාව - ශුද්ධ ගණිතය	E *
	ව්‍යවහාරික ගණිතය - පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය	E *
	ව්‍යවහාරික ගණිතය - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය	E *
	ව්‍යවහාරික ගණිතය - ශුද්ධ ගණිතය - සංඛ්‍යානය	E *
	රසායන විද්‍යාව - පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය	E *
	රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය - ශුද්ධ ගණිතය	E *
	පරිගණක විද්‍යාව - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය	E *
	පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය - සංඛ්‍යානය	E *
	පරිගණක අධ්‍යයනය - ඉලෙක්ට්‍රොනික විද්‍යාව - භෞතික විද්‍යාව	E *
	ඉලෙක්ට්‍රොනික විද්‍යාව - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය	E *

* පළමු වසරේ පළමු සමාසිකයේ දී පාඨමාලා සිංහල/ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර දෙවන සමාසිකයේ සිට පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

පාඨමාලා සඳහා ඇති ඉල්ලුම නියමිත ප්‍රමාණය ඉක්මවන විට, ජෛවීය විද්‍යා විෂය ධාරාවෙහි සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනු ලබන පාඨමාලා සඳහා පළමු අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකය තුළ පවත්වන පරීක්ෂණවලදී දක්වන කුසලතාවය පදනම් කරගෙන පළමු අධ්‍යයන වර්ෂයේ දෙවැනි සමාසිකය ආරම්භයේදී ශිෂ්‍යයන් තෝරා ගනු ලැබේ. ජෛවීය විද්‍යා විෂය ධාරාවෙහි ජෛව රසායන විද්‍යාව, පරිගණක අධ්‍යයනය සහ ක්ෂුද්‍රජීව විද්‍යාව යන විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගනු ලැබේ.

භෞතීය විද්‍යා විෂයය ධාරාවෙහි සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනු ලබන පාඨමාලා සඳහා පළමු වසර පළමු සමාසිකය ආරම්භයේදී ශිෂ්‍යයන් තෝරා ගනු ලැබේ. භෞතීය විද්‍යා විෂයය ධාරාවෙහි රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, පරිගණක අධ්‍යයනය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංඛ්‍යානය යන විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගනු ලැබේ.

විද්‍යාර්ථයකු විසින් වසර තුන ඇතුළත පෙනී සිටි සියලුම පාඨමාලා ඒකක වලට අදාළ අධ්‍යයන සම්භාර විද්‍යාවේදී උපාධිය හා පරිසර සංරක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය ප්‍රධානය කිරීම සඳහා සලකා බලනු ලැබේ.

දෙවන වසර අවසානයේදී විද්‍යා පීඨයේ ශිෂ්‍යයෙකුට පහත සඳහන් ඕනෑම විෂයයක් ගෞරව උපාධි වැඩසටහන සඳහා හැදෑරීමට අයදුම් කළ හැකිය. සිව් වසරක සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ සමුච්චිතව ඇති සියලුම අධ්‍යයන ඒකක විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනැමීම සඳහා සලකා බලනු ලැබේ.

අනු අංකය	උපාධි පාඨමාලාව	කාලසීමාව
1	ජෛව රසායන විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	වසර 4
2	රසායන විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
3	පරිගණක විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
4	පරිගණක අධ්‍යයනය - විද්‍යාවේදී ගෞරව	
5	ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
6	ගණිතමය භෞතික විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
7	ගණිතය - විද්‍යාවේදී ගෞරව	
8	ක්ෂුද්‍රජීව විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
9	අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව	
10	භෞතික විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
11	ශාක ජීව විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	
12	සංඛ්‍යානය - විද්‍යාවේදී ගෞරව	
13	සත්ත්ව විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	

2. පරිසර සංරක්ෂණය හා කළමනාකරණය - විද්‍යාවේදී/ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය මඟින් දැනට පිළිවෙලින් වසර 3 සහ 4 ගතවන පරිසර සංරක්ෂණය හා කළමනාකරණය විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව යන උපාධි පාඨමාලා දෙකම පවත්වාගෙන යයි.

මෙම උපාධි පාඨමාලාව ජාතික හා ගෝලීය පරිසර සංරක්ෂණ හා කළමනාකරණ ගැටළු හා අවශ්‍යතා වෙත යොමු කර ඇත. එහි විෂය නිර්දේශය පරිසර කළමනාකරණය, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ශාක ජීව විද්‍යාව සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව යන විෂය සංකලනයන් හා අදාළව සකසා ඇත. මෙම විෂය නිර්දේශය මඟින් ශාක හා සතුන්ගේ විවිධත්වය (Diversity of Plant and Animal), පරිසර විද්‍යාව (Ecology), වන විද්‍යාව (Forestry), ජල විද්‍යාව (Hydrology), ජල සම්පත් කළමනාකරණය (Water Resources Management), වන ජීවී කළමනාකරණය (Wildlife Management), සංරක්ෂණ ජීව විද්‍යාව (Conservation Biology), පරිසර ආර්ථික විද්‍යාව (Environmental Economics), පාංශු සංරක්ෂණය (Soil Conservation), වායු තත්ව කළමනාකරණය (Air Quality Management), ඝන අපද්‍රව්‍ය, අපජල සහ අන්තරායකාරී අපද්‍රව්‍ය කළමනාකරණය (Solid Waste, Waste Water and Hazardous Waste Management), පරිසර තත්ත්ව ප්‍රමාණනය (Environment Monitoring), පාරිසරික සෞඛ්‍යය (Environment Health), පාරිසරික ඇගයීම් ක්‍රමවේදයන් (Environment impact assesment practices), GIS සහ දුරස්ථ සංවේදක උපයෝගීතාවන් (GIS and remote sensing applications), පාරිසරික ප්‍රතිපත්ති හා නීති සම්පාදනය (Environmental Policies and Legislation), දේශගුණික විපර්යාස (Climatic Changes), ස්වාභාවික ආපදා (Natural Disasters), හරිත තාක්ෂණික ක්‍රමවේදයන් (Green Technologies), වැනි විශේෂිත වූ ක්ෂේත්‍රයන්හි නිපුණතාවක් ලැබීමට ඉඩ සැලසේ. මෙම උපාධි පාඨමාලාවේදී සියලුම සිසුන්ට පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හා අදාළ කර්මාන්තයක් ආශ්‍රිතව මනා කාර්මික හා වෘත්තීය නිපුණතාවයක් ලබා දෙයි. එමෙන්ම පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හා අදාළ ක්ෂේත්‍රයක් ආශ්‍රිතව පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සඳහා අදාළ පුහුණුවක් ද ලබා දෙයි. විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන් විසින් කෙටි කාලීන කණ්ඩායම් පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරන අතර, ගෞරව උපාධි අපේක්ෂකයන් විසින් වර්ෂයක් තුළ සම්පූර්ණ කරන ඒකල විශේෂ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරයි. මෙයට අමතරව පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳව ගැඹුරු මාතෘකා වෙතට ද එම ගෞරව උපාධි අපේක්ෂකයන් යොමු කරවයි.

දෙවන වසර අවසානයේදී පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී උපාධි පාඨමාලාව හදාරනු ලබන සිසුන් සඳහා පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කළ හැකිය. ගෞරව උපාධිය පිරිනැමීම සඳහා සමස්ත අධ්‍යයන වර්ෂ හතර තුළ රැස් කරගත් සියලුම සම්භාර සලකා බලනු ලැබේ.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී	වසර 3	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	E
පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව	වසර 4	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	E

3. භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාවේදී

මෙය භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන ප්‍රධාන විෂයයන් දෙකකින් සමන්විත වසර තුනක පාඨමාලාවකි. මෙහි අරමුණ අ.පො.ස. (උසස් පෙළ) සඳහා භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය හෝ භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් හදාරා ඇති සහ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට අවශ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවශ්‍යතා සපුරා ඇති විශේෂ ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස බඳවා ගැනීමයි.

උපාධිය සාර්ථකව නිම කිරීමේදී උපාධිධාරීන්ට භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධි මට්ටමේ මනා දැනුමක්, නිපුණතාවයක් සහ අවබෝධයක් ද ඊට අමතරව ගණිතය සහ පරිගණක අධ්‍යයනය පිළිබඳව ද මනා දැනුමක් සහිත උපාධිධාරීන් ලෙස වැඩ කටයුතු කිරීමට හැකිවේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යයන අංශයේ සහ ගණිත අධ්‍යයන අංශයේ සහය ඇතිව භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශ විසින් මෙම උපාධි පාඨමාලාව මෙහෙයවනු ලබයි.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාවේදී	වසර 3	භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව	E*

* පළමු වසරේ පළමු සමාසිකයේ දී පාඨමාලාව සිංහල/ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර දෙවන සමාසිකයේ සිට පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

4. ව්‍යවහාරික රසායන විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

ව්‍යවහාරික රසායන විද්‍යා පාඨමාලාව සකස් කර ඇත්තේ රසායන විද්‍යාවේ මූලික මූලධර්ම සහ එහි යෙදීම් පිළිබඳ අවශ්‍ය දැනුම සහ අවබෝධය, රසායනාගාරවල භාවිතා කරන විශ්ලේෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතා, රසායන විද්‍යාවේ කර්මාන්ත ආශ්‍රිත ක්ෂේත්‍රවල උසස් දැනුම, එමඟින් උපාධි අපේක්ෂකයින් විවිධාංගීකරණය කිරීම මඟින් ජාතික හා ගෝලීය අවශ්‍යතාවලට අදාළව, උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩි කිරීම.

රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව විෂයයන් සමඟින් අ.පොස. (උසස් පෙළ) විභාගය සමත් අයදුම්කරුවන්ගේ Z අගය මත පදනම්ව සෘජු බඳවා ගැනීමක් ලෙස ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා ගැනීම් සිදු කරනු ලැබේ. (ජෛවීය විද්‍යාව හෝ භෞතීය විද්‍යාව විෂය ධාරාව)

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
රසායන විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	වසර 4	ව්‍යවහාරික රසායන විද්‍යාව	E

5. ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට විද්‍යා පීඨය මඟින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාව ඉදිරිපත් කර ඇත. නවීන යුගයේ ජාතික ආර්ථිකයට දායක විය හැකි දෘඩාංග සහ මෘදුකාංග යන දෙඅංශයෙන්ම නිපුණ උපාධිධාරීන් බිහි කිරීම සඳහා මෙම උපාධි වැඩසටහනින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රවල න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සපයයි.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	වසර 4	ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව	E

6. තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව/ කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව

කළමනාකරණය හා තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාවට බඳවා ගන්නා සිසුන්හට කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (MIT) සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (IT) යන දෙකකින් එකක් හැදෑරීමට අවස්ථාව ලැබේ. මෙම උපාධි පාඨමාලාවේ පළමු අධ්‍යයන වර්ෂය, තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුමක් ලැබෙන පරිදි හෝ කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය යන විෂය සංකලනයෙහි ප්‍රවීනත්වයක් ලැබෙන පරිදි හෝ අධ්‍යයන කටයුතු සිදු කරගෙන යාමට අවශ්‍ය පදනම සකස් කෙරෙන ලෙස නිර්මාණය කර ඇත. ප්‍රථම අධ්‍යයන වර්ෂය අවසානයේදී දක්වා ඇති කුසලතා සහ තමන්ගේ රුචිකත්වය මත ඉහත උපාධි පාඨමාලා දෙක සඳහා සිසුන් තෝරා ගනේ.

*6.1 තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව **(BSc Hons in Information Technology)***

කුසලතා සපිරි තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සඳහා ශ්‍රී ලංකාවේ මෙන් ම විදේශීය ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගෙන මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාවේ විෂය නිර්දේශය ACM, IEEE වැනි ලොව පිළිගත් වෘත්තීය සංගම්වල නිර්ණායක වලට අනුකූලවන අතර මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව (Software Engineering), දත්ත විද්‍යාව (Data Science), පද්ධති ඉංජිනේරු (Systems Engineering), දත්ත සමුදා පරිපාලනය (Database Administration), පරිගණක ජාල ඉංජිනේරු විද්‍යාව (Network Engineering), ව්‍යාපාර විශ්ලේෂණය (Business Analysis), මෘදුකාංග තත්ත්ව ඉංජිනේරු විද්‍යාව (Software Quality Engineering) ඇතුලු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීන්හි නියැලීමට සිසුන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීම එහි ප්‍රමුඛතම ඉලක්කය වේ. මෙයට අමතරව කළමනාකරණ ක්ෂේත්‍රයේ වැදගත් විෂය කොටස් හැදෑරීමට විෂය නිර්දේශය තුළ අවස්ථා සලසා දී ඇති අතර එම දැනුම සිසුන් හට ක්‍රමානුකූලව තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දක්ෂ කළමනාකරුවන් මෙන් ම

සාර්ථක ව්‍යාපාරිකයින් බවට පත් වීමට විශාල පිටිවහලක් වේ.

6.2 කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව (BSc Hons in Management and Information Technology)

මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව මඟින් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර දෙකෙහි සංකලනයක් ලෙස විශාල පරාසයක දැනුම සහ කුසලතා ලබා දීම සිදු කෙරේ. මෙම උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනෙන සිසුන් හට සිය තෙවන වර්ෂයේ සිට ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව, මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය සහ තොරතුරු පද්ධති යන ක්ෂේත්‍ර වලින් එකක නිපුනතාවය ලබා ගැනීම ඉලක්ක කොට ගෙන සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමට වැඩිදුරටත් අවස්ථාව හිමිවේ.

(අ) **ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව (Business Systems Engineering)**

ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව උපාධි පාඨමාලාව හැදෑරීම මඟින් සාර්ථක ව්‍යාපාරයක් ගොඩනැඟීම සඳහා වන ව්‍යාපාර උපක්‍රම, කාර්යයන් සහ ගණුදෙනු හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සවිස්තර ප්‍රවේශයක් ලබා දීම සිදු කෙරේ. ගෝලීය වෙළඳපොළ තුළ තරඟකාරී ලෙස හැසිරීමට අපගේ ව්‍යාපාර සංවිධාන සහ ඒවායෙහි ක්‍රියාවලීන් ලොව පිළිගත් විශිෂ්ඨ කළමනාකරණ භාවිතයන්ට ගැළපෙන ලෙස ප්‍රතිනිර්මාණය කිරීම වැදගත් වන අතර ඒ සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම තුළින් නව ව්‍යාපාරික අවස්ථාවන් උත්පාදනයට ඉඩ සැලසේ.

(ආ) **මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය (Operations & Supply Chain Management)**

මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය පාඨමාලාවේ පදනම තොරතුරු තාක්ෂණ මූලධර්ම යොදා ගනිමින් ලොව පිළිගත් විශිෂ්ඨ ක්‍රමෝපායන් භාවිතය හරහා සැපයුම් දාම **(Supply Chain)** මෙහෙයුම් කළමනාකරණය කිරීම වේ. මෙම පාඨමාලාවේ අන්තර්ගතය, ඒ සඳහා අවශ්‍ය වන ව්‍යාත්තීමය දැනුම සහ කුසලතාවයන් වැඩිදියුණු කිරීම අරමුණු කොට ගෙන නිර්මාණය කර ඇත.

(ඇ) **තොරතුරු පද්ධති (Information Systems)**

වර්තමාන ලෝකයේ ව්‍යාපාර සඳහා කරනු ලබන ආයෝජනවල උපරිම ප්‍රතිලාභ ලබාගැනීමෙහිලා තොරතුරු පද්ධති ක්‍රමෝපායික වැදගත්කමක් උසුලන අතර ඒ සඳහා යොදා ගන්නා තොරතුරු තාක්ෂණ සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ. ව්‍යාපාර ආයතනවල ක්‍රමෝපායන් සහ ක්‍රියාවලීන් සමඟ තදින් බැඳී ඇති තොරතුරු පද්ධති නිසිලෙස පවත්වා ගෙන යාමට, වැඩිදියුණු කිරීමට මෙන් ම එයට අවශ්‍ය මානව හා භෞතික සම්පත් නිසිලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සපිරි ව්‍යාත්තිකයන් බිහි කිරීම මෙම පාඨමාලාවේ අරමුණ වේ.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව/ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය - විද්‍යාවේදී ගෞරව	වසර 4	තොරතුරු තාක්ෂණය - කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය	E

7. මෘදුකාංග ඉංජිනේරු - විද්‍යාවේදී ගෞරව

ජාත්‍යන්තරව පිළිගත් ACM මාර්ගෝපදේශයන්ට අනුව මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව සකස් කර ඇත. එමඟින් සිසුන්ට අවශ්‍ය කුසලතා, දැනුම මෙන්ම දේශීය හා ජාත්‍යන්තර තලයේ මෘදුකාංග ඉංජිනේරුවන් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය ආකල්ප හා ඉංජිනේරු පුහුණුව ලබා ගැනීමට මෙම උපාධි පාඨමාලාව උපකාරී වේ. හය මාසයක ප්‍රායෝගික සීමාවාසික පුහුණු කාලසීමාවක් සඳහා ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් සමාගම් සහ ආයතන වෙත සිසුන් යොමු කරන අතර එමඟින් ඔවුන් ලබා ගන්නා තාක්ෂණික දැනුම සහ පළපුරුද්ද ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට සහ ව්‍යාත්තීය භාවිතය වැඩිදියුණු කර ගැනීමටද අවස්ථාව හිමි වේ. මීට අමතරව මෙම උපාධි පාඨමාලාවේ ඇති සුවිශේෂිත්වය වන්නේ පළපුරුදු උපදේශකයන්ගේ මඟ පෙන්වීම යටතේ අවසන් වර්ෂයේ මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය පර්යේෂණක් සිදු කිරීමට අවස්ථාව උදාවීමයි. මෙම උපාධි පාඨමාලාව සඳහා මෘදුකාංග ඉංජිනේරු විශේෂිත වූ ක්ෂේත්‍ර 6ක් අන්තර්ගත කර ඇති අතර සිසුන්ගේ කැමැත්ත අනුව ඒවා තෝරා ගැනීමට නම්‍යශීලී භාවයක් ලබා දී ඇත. වෙබ් කේන්ද්‍රීය (Net Centric), ජංගම දුරකථන සඳහා පරිගණකකරණය (Mobile Computing), පරිගණක ක්‍රීඩා සහ සජීවනය (Digital Gaming and Animations), සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය (Health Informatics), බුද්ධිමය ව්‍යාපාර පද්ධති (Business Engineering Applications) සහ දත්ත විද්‍යාව සහ ඉංජිනේරු යෙදුම් (Data Science and Engineering Applications) එම ක්ෂේත්‍රයන් වේ.

අ) **වෙබ් කේන්ද්‍රීය (Net Centric)**

වෙබ් කේන්ද්‍රීය විෂය ක්ෂේත්‍රය මඟින් උසස් වෙබ් යෙදුම්, බෙදාහැරීම් සහ වළාකුළු පරිගණකකරණය සහ අර්ථකතන වෙබ් සහ ඔන්ටොලොජිකල් ඉංජිනේරු විද්‍යාවේ සාර්ථක මෘදුකාංග ඉංජිනේරුවන් වීමට අවශ්‍ය උසස් කුසලතා සහ දැනුම වර්ධනය කිරීම අරමුණු කරයි.

ආ) **ජංගම දුරකතන සඳහා පරිගණකකරණය (Mobile Computing)**
ජංගම පරිගණකරණය යනු දැවැන්ත වෙළඳපල විභවයක් සහ වර්ධනයක් ඇති වේගයෙන් නැගී එන ක්ෂේත්‍රයකි. මෙම විෂය ක්ෂේත්‍රය හැදෑරීමට අවකාශය සැලසීම මඟින් ජංගම පරිගණක තාක්ෂණයන්, ජංගම ජාල සහ ජංගම යෙදුම් සංවර්ධනයට අදාළ උසස් කුසලතා ගොඩනැගීමට අවශ්‍ය සම්පූර්ණ දැනුමක් සපයයි.

ඇ) **පරිගණක ක්‍රීඩා සහ සජීවනය (Digital Gaming and Animations)**
මෙම ක්ෂේත්‍රයෙන් අති නවීන ඩිජිටල් ක්‍රීඩා සහ සජීවිකරණ තාක්ෂණයන් පිළිබඳ දැනුම ලබා දෙන අතර ඩිජිටල් ක්‍රීඩා සහ සජීවිකරණ කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය උසස් කුසලතා ගොඩනඟා ගැනීමට උපකාරී වේ.

ඈ) **සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය (Health Informatics)**
මෙම විෂය ක්ෂේත්‍රය හැදෑරීමට අවකාශය සැලසීම මඟින් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණය, සෞඛ්‍ය තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ සංවර්ධනය සහ වෛද්‍ය රූපකරණය සහ ජෛව වෛද්‍ය සංඥා සැකසීම පිළිබඳ උසස් දැනුමක් ලබා දීම අරමුණු කරයි.

ඉ) **ව්‍යාපාර ඉංජිනේරු යෙදුම් (Business Engineering Applications)**
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව නවීන ව්‍යාපාරික යෙදුම්වල අනිවාර්ය අංගයක් වේ. ව්‍යාපාර ඉංජිනේරු යෙදුම් විශේෂීකරණය පාඨමාලාව මඟින් ව්‍යාපාර ක්‍රියාවලි සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා මෘදුකාංග ඉංජිනේරුවෙකු විසින් අනුගමනය කළ යුතු සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා පිළිබඳ දැනුම වර්ධනය කරයි. මෙම විෂය මාලාවට ව්‍යාපාර පද්ධති ආකෘති නිර්මාණය සහ ප්‍රශස්තකරණය, පරිගණක පාදක මෙහෙයුම් කළමනාකරණය සහ ව්‍යාපාර ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව යන විෂයධාරාවන් ඇතුළත් වේ.

j) **දත්ත විද්‍යාව සහ ඉංජිනේරු යෙදුම් (Data Science and Engineering Applications)**
දත්ත විද්‍යාව සහ ඉංජිනේරු යෙදුම් විෂය ක්ෂේත්‍රය තුළින් ව්‍යාපාර බුද්ධිය සහ කළමනාකරණ අධාරක පද්ධති ගොඩනැගීම, විශාල දත්ත යටිතල පහසුකම් සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම, තීක්ෂණ බුද්ධිය ලබා දීම සහ නව සබඳතා සොයා ගැනීම සඳහා විශාල දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය ඉහළ දැනුම සහ කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීම අරමුණු කරයි.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
මෘදුකාංග ඉංජිනේරු - විද්‍යාවේදී ගෞරව	වසර 4	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	E

8. ක්‍රීඩා විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

ක්‍රීඩා විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව මඟින් ක්‍රීඩා විද්‍යාවේ සහ ඒ ආශ්‍රිත විෂය පථය උද්යෝගීමත් වෘත්තීන් සඳහා සිසුන්ගේ දැනුම, කුසලතා සහ මානසිකත්වය වැඩි දියුණු කිරීම අපේක්ෂා කරනු ලබයි.

සැබෑ ලෝකයේ යෙදුම සමඟ විද්‍යාත්මක න්‍යාය ඒකාබද්ධ කිරීම තුළින් මෙම උපාධි පාඨමාලාවේ මූලික විෂයයන් වන්නේ ජෛව යාන්ත්‍ර විද්‍යාව, ව්‍යායාම කායික විද්‍යාව, ව්‍යායාම මනෝවිද්‍යාව සහ පුහුණු විද්‍යාවයි. සිසුන් හට සීමාවාසික පුහුණුව, ක්ෂේත්‍ර වැඩ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම, විවේචනාත්මක චින්තන කුසලතා වර්ධනය කිරීම සහ පර්යේෂණ විශේෂඥතාව ගොඩනැගීම, ක්‍රීඩා කාර්යය සාධනය, සෞඛ්‍ය සහ සුවය ඇතුළත්ව මෙම විෂය මාලාව සකස් කර ඇත.

උපාධි වැඩසටහනට බාධාවකින් තොරව සංක්‍රමණය වීමට විවිධ අධ්‍යයන පසුබිම්වල සිසුන්ට සහාය වීම සඳහා විද්‍යාත්මක දැනුම සහ අත්‍යවශ්‍ය කුසලතා පිළිබඳ ශක්තිමත් පදනමක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් සති හතරක පදනම් පාඨමාලාවක් පවත්වනු ලබයි. මෙම පදනම් පාඨමාලාව ක්‍රීඩා විද්‍යාවේ සාමාන්‍ය පූර්ව අවශ්‍යතා නොමැති සිසුන්, වැඩසටහනට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා මාර්ගයක් සපයයි. ක්‍රීඩා විද්‍යාව - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව විද්‍යාර්ථීන් ක්‍රීඩා පුහුණු කිරීම, කාර්යය සාධන විශ්ලේෂණය, සෞඛ්‍ය සහ යෝග්‍යතා උපදේශනය, ක්‍රීඩා ඉසව් කළමනාකරණය සහ පර්යේෂණ මෙන් ම පශ්චාත් උපාධි මට්ටමින් වැඩිදුර අධ්‍යයනය සඳහා සූදානම්ව සිටින මනා දැනුමකින් යුතු වෘත්තිකයන් පිරිසක් බවට පත්වේ.

උපාධි පාඨමාලාව	කාල සීමාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
ක්‍රීඩා විද්‍යාව - විද්‍යාවේදී ගෞරව	වසර 4	ක්‍රීඩා විද්‍යාව	E

වෛද්‍ය පීඨය

වෛද්‍ය විද්‍ය (එම්.බී.බී.එස්.) පාඨමාලාව

එම්.බී.බී.එස්. පාඨමාලාව වසර පහකි. එහි විෂය මාලාව මිනිස් සිරුරේ අවයව පද්ධති පාදක කරගනිමින් සකස් කොට ඇත. මෙම පාඨමාලාව අදියර තුනක් යටතේ සංවිධානය වී ඇති අතර එක් එක් අදියරක් අවසානයේ වෘත්තීයමය උපාධිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රධාන විභාගයක් බැගින් පැවැත්වේ. පළමු සහ දෙවන වසර ඇතුළත් වන ප්‍රථම අදියරේදී සිසුන් විසින් මිනිස් සිරුරේ සාමාන්‍ය ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය ද තෙවන සහ සිව්වන වසර ඇතුළත්වන දෙවන අදියරේදී රෝග ඇතිවීමට හේතු සාධක, ප්‍රතිකාර ක්‍රම සහ රෝග වළක්වා ගැනීමේ ක්‍රමවේදයන් ද හදාරනු ලබේ. ඊට අමතරව තෙවන සහ සිව්වන වසරේදී විවිධ වෛද්‍ය ක්ෂේත්‍රවලට අදාළ සායනික පුහුණුව ද ලබා දේ. සිව්වන වසරේදී අධීක්ෂිත පර්යේෂණ ව්‍යාපෘතියක් ද සම්පූර්ණ කළ යුතුය. අවසන් අදියරේදී සිසුන් පූර්ණකාලීන සායනික පුහුණුව සඳහා උතුරු කොළඹ ශික්ෂණ රෝහලට යොමු කෙරෙන අතර එම පුහුණුව අවසානයේ වෛද්‍යවේදය, ප්‍රසව හා නාරීවේදය, ළමා රෝගවේදය, මානසික වෛද්‍යවේදය සහ ශල්‍ය වෛද්‍යවේදය යටතේ පැවැත්වෙන අවසාන පරීක්ෂණයට මුහුණදිය යුතුය. මෙම පරීක්ෂණයෙන් සමත්වන සිසුන්ට වෛද්‍ය විද්‍යා උපාධිය පිරිනැමෙන අතර මාස 12 ක සීමාවාසික පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු වෛද්‍යවරයෙකු/ වෛද්‍යවරියක ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය හිමිවේ. මෙම පාඨමාලාවේ සියලු ඉගැන්වීම් කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් සිදු වේ.

කථන හා ශ්‍රවණ විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම ගෞරව උපාධි පාඨමාලාව කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (කථන හා භාෂා චිකිත්සාව හෝ ශ්‍රවණවේදය පිළිබඳ විශේෂීකරණය කළ හැකි) පිරිනමන දැනට ශ්‍රී ලංකාවේ පවතින එකම පාඨමාලාවයි. පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකාව තුළ කථන හා භාෂා චිකිත්සකවරයෙකු හෝ ශ්‍රවණවේදියෙකු ලෙස සේවය කිරීමට අවශ්‍ය වෘත්තීය නිපුණතාවය සපුරයි. විෂය මාලාවට න්‍යායාත්මක පන්ති කාමර පදනම් කරගත් ඉගෙනුම් ක්‍රම වලට අමතරව සෞඛ්‍ය, අධ්‍යාපන හා පුනරුත්ථාපන ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් කර ඇත.

පාඨමාලාවේ මූලික අරමුණ වන්නේ

- සන්නිවේදන දුෂ්කරතා ඇති පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් වලට පුනරුත්ථාපන සේවා සැපයීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා ඇති දක්ෂ කථන හා භාෂා චිකිත්සකයින් සහ ශ්‍රවණවේදීන් පුහුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ පුළුල් ප්‍රජාවන් තුළ සන්නිවේදන දුෂ්කරතා පිළිබඳ ඇති දැනුවත්භාවය ඉහළ නැංවීම.
- පර්යේෂණ සහ තමන්ගේ වෘත්තීය සංවර්ධනය තුළින් විෂය පථයේ උන්නතියට දායක වීම.

උපාධි පාඨමාලාවේ කාල සීමාව වසර 04 ක් වන අතර මොඩියුලර් ව්‍යුහයක් හා අවම ක්‍රෙඩිට් අගයන් 120 කින් සමන්විතය. අවසන් වසරේදී සිසුන් පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම අනිවාර්ය වේ. සම්පූර්ණ පාඨමාලාවේ ඉගැන්වීමේ සහ විභාග කටයුතුවලදී ඉංග්‍රීසි මාධ්‍යය භාවිතා වේ.

වෘත්තීය චිකිත්සාව විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම උපාධි පාඨමාලාව වෘත්තීය චිකිත්සාව පිළිබඳ වෘත්තීය නිපුණතාවය ලබාදෙයි. උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ප්‍රදානය කිරීමට හේතු වේ. සියලුම ආකාරයේ ආබාධ හා සියලු වයස්වල පුද්ගලයින්ට ඔවුන්ගේ දිනපතා ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීමට විද්‍යාත්මක පදනමක් සහිත චිකිත්සාවක් ලබා දීමට වෘත්තීය චිකිත්සකවරුන් පුහුණු කරනු ලබයි. එමඟින් මනෝසමාජීය ගැටළු, නිදන්ගත රෝග, කෙටි කාලීන හා දිගු කාලීන රෝග සහිතව ජීවත් වන ළමයින් හා වැඩිහිටියන්ගේ සෞඛ්‍ය සහ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කරයි.

පාඨමාලාවේ මූලික අරමුණ වන්නේ සීමා සහිත ජීවන රටාවක් තුළ ජීවත් වන පුද්ගලයෙකුගේ දෛනික ජීවන ක්‍රියාකාරකම් සඳහා වූ සහභාගීත්වය වර්ධනය කර, පවත්වා ගැනීමට හෝ මුල් තත්ත්වයට පත් කිරීමට හේතුවන පුනරුත්ථාපන සේවා සැපයීමට අවශ්‍ය හැකියාව, දැනුම සහ වෘත්තීය ආකල්ප සහිත දක්ෂ වෘත්තීය චිකිත්සකයෙකු පුහුණු කිරීමයි.

උපාධි පාඨමාලාවේ කාල සීමාව වසර 04 කි. විෂය මාලාවට න්‍යායාත්මක පන්ති කාමර පදනම් කරගත් ඉගෙනුම් ක්‍රම වලට අමතරව විවිධ සෞඛ්‍ය ගැටළු හා අවශ්‍යතා ඇති පුද්ගලයින් ඇතුළත් වන පරිදි ලබාදෙන සායනික පුහුණුවක් සහ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතියක් ද ඇතුළත්ව ඇත. සම්පූර්ණ පාඨමාලාවේ ඉගැන්වීමේ සහ විභාග කටයුතුවලදී ඉංග්‍රීසි මාධ්‍යය භාවිතා වේ.

පරිගණක හා තාක්ෂණ පීඨය

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථකව නිම කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය මඟින් ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ.

මෙම ඉංජිනේරු තාක්ෂණ උපාධි පාඨමාලාව උපාධිධාරීන්ව පුළුල් විවිධ කර්මාන්ත යෙදුම් සඳහා සූදානම් කිරීම අරමුණු කොටගත් විද්‍යාව හා තාක්ෂණයේ ප්‍රායෝගික යෙදුම් මත ප්‍රබලව ඉලක්ක වී ඇත. විෂය නිර්දේශයේ පළමු වසර දෙකෙහි ඉලක්කය වන්නේ ඉංජිනේරු තාක්ෂණවේදියෙකුට තිබිය යුතු පොදු නිපුණතාවන් දියුණු කිරීම වන අතර, අවසන් වසර දෙකෙහි දී තෝරා ගත් විෂය ක්ෂේත්‍රයක විශේෂ නිපුණතා දියුණු කිරීම සඳහා වෙන්ව ඇත.

මූලිකව ලබා දී ඇති විශේෂඥ ක්ෂේත්‍රයන් වන්නේ:

- ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි තාක්ෂණය (Material and Process Tehnology)
- කර්මාන්ත ස්වයංයන්ත්‍රකරණය හා රොබෝ විද්‍යාව (Industrial Automation and Robotics)
- තිරසර තාක්ෂණය (Sustainable Tehnologies)

කර්මාන්ත ස්වයංයන්ත්‍රකරණය හදාරන විද්‍යාර්ථීන්ට, පරිගණක හෝ රොබෝ යන්ත්‍ර වැනි කාලීන පද්ධති භාවිතා කිරීමට සහ කර්මාන්තවල විවිධ ක්‍රියාවලින් සහ යන්ත්‍ර සූත්‍ර හැසිරවීමට අවශ්‍ය ICT නිපුණතාවය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි ඉංජිනේරු තාක්ෂණ විශේෂඥ ක්ෂේත්‍රවලදී ඉලක්ක වන්නේ, අමුද්‍රව්‍ය සහ ප්‍රයෝජනවත් දෑ වටිනා භාණ්ඩ බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම සැලසුම් කිරීම වේ. තිරසර තාක්ෂණය විශේෂඥ ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ කාලීන ලෝක සහ ශ්‍රී ලාංකීය ආර්ථික-සමාජීය ගැටලුවලට තිරසාර විසඳුම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

කර්මාන්ත පුහුණුව උපාධි පාඨමාලාවේ අනිවාර්ය අංගයක් වේ. හතරවන වර්ෂයේ අවසාන අර්ධ වාර්ෂිකයේ දී විද්‍යාර්ථීන් ප්‍රසිද්ධ කර්මාන්ත ආයතනවල ආධුනිකයන් වශයෙන් යොමු කරනු ඇත.

උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක්ම වේ.

තුන්වන අධ්‍යයන වසරට ප්‍රවේශ වීම සඳහා සිසුන් විසින් දෙවන අධ්‍යයන වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අවම අධ්‍යයන පරිසාධන මට්ටම සපුරාලිය යුතුව ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථකව නිම කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය මඟින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ.

මෙම පාඨමාලාව මඟින් මෘදුකාංග සංවර්ධකවරුන්, ජාලකරණ පරිපාලකවරුන් හා තොරතුරු හා සන්නිවේදන වෘත්තිකයන් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කිරීමට විද්‍යාර්ථීන්ට උපකාර කරයි. ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ දත්ත සන්නිවේදන පිළිබඳව ශක්තිමත් පදනමක් ලබාදීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රමිතීන්ට අනුව, මෘදුකාංග හා පරිගණක ජාල සැලසුම් කිරීමට, නිර්මාණයට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා හා දැනුම වර්ධනය කිරීම මෙම පාඨමාලාව තුළින් සිදු වේ. අතථ්‍යකරණය හා වළා පරිගණනය, ජාල කළමනාකරණය, රැහැන් රහිත හා ජංගම සන්නිවේදන විද්‍යාව, පරිගණක ආරක්ෂණය, වෙබ් ක්‍රමලේඛණය, පරිගණක ක්‍රීඩා හා සජීවීකරණය අතථ්‍ය යථාර්තය සහ ජංගම යෙදුම් සංවර්ධන විද්‍යාව වැනි විශේෂ විෂය ඒකක, විෂය ධාරාවට ඇතුළත් කිරීම මඟින් විද්‍යාර්ථීන්ට තම අභිමත වෘත්තීය ධාරා ඔස්සේ විපුල දැනුමක් ලබාගැනීමේ අවකාශ සපයාදී ඇත.

මූලිකව ලබා දී ඇති විශේෂඥ ක්ෂේත්‍රයන් වන්නේ:

- පරිගණක ජාල තාක්ෂණය (Computer Networks Technology)
- පරිගණක ක්‍රීඩා සහ සජීවීකරණය (Games and Animation)
- මෘදුකාංග පද්ධති තාක්ෂණය (Software Systems Technologies)

හතරවන වසරට අදාළ වන සය මාසික සීමාවාසික පුහුණු කාලය තුළදී විද්‍යාර්ථීන්ට සැබෑ කර්මාන්ත

පරිසරය තුළ කටයුතු කිරීමට ඉඩහසර ලබාදේ. උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක්ම වේ.

තුන්වන අධ්‍යයන වසරට ප්‍රවේශ වීම සඳහා සිසුන් විසින් දෙවන අධ්‍යයන වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අවම අධ්‍යයන පරිසාධන මට්ටම සපුරාලිය යුතුව ඇත.

ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

අධ්‍යයන පාඨමාලාවේ කාලසීමාව වසර හතරක් (4) වන අතර එය සාර්ථකව නිම කිරීමෙන් පසු කැලණිය විශ්වවිද්‍යාලය ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය ප්‍රදානය කරනු ඇත. මෙම උපාධි වැඩසටහන ජෛව විද්‍යාව සහ නවීන තාක්ෂණය යෙදීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති අතර එමඟින් ජෛව පාදක, ආහාර, පාරිසරික සහ පර්යේෂණ - නැඹුරු කර්මාන්ත සඳහා උපාධිධාරීන් සූදානම් කිරීමේ අරමුණින් කටයුතු කරයි. විෂය මාලාව රසායනාගාර කටයුතු, ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සහ කර්මාන්ත සම්බන්ධිත ඉගෙනුම් හරහා පුළුල් ප්‍රායෝගික පුහුණුවක් සමඟ න්‍යායාත්මක දැනුම ඒකාබද්ධ කරයි. වැඩසටහනේ පළමු වසර ජීව විද්‍යාත්මක පද්ධති, රසායන විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, පාරිසරික තාක්ෂණය, දත්ත හැසිරවීම සහ අදාළ ක්ෂේත්‍රවල මූලික විද්‍යාත්මක හා තාක්ෂණික නිපුණතා වර්ධනය කිරීම අරමුණු කරයි. දෙවන වසරේ සිට, විෂයමාලාව සැලසුම් කර ඇත්තේ විශ්ලේෂණාත්මක, පර්යේෂණ සහ ගැටළු විසඳීමේ කුසලතා වැඩි දියුණු කරන අතරම තෝරාගත් අවධානය යොමු කරන ක්ෂේත්‍රවල විශේෂිත නිපුණතා වර්ධනය කිරීම සඳහා ය.

දැනට පිරිනමනු ලබන අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර වන්නේ:

- ජෛව තාක්ෂණය
- ආහාර සැලසුම් තාක්ෂණය
- පාරිසරික සම්පත් තාක්ෂණය

අනිවාර්ය සීමාවාසික පුහුණුවක් හරහා අවම වශයෙන් මාස හයක කාලයක් කර්මාන්තයේ හෝ අදාළ පර්යේෂණ හා සංවර්ධන සංවිධානවල වැඩ කිරීමට සිසුන්ට අවස්ථාවක් ලැබෙනු ඇත. අවසාන වසරේදී, සියලුම සිසුන් තම තෝරාගත් අවධානය යොමු කරන ප්‍රදේශයට අදාළ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කළ යුතුය. ඉගැන්වීමේ සහ විභාග මාධ්‍යය දැඩි ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් වේ. තුන්වන වසර අධ්‍යයනය දක්වා ඉදිරියට යාමට නම්, පළමුවන වසර අවසානයේ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අවම අධ්‍යයන කාර්ය සාධන මට්ටමක් සිසුන් ලබා ගත යුතුය.

පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සිව් අවුරුදු පාඨමාලාවකි. මෙම පාඨමාලාවෙහි ව්‍යුහය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුවෙහි නිර්දේශය මත සහ Institute of Electrical and Electronics Engineers (IEEE) සහ Association for Computing Machinery (ACM) ආයතනයන්හි නිර්ණායකවලට අනුකූලව සකසා ඇත.

මෙම පාඨමාලාව මඟින් විද්‍යාර්ථීන්ට මෘදුකාංග නිපැයුම් කර්මාන්තය සඳහාත්, පර්යේෂණ හැසිරවීම හා පරිගණක විද්‍යාව පිළිබඳ දැනුම බෙදාහැරීම සඳහාත් අදාළ වන කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කර ගැනීමට සහය ලබා දේ. පරිගණක තාක්ෂණය පිළිබඳ ගැඹුරු මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල මෘදුකාංග විශ්ලේෂණය කිරීමට, සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කර පවත්වාගෙන යාමට අදාළ කුසලතා හා දැනුම වර්ධනය කිරීම මෙම පාඨමාලාව තුළින් සිදුවේ. දත්ත සමුදාය (Databases), යාන්ත්‍රික ඉගෙනුම් ක්‍රියාවලිය (Machine Learning), දත්ත ආරක්ෂණය (Data Security), සම්පාදක පිළිබඳ න්‍යාය (Theory of Compilers), සමාන්තර පරිගණනය (Parallel Computing), අධිකාර්ය සාධන පරිගණනය (High Performance Computing), සංඛ්‍යාංක අධිකරණ වෛද්‍ය විද්‍යාව (Digital Forensics), විචාරයික ජාල (Semantic Web), විද්‍යුත් ව්‍යාපාර තාක්ෂණය (e-Business Technology), පරිගණක ක්‍රීඩා හා සජීවීකරණය (Computer Games & Animation) සහ අතථ්‍ය යථාර්තය (Virtual Reality) ආදි විෂය ඒකක, විෂය ධාරාවට එක්ව තිබීම මඟින් විද්‍යාර්ථීන්ට සිය අභිමත වෘත්තීය ධාරාව ඔස්සේ විපුල දැනුමක් ලබා ගැනීමේ අවකාශය සළසා ඇත. දෙවෙනි වසර අවසානයේදී පහත විෂය ධාරාවන්ගෙන් එකක් තෝරා ගැනීමට හැකියාව ඇත.

- දත්ත විද්‍යාව (Data Science)
- කෘතිම බුද්ධිය (Artificial Intelligence)
- සයිබර් ආරක්ෂණය (Cyber Security)
- විද්‍යාත්මක පරිගණනය (Scientific Computing)

මොරටුව විශ්වවිද්‍යාලය		
අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
ඉංජිනේරු විද්‍යාව	-	E
ඉංජිනේරු විද්‍යාව (EM)	-	E
ඉංජිනේරු විද්‍යාව (TM)	-	E
තොරතුරු තාක්ෂණය (IT)	-	E
වාස්තු විද්‍යාව	-	E
නිර්මාණවේදය	-	E
ප්‍රමාණ සමීක්ෂණය	-	E
නාගරික තොරතුරුකරණය සහ නිර්මාණකරණය	-	E
විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය	-	E
පහසුකම් කළමනාකරණය	-	E
ප්‍රවාහන කළමනාකරණය සහ කාර්යෝපාය ඉංජිනේරු (TMLE)	-	E
තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	-	E
භූමි නිර්මාණවේදය	-	E
ව්‍යාපාර විද්‍යාව	-	E
බුද්ධිමය යාන්ත්‍ර විද්‍යාව	-	E

වාස්තු විද්‍යා පීඨය

මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය වාස්තු විද්‍යාව, භූමි නිර්මාණවේදය, ප්‍රමාණ සමීක්ෂණය, පහසුකම් කළමනාකරණය, නාගරික තොරතුරුකරණය සහ නිර්මාණකරණය සහ නිර්මාණවේදය යන විෂය පථයන් සඳහා ශ්‍රී ලංකාවේ උපාධි හා පශ්චාත් උපාධි පිරිනමනු ලබන එකම ශාස්ත්‍රීය ආයතනය වන මෙම පීඨය, වාස්තු විද්‍යා අධ්‍යයනාංශය, ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යයනාංශය, සමෝධානිත නිර්මාණ අධ්‍යයනාංශය හා පහසුකම් කළමනාකරණ අධ්‍යයනාංශය නමින් නම් කරන ලද දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ.

මෙම පීඨය මඟින් වාස්තු විද්‍යාව, නාගරික තොරතුරුකරණය සහ නිර්මාණකරණය, ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව, පහසුකම් කළමනාකරණ විද්‍යාව, නිර්මාණවේදය සහ භූමි නිර්මාණවේදය සඳහා ගෞරව උපාධි පිරිනමනු ලබන අතර බහුතර පාඨමාලාවන් සඳහා ජාතික හා අන්තර්ජාතික මට්ටමේ වෘත්තීයවේදීන්ගේ ආයතනය මඟින් පිළිගැනීමක් ලබා දී ඇත.

වාස්තු විද්‍යා අධ්‍යයනාංශය මඟින් වාස්තු විද්‍යාව සඳහා වූ පස් අවුරුදු වාස්තු විද්‍යා ගෞරව උපාධියත්, භූමි නිර්මාණ විද්‍යාව සඳහා සිව් අවුරුදු භූමිනිර්මාණවේදී ගෞරව උපාධියත් පිරිනමනු ලබයි. වාස්තු විද්‍යාවේදී ගෞරව උපාධිය ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාවේදීන්ගේ සංගමයත්, බ්‍රිතාන්‍ය රාජකීය වාස්තුවිද්‍යාවේදීන්ගේ සංගමයත්, පොදු රාජ්‍ය මණ්ඩලීය වාස්තු විද්‍යාවේදීන්ගේ සංගමයත් මෙම ගෞරව උපාධිය අන්තර්ජාතික මට්ටමේ උපාධියක් බව පිළිගෙන තිබේ.

ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

ප්‍රමාණ සමීක්ෂණය - විද්‍යාවේදී ගෞරව උපාධිය

ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය යනු මොරටුව විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් පිරිනමනු ලබන පූර්ණකාලීන සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. මෙම පාඨමාලාව ගොඩනැගිලි මිනුම්, ඉදිකිරීම් ආර්ථික විද්‍යාව, වාණිජ කළමනාකරණය සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ නැගී එන තාක්ෂණයන් සම්බන්ධ පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරයි. ගොඩනැගිලි සැලසුම් කිරීම, ගොඩනැගිලි සේවා සැපයීම සහ ගිවිසුම් සබඳතා කළමනාකරණය කිරීම ඇතුළු කාර්යයන් හරහා ඉදිකිරීම් කර්මාන්තය ගවේෂණය කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කෙරේ. තව ද මෙම

උපාධි පාඨමාලාව ඉදිකිරීම් උපදේශනය සහ ගොඩනැගිලි ඉදිකිරීම යන අංශ දෙකෙහිම ක්ෂේත්‍රීය කුසලතා ලබා ගැනීමට උපාධි අපේක්ෂකයන් හට අවස්ථාව සලසයි. වර්තමානයේ මෙම උපාධිය, පුළුල් පරාසයක සේවා ස්ථානගත කිරීම්, පර්යේෂණ ව්‍යාපෘති සහ කාර්මික සහයෝගිතාවය මත පදනම් වූවකි. තව ද, ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (IQSSL), වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනය (RICS), ඕස්ට්‍රේලියානු ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය (AIQS), සිවිල් ඉංජිනේරු මිනින්දෝරුවන්ගේ වරලත් ආයතනය (CICES) සහ පැසිෆික් ප්‍රමාණ සමීක්ෂකයන්ගේ සංගමය (PAQS) ඇතුළු දේශීය හා ජාත්‍යන්තර ප්‍රමුඛ වෘත්තීය ආයතනවලින් මෙම උපාධි පාඨමාලාවට ප්‍රතිඥතය ලැබී ඇත.

නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යයනාංශය

නාගරික තොරතුරුකරණය සහ නිර්මාණකරණය - විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම අධ්‍යයන අංශය දැනට ශ්‍රී ලංකාවෙහි නාගරික හා පරිසර නිර්මාණකරණය පිළිබඳව පාඨමාලාවන් පිරිනමන එකම ආයතනය වේ. එසේම මෙහි නාගරික තොරතුරු විද්‍යාව, ප්‍රජා සැලසුම්කරණය, නාගරික සංවර්ධනය හා නිර්මාණය සහ පරිසර කළමනාකරණය වැනි අංශයන්හි පර්යේෂණ ක්‍රියාත්මකයි.

දැනට මෙම අංශය මඟින් නාගරික තොරතුරුකරණය සහ නිර්මාණකරණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව [BScHons(UI&P)] පිරිනැමේ. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා නගර නිර්මාණකරුවන්ගේ ආයතනය මඟින් ප්‍රතිඥතය කොට ඇත. එසේම නාගරික සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුවන නවතාවයන්ට ගැලපෙන ලෙස මෙම පාඨමාලාව නිතිපතා යාවත්කාලීන කෙරේ.

පාඨමාලාව සම්පූර්ණ කළ උපාධිධාරීන් නාගරික සංවර්ධන සැලසුම්කරණය, පාරිසරික කළමනාකරණය, නාගරික තොරතුරු විද්‍යාකරණය සහ සම්බන්ධ අනෙකුත් විෂයයන්හි නියැලෙන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි සේවයෙහි යෙදවේ.

සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය - සිව් අවුරුදු ගෞරව උපාධියක් නිර්මාණවේදය සඳහා පිරිනමනු ලබයි. ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් වටා මෙහි විෂය පථය විහිදී පවතී. එනම්, විලාසිතා සහ ජීවන ක්‍රම නිර්මාණය, මාධ්‍ය සහ සන්නිවේදනය සහ නිෂ්පාදන නිර්මාණ වේ.

පහසුකම් කළමනාකරණ අධ්‍යයනාංශය

පහසුකම් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය

පහසුකම් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය වසර හතරක පූර්ණ කාලීන උපාධි පාඨමාලාවකි. පහසුකම් කළමනාකරණ වෘත්තීය, ගොඩනැගිලි සේවා සහ සුහුරු තාක්ෂණය, ගොඩනැගිලි කාර්ය සාධනය, ගොඩනැගිලි තත්ත්වය මැනීම, බලශක්ති සහ තිරසාර සංවර්ධනය, වත්කම් කළමනාකරණය, සෞඛ්‍ය හා ආරක්ෂාව, මෙහෙයුම් කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් කළමනාකරණය, ගිවිසුම් සහ ප්‍රසම්පාදන, සමෝධානික ඩිජිටල්කරණය යනාදී ක්ෂේත්‍ර වලින් සමන්විත වන අතර එමඟින් ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඵලදායී ලෙස මෙහෙයුම්ගත කිරීම තහවුරු කරනු ලබයි. මෙම උපාධි පාඨමාලාවෙහි මූලික අරමුණ වන්නේ විවිධ කර්මාන්තයන්හි පහසුකම් කළමනාකරණ වෘත්තිකයන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ ආකල්ප සහිත උපාධිධාරීන් පිරිසක් බිහි කිරීමයි. මෙම පාඨමාලාව සඳහා භෞතීය විද්‍යා සහ වාණිජ යන අංශ දෙකෙහි සිසුන්ට අයදුම් කළ හැක.

ඉංජිනේරු පීඨය

මොරටුව විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු විද්‍යා පීඨය මඟින් උපාධි අපේක්ෂකයන් සඳහා පූර්ණකාලීන ප්‍රථම උපාධි පාඨමාලා 03 ක් පවත්වනු ලැබේ. මින් පළමු පාඨමාලාව ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව පාඨමාලාවයි. ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අංශ තුනකින් සිසුන් ඇතුලත් කරනු ලැබේ. එනම් ඉංජිනේරු, ඉංජිනේරු (භූ සම්පත් EM) සහ ඉංජිනේරු (ජේෂකර්ම හා ඇඟලුම් ඉංජිනේරු TM) අංශයයි. විද්‍යාවේදී ඉංජිනේරු පාඨමාලාව වසර හතරක අධ්‍යයන කාල සීමාවකින් යුතු වන අතර එය සෙමෙස්තර අටකින් සමන්විත වේ. සෑම සෙමෙස්තරයක්ම සති විස්සකින් සමන්විත වන අතර එයට විභාග කාලය ද ඇතුලත් වේ. පළමු සෙමෙස්තරය අවසානයේ ඉංජිනේරු පාඨමාලාව සඳහා බඳවා ගත් සියලුම සිසුන්, ඔවුන්ගේ කැමැත්ත සහ පළමු සෙමෙස්තරයේ ලබා ගත් කාර්ය සාධනය අනුව ක්ෂේත්‍ර අටකට බෙදා වෙන් කරනු ලැබේ. මෙම ක්ෂේත්‍ර අට නම්

1. ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව
2. රසායන විද්‍යා හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව
3. සිවිල් ඉංජිනේරු විද්‍යාව
4. පරිගණක විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව
5. විදුලි ඉංජිනේරු විද්‍යාව
6. ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශන විද්‍යාව
7. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
8. ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව

ඉංජිනේරු (භූ සම්පත් EM) පාඨමාලාවට ඇතුලත් කරගන්නා සිසුන් භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව හදාරණ අතර ඉංජිනේරු (පේෂකර්ම හා ඇඟලුම් ඉංජිනේරු TM) පාඨමාලාවට ඇතුලත් කරගන්නා සිසුන් පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය හදාරනු ලැබේ.

ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සඳහා විශේෂිකරණය වූ ක්ෂේත්‍ර දහයකට අදාළව විද්‍යාගාර පුහුණුව, නිර්මාණ පුහුණුව, ක්ෂේත්‍ර පුහුණුව සහ වෘත්තීය පුහුණුව අන්තර්ගත වේ. ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව දේශීය හා විදේශීය වෘත්තීමය සංවිධාන මඟින් පිළිගෙන ඇත.

ඉංජිනේරු පීඨය මඟින් පිරිනමනු ලබන දෙවන උපාධි පාඨමාලාව වනුයේ මෝස්තර නිර්මාණ හා විලාසිතා නිර්මාණ පාඨමාලාවයි. මෙය වර්ෂ හතරක පූර්ණ කාලීන පාඨමාලාවක් වන අතර තුන්වන වසරේදී වෘත්තීය පුහුණුව අන්තර්ගතවේ.

ඉංජිනේරු පීඨය මඟින් පවත්වන ලබන තෙවන ගෞරව උපාධි පාඨමාලාව වනුයේ ප්‍රවාහන කළමනාකරණ සහ කාර්යෝපාය ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව පාඨමාලාවයි. මෙය වසර හතරක පූර්ණ කාලීන පාඨමාලාවක් වන අතර ඒ සඳහා සෙමෙස්තර අටක අධ්‍යයන කාලයක්, වෘත්තීය පුහුණුව ද සමඟින් ඇතුළත් වේ.

තොරතුරු තාක්ෂණ පීඨය

තොරතුරු තාක්ෂණ පීඨය තුල, තොරතුරු තාක්ෂණ, පරිගණකමය ගණිත විද්‍යා හා අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන වශයෙන් අධ්‍යයන අංශ තුනක් පිහිටුවා තිබේ. මෙම පීඨය මඟින්, විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණ (BScHons IT), විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ (BScHons IT & M) හා බුද්ධිමය යාන්ත්‍ර විද්‍යා - විද්‍යාවේදී ගෞරව (BScHons AI) වශයෙන් සිව් අවුරුදු උපාධි පාඨමාලා තුනක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලා තුනෙහි ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් එකිනෙකට වෙනස් වන අතර, එම ප්‍රවේශ සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2 කොටසින් දැනගත හැකිය.

තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව

දිනෙන් දින වර්ධනය වන්නා වූ තොරතුරු තාක්ෂණික වෘත්තිකයන්ගේ ඉල්ලුමට සරිලන පරිදි දැනුමෙන්, හැකියාවන්ගෙන් සහ ආකල්පමය වශයෙන් පරිපූර්ණ වූ උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින් මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. "තොරතුරු තාක්ෂණ" යන පුළුල් ක්ෂේත්‍රය යටතේ මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කොට ඇත්තේ ඉන් බිහිවන උපාධිධාරීන් නවීන තොරතුරු තාක්ෂණ ආයතනවල රැකියාවල නිරතවීමේදී එල්ලවන අභියෝග වලට සාර්ථකව මුහුණදීමේ හැකියාව වර්ධනය වන අයුරිනි. පරිගණක තාක්ෂණය, අත්‍යවශ්‍ය කළමනාකරණ පරිශීලනය, කාර්මික ක්ෂේත්‍රයට නැඹුරුතාව යන සියල්ලෙහිම සංකලනයක් ලෙස විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාවේ වත්මන් විෂය මාලාව සහ එය ඉගැන්වීමේ පටිපාටිය සැකසී ඇත. මෙම උපාධි පාඨමාලාවට සිසුන් ඇතුළත් කෙරෙනුයේ අ.පො.ස. (උසස් පෙළ) භෞතීය විද්‍යාව හෝ ජෛවීය විද්‍යාව (භෞතික විද්‍යාව විෂයක් ලෙස) හැදෑරූ සිසුන්ය. සිසුන්ගේ තොරතුරු තාක්ෂණ හැකියාවන් විවිධ පැතිකඩ ඔස්සේ වර්ධනය කිරීමේ අරමුණින් අනිවාර්ය සහ ප්‍රධාන අධ්‍යයන ඒකක කිහිපයක් මුල් අධ්‍යයන වර්ෂ දෙකෙහිදී ක්‍රියාත්මක වේ. තෙවන වර්ෂය ආරම්භයේ සිට විකල්ප අධ්‍යයන ඒකක හරහා තොරතුරු තාක්ෂණයේ සුවිශේෂී අංශයන්ට සිසුන් නිරාවරණය කරනු ලැබේ. තෙවන අධ්‍යයන වර්ෂයෙහි දෙවන වාරය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර පුහුණුවකින් සමන්විත වන අතර සිසුන්ගේ තරඟකාරී හැකියාවන් වැඩිදියුණු කිරීම සහ පුළුල් පරාසයක් තුල වෘත්තීය අත්දැකීම් ලබා දීම එහි අරමුණ වේ. ඊට අමතරව, සිසුන්හට තම න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යයන ක්ෂේත්‍රය හා බැඳුණු ව්‍යාපෘති වලින් ද මෙම පාඨමාලාව සමන්විත වේ. තම උසස් අධ්‍යාපනය සඳහා යොමුවීමට උනන්දුවක් දක්වන සිසුන්ට පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා ගැනීමට කේවල ව්‍යාපෘතියක් තෝරා ගත හැකිය. අවසන් වසරෙහිදී ක්‍රියාක්මක කෙරෙන අනිවාර්ය කණ්ඩායම් ව්‍යාපෘතිය තුළින් සිසුන් එතෙක් ලබා ගත් දැනුම හා හැකියාව අභියෝගාත්මක තොරතුරු තාක්ෂණ ගැටළු විසඳීම සඳහා යොදා ගැනේ.

තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

දිනෙන් දින ඉහළ යන සර්ව නිපුණ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින්ගේ, කළමනාකරණ සිද්ධාන්ත භාවිතයේ අවශ්‍යතාව සැපිරීම සඳහා 2010 වසරේදී මෙම ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වාදෙන ලදී. සියලු සිසුන් සඳහා තාක්ෂණ අධ්‍යාපනයේ නිම්වළලු පුළුල් කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව අ.පො.ස. (උසස් පෙළ) සෑම විෂය ධාරාවක් සඳහාම විවෘතව ඇත. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ අංශයේ රැකියා අවස්ථා කඩිනමින් ළඟා කර ගැනීමට හැකි වන පරිදි අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ දැනුමින් සහ වැඩිදියුණු කළ කළමනාකරණ නිපුණතාවන්ගෙන් මෙම පාඨමාලාව සමන්විත වේ. කළමනාකරණ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගීකරණය කිරීමේ අරමුණින් සැදුම්ලත් ව්‍යාපෘතීන් මෙම උපාධි පාඨමාලාව තුළ ඇතුලත් වේ. තෙවන අධ්‍යයන වර්ෂයෙහි දෙවන වාරය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර පුහුණුවකින් සමන්විත වන අතර සිසුන්ගේ තරඟකාරී හැකියාවන් වැඩි දියුණු කිරීම සහ පුළුල් පරාසයක් තුළ වෘත්තීය අත්දැකීම් ලබා දීම එහි අරමුණු

වේ. අවසන් වසරෙහිදී ක්‍රියාත්මක කෙරෙන අනිවාර්ය කණ්ඩායම් ව්‍යාපෘතිය තුළින් සිසුන් එතෙක් ලබා ගත් දැනුම හා හැකියාව අභියෝගාත්මක තොරතුරු තාක්ෂණ ගැටළු විසඳීම සඳහා යොදා ගනේ.

බුද්ධිමය යාන්ත්‍ර විද්‍යා - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

බුද්ධිමය යාන්ත්‍ර විද්‍යා උපාධිධාරීන් සඳහා වැඩිවෙමින් පවතින ගෝලීය ඉල්ලුම සපුරාලීම පිණිස, මෙම බුද්ධිමය යාන්ත්‍ර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සම්පාදනය කරන ලදී. මෙම උපාධි පාඨමාලාව තුළ පුළුල් පරාසයක් ආවරණය වන සේ බුද්ධිමය යාන්ත්‍ර විද්‍යාවෙහි එන සිද්ධාන්ත හා ප්‍රායෝගික යෙදීම්, පරිගණක විද්‍යාව, උසස් ගණිතය හා සංඛ්‍යාන විද්‍යාව අන්තර්ගත කර තිබේ. පරිගණකමය ගණිත විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කරන මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව මඟින් පළමු වසරේ සිටම සිසුන්ගේ බුද්ධිමය යාන්ත්‍ර විද්‍යාත්මක චින්තනය සංවර්ධනය වීම සැළකිල්ලට ගෙන තිබේ. බුද්ධිමය යාන්ත්‍ර විද්‍යා උපාධිධාරීන් සඳහා පවතින දෙස්-විදෙස් අධ්‍යාපන, කර්මාන්ත, අනෙකුත් ක්ෂේත්‍රවල පවතින ඉල්ලුම දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතින නිසා මෙම උපාධිධාරීන්ට බොහෝ රැකියා අවස්ථා බිහි වී තිබේ.

ව්‍යාපාර පීඨය

ව්‍යාපාර පීඨය 2017 දී පිහිටුවන ලද අතර ව්‍යාපාර විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලබයි. ව්‍යාපාර පීඨයේ ප්‍රධාන ඉලක්කය වන්නේ ඉදිරි දශකය තුළ ව්‍යාපාර ප්‍රවර්ධනයට හැකියාව ඇති උපාධිධාරීන් බිහි කිරීමයි. පීඨයේ දෙපාර්තමේන්තු තුනක් ඇති අතර සෑම දෙපාර්තමේන්තුවක්ම විශේෂීකරණ ක්ෂේත්‍රයක් සඳහා ගෞරව උපාධිය පිරිනමනු ලබයි. තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපාර විශ්ලේෂණය සඳහා ද, කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් මූල්‍ය සේවා කළමනාකරණය සඳහා ද, තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍ර සඳහා ද ගෞරව උපාධිය පිරිනමනු ලබයි. ව්‍යාපාර පීඨයට ඇතුළත් වීමෙන් පසුව අ.පොස. උසස් පෙළ විභාගයේ Z- ලකුණු සහ සිය අභිමතය මත පදනම්ව විශේෂීකරණ ක්ෂේත්‍රයකට සිසුන් අනුයුක්ත කෙරේ. මෙය වසර හතරක පූර්ණකාලීන පාඨමාලාවක් වන අතර අවසාන වසරේදී වෘත්තීය පුහුණුවකින් ද සමන්විත වෙයි.

මෙම පාඨමාලාවේ ඒකක නිර්මාණය කර ඇත්තේ වෘත්තීය ක්ෂේත්‍රයේ සහ ගෝලීය ආර්ථිකයේ අපේක්ෂිත අවශ්‍යතා සපුරාලීම සඳහාය. විශ්ලේෂණ කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම මෙම විශේෂීකරණ ක්ෂේත්‍ර තුනෙහිම ප්‍රධාන ලක්ෂණයක් වෙයි.

තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව: ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විශේෂීකරණය

තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව (DS) මඟින් ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විශේෂීකරණය සහිත ව්‍යාපාර විද්‍යාවේදී ගෞරව උපාධිය (BBSc.) පිරිනමනු ලබයි. ඒ සමඟම ප්‍රමාණාත්මක මූල්‍ය පිළිබඳව ද්විතීයික විශේෂීකරණයක් ලබා ගැනීමේ අවස්ථාවක් ද පවතියි. දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන පාඨමාලා සංකීර්ණ ව්‍යාපාරික ගැටළු විසඳීමට සහ තීරණ ගැනීමට දත්ත භාවිතා කිරීමට අත්‍යවශ්‍ය ගණිතමය, සංඛ්‍යානමය සහ පරිගණක කුසලතා ආවරණය කරන විශ්ලේෂණ ආශ්‍රිත මාතෘකා රාශියකින් සමන්විතය. සියලුම පාඨමාලා ඒකක ව්‍යාපාර භාවිතාව කෙරෙහි අවධාරණය කරමින් ලබා දී ඇති අතර එමඟින් සිසුන්ට ප්‍රමාණාත්මක කුසලතා සහ කළමනාකරණ ක්ෂේත්‍ර දැනුම යන දෙකෙහිම ඉතා හොඳ පදනමක් ලබා ගත හැකිය.

කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුව: මූල්‍ය සේවා කළමනාකරණය පිළිබඳ විශේෂීකරණය

කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුව (IM) මඟින් ව්‍යාපාර විද්‍යාවේදී ගෞරව උපාධි (BBSc.) පාඨමාලාවේ කොටසක් ලෙස මූල්‍ය සේවා කළමනාකරණය පිළිබඳ විශේෂීකරණය සහිත ගෞරව උපාධිය පිරිනමනු ලබයි. සාම්ප්‍රදායික මූල්‍ය රැකියා අභිබවා යමින්, මූල්‍ය සේවා කළමනාකරණය වඩාත් ලාභදායී මූල්‍ය කර්මාන්තයේ විශිෂ්ටත්වය අත්කර ගැනීමට වෘත්තීය අවස්ථා රාශියක් සපයයි. මූල්‍ය සේවා කළමනාකරණ ක්ෂේත්‍රය අංකුර කළමනාකරුවන්ගේ සමස්ත සංවර්ධනයට ඉඩ සලසා දෙන අතර ආයතනික ලෝකයේ අපේක්ෂාවන් සපුරාලීමට හැකියාව ද ලබා දෙනු ඇත. මූල්‍ය කර්මාන්තයේ සමකාලීන අවශ්‍යතාවලට අදාළ ව්‍යාපාර සහ අන්තර් පුද්ගල කුසලතා, ආකල්ප සහ දැනුම පිළිබඳ පූර්ණ සවිබල ගැන්වීමත් සමඟ, සිසුන් සිය ක්ෂේත්‍රයේ පුරෝගාමීන් බවට පත් කිරීමට සූදානම් කරනු ලබයි.

තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව: ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය පිළිබඳ විශේෂීකරණය

තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (MoT) මඟින් ව්‍යාපාර විද්‍යාවේදී උපාධිය (BBSc.) පාඨමාලාවේ කොටසක් ලෙස ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (BPM) පිළිබඳ විශේෂීකරණය සහිත ගෞරව උපාධිය පිරිනමනු ලබයි. මෙම පාඨමාලා සැලසුම් කර ඇත්තේ වර්තමාන ගතික ව්‍යාපාර පරිසරයන්හි නවෝත්පාදනය මෙහෙයවීම සහ ස්ථාවර දියුණුවක් පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය පුළුල් දැනුම, ප්‍රායෝගික කුසලතා සහ

ඉදිරි දැක්මක් සහිත උපාධිධාරීන් බිහිකිරීමටය. BPM විෂයමාලාව දකුණු ආසියානු කලාපයේ සුවිශේෂී වන අතර, ප්‍රධාන වශයෙන් BPM තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ කිරීම සහ ව්‍යාපාර ක්‍රියාවලි විශිෂ්ටත්වය අන්තර්ගතයෙහි දැක්වීම කෙරෙහි අවධානය යොමු කරයි. විෂයමාලාවේ ඇති සුවිශේෂත්වය සහ වෘත්තීය පුහුණුව මඟින්, උපාධිධාරීන් ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය අත්කර ගැනීමට හොඳින් සූදානම් කරනුයේ, න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් යන දෙකෙහිම පදනමක් ලබා දෙමිනි.

යාපනය විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	-	T
කළමනාකරණය	-	T/E
වාණිජ්‍යය	-	T/E
නීතිය	-	E
වෛද්‍ය විද්‍යාව	-	E
සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	-	T
කෘෂිකර්මය	-	E
ජෛවීය විද්‍යාව	උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව	T/E
ඉංජිනේරු විද්‍යාව	-	E
භෞතීය විද්‍යාව	-	T/E
පරිගණක විද්‍යාව	-	T/E
හෙද	-	E
ඖෂධ විද්‍යාව	-	E
වෛද්‍ය රසායනාගාර විද්‍යා	-	E
පරිවර්තන අධ්‍යයනය	-	E/T
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
ශාරීරික අධ්‍යාපනය	-	E
සංගීතය	-	T
නර්තනය	-	T
චිත්‍ර සහ නිර්මාණ	-	T

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව පහත සඳහන් විශේෂීකරණයන්ගෙන් සමන්විත වේ.

- මෝටර් රථ
- ගොඩනැගිලි ඉදිකිරීම්
- ඉලෙක්ට්‍රොනික

කලා පීඨය

පීඨය මඟින් පවත්වාගෙන යනු ලබන විෂයයන් සහ විෂයයන් තෝරා ගැනීම:

යාපනය විශ්වවිද්‍යාලයේ කලා පීඨයට ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ගනු ලබන සිසුන්ට හැදෑරීම සඳහා පහත සඳහන් විෂයයන් පීඨය විසින් පවත්වා ගෙන යනු ලැබෙයි.

පළමු මට්ටමේදී කලා පීඨයට ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ඇතුළත් වන සියලුම සිසුන්ට පොදුය. ඒ අනුව පළමු මට්ටමේදී සිසුවකු හෝ සිසුවියකට කලා පීඨය මඟින් සපයන ප්‍රධාන විෂයයන් ගෙන් තමන් කැමති ප්‍රධාන පාඩම් තුනක් තෝරා ගත හැකිය.

මානව විද්‍යාව, පුරා විද්‍යාව, කලා ඉතිහාසය, ක්‍රිස්තියානු ශිෂ්ටාචාරය, සංස්කෘතික සංචාරක කර්මාන්තය, නාට්‍ය සහ රංග කලාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි සාහිත්‍ය (ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන්), ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම (ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන්), භූගෝල විද්‍යාව, ඉතිහාසය, ගෘහ ආර්ථික විද්‍යාව, වාග් විද්‍යාව, මාධ්‍ය අධ්‍යයනය, දර්ශනය, ප්‍රජා සහ ප්‍රාදේශීය සැලසුම්කරණය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, දෙමළ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය යනු එම විෂයන් ය.

තව ද කලා පීඨයට ඇතුළත් වූ සිසු සිසුවියන් යාපනය විශ්වවිද්‍යාලයේ හින්දු අධ්‍යයන පීඨය මඟින් සපයනු ලබන හින්දු දර්ශනය (ශෛව සිද්ධාන්ත), හින්දු ශිෂ්ටාචාරය සහ සංස්කෘත යන විෂයන් හැදෑරිය හැකිවන අතර එය කළ හැක්කේ අදාළ විෂය විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීම සඳහා සළකා බලනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට හදාරා තිබීම යන කොන්දේසියට යටත්වය.

අතිරේක බඳවා ගැනීම (Additional Intake) යටතේ කලා පීඨයට පැමිණෙන සිසු සිසුවියන් විෂයයන් තෝරා ගත යුත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශයන්ට යටත්ව වන අතර එම විෂයයට හෝ විෂයයන්ට අමතරව අදාළ අධ්‍යනාංශයෙහි උපදේශනය සමඟින් තෝරා ගත හැකිය.

පළමු මට්ටම සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ගෞරව උපාධි පාඨමාලාවක් හැදෑරීමට සිසු සිසුවියන්ට අදාළ සිසුවා හෝ සිසුවිය විසින් හැදෑරූ ප්‍රධාන විෂයන් ගෙන් එකක් තෝරා ගෙන කලා පීඨය විසින් සපයනු ලබන අදාළ ආකෘති පත්‍රය පුරවා භාර දීමෙන් කළ හැකිය.

පහත සඳහන් විෂයන් සඳහා ගෞරව උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

පුරා විද්‍යාව, කලා ඉතිහාසය, ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය, සංස්කෘතික සංචාරක කර්මාන්තය, නාට්‍ය සහ රංගකලාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි සාහිත්‍ය (ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන්), ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම (ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන්), භූගෝල විද්‍යාව, ඉතිහාසය, ගෘහ ආර්ථික විද්‍යාව, වාග් විද්‍යාව, මාධ්‍ය අධ්‍යනය, දර්ශනය, ප්‍රජා සහ ප්‍රාදේශීය සැලසුම්කරණය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව සහ දෙමළ.

සටහන: එල්.එල්.බී. උපාධි පාඨමාලාව සඳහා සහ වෙනම ප්‍රවේශ ද්වාරයක් සහිත පරිවර්තන අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හැදෑරීම සඳහා පැමිණෙන සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශන අනුව සිදු වෙයි.

රුහුණ විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	-	S
කළමනාකරණය	-	E
වෛද්‍ය විද්‍යාව	-	E
කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	-	E
ඉංජිනේරු විද්‍යාව	-	E
ජෛවීය විද්‍යාව	උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
ජෛවීය විද්‍යාව	රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව	E
ජෛවීය විද්‍යාව	රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
ජෛවීය විද්‍යාව	භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව	E
භෞතීය විද්‍යාව	රසායන විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව	E
භෞතීය විද්‍යාව	භෞතික විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව	රසායන විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය	E
භෞතීය විද්‍යාව	භෞතික විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය	E
භෞතීය විද්‍යාව	රසායන විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව	පරිගණක විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය	E
භෞතීය විද්‍යාව	ගණිතය, කාර්මික ගණිතය, රසායන විද්‍යාව	E
භෞතීය විද්‍යාව	ගණිතය, කාර්මික ගණිතය, භෞතික විද්‍යාව	E
ධීවර සහ සාගර විද්‍යාව	-	E
හෙද	-	E
වෛද්‍ය රසායනාගාර විද්‍යා	-	E
ඖෂධ විද්‍යාව	-	E
පරිගණක විද්‍යාව	-	E
කෘෂි ව්‍යාපාර කළමනාකරණය	-	E
හරිත තාක්ෂණය	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
සාගර සහ මිරිදිය විද්‍යාව	-	E
ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	-	E
මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	-	E
භූගෝලීය තොරතුරු පද්ධති	-	E

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් හඳුන්වා දී ඇති උපාධි පාඨමාලා ආකෘතිය, අර්ඝ පදනම් කරගත් පාඨමාලා ඒකක වලින් සමන්විත සමාසික ක්‍රමය (Credits based course units semesters system) වශයෙන් නම් කෙරේ.

පීඨයේ උපාධි පාඨමාලාවන් හි ප්‍රධානතම පරමාර්ථය වනුයේ උසස් බුද්ධි මට්ටමකින් හා වෘත්තීය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ නිර්මාණශීලී වූ උපාධිධාරීන් බිහි කිරීමයි. එසේම ඔවුන් විසින් සමාජ හා ආර්ථික පරිසරයේ උන්නතිය උපරිම වන ආකාරයෙන් බුද්ධිමය දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර ඔවුන් මනා සහජීවනයකින් හා උසස් බුද්ධිමය වටිනාකම්වලින් පරිපූර්ණ වූ ආදර්ශමත් ලෙස

සමාජයේ කටයුතු සඳහා යොමුකිරීමක් ද අපේක්ෂා කෙරේ.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය එහි උපාධි අපේක්ෂකයන්ට පළල් මට්ටමක උපාධි පාඨමාලා දෙකක් පවත්වාගෙන යනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය - වසර තුනකි
2. ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - වසර හතරකි

ඉංග්‍රීසි, පුරා විද්‍යාව, ඉතිහාසය, බෞද්ධ ශිෂ්ඨාචාරය, පාලි, බෞද්ධ දර්ශනය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සිංහල, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, සමාජ සංඛ්‍යානය, තොරතුරු තාක්ෂණය යන විෂයයන් උපාධි සඳහා හැදෑරිය හැකිය.

සාමාන්‍යයෙන් ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය සඳහා විෂයයන් තුනකින් යුත් ඕනෑම විෂයය සංකලනයක් තෝරා ගත හැකි අතර මෙය සිසුන්ගේ ඉල්ලීම මත පීඨය මඟින් වසරින් වසර තීරණය කරනු ලැබේ. ඉහත ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය විෂය හැර අනෙක් ඕනෑම විෂයයක් විශේෂවේදී උපාධි පාඨමාලාව සඳහා තෝරා ගත හැකිය. විෂයක් ලෙස ඉංග්‍රීසි හැදෑරීමට නම් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි සාහිත්‍යයට හෝ අ.පො.ස. (උසස් පෙළ) ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් (C ශ්‍රේණිය) ලබා තිබිය යුතුය. සමාජ සංඛ්‍යානය විෂය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C ශ්‍රේණිය) සාමාර්ථයක් ලබා තිබිය යුතුය. පාලි විෂය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා ඒ විෂය හදාරා තිබිය යුතුය. තොරතුරු තාක්ෂණය හැදෑරීම සඳහා පීඨය මඟින් විභාගයක් පවත්වා සිසුන් තෝරා ගනු ලැබේ. ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පළමු ස්ථල පරීක්ෂණයන්ගෙන් සමත් වී අදාළ විෂයයට ඉහළ සාමාර්ථයක් ලබා තිබිය යුතුය. උපාධි අපේක්ෂකයන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා පදනම් පාඨමාලා හා පරිපූරක පාඨමාලා සිසුන්ගේ අභිමතය පරිදි තෝරා ගත හැකි අතර ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය (IT), මූලික ගණිතය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පර්යේෂණ ක්‍රම මේ අතර වේ. මේ අතුරින් ඉංග්‍රීසි හා IT අනිවාර්ය වේ. පදනම් විෂයයන් තෝරා ගැනීමේදී ඒ සඳහා වන පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. අනෙක් විෂයයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත. තව ද දෙමළ, ප්‍රංශ, කොරියන් හා හින්දි වැනි භාෂා පිළිබඳ හැදෑරීමට අමතර පහසුකම් සලසා තිබේ. සිසුන්ගේ ඉල්ලීම මත විශේෂවේදී පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද හැදෑරීමට අවස්ථාව ඇත.

උපාධි පාඨමාලා සමාසික පදනම මත ඉගැන්වීම් කටයුතු සිදු කරන අතර විභාග අඛණ්ඩව ඇගයීම් සහ සමාසික අවසානයේ පවත්වනු ලබන විභාග යන ඇගයීම් ක්‍රම දෙකක් යටතේ සිදු කෙරේ.

කළමනාකරණ හා මූල්‍ය පීඨය

2003 වර්ෂයේ දී පිහිටුවන ලද කළමනාකරණ හා මූල්‍ය පීඨය ශිෂ්‍ය සංඛ්‍යාව අනුව රුහුණ විශ්වවිද්‍යාලයේ දෙවන විශාලතම පීඨය වේ. (එනම් 2018 වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 1511 කි.) ගණකාධිකරණය සහ මූල්‍ය, ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය යන අධ්‍යයන දෙපාර්තමේන්තු හතරකින් කළමනාකරණ හා මූල්‍ය පීඨය සමන්විත වේ. කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් පිරිනමනු ලබන බීබීඒ (ගෞරව) උපාධි පාඨමාලාවන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF)-6 වන මට්ටමට සමාන වන අතර, ඒ සෑම උපාධි පාඨමාලාවක්ම වසර හතරක් තුළ පිරිනමන අර්ඝ (Credit) 120 කින් සමන්විත වේ. පීඨය විසින් 2001 වර්ෂයේදී විෂය ඒකක පදනම් කරගත් උපාධි පාඨමාලා හඳුන්වා දුන් අතර, සෑම උපාධි පාඨමාලාවක්ම අනිවාර්ය සීමාවාසික ප්‍රායෝගික පුහුණුවකින් සහ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතියකින් සමන්විත වේ. සෑම උපාධි පාඨමාලාවකම විෂය නිර්දේශය අදාළ ක්ෂේත්‍ර වල තත්කාලීන වර්ධනයන්ට ගැලපෙන, නව්‍යතම විෂය ඒකක වලින් පොහොසත් වේ.

කළමනාකරණ මූල්‍ය පීඨය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

ව්‍යාපාර පරිපාලනවේදී ගිණුම්කරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)

ව්‍යාපාර පරිපාලනවේදී ගිණුම්කරණය පිළිබඳ උපාධි පාඨමාලාව, දේශීය මෙන්ම විදේශීය වශයෙන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සාර්ථක ගිණුම්කරණ වෘත්තියක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා, නිපුණතා සහ වෘත්තීය දැනුම සහිත ගුණාත්මක උපාධිධාරීන් බිහිකිරීම සඳහා නිර්මාණය කර ඇත. මේ අනුව වෙනස්වන ව්‍යාපාර ලෝකය තුළ ආයතන මෙහෙයවීමේ හැකියාවන් වර්ධනය කිරීමට සිසුන්ට අවශ්‍ය වන ප්‍රායෝගික අංග ඇතුළත් නව්‍යතම විෂය ඒකක සමූහයකින් මෙම උපාධි පාඨමාලාව සමන්විත වේ. ඒ අතර සීමාවාසික ප්‍රායෝගික පුහුණුව, පර්යේෂණ ව්‍යාපෘති, අඛණ්ඩ ඇගයීම් වලට අනුයුක්තව ක්ෂේත්‍ර කටයුතු ප්‍රධාන තැනක් ගනී. තවද දෙපාර්තමේන්තුව විසින් ශිෂ්‍ය කව සහ සංගම් පිහිටුවීම මඟින් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන අතර එමඟින් නිර්මාණශීලිත්වය, දැනුම හුවමාරු කර ගැනීම, නවෝත්පාදනය කෙරෙහි සිසුන් දිරිමත් කරයි. අවසාන වශයෙන් මෙම උපාධි පාඨමාලාවේ උපාධිධාරීන් හට ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන් විශිෂ්ඨ වෘත්තීය අවස්ථාවන් ඇති අතර රැකියා ආයතන තුළ හා සමාජය තුළ සුවිශේෂී වටිනාකමක් නිර්මාණය කිරීමේ හැකියාව ද ඇත.

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව මඟින් ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රය තුළ වර්තමාන හා නැගී එන ව්‍යාපාර අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය දැනුම, කුසලතා හා නිපුණතා සහිත උපාධිධාරීන් බිහිකිරීමට අපේක්ෂා කරයි. මෙය අර්ඝ (credit) 120 ක් සහිත සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාවක් වන අතර ව්‍යාපාර කළමනාකරුවන් ලෙස සිය වෘත්තීය ජීවිතය දියුණු කර ගැනීමට අපේක්ෂා කරන උපාධි අපේක්ෂකයින් බිහි කිරීම මෙම පාඨමාලාවේ අරමුණ වේ. ඒ සඳහා අනිවාර්ය පර්යේෂණ අංගයකින් සහ ව්‍යාපාර කළමනාකරණයේ සීමාවාසික ප්‍රායෝගික පුහුණුවකින් මෙම පාඨමාලාව සමන්විත වේ. තව ද මෙම උපාධි පාඨමාලාව ව්‍යාපාරික පරිසරය තුළ විකල්ප අවස්ථා ඇගයීම සඳහා අවශ්‍ය සංඛ්‍යාත්මක කුසලතා සහ ගැටළු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. එමඟින් සිසුන්ට ව්‍යාපාර කළමනාකරණය සඳහා ව්‍යාපාරික අවස්ථා අවබෝධ කර ගැනීමට සහ ඇගයීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ වෘත්තීය නිපුණත්වය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. අවසාන වශයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරියා හට ඉහළ විශිෂ්ඨත්වයක් හා වෘත්තීමය බවක් සහිත පුළුල් පරාසයක් තුළ විහිදුණු රැකියා අවස්ථා රාශියක් විදේශීය හා දේශීය වශයෙන් හිමිය.

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්වය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධියේ අරමුණ වනුයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙන් හා පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දිය හැකි මනා ව්‍යවසායකත්ව ගුණාංග සහිත සිසුන් පිරිසක් බිහිකිරීමයි. ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි මූලික සංකල්ප පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා පළමු අධ්‍යයන වාර තුනේදී පොදු විෂය මාලාවකින් ද අවසාන අධ්‍යයන වාර පහේදී විශේෂ ක්ෂේත්‍රයන් ඔස්සේ පුළුල් ප්‍රායෝගික හැදෑරීමකින් ද මෙම පාඨමාලාව සමන්විත වේ. පළමු අධ්‍යයන වාර තුන අවසානයේදී, පීඨය විසින් කලින් නියම කරන ලද අවශ්‍ය නිර්ණායක සපුරාලන සිසුන් ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධිය හැදෑරීමට සුදුසුකම් ලබයි.

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධිය හැදෑරීම තුළින් සිසුන්ට අධ්‍යයනාංශ විසින් කර්මාන්තායතන සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලබන වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා සහ බාහිර පුහුණුවන් වැනි විවිධ ක්‍රියාකාරකම් තුළින් ව්‍යවසායකත්ව විනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් ලබා ගත හැකිය. එම ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට ඔවුන්ගේ අන්තර් පුද්ගල, සන්නිවේදන සහ කණ්ඩායම් ගොඩනැගීමේ හැකියාව වර්ධනය කර ගත හැකිය.

ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)

ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය සැලසුම් කර ඇත්තේ නූතන ව්‍යාපාරික ආයතනයන්හි අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් දැනුමක් සහිත කුසලතා සහ නිපුණතාවලින් හෙබි ඉහළ රැකියා නියුක්තියකින් යුතු මානව සම්පත් කළමනාකරණ උපාධිධාරීන් බිහි කිරීම සඳහාය. ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි මූලික සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා පළමු අධ්‍යයන වාර තුනේදී පොදු විෂය මාලාවකින් ද අවසාන අධ්‍යයන වාර පහේදී විශේෂ ක්ෂේත්‍රයන් ඔස්සේ පුළුල් ප්‍රායෝගික හැදෑරීමකින් ද මෙම පාඨමාලාව සමන්විත වේ. පළමු අධ්‍යයන වාර තුන අවසානයේදී, පීඨය විසින් කලින් නියම කරන ලද අවශ්‍ය නිර්ණායක සපුරාලන සිසුන් ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය හැදෑරීමට සුදුසුකම් ලබයි.

ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය හැදෑරීම තුළින් සිසුන්ට අධ්‍යනාංශය විසින් කර්මාන්තායතන සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලබන වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා සහ බාහිර පුහුණුවන් වැනි විවිධ ක්‍රියාකාරකම් තුළින් මානව සම්පත් කළමනාකරණයේ හොඳම භාවිතයන් සහ නවීන ප්‍රවණතා ගවේශණය කළ හැකිය. එම ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට ඔවුන්ගේ අන්තර් පුද්ගල, සන්නිවේදන සහ කණ්ඩායම් ගොඩනැගීමේ හැකියාවන් වර්ධනය කර ගත හැකිය.

ව්‍යාපාර පරිපාලනවේදී අලෙවිකරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)

පරිපූර්ණ අලෙවි වෘත්තිකයන් බිහි කිරීමේ අභිමතාර්ථයෙන්, 2008 වර්ෂයේදී, අලෙවිකරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ව්‍යාපාර පරිසරයේ සිදුවන නිරන්තර වෙනස්වීම් මත, මනා දැනුමින් හා හැකියාවන්ගෙන් යුත් අලෙවිකරණ වෘත්තිකයෙකුට වන ඉල්ලුම අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. එම අවශ්‍යතාවයන්ට සුදුසු උපාධිධාරියෙකු බිහි කිරීමට මනා හැකියාවන්ගෙන් හා ඉහළ ගුණාත්මක දැනුමින් යුත් ආචාර්ය මණ්ඩලයකින් දෙපාර්තමේන්තුව සමන්විත වන අතර, තම දැනුම දේශන, පර්යේෂණ, උපදේශන සේවා හා වෘත්තීමය හා ක්‍රමසම්පාදන සේවා යන විවිධ තලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා සමාජය තුළ බෙදා හරිමින් සිටී. තවදුරටත් දෙපාර්තමේන්තුව බිහි කළ හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ විද්‍යාර්ථයන් දේශීය හා විදේශීයන්හි එක ලෙස තම දායකත්වය ලබා දෙමින් සිටී. දෙපාර්තමේන්තුවේ සිසුන් අධ්‍යයන කවය හරහා විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියක නිරතවන අතර, ඒ තුළින් ඔවුන් තම අධ්‍යයන හැකියාවන් ඔප්නංවා ගැනීම පමණක්

නොව, ඔවුන්ගේ සමාජ වගකීම පිළිබඳ හැඟීම වර්ධනය තුළින් පරිපූර්ණ උපාධිධාරියෙකු බවට පත්වේ.

මූල්‍ය-ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය

මූල්‍ය- ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි පාඨමාලාව මඟින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය වෘත්තියේ මතුවන අවශ්‍යතාවයන්ට සරිලන අග්‍රගණයේ උපාධිධාරීන් නිර්මාණය කරනු ලබයි. SLQF 6 වන ස්තරයේ පිහිටා ඇති සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් වන මේ පාඨමාලාව අර්ඝ (credit) 120 කින් සමන්විත වේ. මෙම පාඨමාලාව හැදෑරීමෙන් සිසුන් හට ප්‍රධාන මූල්‍ය සංකල්පයන්, න්‍යායයන් සහ ශිල්ප ක්‍රම මෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ නවීන ක්‍රියාකාරීත්වය තීරණය කෙරෙන සාධක අවබෝධ කර ගැනීමට හා කළමනාකරණය කිරීමට අවශ්‍ය සන්නිවේදන කුසලතා, විශ්ලේෂණ කුසලතා සහ ගැටලු විසඳීමේ කුසලතා වැනි වෙනත් වැදගත් කුසලතා ප්‍රගුණ කිරීමට හැකියාවක් ලැබේ. එමෙන්ම අනිවාර්ය වූ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘති මඟින් යාවජීව ඉගෙනුම් කුසලතා මෙන්ම සප්‍රමාණ තර්ක ගොඩනැගීමේ නිපුණතා වැඩිදියුණු කරන අතරම, ප්‍රායෝගික පුහුණුව මඟින් ඔවුන් උකහාගත් දැනුම, කුසලතා සහ ආකල්ප ව්‍යාපාරික පරිසරය තුළ කෙසේ යෙදවෙන්නේ ද යන්න පිළිබඳව ද පළපුරුද්දක් ලබා ගැනීමට හැකිවන පරිදි සිසුන්ව ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කරයි. එම උපාධිධාරීන් හට සමාගම්, බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වල ඇති සුවිශේෂී රැකියාවලට යොමු විය හැකි අතරම අවශ්‍යනම් තමන්ගේම ව්‍යාපාරයක් ගොඩනැගීම වුව ද කළ හැකිවනු ඇත.

ව්‍යාපාර නීතිය-ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව

කළමනාකරණය සහ ව්‍යාපාර නීතිය යන විෂයයන් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාවේ පළමු වරට උපාධි පාඨමාලාවක් ව්‍යාපාර නීතිය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව මඟින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම වැඩසටහන මඟින් ව්‍යාපාර නීතිය සහ කළමනාකරණය පිළිබඳ මනා දැනුමක් ඇති සිසුන් බිහි කිරීම අපේක්ෂා කරයි. ව්‍යාපාර කළමනාකරණය සහ මෙහෙයුම් වල ගැටළු සඳහා නීතිය පදනම් කරගත් විසඳුම් ලබා දීමට මෙමඟින් සිසුන්ට හැකි වේ. කළමනාකරණය සහ නීතියට අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සිසුනට තරඟකාරී වාසියක් ලබා දෙනු ඇත. අන්තර්වාසික ස්වරූපයෙන් සිසුන්ට අධ්‍යයන වාරයක් පුරා අනිවාර්ය ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙනු ඇත. මෙමඟින් ව්‍යාපාර කළමනාකරණයේදී නීතිය ක්‍රියාත්මක කිරීම අවබෝධ කර ගැනීමට සිසුන්ට හැකිවනු ඇත. මෙම අන්තර්වාසික පුහුණුව සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය ලෝකය සඳහා වරප්‍රසාදිත ආරම්භයක් සපයයි. නීතිය හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දැනුමක් ඇති වෘත්තිකයින් සඳහා ඇති ඉල්ලුම මෙම වැඩසටහනෙන් බිහිවන උපාධිධාරීන් සපුරාලනු ඇත. එම නිසා, සියළු නීතිමය ලියකියවිලි සකස් කිරීම, අභ්‍යන්තර නීතිමය කටයුතු හැසිරවීම සහ සංවිධානවල උපායමාර්ගික තීරණවලට උපදෙස් දීම සඳහා වගකිව යුතු නීති කළමනාකරු ලෙස කටයුතු කිරීමේ වෘත්තීය අවස්ථා ඔවුන්ට විවෘතය.

රුහුණු විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය මඟින් පිරිනමනු ලබන ව්‍යාපාර නීතිය ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත්වීම සඳහා සුදුසුකමක් නොවේ.

විද්‍යා පීඨය

විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය සහ ගෞරව)

එක් අධ්‍යයන වර්ෂයක් සති පහළොව (15) බැගින් යුතු සමාසික දෙකකින් යුක්ත වේ. දැනට භාවිත වන විෂය පාඨමාලා ඒකකයන්, අර්ඝ මූලික ඇගයුම් ක්‍රමයක් පදනම් කර ගනී. උපාධි පාඨමාලාව ආරම්භයේදීම ශිෂ්‍යයන් තම අභිමතය පරිදි විෂය සංයෝජනයන් තෝරා ගත යුතුය. පළමු සහ දෙවන වසර වලට නියමිත පදනම් පාඨමාලා ඒකක හැදෑරීම ඔවුන්ට අනිවාර්ය වේ. පීඨයෙන් සහ දෙපාර්තමේන්තු මඟින් දෙවන සහ තෙවන වසර වලදී පිරිනැමෙන වෛකල්පිත පාඨමාලා ඒකක තම වෘත්තීය අපේක්ෂණයන්ට ගැලපෙන පරිදි තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ඇත. බොහෝ වෛකල්පිත විෂයයන් භෞතික විද්‍යා සහ ජීව විද්‍යා විෂය ක්ෂේත්‍ර දෙකටම පොදුය. පීඨයෙන් පිරිනැමෙන ඇතැම් වෛකල්පිත විෂය ඒකකයන් පහත සඳහන් වෙයි.

ඉලෙක්ට්‍රොනික විද්‍යාව (Electronics), ක්ෂුද්‍රපාලක සහ ඒවායේ භාවිතය (Microcontrollers and applications), පරිගණකමය භෞතික විද්‍යාව (Computational Physics), තාරකා විද්‍යාව සහ විශ්ව න්‍යාය විද්‍යාව (Astronomy and Cosmology), කළමනාකරණය (Management), ගිණුම්කරණය (Accounting), අලෙවිකරණ කළමනාකරණය (Marketing Management), පර්යේෂණ ව්‍යාපෘති (Research Project), පර්යේෂණ ක්‍රම විද්‍යාව (Research Methodology), කථනය හා සන්නිවේදනය (Speech and Communication), ශාරීරික යෝග්‍යතාව සහ සෞඛ්‍ය කළමනාකරණය (Physical Fitness and Health Management), විද්‍යාත්මක ලේඛනය සහ සන්නිවේදනය (Scientific writing and Communication), ප්‍රවේණික ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණය (Genetic Engineering and Biotechnology), උසස් පරිසර විද්‍යාව (Advanced Environment Technology), උද්‍යාන විද්‍යාව-මල් වගාව සහ භූ දර්ශනය (Horticulture Floriculture and Landscape), වන විද්‍යාව (Forestry), ආහාර තාක්ෂණය (Food Technology), ව්‍යවහාරික කීට විද්‍යාව (Applied Entomology), ප්‍රතිශක්තීකරණ විද්‍යාව (Immunology), ජලජ ජීවවිද්‍යාව (Aquaculture), පරපෝෂිත විද්‍යාව (Parasitology), පක්ෂි විද්‍යාව (Ornithology), ජෛව ආචාර ධර්ම (Bioethics), ආර්ථික විද්‍යාවේ

ගණිතමය ක්‍රම හඳුන්වා දීම (Introductory Mathematical Methods in Economics), නියුරෝන ජාලයන් පිළිබඳ න්‍යාය සහ භාවිතය (Theory and applications of Neural Networks), දෘශ්‍ය ක්‍රමලේඛනය (Visual Programming), පරිගණක දෘඩාංග සහ ජාලකරණය (PC Hardware and Networking), පද්ධති සහ ජාල පරිපාලනය (System and Network Administration), කාර්මික රසායන විද්‍යාව (Industrial Chemistry), පාරිසරික රසායන විද්‍යාව (Environment Chemistry).

මීට අමතරව, පරිගණක විද්‍යාව විෂයයන් ලෙස හදාරණු නොලබන භෞතික විද්‍යා ශිෂ්‍යයන් සහ සියලුම ජීව විද්‍යා ශිෂ්‍යයන් පරිගණක සාක්ෂරතාව පිළිබඳ පාඨමාලාව (Computer Literacy Course - CLC) ඔවුන්ගේ ප්‍රථම වසරේදී හැදෑරිය යුතු වේ. එම CLC පාඨමාලාවෙන් විශිෂ්ඨ කුසලතා පෙන්වන ශිෂ්‍යයෝ ඔවුන්ගේ දෙවන වසරේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in Information Technology - CCIT) හැදෑරීමට සුදුසුකම් ලබා ගනිති.

උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන අංශ විසින් පවත්වන ගෞරව උපාධි පාඨමාලාවන් පිරිනැමෙන්නේ පළමු සහ දෙවන වසර විභාග වලදී විශිෂ්ඨ දක්ෂතා දැක්වූ ශිෂ්‍යයන්ට පමණි. (ගෞරව උපාධි පිරිනැමෙන්නේ තෙවන සහ සිව්වන වසර වලදීය). අධ්‍යයන සහ/ හෝ පර්යේෂණ අංශ වලට සම්බන්ධ වෘත්තීය අවස්ථා ලබා ගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් මෙම වැඩසටහන් ඉලක්ක කර ගනිමින් කටයුතු කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

සියලුම ශිෂ්‍යයන් ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගැනීම සඳහා වන නිර්දේශිත පාඨමාලා හැදෑරිය යුතු වේ. පාඨමාලා ඒකක සහ අනෙකුත් සම්පත්/ පහසුකම් පිළිබඳ වැඩිදුර විස්තර http://www.ruh.ac.lk විශ්වවිද්‍යාලයීය අන්තර්ජාල අඩවියෙහි සඳහන් වේ.

BCS පරිගණක විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය සහ ගෞරව)

මේ සඳහා විශේෂ එළඹුමකින් ද ශිෂ්‍යයන් බඳවා ගනු ලැබේ. වසර තුනක කාලයක් තිස්සේ (BCS) පරිගණක විද්‍යාවේදී උපාධි අපේක්ෂකයෝ පරිගණක විද්‍යාවේ විවිධ පැතිකඩ හදාරති. ප්‍රථම වසර තුන තුළ සුවිශේෂී දක්ෂතා දක්වන ශිෂ්‍යයෝ පරිගණක විද්‍යාවේදී ගෞරව උපාධියට නියමිත උසස් පාඨමාලාවන් (Advanced Courses) හැදෑරීම සඳහා අතිරේක අධ්‍යයන වසරක් වෙනුවෙන් තෝරා ගනු ලැබෙති.

වෛද්‍ය පීඨය

රුහුණ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටුවා ඇති එකම වෛද්‍ය විද්‍යාලයයි. වර්ෂ 1980 දී ආරම්භ කෙරුණු මෙම වෛද්‍ය පීඨය ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම වෛද්‍ය විද්‍යාලයක් බවට පත්වීම සඳහා දිගු ගමනක නියැලිණි. ශ්‍රී ලංකාවේ අනෙකුත් වෛද්‍ය විද්‍යාලවලින් බිහිවන උපාධිධාරීන්ට නොදෙවෙනි ගුණාත්මක භාවයෙන් යුතු උසස් වෛද්‍ය උපාධිධාරීන් රටට දායාද කර ඇත.

මෙම පීඨයඃ කාය ව්‍යවච්ඡේද විද්‍යා, ජෛව රසායන විද්‍යා, ප්‍රජා වෛද්‍ය විද්‍යා, අධිකරණ වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා, ධාත්‍රික භ්‍රෑත හා නාරීවේද විද්‍යා, ළමා රෝග විද්‍යා, පරපෝෂවේද විද්‍යා, ව්‍යාධි විද්‍යා, භීශක්වේද විද්‍යා, කායික විද්‍යා, මනෝ විද්‍යා, ශල්‍ය විද්‍යා සහ නිර්වින්දන විද්‍යා යන අධ්‍යයනාංශ පහළොවකින් සමන්විත වේ.

මීට අමතරව, දේශන ශාලා, නිබන්ධන කාමර, විද්‍යාගාර, සායනික පුහුණු විද්‍යාගාරය, සායන, තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, පුස්තකාල පහසුකම්, ආපනශාලාව, ක්‍රීඩාගාරය, ක්‍රීඩා භූමිය සහ විශාල ශ්‍රවණාගාරයකින් සමන්විත යටිතල පහසුකම් පීඨයට ඇතුළත් වේ.

පීඨය මඟින් ශිෂ්‍ය ආධාරක සේවා දවස පුරාම ක්‍රියාත්මක කෙරේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් 560 දෙනෙකු සඳහා ප්‍රමාණවත් ලෙස නේවාසික පහසුකම් පීඨ සංකීර්ණය තුළම ලබා දී ඇත.

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් 2008 වර්ෂයේ දී හෙද විද්‍යා, වෛද්‍ය රසායනාගාර විද්‍යා සහ ඖෂධවේද යන විෂය ක්ෂේත්‍රයන් උදෙසා උපාධිධාරීන් පුහුණු කිරීම පිණිස සම සෞඛ්‍ය උපාධි පාඨමාලා වැඩසටහන මූලාරම්භ කරන ලදී. දශක ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තියුණු අවශ්‍යතාවයක්ව පැවති සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි වෙනස්වන ප්‍රවණතාවයන් සමඟ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි දර්ශකයන් ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණුවලින් සමන්විත සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් බිහිකිරීමේ අරමුණු පෙරදැරිව ඉහත උපාධි පාඨමාලාවන් ආරම්භ කරන ලදී. ජාතික මෙන්ම අන්තර්ජාතික රැකියා වෙළඳපොළට ප්‍රවේශවීමේ හැකියාවන් මුදුන්පත් කර ගැනීමට හැකිවන පරිදි ඉහත උපාධි පාඨමාලාවන් සැලසුම් කර ඇත.

වර්ෂ 2017 සැප්තැම්බර් මාසයේ දී ඉහත උපාධි පාඨමාලාවන් රුහුණු විශ්වවිද්‍යාලයේ අභිනව සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙය දක්ෂිණ ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති එකම සම සෞඛ්‍ය විද්‍යා පීඨයයි. රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය දැනට අධ්‍යයන අංශ තුනකින්

සමන්විත වන අතර, එමඟින් ඒවායේ විෂය පථයට අනුකූලව විද්‍යාවේදී හෙද උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර උපාධිය, ඖෂධවේද උපාධිය පිරිනමනු ලැබේ. මෙම සියලු උපාධි පාඨමාලාවන් ඉගැන්වීම හා විභාග කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, ඒ සියල්ල සම්මාන 120 කින් සමන්විත වේ. මේ සියලු උපාධි පාඨමාලාවන් සිව් අවුරුදු පාඨමාලාවන් වන අතර, ඒවායෙහි විෂයය මාලා, ශ්‍රී ලංකා යෝග්‍යතා තීරණ මාර්ගෝපදේශයට ගැළපෙන ලෙස හා අත්‍යවශ්‍ය වන්නා වූ කේවල පර්යේෂණ ව්‍යාපෘති සහ අනුරූපී පුහුණු වැඩසටහන්ගෙන් (රෝහල්, සායනික, ප්‍රජා හා කර්මාන්ත ආශ්‍රිත) සමන්විත වේ.

මෙම පීඨයට අනුබද්ධව නුදුරු අනාගතයේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ නව උපාධි පාඨමාලාවන් හා පශ්චාත් උපාධි පාඨමාලාවන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

ඉංජිනේරු පීඨය

රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට (BScEng Hons) මඟ පාදන පූර්ණකාලීන උපාධි පාඨමාලාවක් ඉදිරිපත් කරයි. උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ හතරක කාලසීමාව තුළ එක් අධ්‍යයන වර්ෂයකට සති 15 බැගින් වූ අධ්‍යයන වාර දෙකක් ලෙස සංවිධානය කර ඇත. සාමාන්‍ය අධ්‍යයන කටයුතුවලට අමතරව පෙර ඉදිරිපත් කරන ලද පරිගණක දැනුවත්භාවය, සමාජ දැනුවත්භාවය සහ වෘත්තීය ඉංග්‍රීසි පාඨමාලාවලින් සමන්විත සංවර්ධන වැඩසටහනක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන උපාධි පාඨමාලා හැදෑරීමට සිසුන් ප්‍රමාණවත් ලෙස සූදානම් කරයි. සියලුම සිසුන් පළමුවාර දෙක තුළ පොදු මූලික පාඨමාලාවක් (CCC) අනුගමනය කළ යුතුය. ඊළඟ අධ්‍යයන වාර හය ඉංජිනේරු විද්‍යා අංශයේ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා විශේෂීකරණය වීමට වෙන් කර ඇත. පොදු මූලික පාඨමාලාව සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව සිසුන්ගේ මනාපයන් සහ පළමු අධ්‍යයන වාර දෙකේ අධ්‍යයන කාලය තුළ පෙන්වන ලද කාර්ය සාධනය මත පදනම්ව පහත ලැයිස්තුගත කර ඇති පරිදි විශේෂීකරණය වූ ක්ෂේත්‍රයක් තෝරා ගැනීමට සිසුන්ට අවකාශ හිමිවෙයි.

(i) සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාව
(ii) පරිගණක ඉංජිනේරු විද්‍යාව
(iii) විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යාව
(iv) නාවික ඉංජිනේරු සහ නෞකා නිර්මාණ
(v) යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව

ඉහත විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන් යටතේ ආවරණය වන විෂයයන් අධ්‍යයන අංශ පහක් විසින් ඉදිරිපත් කරනු ලැබේ. එනම් සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව (DCCE), විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව (DEIE), යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව (DMME), නාවික ඉංජිනේරු හා නෞකා නිර්මාණ අධ්‍යයන අංශය (DMENA) සහ විෂයාන්තර අධ්‍යයන දෙපාර්තමේන්තු (DIS). DCCE, DEIE, DMME සහ DMENA විසින් සපයනු ලබන තාක්ෂණික විෂයයන් වලට අමතරව ප්‍රතීතන අවශ්‍යතා සපුරාලීම සඳහා විෂයාන්තර අධ්‍යාපන දෙපාර්තමේන්තුව (DIS) ඉංජිනේරු ගණිතය, කළමනාකරණය, ඉංජිනේරු ආර්ථික විද්‍යාව, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, කලා වෘත්තීය, ආචාරධර්ම ආදිය සම්බන්ධ පුළුල් පරාසයක විෂයයන් ඉදිරිපත් කරයි.

DCEE/DEIE/DMME/DMENA ඔවුන්ගේ කර්මාන්ත උපදේශන කමිටු (ICCs) හරහා කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ ශක්තිමත් සම්බන්ධතා පවත්වයි. මෙම ක්ෂේත්‍රයේ සේවා යෝජකයින්ගේ සහ වෘත්තිකයන්ගේ නිරන්තර මැදිහත්වීම මඟින් ඉංජිනේරු පීඨය විසින් පිරිනමනු ලබන විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන් එක් එක් විෂය ක්ෂේත්‍රයේ රටේ පවතින වෘත්තීය අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මෑත කාලීන තාක්ෂණික දියුණුව සමඟ ද අඛණ්ඩව යාවත්කාලීන වී ඇත.

ගණිතය, මූලික විද්‍යාව සහ පරිගණකකරණය, සහ ඉංජිනේරු විද්‍යාව සහ ඉංජිනේරු සැලසුම් යන කාණ්ඩවලට අදාළ විෂයයන් මූලික කොටගෙන ප්‍රතිඵල පාදක අධ්‍යාපනය (OBE) සංකල්පය මත පදනම්ව විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්හි විෂයමාලා සකස් කර ඇති අතර එය සාමාන්‍ය හා තාක්ෂණික කාණ්ඩවලට අයත් තෝරා ගත හැකි විෂයයන් සංචිතයකින් අනුපූරක වන අතර අනිවාර්ය කාර්මික සීමාවාසික පුහුණුවකින් සමන්විත වේ.

ඉහත විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන් සඳහා තෝරා ගනු ලබන සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය අරමුණු සමඟ සාර්ථක වීමට අවස්ථාව ලැබෙන අතර එමඟින් පහත වගුවේ දක්වා ඇති පරිදි ඉංජිනේරු වෘත්තිකයන්ගෙන් කෙනෙකු වීමටත් අවස්ථාව ලැබේ.

සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාව	පරිගණක ඉංජිනේරු විද්‍යාව	විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යාව
සිවිල් ඉංජිනේරු වෙරළ හා ජල ඉංජිනේරු පාරිසරික ඉංජිනේරු භූ තාක්ෂණික ඉංජිනේරු මහාමාර්ග හා ප්‍රවාහන ඉංජිනේරු ව්‍යුහාත්මක ඉංජිනේරු	දත්ත විද්‍යා ඉංජිනේරු කාවැද්දූ ඉංජිනේරු ජාල ආරක්ෂක ඉංජිනේරු මෘදුකාංග ඉංජිනේරු පද්ධති ඉංජිනේරු	විදුලි ඉංජිනේරු ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ජාල ඉංජිනේරු විදුලි සංදේශ ඉංජිනේරු

යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව	නාවික ඉංජිනේරු විද්‍යාව සහ නෞකා නිර්මාණ ශිල්පය
යාන්ත්‍රික ඉංජිනේරු ගොඩනැගිලි සේවා (MEP) ඉංජිනේරු ද්‍රව්‍ය ඉංජිනේරු මෙකැට්‍රොනික්ස් ඉංජිනේරු නිෂ්පාදන ඉංජිනේරු	නාවික ඉංජිනේරු නෞකා ගෘහ නිර්මාණ ඉංජිනේරු නෞකා සමීක්ෂණ ඉංජිනේරු නෞකා සැකසුම් ඉංජිනේරු විදුලි බලාගාර ඉංජිනේරු නෞකා බල සම්ප්‍රේෂණ ඉංජිනේරු

තව ද BScEng Hons උපාධි පාඨමාලාවේ සාර්ථක උපාධිධාරීහු රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සහ රටේ හෝ ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන ඕනෑම අදාළ පශ්චාත් උපාධි පාඨමාලාවක් (MEng, MSc, MPhil, DEng හෝ PhD) සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති.

වර්තමානයේ ඉංජිනේරු පීඨය විසින් පවත්වනු ලබන BScEng Hons ඉංජිනේරු උපාධි පාඨමාලාවට "වොෂින්ටන් ගිවිසුම" අත්සන් තැබූ ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය (IESL) විසින් කොන්දේසි විරහිතව "පූර්ණ ප්‍රතීතනය" ලබා දී ඇත. "වොෂින්ටන් ගිවිසුම" විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන වෘත්තීය ඉංජිනේරු උපාධි ප්‍රතීතනය කිරීමේ ජාත්‍යන්තර ගිවිසුමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපාධිධාරීන්ගේ උපාධිය ඕස්ට්‍රේලියාව, කැනඩාව, තායිවානය, හොංකොං, අයර්ලන්තය, ජපානය, කොරියාව, මැලේසියාව, නවසීලන්තය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය වැනි වොෂින්ටන් ගිවිසුමට අත්සන් තැබූ රටවල් විසින් පිළිගැනීමට ලක් වන අතර අනෙකුත් රටවල් වල ද පිළිගැනීමට ලක්වේ.

තාක්ෂණ විද්‍යා පීඨය

තාක්ෂණ විද්‍යා පීඨය ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය, ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය සහ බහු විෂයයික අධ්‍යයනාංශය ලෙස අධ්‍යයනාංශ හතරකින් සමන්විත වේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) තාක්ෂණ විෂය ධාරාව හදාරණ ලද සිසුන්හට පහත දැක්වෙන සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා තාක්ෂණ පීඨය විසින් ඉදිරිපත් කරනු ලබයි.

1. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
3. ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

මෙම සෑම උපාධි පාඨමාලාවක්ම සති 15 කින් සමන්විත සමාසික අටකින් යුක්ත වේ. සෑම උපාධි පාඨමාලාවක්ම අවම වශයෙන් සම්භාර 120 කින් සමන්විත වන අතර සෑම උපාධි පාඨමාලාවක්ම මාස හයක කර්මාන්තගත පුහුණු කාලයකින් ද සමන්විත වේ. බහු විෂයයික අධ්‍යයනාංශය විසින් උපාධි පාඨමාලා ද්විත්වයටම අවශ්‍යවන සම්බන්ධිත විෂයය ඒකක පිරිනමනු ලබයි. සෑම උපාධි පාඨමාලාවක්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු කෙරෙන අතර විෂයය ඒකක පිළිබඳ විස්තර රුහුණු විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

කෘෂිකර්ම පීඨය

රුහුණ විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය 1978 වසරේදී පිහිටුවන ලදුව, වර්තමානය වන විට දකුණු දිග ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අධ්‍යාපනයේ සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය බවට පත්වී ඇත. අධ්‍යනාංශ හතකින් සමන්විත මෙම පීඨය, විද්‍යාත්මක තාක්ෂණික, කළමනාකරණ, ආර්ථික, පාරිසරික සහ සමාජයීය මූලධර්ම උපයෝගී කරගනිමින් ආහාර, සත්වාහාර, කෙඳි සහ ඉන්ධන (ජෛව) ආශ්‍රිත වැඩිවන විශ්ව අවශ්‍යතා සපුරාලීමට දායක විය හැකි විවිධත්වයකින් යුතු හා අභියෝගාත්මක වෘත්තිකයන් බිහිකරනු ලබන්නේ, කෘෂි විද්‍යා ක්ෂේත්‍රය තුළ සම්ප්‍රදායික බෝග වගාව සහ සත්ව පාලනය යන ප්‍රධාන විෂය ධාරාවෙන් ඔබ්බට විහිදී ගිය ප්‍රායෝගික දැනුමෙන් විද්‍යාර්ථීන් පෝෂණය කරමිනි. මෙම අවශ්‍යතා මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන්

රුහුණු විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය පහත නම් සඳහන් උපාධි පාඨමාලා තුන පිරිනමනු ලබයි.

1. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Agricultural Resource Management & Technology)
2. කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Agribusiness Management)
3. හරිත තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Green Technology)

කෘෂි විද්‍යා, පරිසර හා සම්පත් කළමනාකරණ ක්ෂේත්‍ර හා සබැඳෙන අනාගත නායකයින් වෙත උවමනා අධ්‍යාපනික අවබෝධය මෙන්ම නිසි පුහුණුව, සමාජ ආචාරධර්මවලින් ඔවුන් සවිබල ගන්වමින් සහ ප්‍රජාව තුළ මනා බුද්ධිමය දැක්මකින් යුතු වෘත්තිකයන් බිහි කිරීම මෙම පාඨමාලාවන්ගේ ප්‍රධානතම අභිලාෂය වේ. උපාධි පාඨමාලාවන් තුනෙහිම අන්තර්ගත විෂය මාලා මඟින් උපාධිධාරීන්ට වෙළඳපල වටිනාකමක් සහිත අත්දැකීම් සහ අනාගත කෘෂිකාර්මික ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය හැඩගැන්වීම් ලබා දෙනු ලබයි. ක්ෂේත්‍රයට අදාළ නිසි දැනුම සහ පුහුණුව සහිත විශේෂඥ වෘත්තිකයන් විසින් සිදුකරනු ලබන දේශන සහ විද්‍යාගාර සැසි ඇතුළුව වෘත්තීමය පුහුණු, ක්ෂේත්‍ර චාරිකා, උපදේශන සහ ආගන්තුක දේශකයින් මෙහෙයවන පාඨමාලා තුළින් මෙම හුරුව නිරන්තරයෙන් බෙදා දෙනු ලබයි.

1. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

මෙම උපාධි පාඨමාලාව වසර හතරක (සමාසික 8) විශේෂවේදී ගෞරව (SLQF 06 වන මට්ටම) උපාධියක් වන අතර මනා සුදුසුකම් සහිත විද්වත් ආචාර්ය මණ්ඩලයක් මඟින් පෘථුල පරාසයක විෂය මාලාවක් ආවරණය කරනු ලබයි. සාම්ප්‍රදායික සහ ගතානුගතික කෘෂිකාර්මික ක්‍රමෝපායන් වෙනුවට, නවීන තාක්ෂණය සහ කළමනාකරණයට අදාළ දැනුම, ප්‍රායෝගික වැඩ ලෝකයට ගැළපෙන අත්දැකීම් සහ ක්ෂේත්‍ර පර්යේෂණ තුළින් අප උපාධිධාරීන්ට හිමිවේ. මානව සංහතියේ යහ පැවැත්ම සඳහා දේශීය, ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ආහාර, කෙදි හා පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනයේදී පරිසර සම්පත් පිළිබඳ අවධානය සලකමින් කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ඉතා සැලකිල්ලෙන් නිර්මාණය කර ඇත. වර්තමාන ලෝකයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් මෙම සම්පූර්ණ පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදු කරනු ලබයි. ශෂ්‍ය විද්‍යාව, කෘෂි-පරිසර විද්‍යාව, තිරසාර කෘෂිකර්මාන්තය, වන කළමනාකරණය, අපනයන බෝග, වගා බෝග, ක්ෂේත්‍ර බෝග සහ එළවළු නිෂ්පාදන තාක්ෂණය, බෝග භූවමාරු සහ බෝග පර්යේෂණ, අලංකරණ බෝග, ක්ෂුද්‍ර හා සාර්ව ආර්ථිකය, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, කෘෂි අළෙවිකරණය, ආහාර ජෛව රසායනය සහ පෝෂණය, ආහාර පරිරක්ෂණ තාක්ෂණය, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව, ශාක කායික විද්‍යාව, ජාන තාක්ෂණය හා ශාක අභිජනනය, ශාක ආරක්ෂණය, තිරසාර කසල කළමනාකරණය, කෘෂි යාන්ත්‍රීකරණය, කාලගුණ විද්‍යාව හා කාළගුණික වෙනස්වීම් පෙරැයීම, පසු අස්වනු තාක්ෂණය, බෝග ජල සම්පාදනය හා ජල කළමනාකරණය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා ඇතුළත් විෂය මාලාවක් නිසි ඇගයීම් පටිපාටියක් සමඟ ඉගැන්වෙනු ලබයි. සෑම විද්‍යාර්ථියෙකුටම ඔවුන්ගේ අවසන් වසරේදී කීර්තිමත් වෘත්තීය ආයතනයක් හෝ කර්මාන්තයක් ආශ්‍රිත දෙමාසික වෘත්තීමය පුහුණුවක් සහ සය මාසික පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීම අනිවාර්ය වේ. මෙලෙස වැඩ ලෝකයට හැඩගැහෙන උපාධිධාරීන් ජාත්‍යන්තර වශයෙන් මෙන්ම ජාතික තලයේදී දීප්තිමත් සහ සාර්ථක වෘත්තීය අවස්ථාවන්ට හිමිකම් කියන බව විශ්වාසයෙන් සඳහන් කරමු.

2. කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව සිව් අවුරුදු (සමාසික 8ක) විශේෂ ගෞරව උපාධි (SLQF 06 වන අදියර හා සමාන) පාඨමාලාවක් වන අතර මනා සුදුසුකම්ලත් විද්වත් ආචාර්ය මණ්ඩලයක් යටතේ පුළුල් පරාසයක පැතිරෙන විෂය ක්ෂේත්‍ර ගණනාවක් හා ඊට අදාළ න්‍යායාත්මක දැනුම ආවරණය කරනු ලබන්නකි. ඊට අමතරව මෙම උපාධි පාඨමාලාව තුළින් ප්‍රායෝගික කුසලතා හා සබැඳුණු ක්ෂේත්‍ර පර්යේෂණ හරහා උපාධිධාරීන් හට ව්‍යවසායකත්ව හා ව්‍යාපාර කළමනාකරණ අංශයන්හි දොරටු විවර කර දෙයි. මේ හරහා උපාධි අපේක්ෂක සිසුන්ට මූලික කෘෂිකාර්මික සිද්ධාන්ත, කෘෂිකාර්මික නිෂ්පාදන දැනුම, වාණිජ ශක්‍යතා සහ ව්‍යාපාර කළමනාකරණ ඥානය ලබා දෙනු ලැබේ. සම්පූර්ණ උපාධි පාඨමාලාවම ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවන අතර මෙම පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් ලෙස ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව, සාර්ව ආර්ථික විද්‍යාව, කෘෂි යාන්ත්‍රීකරණය, කෘෂිකර්මයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT), සත්වාහාර භෝග නිෂ්පාදන, ව්‍යවහාරික සංඛ්‍යානය, කෘෂි සංවර්ධනය හා ප්‍රතිපත්ති අධ්‍යයනය, පාරිභෝගික චර්යාව, කෘෂි මූල්‍ය අධ්‍යයනය, පසු අස්වනු තාක්ෂණය, ශාක අභිජනනය හා ජාන තාක්ෂණය, පාංශු විද්‍යාව, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, පොත් තැබීම සහ ගිණුම්කරණය, පළතුරු භෝග කළමනාකරණය, ආහාර සහ පොෂණවේදය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය, සත්ව පෝෂණය සහ ආහාර සැපයීම, සන්නිවේදනය හා දැනුම ප්‍රචාරණය, ජාත්‍යන්තර වෙළඳාම, ව්‍යවසායකත්වය, කෘෂි අපනයන භෝග කළමනාකරණය, ආහාර පරිරක්ෂණය හා සැකසුම් තාක්ෂණය, භූසම්පත් කළමනාකරණය, කෘෂි ව්‍යාප්තිය, ආයතනික කළමනාකරණය, පාරිසරික බලපෑම් අධ්‍යයනය, වෘත්තීය මාර්ගෝපදේශනය, මානව සම්පත් කළමනාකරණය, කෘෂි අළෙවිකරණය, පටක රෝපණ විද්‍යාව, උද්‍යාන අලංකරණය, ස්වභාවික සම්පත් කළමනාකරණය, විද්‍යාත්මක ලේඛනය, ධාන්‍ය රසායනය දැක්විය හැක. එමෙන්ම අවසන් වසරේදී සෑම ශිෂ්‍යයෙක්ම මාස 2 ක වෘත්තීය පුහුණුවක් හා මාස 6ක පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පිළිගත් ආයතනවලට අනුයුක්ත කෙරේ. විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ

උපාධිධාරීන් දේශීය විදේශීය ඕනෑම ආයතනයක උසස් තනතුරු පවා හෙබවීමේ ශක්‍යතාවයෙන් පරිපූර්ණ වන අතර ඔවුන්ගේ අනාගත වෘත්තීමය මාවත ඉතා පැහැදිලි සහ සාර්ථක එකක් වනු නොඅනුමානය. නවතම සමීක්ෂණ වාර්තාවලට අනුව මෙතෙක් බිහි වූ විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරීන් මේ වන විටත් පිළිගත් දේශීය හා විදේශීය ආයතනවල රැකියා අවස්ථා උදාකර ගැනීමට සමත්ව ඇත.

3. විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධි පාඨමාලාව

විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධි පාඨමාලාව සිව් අවුරුදු (සමාසික 8ක) විශේෂ ගෞරව උපාධි (SLQF 06 වන අදියර හා සමාන පාඨමාලාවක් වන අතර මනා සුදුසුකම්ලත් විද්වත් ආචාර්ය මණ්ඩලයක් යටතේ පුළුල් පරාසයක පැතිරෙන විෂය ක්ෂේත්‍ර ගණනාවක් හා ඊට අදාළ න්‍යායාත්මක දැනුම ආවරණය කරනු ලබන්නකි. ඊට අමතරව මෙම උපාධි පාඨමාලාව තුළින් ප්‍රායෝගික කුසලතා හා සබැඳුණු ක්ෂේත්‍ර පර්යේෂණ හරහා උපාධිධාරීන්හට නවීන හරිත තාක්ෂණික ක්‍රමවේද හා ඒවායේ වැඩිදියුණුවීම් සම්බන්ධව මනා දැනුමක් ලබා දෙයි. හරිත තාක්ෂණ උපාධිධාරියෙකු යනු දැනට සිදුවෙමින් පවතින හා අනාගතයේ සිදුවීමට නියමිත සංවර්ධන ක්‍රියාදාමයනට අතහිත දීම අරමුණු කර ගනිමින් දේශීය හා විදේශීය විද්‍යා හා තාක්ෂණික වෘත්තීන්ගේ අභිවෘධිය උදෙසා අවම පාරිසරික හානියට අනුබල දෙමින් නූතන නව්‍යකරණ තාක්ෂණික ක්‍රමවේදයන් හැසිරවීමෙහි ප්‍රාගුන්‍යයෙන් හෙබි අයෙකි. මෙම උපාධි පාඨමාලාවම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් හැදෑරිය යුතුවන අතර මෙම පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් ලෙස පරිසර කළමනාකරණය, බලශක්ති විශ්ලේෂණය හා කළමනාකරණය, පුනර්ජනනීය බලශක්තිය, තිරසාර භූමි භාවිතය හා භෝග නිෂ්පාදනය, තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය හා ප්‍රතිචක්‍රීකරණය, නිෂ්පාදන තත්ත්ව කළමනාකරණය, ජෛව නිෂ්පාදන තාක්ෂණය, පරිසර අභිවෘද්ධිය, දේශගුණ විපර්යාස, පාරිසරික ආර්ථික විද්‍යාව, නිෂ්පාදන චක්‍ර අධ්‍යයනය, පාරිසරික ජෛව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, ජල සම්පත් කළමනාකරණය, නිරවද්‍ය කෘෂි තාක්ෂණය (Precision Agriculture), පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, හරිත ගොඩනැගිලි නිර්මාණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා උපාංග, හරිත රසායනය, පාරිසරික පියසටහන්, දත්තගොනු කළමනාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT), භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදනය (GIS and Remote Sensing), ආපදා සහ හරිත විසඳුම්, නව්‍යකරණය හා තාක්ෂණ සම්ප්‍රේෂණය සහ සාධනීය ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය යනාදිය දැක්විය හැක. තව ද අවසන් වසරේදී සෑම ශිෂ්‍යයෙක්ම මාස 3 ක වෘත්තීය පුහුණුවක් හා මාස 6 ක පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පිළිගත් ආයතනවලට අනුයුක්ත කෙරේ. විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධිධාරීන් දේශීය විදේශීය ඕනෑම ආයතනයක උසස් තනතුරු පවා හෙබවීමේ ශක්‍යතාවයෙන් පිරිපුන් වන අතර ඔවුන්ගේ අනාගත වෘත්තීමය මාවත ඉතා පැහැදිලි සහ සාර්ථක එකක් වනු නොඅනුමානය. නවතම සමීක්ෂණ වාර්තාවලට අනුව මෙතෙක් බිහි වූ විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධිධාරීන් මේ වන විටත් පිළිගත් දේශීය හා විදේශීය ආයතනවල උසස් රැකියා අවස්ථා උදාකර ගැනීමට සමත්ව ඇත.

ධීවර සහ සාගර විද්‍යා තාක්ෂණ පීඨය

ධීවර සහ සාගර විද්‍යා සහ සාරස විද්‍යාව හා ජල තාක්ෂණය යන විෂය සංකලනයන් ඔස්සේ උපාධි පාඨමාලා හඳුන්වාදෙන රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති එකම පීඨය රුහුණ විශ්වවිද්‍යාලයේ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයයි. මෙම පීඨය ධීවර සහ ජල ජීවී වගා, සාගර විද්‍යා හා සාගර භූ විද්‍යා සහ සාරස විද්‍යා හා ජල තාක්ෂණ යන අධ්‍යයනාංශ තුනකින් සමන්විතය. සති 15 කින් යුත් සමාසික ක්‍රමය යටතේ මෙම පීඨය අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන අතර පාඨමාලා ඇගයීම් කරනු ලබන්නේ ශ්‍රේණි ලක්ෂය සාමාන්‍ය ක්‍රමය (Credit Based Grade Point Average) මඟිනි. මේ වන විට මෙම පීඨය පහත දැක්වෙන සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා (විශේෂවේදී උපාධි) දෙකක් පවත්වාගෙන යයි.

1. ධීවර සහ සාගර විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - ධීවර විද්‍යාව සහ ජල ජීවී වගා මෙහි විශේෂිත විෂය ක්ෂේත්‍ර වේ.

2. සාගර සහ මිරිදිය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - සාගර විද්‍යාව සහ සාගර භූ විද්‍යාව සහ ජල විද්‍යාව හා තාක්ෂණය මෙහි විශේෂිත විෂය ක්ෂේත්‍ර වේ.

උපාධි පාඨමාලාවෙහි තෙවැනි ස්ථරය ආරම්භයේදී උපාධි අපේක්ෂකයින් හට විශේෂවේදී පාඨමාලා සඳහා තෝරා ගැනීම කළ හැකි අතර ඔවුන් අදාළ විෂය පාඨමාලා සඳහා ලබා ඇති ප්‍රවීනතාවන් මෙහිදී සැලකිල්ලට ගැනේ. උපාධි පාඨමාලාවන්හි අවසාන වර්ෂයේදී ක්ෂේත්‍ර පුහුණුව සහ පර්යේෂණ නිබන්ධන භාරදීම සම්පූර්ණ කළ යුතු වේ.

වැඩි විස්තර සඳහා www.fmst.ruh.ac.lk යන වෙබ් අඩවියට පිවිසෙන්න.

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව (මඩකලපුව)

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
කෘෂිකර්මය	-	E
ජෛවීය විද්‍යාව *	උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, පරිගණක විද්‍යාව	E
භෞතීය විද්‍යාව *	ව්‍ය. ගණිතය, භෞතික විද්‍යාව, ශු. ගණිතය, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව	E
කළමනාකරණය	-	E
වාණිජ්‍යය	-	E
කලා	අරාබි, ඉස්ලාම් අධ්‍යයනය, දේශපාලන විද්‍යාව, දර්ශනය, ලලිත කලා, සමාජ විද්‍යාව, මානව විද්‍යාව, ඉංග්‍රීසි, දෙමළ, භූගෝල විද්‍යාව, සංසංදනාත්මක ආගම්, ආර්ථික විද්‍යා අධ්‍යාපනය, හින්දු ශිෂ්ඨාචාරය, ඉතිහාසය, නාට්‍ය හා රංග කලාව, ක්‍රිස්තියානි	T
හෙද #	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
පරිවර්තන අධ්‍යයනය	-	E/T
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E

විද්‍යා, කෘෂිකර්ම, කළමනාකරණ අධ්‍යයන, කලා සහ සංස්කෘතික පීඨ යටතේ පවත්නා විෂයයන්ගෙන් සංයුක්ත පාඨමාලා හැදෑරීම සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලය අවසර දෙනු ලැබේ.

* පවතින ඉඩපහසුකම් සීමාවන්ට යටත්ව ජෛවීය හා භෞතීය විද්‍යා විෂය ධාරා යටතේ ඇති විෂය ඒකක හැදෑරීමට සිසුන්ට හැකිය.

සුදුසුකම් ලත් හෙද සේවා කාර්යය මණ්ඩලයක් ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ හෙද අධ්‍යාපනය ඉහළ නැංවීම.

විද්‍යා පීඨය

විද්‍යා පීඨය සයමාසික (Semester), පාඨමාලා ඒකක ක්‍රමවේදයක් යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධි පාඨමාලාවක් පවත්වනු ලබන අතර ප්‍රතිඵල පදනම් අධ්‍යාපන ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. එහි උපාධිධාරී ආකෘතියක් සහ පාඨමාලා ප්‍රතිඵලයන්, පාඨමාලාවන් ඉගෙනීමේ අපේක්ෂිත ප්‍රතිඵලයන් සහ, ඉගැන්වීමේ-ඉගෙන ගැනීමේ-ඇගයීමේ ක්‍රමවේදයන් හා අනුගතකොට ඇත. විද්‍යා පීඨය, අවුරුදු 3ක විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සහ අවුරුදු 4ක විද්‍යාවේදී විශේෂ උපාධිය පිරිනමයි. මෙම අධ්‍යයන පාඨමාලා, ප්‍රධාන විෂය ධාරාවන් සහ ඊට අමතරව, උපකාරක, සංවර්ධක හා පරිපූරක (අතිරේක) පාඨමාලාවලින් යුක්ත වේ. විෂය ක්‍රියාදාමයන් පුළුල් වූ විද්‍යා විෂය පථයක් ඔස්සේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් අනුව සිදුකිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ඇත.

විද්‍යා පීඨය, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිත විද්‍යාව සහ සත්ත්ව විද්‍යා යන අධ්‍යයන අංශයන්ගෙන් සමන්විත වන අතර, පහත සඳහන් උපාධි පාඨමාලාවන් පිරිනමයි.

- විද්‍යාවේදී
- උද්භිද විද්‍යාව - විද්‍යාවේදී ගෞරව
- රසායන විද්‍යාව - විද්‍යාවේදී ගෞරව
- පරිගණක විද්‍යාව - විද්‍යාවේදී ගෞරව
- ගණිතය - විද්‍යාවේදී ගෞරව

- භෞතික විද්‍යාව - විද්‍යාවේදී ගෞරව
- සත්ත්ව විද්‍යාව - විද්‍යාවේදී ගෞරව

පළමු සහ දෙවන අධ්‍යයන වසරවල ප්‍රතිඵල මත, අවම සුදුසුකම් සපුරන ශිෂ්‍යයන් අතුරින්, ඉතා සීමිත ශිෂ්‍යයන් ප්‍රමාණයක් විද්‍යාවේදී විශේෂ උපාධි සඳහා තෝරාගනු ලබයි.

පළමු අධ්‍යයන වසර ආරම්භයේදී ශිෂ්‍යයන් පහත සඳහන් විෂය සංකලනයන් යටතේ, ලබාගත හැකි උපාධි සහ ශ්‍රී ලංකා ප්‍රමිති මට්ටම පහත වගුවේ සටහන් කර ඇත.

පළමු වසරේදී පිරිනමනු ලබන විෂය සංකලන	**ප්‍රමිති මට්ටම - 5**	**ප්‍රමිති මට්ටම - 6**
භෞතික විද්‍යා අංශය	විද්‍යාවේදී සාමාන්‍ය ප්‍රධාන විෂයන් 2ක් හෝ 3ක් සමඟ (ඉතිරි පාඨමාලා ඒකක අතිරේක හෝ, ප්‍රධාන විෂය ධාරාවන්ගෙන් සම්පූර්ණ කළ යුතුය.)	
රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය- I		විද්‍යාවේදී ගෞරව (රසායන විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (භෞතික විද්‍යාව)
රසායන විද්‍යාව, ගණිතය- I, ගණිතය- II		විද්‍යාවේදී ගෞරව (ගණිත විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (රසායන විද්‍යාව)
පරිගණක විද්‍යාව, ගණිතය- I, ගණිතය- II		විද්‍යාවේදී ගෞරව (ගණිත විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (පරිගණක විද්‍යාව)
ගණිතය- I, ගණිතය- II, භෞතික විද්‍යාව		විද්‍යාවේදී ගෞරව (ගණිත විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (භෞතික විද්‍යාව)
පරිගණක විද්‍යාව, ගණිතය- I, භෞතික විද්‍යාව		විද්‍යාවේදී ගෞරව (භෞතික විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (පරිගණක විද්‍යාව)
රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය- I		විද්‍යාවේදී ගෞරව (රසායන විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (පරිගණක විද්‍යාව)
ජීව විද්‍යා අංශය		
උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව		විද්‍යාවේදී ගෞරව (උද්භිද විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (රසායන විද්‍යාව) විද්‍යාවේදී ගෞරව (සත්ත්ව විද්‍යාව)

භෞතික විද්‍යා අංශයේ සමහර විෂය සංකලනයන් ලබා ගැනීම තරඟකාරී වේ.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ඔලුවිල්)

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කලා	ආර්ථික විද්‍යාව, දර්ශනය සහ මනෝ උපදේශනය, සමාජ විද්‍යාව, ඉතිහාසය, සංඛ්‍යානය, දෙමළ, ඉංග්‍රීසි, සිංහල, හින්දු ශිෂ්ඨාචාරය, භූගෝල විද්‍යාව, භූගෝලීය තොරතුරු පද්ධතිය, දේශපාලන හා සාමය අධ්‍යයනය, නිලබල ක්‍රමය හා රාජ්‍ය ප්‍රතිපත්ති, ත්‍රිභාෂා අධ්‍යයනය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම.	T
කළමනාකරණය ☞	-	T/E
වාණිජ්‍යය	-	T/E
කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) ➹	-	E
ජෛවීය විද්‍යාව #	ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යවහාරික සංඛ්‍යානය, භෞතීය විද්‍යාව, පාංශු විද්‍යාව, පරිගණක විද්‍යාව සහ අනිවාර්ය විෂයයන්, සහ වෛකල්පිත විෂයයන් *	E
ඉංජිනේරු විද්‍යාව	-	E
භෞතීය විද්‍යාව #	පරිගණක විද්‍යාව, ගණිතය 1, ගණිතය 11, ව්‍යවහාරික සංඛ්‍යානය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පාංශු විද්‍යාව, අනිවාර්ය සහ වෛකල්පිත විෂයයන් *	E
ඉස්ලාම් අධ්‍යයනය	ඉස්ලාමීය චින්තනය හා ශිෂ්ටාචාරය, ඉස්ලාමීය බැංකුකරණය හා මුදල්, ඉස්ලාමීය නීතිය හා නීති සම්පාදනය, ඉංග්‍රීසි, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, දෙමළ, ගණකාධිකරණය හා මුදල්, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන	T/E
අරාබි භාෂාව	භාෂාව හා සාහිත්‍යය, වාග් විද්‍යාව හා පරිවර්තනය, ඉංග්‍රීසි, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, දෙමළ, ගණකාධිකරණය හා මුදල්, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන	A/T/E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E

☞ කළමනාකරණ සහ වාණිජ පීඨය මඟින් උපාධි පාඨමාලා BBA, B.COM සහ B.Sc in MIT වශයෙන් පිරිනමයි. BBA සහ B.COM යන උපාධි පාඨමාලා විශේෂ උපාධි ලෙස වසර 4 ක කාලයක් තුළ ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වයි. BBA උපාධි පාඨමාලාව විශේෂවේදී ගණකාධිකාරී, මූල්‍ය, තොරතුරු පද්ධති, අලෙවිකරණ සහ මානව සම්පත් කළමනාකරණ ලෙස පවතියි. B.Sc in MIT වසර 3 ක උපාධි පාඨමාලාවක් වන අතර එය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වයි.

* අනිවාර්ය සහ වෛකල්පිත විෂයයන් ලෙස ඉංග්‍රීසි, ගණිතය සඳහා ජීවවිද්‍යාව, ජීවවිද්‍යාව සඳහා ගණිතය, මූලික පාරිසරික විද්‍යාව, සමාජ ප්‍රසංවාදය, වෘතීය ප්‍රවර්ධනය, මූලික සංඛ්‍යානය, සංඛ්‍යාත්මක ගණිතය, තොරතුරු තාක්ෂණය, ආතති කළමනාකරණය, තොරතුරු සාක්ෂරතාව, මූලික කාලගුණ විද්‍යාව, ධූලකවේදය හඳුන්වාදීම, කාර්ය රීතිය හා ඵලදායී සන්නිවේදනය, ආර්ථික විද්‍යා මූලධර්ම, නායකත්ව සහ සාමූහික ක්‍රියා කළමනාකරණ මූලධර්ම, පර්යේෂණ ක්‍රමවේද, ව්‍යාපෘති විශ්ලේෂණය, ජෛව ආචාරධර්ම, සාමය හා ගැටුම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, කඩිනම් කර්මාන්ත පුහුණු අභ්‍යාසය ඉගැන්වේ.

\# ව්‍යවහාරික විද්‍යා පීඨය, ජීව විද්‍යා අංශය, රසායන විද්‍යා අංශය, ගණිත අංශය සහ භෞතික විද්‍යා අංශය ලෙස අංශ 4 කින් සමන්විත වන අතර පීඨය මඟින් තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක් සහ ව්‍යවහාරික ජීව විද්‍යාව, ව්‍යවහාරික සංඛ්‍යානය, උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන්ගෙන් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවන් පිරිනමයි. අමතරව ව්‍යවහාරික විද්‍යා සිව් අවුරුදු ගෞරව උපාධිය ලබා ගත හැක.

➢ *කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)*

1. අලෙවිකරණය, මූල්‍ය, කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පසුබිමක් සහිතව ව්‍යාපාර උපාය මාර්ග, ව්‍යාපාර සංවර්ධනය, ජනතාව හා සංවිධාන කළමනාකරණය, ව්‍යාපෘති හා මෙහෙයුම් සම්බන්ධ කළමනාකරණ සංකල්ප ඵලදායීව යොදා ගැනීමට හැකියාව ලැබෙන්නා වූ තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර පද්ධති සහ ආකෘති හා විශ්ලේෂණ පිළිබඳ මූලික කුසලතා සංවර්ධනය කිරීමට

2. කළමනාකරණ දැනුම වැඩි කිරීමට උපකාරීවන තොරතුරු තාක්ෂණ කුසලතා භාවිතා කිරීමෙන් දේශීය සංවිධාන, ගෝලීය වෙළඳපළ තුළ සාර්ථක ලෙස තරඟකාරීව ක්‍රියාත්මක වීමට

3. ප්‍රායෝගික සිද්ධි අධ්‍යයනයන් හා පැවරුම් ආදියෙන් තමන් ලද අධ්‍යයනයන් පරිපූර්ණය කරමින් පංති කාමරය ඉගෙනුම් සඳහා වන ප්‍රායෝගික විද්‍යාගාරයක් බවට පත්කිරීම සඳහා තෝරා ගත් කාර්ය බද්ධ ක්ෂේත්‍රවල ස්ථීර සෛද්ධාන්තික පසුබිමක් සහිත සුදුසුකම් ඇති අය බවට කළමනාකරුවන් පත් කිරීම

4. ඉගැන්වීම, පර්යේෂණ කිරීම හා කර්මාන්තයට ව්‍යාප්ති සේවාවන් ලබාදීම ආදියෙහිදී සක්‍රීයව නිරතවීමට ශිෂ්‍යයන් හා ආචාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට

5. රටේ තොරතුරු තාක්ෂණය සඳහා මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට

තාක්ෂණ පීඨය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය මඟින් තාක්ෂණ විෂය ධාරාව සඳහා පහත සඳහන් ගෞරව උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

1. කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය [BBST(Hons)]
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය [BICT(Hons)]

අදාළ උපාධි පාඨමාලා දේශන, රසායනාගාර හා ක්ෂේත්‍ර අධ්‍යයනයන්, සම්මන්ත්‍රණ, කාර්මික පුහුණු සැසි, පර්යේෂණ, නවෝත්පාදන, ව්‍යාපාර, නිපැයුම් සංවර්ධන හා පද්ධති සංවර්ධනය ආදී ව්‍යාපෘතීන්ගෙන් සමන්විත වේ. අන්තර්ජාල පහසුකම් මඟින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේද සවිමත් කරනු ලැබේ. එසේම, රසායනාගාර හා ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තා, ස්වයං අධ්‍යයන (පුස්තකාල, ක්ෂේත්‍ර අධ්‍යයන, තනි හා කණ්ඩායම් පැවරුම්), විශාල හා කුඩා කණ්ඩායම් සාකච්ඡා, නිබන්ධන සාකච්ඡා ආදිය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය නැංවීම සඳහා භාවිතා කෙරේ.

කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන්, කෘෂි තාක්ෂණය හා සම්බන්ධ වූ අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ පුළුල් දැනුමක් හා කුසලතාවයන්ගෙන් සම්පූර්ණ වේ. තව ද, මෙම උපාධිධාරීන්ට විද්‍යා හා තාක්ෂණ සහ කළමනාකරණ කුසලතා ඒකාබද්ධ කිරීම මඟින් නූතන කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා බැදුණු නිෂ්පාදන හා සේවා අංශ වෙත සම්බන්ධ විය හැකිය.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන් තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ භාවිතය සඳහා අදාළ වන තාක්ෂණික හා කළමනාකරණ නිපුණත්වයෙන් සම්පූර්ණ වේ. එසේම මෙම උපාධි පාඨමාලාව සීඝ්‍රයෙන් දියුණුවන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා අනුගත විය හැකි උපාධිධාරීන් බිහිකිරීම සඳහා ඉවහල් වේ.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (මිහින්තලේ)

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
කලා *	-	S
කළමනාකරණය	-	S/E
කෘෂිකර්මය #	-	E
ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) +	-	E
ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) +	-	E
සෞඛ්‍ය ප්‍රවර්ධන	-	E
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT)	-	E
සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E

*සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය **

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය විසින් පහත සඳහන් උපාධි පාඨමාලා 08 පිරිනමනු ලැබේ.

අනු අංකය	උපාධි පාඨමාලාව	සංක්ෂේපණය	කාල සීමාව	මාධ්‍යය
01	ශාස්ත්‍රවේදී සාමාන්‍ය	BA	වසර 03	සිංහල
02	ශාස්ත්‍රවේදී ගෞරව ඉතිහාසය	BAHons (Hist)	වසර 04	සිංහල
03	ශාස්ත්‍රවේදී ගෞරව පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය	BAHons (Archae)	වසර 04	සිංහල
04	ශාස්ත්‍රවේදී ගෞරව ආර්ථික විද්‍යාව	BAHons (Ec)	වසර 04	ඉංග්‍රීසි
05	ශාස්ත්‍රවේදී ගෞරව පරිසර කළමනාකරණය	BAHons (Env Mgt)	වසර 04	ඉංග්‍රීසි
06	ශාස්ත්‍රවේදී ගෞරව ජන සන්නිවේදනය	BAHons (Mass Comm)	වසර 04	සිංහල
07	ශාස්ත්‍රවේදී ගෞරව සිංහල	BAHons (Sinhala)	වසර 04	සිංහල
08	ශාස්ත්‍රවේදී ගෞරව සමාජ විද්‍යාව	BAHons (Sociol)	වසර 04	සිංහල/ඉංග්‍රීසි

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය විසින් ප්‍රධාන විෂයයන් 18ක් ඔස්සේ විෂයය විශේෂිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව පිරිනමනු ලබයි. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාවේ පළමු වසර පළමු සාමාසිකය සඳහා ස්වකීය අභිරුචිය අනුව විෂයයන් තුනක් තෝරා ගැනීමට විද්‍යාර්ථීන්ට අවසර ලැබේ. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් දෙවන වසර පළමු සමාසිකයේදී එම විෂයයන් තුනෙන් එක් ප්‍රධාන විෂයයක් තෝරා ගෙන ඔහුගේ/ඇයගේ ව්‍යාපෘති වාර්තාව සම්පූර්ණ කළ යුතුය. සෑම විෂයයක් සඳහාම සමාන අර්ඝ සීමාවක් වෙන්කර ඇත. විද්‍යාර්ථීන් තෙවන වසර දෙවන සාමාසිකයේදී කාර්මික පුහුණුව හා ස්වාධීන පර්යේෂණ සම්පූර්ණ කළ යුතුය.

ප්‍රධාන විෂයයන් පහත පරිදි වේ.

පුරාවිද්‍යාව, චීන භාෂාව, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, පරිසර කළමනාකරණය, ප්‍රංශ භාෂාව, හින්දි භාෂාව, ඉතිහාසය, ජපන් භාෂාව, කළමනාකරණය, ජන සන්නිවේදනය, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, සංඛ්‍යානය, සංචාරක කළමනාකරණය, ජල සම්පත් කළමනාකරණය, උරුම කළමනාකරණය.

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

පළමු වසර පරීක්ෂණයේ කාර්යසාධනය අනුව විද්‍යාර්ථීන් ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබේ. දෙවන වසරේ සිට ඔවුන් තෝරාගත් විශේෂ විෂයය ක්ෂේත්‍රයට අදාළව අධ්‍යයන කටයුතු කළ යුතුය. ඔවුන් සිය සිව්වන වසර දෙවන සාමාසිකයේදී ස්වාධීන පර්යේෂණය සම්පූර්ණ කළ යුතුය.

කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් පහත සිව් අවුරුදු උපාධි පාඨමාලා 06 ප්‍රධානය කරනු ලබයි. මෙම සියලු පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබයි.

1. ගණකාධිකරණ හා මූල්‍ය - විද්‍යාවේදී ගෞරව
2. ව්‍යාපාර කළමනාකරණ - විද්‍යාවේදී ගෞරව
3. සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය - විද්‍යාවේදී ගෞරව
4. අළෙවි කළමනාකරණ - විද්‍යාවේදී ගෞරව
5. මානව සම්පත් කළමනාකරණ - විද්‍යාවේදී ගෞරව
6. තොරතුරු පද්ධති - විද්‍යාවේදී ගෞරව

සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ - විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලබයි.

අනෙකුත් උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් තෝරා ගැනීම Z - අගය, සිසුවාගේ වරණය සහ දිස්ත්‍රික් කුසලතාවය පදනම් කරගෙන සිසුන් පීඨයෙහි ලියාපදිංචි වන අවස්ථාවේදී සිදු කරනු ලබයි.

කෘෂි විද්‍යා පීඨය

කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

\# මෙම උපාධි පාඨමාලාව සකස් කර ඇත්තේ ක්ෂේත්‍රයේ නූතන අවශ්‍යතාවන්ට සරිලන පරිදි කෘෂිකර්මය පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක සහ න්‍යායාත්මක දැනුමක් සහිත ප්‍රායෝගික නිපුනතාවයන්ගෙන් හෙබි ආකල්පමය අතින් පරිපූර්ණ උපාධිධාරියකු බිහිකිරීම උදෙසා වේ. මෙය වසර හතරක ගෞරව උපාධි පාඨමාලාවක් වන අතර එහි පළමු සමාසික පහ තුළ බෝග නිෂ්පාදනය හා කළමනාකරණය, කෘෂිකාර්මික සත්ව පාලනය, පාංශු විද්‍යාව, ජල කළමනාකරණය, කෘෂි ඉංජිනේරු විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව, ජෛව තාක්ෂණය, කීට විද්‍යාව සහ ව්‍යාධිවේදය සහ උද්‍යාන අලංකරණය යන ක්ෂේත්‍ර පිළිබඳව සෛද්ධාන්තික සහ ප්‍රායෝගික දැනුමක් ලබා දෙනු ඇත. අනතුරුව එළැබෙන සමාසික දෙක තුල කෘෂි ඉංජිනේරු විද්‍යාව, පාරිසරික පාංශු කළමනාකරණය, කෘෂි ආර්ථික විද්‍යාව සහ ව්‍යාපෘතිය, කෘෂි පද්ධති කළමනාකරණය, සත්ව නිෂ්පාදන තාක්ෂණය, ආහාර සහ පසු අස්වනු තාක්ෂණය, බෝග විද්‍යාව සහ කෘෂි කාර්මික ජීව විද්‍යාව යන ක්ෂේත්‍ර අතුරින් එක් ක්ෂේත්‍රයක් උපාධි පාඨමාලාවේ විශේෂ ක්ෂේත්‍රය ලෙස තෝරා ගත හැක.

මෙම උපාධි පාඨමාලාවේ අවසන් සමාසිකය තුල සිසුන් විසින් ස්වාධීනව පර්යේෂණ ව්‍යාපෘතියක් කර එහි වාර්තාව ඉදිරිපත් කල යුතුය. එසේම සිසුන් සඳහා රජයේ සහ පිළිගත් පෞද්ගලික ආයතන තුළ විශේෂ වෘත්තීය පුහුණුවක් ද ලබා දෙනු ඇත.

වසර හතරක උපාධි පාඨමාලාව තුළ සිසුන්ගේ ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා විශේෂිත පාඨමාලාවන් හඳුන්වාදී ඇත.

කෘෂිකර්මයට සම්බන්ධ සියළු ක්ෂේත්‍රයන්හි පැතිරුනු දැනුමක් සහිත සඵල උපාධිධාරියෙකු බිහිකිරීම මෙම පාඨමාලාවේ අවසන් අරමුණ වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨය

\+ ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි පාඨමාලා ඒකක ක්‍රමයක් (course unit system) ක්‍රියාත්මක වේ. එක් ශිෂ්‍යයකු අවම වශයෙන් එක් අවුරුද්දකට සම්මාන වටිනාකම් (Course Credits) 30 වනසේ පාඨමාලා ඒකක තෝරා ගත යුතුයි. පහත සඳහන් විෂයයන් අතුරින් ප්‍රථම වර්ෂයේ දී සහ දෙවන වර්ෂයේදී තෝරා ගත හැකි

විෂය සංයෝජන කීපයක්ම ඇත; ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය. තුන්වන සහ හතරවන වර්ෂයන්හිදී පහත සඳහන් ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත විෂය සංයෝජන තෝරා ගත හැකිය; ව්‍යවහාරික ජීව විද්‍යාව, ව්‍යවහාරික උද්භිද විද්‍යාව, ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව, ව්‍යවහාරික භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, කාර්මික රසායන විද්‍යාව, කාර්මික ගණිතය, මූල්‍යමය ගණිතය.

සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධි පාඨමාලාව

අග්නිදිග ආසියාවේ එකම සෞඛ්‍ය ප්‍රවර්ධන සාමාන්‍ය හා ගෞරව උපාධි පාඨමාලාව පිරිනමනු ලබන්නේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයෙන් පමණි. සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු, තනි පුද්ගලයන්ගේ සහ ප්‍රජාවේ සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට ඉතා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමයක් ලෙස මේ වන විට ලොව බොහෝ රටවල් විසින් පිළිගෙන ඇති ප්‍රජා මූලික ක්‍රියාවලියකි. එමෙන්ම සංවර්ධන අභියෝග යන් ජයගැනීමටත්, ප්‍රජාවේ සාමාජිකයින්ගේ ආකල්ප හා ක්‍රියාපිළිවෙත් වෙනස් කිරීමටත් හැකි ක්‍රමවේදයකි.

අධ්‍යයන පාඨමාලාවේ අරමුණ වන්නේ, යහපැවැත්ම හා සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාවලිය නිවැරදිව ක්‍රියාත්මක කළ හැකි නිපුණතාවන් සහිත ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෘත්තිකයන් බිහි කිරීමයි. එමෙන් ම ජනතාවගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීමට ඵලදායී කාර්ය භාරයක් ඉටුකිරීම සඳහා දැනුම සහ කුසලතාවයන් සහිත සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය සුදුසුකම් ලැබෙනු ඇත.

විෂය මාලාව, න්‍යායාත්මක හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර, න්‍යායාත්මක දැනුම, ප්‍රජාව සමඟ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් කිරීමට පුළුල් අවබෝධයක් හා අත්‍යවශ්‍ය දැනුම සැපයීම සඳහා නිර්මාණය කර ඇත. මෙම අධ්‍යයන වැඩසටහන පිළිගත්, සුවිශේෂී වූ ක්‍රමවේදයක් අනුගමනය කරන අතර ප්‍රජා මූලික සෞඛ්‍ය ප්‍රවර්ධන මූලධර්ම හරහා ප්‍රජාව සමඟ සිදු කරන ක්ෂේත්‍ර හා සාමූහික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. එමෙන්ම, ප්‍රජාවේ සෞඛ්‍ය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාවලි සැළසුම් කිරීමටත්, මැදිහත් වීමටත් සහ විවිධ පාර්ශ්වකරුවන් හා එක්ව වැඩකටයුතු කිරීමටත්, උපාධි අපේක්ෂකයින් උනන්දු කරනු ලැබේ. උපාධි පාඨමාලාව අවසානයේ දී උපාධිධාරීන්හට ප්‍රජාව හා තනි පුද්ගලයන්ට බලපාන විවිධ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන උපාය මාර්ග, වැඩසටහන් හා ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ඇගයීමේ හැකියාව ලැබෙනු ඇත. මීට අමතරව, උපාධි අපේක්ෂකයින්ට ළමා යහපැවැත්ම වැඩි දියුණු කිරීම, මන්ද පෝෂණය අවම කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, ඇතුළු බෝ නොවන රෝග වැළැක්වීම, සිය දිවි නසාගැනීම අවම කිරීම සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වැනි ජාතික හා ගෝලීය වශයෙන් වැදගත් ප්‍රධාන ක්ෂේත්‍රයන් ඇමතීමට නිපුණතාවන් වැඩි දියුණු වනු ඇත.

තාක්ෂණ පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය 2017 ජූනි මස 30 වන දින මිහින්තලා පරිශ්‍රයේදී පිහිටුවන ලදී. වර්තමානයේ පීඨය දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ. ඒවා නම්,

- ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Bioprocess Technology)
- ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Food Technology)
- විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Electrical & Electronics Technology)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Information and Communication Technology)
- ද්‍රව්‍ය තාක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Materials Technology)

තාක්ෂණ පීඨය මඟින් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුනක් (Three Major Subjects) යටතේ පහත සඳහන් ගෞරව උපාධි පාඨමාලා (Honours Degrees) පහක් ප්‍රධානය කරනු ලබයි (SLQF Level 6). පළමු වසරට ඇතුළත් වන සිසුන් එම වර්ෂයට අයත් වර්ෂාර්ධ (Semester) දෙක තුළදී සියලු දෙනා පොදු පාඨමාලාවට (Common Course) අයත් අනිවාර්ය විෂය ධාරාවන් (Compulsory Subjects)හැදෑරිය යුතු අතර එම පළමු වසර අවසානයේදී සිසුන් විසින් ලබාගන්නා කාර්යසාධන මට්ටම [Grade Point Average(GPA)] පදනම් කරගෙන ඔවුන්ගේ ස්වකීය කැමැත්ත මත දෙවන වසර සිට පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් සඳහා ලියාපදිංචි වී තම උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ හැකිය.

උපාධි පාඨමාලාව	ප්‍රධාන විෂය ක්ෂේත්‍රය
ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව Bachelor of Bio Systems Technology Honours [BBST(Hons)]	ජෛව සැකසුම් තාක්ෂණය Bioprocess Technology
	ආහාර තාක්ෂණය Food Technology
ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව Bachelor of Engineering Technology Honours [BET(Hons)]	විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය Electrical & Electronics Technology
	ද්‍රව්‍ය තාක්ෂණය Materials Technology
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව Bachelor of Information and Communication Technnlogy Honours	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය Information and Communication Technology

මෙහිදී ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමයේ [Biotechnology Industry Association(NBIA)] නිර්මිත අවශ්‍යතා (accreditation requirements) මත ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලා [Bachelor of Biosystems Technology Honours(BBST(Hons))] Degrees සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා පරිගණක සංගමයේ [Computer Society of Sri Lanka(CSSL)] නිර්මිත අවශ්‍යතා (accreditation requirements) මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලා [Bachelor of Information and Communication Technology Honours (BICT (Hons))] Degrees සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ [Institution of Engineers Sri Lanka(IESL)] නිර්මිත අවශ්‍යතා (accreditation requirements) මත ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලා [Bachelor of Engineering Technology Honours (BET (Hons))] Degrees සැලසුම් කර ඇති අතර සිඩ්නි එකඟතාවයෙහි (Sydney Accord) අවශ්‍යතා සපුරාලනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (***BBST Honours Degree in Bioprocess Technology***)

ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලා මඟින් කෘෂිකාර්මික, වෛද්‍ය, ආහාර හා කාර්මික ජෛව තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි සංවර්ධන ක්‍රියාවලි හා ගැටලු විසඳීම සඳහා බහුවිධ ප්‍රවේශයක් ළඟාකර දේ. මෙම උපාධි වැඩසටහන මඟින් ජෛව ප්‍රතික්‍රියාකාරක ක්‍රියාකාරීත්වය සහ සැලසුම, ඉලෙක්ට්‍රෝන ස්කෑනින් (SEM) සහ ප්‍රතිදීප්ත අන්වීක්ෂ පිළිබඳ දක්ෂතා, ක්ෂුද්‍ර හැසිරවීම පිළිබඳ හා ජාන තාක්ෂණය මත පදනම් වූ පරිවර්තන පිළිබඳ නිපුණතාවය, UPLC -MS/MS මත පදනම් වූ පරිවෘත්තීය වැනි නවීන තාක්ෂණය යන නිපුණතා ලබා දේ. මෙම වර්තමාන උපාධි පාඨමාලාවේ විෂයමාලාව (Curriculum) සකස් කිරීමේදී චාල්මර්ස් තාක්ෂණ විශ්වවිද්‍යාලය (Chalmers University of Technology) ස්වීඩන්, සහ වැගන්නිගන් පර්යේෂණ විශ්වවිද්‍යාලය [Wegeningen University Research(WUR)], නෙදර්ලන්තය යන විශ්වවිද්‍යාල හා කාර්මික ආයතනවල ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර විද්වතුන්ගේ සහ ප්‍රවීනයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන ඇත. තවද ජාත්‍යන්තර තලයේ උසස් අධ්‍යාපන ආයතන වන ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් ස්ටේට් විශ්වවිද්‍යාලය (Michigan State University, USA), දකුණු කොරියාවේ චුන්නම් සහ ජේජු විශ්වවිද්‍යාල (Chunnam and Jeju University, South Korea) හා සමඟ තිබෙන සහයෝගීතාව (MoUs) පදනම් කරගෙන මෙම උපාධි වැඩසටහන ජෛව සැකසුම් තාක්ෂණයේ නවතම වර්ධනයන්ට සමගාමීව පර්යේෂණ හා ඉගැන්වීම පිළිබඳ ගෝලීය ඉදිරි දැක්මක් ලබාදේ. මෙම උපාධි වැඩසටහන් සාර්ථකව නිමකරන සිසුන්ට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ මහගු අවස්ථාවක් ලැබේ.

- ජෛව සැකසුම් තාක්ෂණ උපදේශකයින් (Bioprocess Technology Consultants)
- ජෛව සැකසුම් තාක්ෂණවේදීන් (Bioprocess Technologist)
- ජෛව සැකසුම් නිෂ්පාදන කළමනාකරුවන් (Bioprocess Product Managers)
- ජෛව සැකසුම් ශිල්පීන් (Bioprocess Technicians)
- ජෛව සැකසුම් නිෂ්පාදන සංවර්ධකයින් (Bioprocess Product Developers)
- ජෛව තාක්ෂණවේදීන් (Biotechnologist)

- ජෛව තොරතුරු තාක්ෂණ හා පරිගණක ජීව විද්‍යාඥයින් (Bioinformatics & Computational Biologist)
- ඖෂධ නිර්මාණකරුවන් (Drug Designers)
- කථිකාචාර්යවරුන් සහ පර්යේෂණ නිලධාරීන් (Lecturers & Research Officers)

ආහාර තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (***BBST Honours Degree in Food Technology)***

ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ අධ්‍යයන අංශයක් වන අතර ආහාර තාක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමටත් ආහාර තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කිරීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය ජීවිතය ගොඩනගා ගැනීමටත් දායකවීමටත් කටයුතු කරයි. මෙම පාඨමාලාව තුළින් ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පර්යේෂණ පවත්වන අතර ආහාර කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයට සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමට කටයුතු කරනු ලබයි. ආහාර තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය ක්‍රියාකාරී ආහාර හා ආහාර විෂ ද්‍රව්‍ය (Functional Food & Food Toxicology), ආහාර ඉංජිනේරු (Food Engineering), ආහාර ජෛව තාක්ෂණය (Food Biotechnology), ආහාර පෝෂණය (Food Nutrition), සූපශාස්තර හා සංවේදක විද්‍යාව (Culinary & Sensory Science) සහ ආහාර නියමු කම්හල (Food Pilot Plant) යන විද්‍යාගාර හය මඟින් සිදු කරයි. ගොවිපලේ සිට ආහාර මේසය දක්වා ආහාරවල භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ගුණාංග පිළිබඳව රසායන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හා වෙනත් මූලික විද්‍යාවන් භාවිතා කරමින් හැදෑරීමක් මෙම පාඨමාලාවෙන් සිදු කරනු ලබයි.

මෙම උපාධි පාඨමාලාව මඟින් ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පර්යේෂණ කෙරෙහි වැඩිපුර අවධානයක් යොමුකර ඇති අතර ආහාර රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව, ක්‍රියාකාරී ආහාර, ආහාර සුරක්ෂිතතාව, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව, ධාන්‍ය, කිරිවිද්‍යා තාක්ෂණය, ආහාර ආකලනය සහ පෝෂණය ඇතුළු රාජ්‍ය හා ආහාර කර්මාන්තවල අවශ්‍යතා සපුරාලීමට සිසුන්ට දැනුම ලබා දේ. මෙම පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කරන උපාධිධාරීන්ට ආහාර සැකසුම් කර්මාන්තය, උපදේශනය, ඉගැන්වීම, තාක්ෂණික විකුණුම් සහ සේවා, කළමනාකරණය, පරීක්ෂාව, රජයේ ආයතන හෝ පෞද්ගලික අංශය විසින් සපයනු ලබන ෆුඩ් සිටි සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් රැකියා අවස්ථාවන් ලබා ගැනීමට හැකියාව ලැබේ.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (***BET Honours Degree in Electrical & Electronics Technology)***

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම තුළින් එම උපාධිධාරීන්ට දේශීය හා ජාත්‍යන්තර කර්මාන්තවල වෘත්තීන්හි නිරතවීමටත්, විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ යන ක්ෂේත්‍රවල ව්‍යවසායකයෙකු වීමට හැකියාව ලැබේ. මෙම උපාධි පාඨමාලාව හැදෑරීම මඟින් පහත සඳහන් දැඩි ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයන්හි දැනුම හා කුසලතා ලැබෙනු ඇත.

- විදුලි තාක්ෂණය (Electrical Technology)
- ඉලෙක්ට්‍රොනික තාක්ෂණය (Electronic Technology)
- කෙටුම්පත විදුලි සංදේශ (Telecommunication)
- රොබෝ සහ ස්වයංක්‍රීයකරණය (Robotic & Automation)

උපාධි පාඨමාලාවේ පළමු දෙවසර තුළ සිසුන්ට ඉතා ප්‍රායෝගික වාතාවරණයක් තුළින් විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ මූලික සංකල්ප ආවරණය කරනු ලබයි. තෙවන වසර මුල් වර්ෂාර්ධයේ දී සිසුන්ට විදුලි හා ඉලෙක්ට්‍රොනික යන අංශවල විවිධ ක්ෂේත්‍රයන් හඳුන්වා දෙනු ලබයි. තෙවන වසර දෙවන වර්ෂාර්ධයේ දී සිසුන් මාස හයක සීමාවාසික පුහුණුවක් සඳහා කාර්මික ආයතනයක් වෙත යොමු කරනු ලබයි. අවසන් වසර පර්යේෂණ වාර්තාවන් හා විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීම සඳහා වෙන් කරනු ලබයි. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුන්ට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ මහඟු අවස්ථාවක් ලැබේ.

- විදුලි ස්ථාපනය (Electrical Installation)
- විදුලිබල උත්පාදනය හා බෙදාහැරීම (Power generation & distribution)
- MEP (යාන්ත්‍රික විදුලි හා ජලනල) ඉදිකිරීම් අංශය [MEP(Mechanical Electrical & Plumbing) Works in the Construction sector]
- IoT පදනම් කරගත් නිෂ්පාදන සංවර්ධනය (IoT based product development)
- එම්බෙඩඩ් පද්ධති අලුත්වැඩියා කිරීම, එකලස් කිරීම හා ස්ථාපනය (Embedded system repair, assembly and installation)
- ජංගම සන්නිවේදන ජාල කළමනාකරණය සහ නඩත්තුව (Mobile Communication network management and maintenance)

- ෆයිබර් ඔප්ටික්ස් සන්නිවේදන උපකරණ හැසිරවීම සහ නඩත්තුව (Fiber Optics communication equipment handling and maintenance)

ද්‍රව්‍ය තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (***BET Honours Degree in Materials Technology)***

ද්‍රව්‍ය තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධියේ අරමුණ වන්නේ ද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම, ද්‍රව්‍ය සැකසීම හා නිෂ්පාදනය කිරීම පිළිබඳව විශේෂඥතා ඥානත්වයෙන් හෙබි උපාධිධාරීන් බිහිකිරීමයි. මෙම උපාධි පාඨමාලාව හරහා ලෝහ, පිඟන් භාණ්ඩ, පොලිමර්ස්, වීදුරු, සංයුතිය සහ බණිජ ලවණ හා සම්බන්ධ විශාල පරාසයක පුහුණුවක් ලබාදේ. තවද මෙම පාඨමාලාව මඟින් ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, පරිගණක ආධාරක සැලසුම් (CAD), මනු සාධකකරණ ශිල්පීය ක්‍රම, තත්ත්ව කළමනාකරණය සහ ද්‍රව්‍ය නිෂ්පාදනයේ වෙනත් අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම උපාධි පාඨමාලාවේ තෙවන අධ්‍යයන වර්ෂය තුළදී සිසුන්ට කාර්මික මධ්‍යස්ථානයක මාස හයක කාර්මික පුහුණුවක් ලබා දෙන අතර අවසාන වසරේදී සිසුන් ද්‍රව්‍ය තාක්ෂණයේ නිර්මාණාත්මක කාර්යයන් වලින් සමන්විත පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතුය. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුන්ට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ මහඟු අවස්ථාවක් ලැබේ.

- කාර්මික ඉංජිනේරු (Industrial Engineering)
- නිෂ්පාදන කළමනාකරණය (Production Management)
- CAD කෙටුම්පත් කිරීම (CAD Draftsman)
- ඉදිකිරීම් ද්‍රව්‍ය විශ්ලේෂක (Construction Materials Analyst)
- ඉංජිනේරු කළමනාකරණය (Engineering Management)
- යන්ත්‍රෝපකරණය (Machinist)
- තත්ත්ව සහතිකකරණය (Quality Assurance)
- රසායනාගාර තාක්ෂණවේදියෙක් (Laboratory Technologist)
- පර්යේෂණ හා සංවර්ධනය (Research and Development)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (***BICT Honours)***

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව සැලසුම් කර තිබෙන්නේ දේශීය හා ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ කර්මාන්තවල අවශ්‍යතා සපුරාලිය හැකි උසස් තත්ත්වයේ පුහුණු උපාධිධාරීන් බිහිකිරීම සඳහාය. මෙම පාඨමාලාවේ විෂයමාලාව නව තාක්ෂණයේ යෙදවුම් පිළිබඳ දැනුමින් සමන්විත වන ඒ ඔස්සේ Artificial Intelligence, Internet of Things, Data Science, Mobile Computing, Networking and Security ආදී ක්ෂේත්‍රයන් ආවරණය කෙරෙන අතර එම විෂයමාලාව සකස්කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ කර්මාන්තකරුවන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙනය. මෙම උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත සිසුන් තාක්ෂණය හා තොරතුරු සඳහා විද්‍යාව යන විෂයය හා සන්නිවේදන තාක්ෂණය යන විෂයය උසස් පෙළ තාක්ෂණික විෂයය ධාරාව යටතේ සමත් විය යුතුය. මෙම උපාධි පාඨමාලාවේ මුල් දෙවසර තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අනිවාර්ය පාඨමාලාව වලින් සමන්විත වන අතර තෙවන හා සිව්වන වසර වලදී සිසුන්ගේ අභිමතය පරිදි විෂයය ක්ෂේත්‍රයේ තෝරා ගැනීමට අවස්ථාව සලසා ඇත. පළමු වසර තුනක කාලයේදී කණ්ඩායම් ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර එමඟින් සිසුන්ට ඔවුන්ගේ දැනුම ක්‍රියාත්මක කිරීමට සහ කණ්ඩායම් තුළ වැඩ කිරීමේ කුසලතාවය වර්ධනය කර ගත හැකිය. අවසන් වසර තුළදී පර්යේෂණ ව්‍යාපෘතියක් නිම කළ යුතු අතර එම කාලයේදී කාර්මික පුහුණු අංගයක් සඳහා සිසුන් යොමු කරන අතර එමඟින් සිසුන්ට කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමේ අවස්ථාවක් උදාවේ.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (බෙලිහුල්ඔය)

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
කලා (SAB)	-	S/E
කළමනාකරණය	-	
කෘෂිකර්මය	-	E
ආහාර විද්‍යාව සහ තාක්ෂණය	-	E
ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා)	-	E
ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා)	-	E
මැනුම් විද්‍යාව	-	E
ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	-	E
ශාරීරික අධ්‍යාපනය	-	E
සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය	-	E
පරිවර්තන අධ්‍යයනය	-	S/E
ආහාර ව්‍යාපාර කළමනාකරණය	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	-	E
තොරතුරු පද්ධති	-	E
දත්ත විද්‍යාව	-	E
ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	-	E

වෛද්‍ය පීඨය

වෛද්‍ය විද්‍යා (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව

පීඨය මඟින් පිරිනමනු ලබන එම්.බී.බී.එස් උපාධි පාඨමාලාවේ කාල සීමාව අවුරුදු 05 කි. පාඨමාලාවෙහි ඉගැන්වීම් මාධ්‍යය හා ඇගයුම් මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව වේ. එහි විෂය නිර්දේශය සමෝධානිත හා පද්ධති පාදක වන අතර අදියර I, අදියර II හා අදියර III ලෙස පූර්ණ සායනික (Pre – Clinical), පරිපූරක සායනික (Para – Clinical) හා සායනික (Clinical) ලෙස අදියර තුනකට පිළිවෙලින් බෙදා වෙන්කර ඇත. පූර්ණ සායනික විෂයයන් මඟින් මිනිස් ශරීරයේ සාමාන්‍ය සැකැස්ම හා ක්‍රියාකාරීත්වය පළමු සාමාසික ත්‍රිත්වයෙහි උගන්වනු ලබයි. පුද්ගලික හා වෘත්තීය සංවර්ධනය I වන අදියරේ දී ආරම්භ කරනු ලබයි. පරිපූරක සායනික විෂයයන් 4 වන සාමාසිකයේ සිට 7 වන සාමාසිකය දක්වා උගන්වන අතර මෙහිදී විද්‍යාර්ථීන් මිනිස් ශරීරයට බලපාන විවිධ ලෙඩ රෝග පිළිබඳවත් ඒ හරහා ඇතිවන අසාමාන්‍ය කායික සංකූලතා පිළිබඳවත්, සමස්තයක් ලෙස පොදු ජනතාවට බලපාන සෞඛ්‍ය ගැටළු සඳහා වූ ඖෂධ ප්‍රතිකාර හා පුද්ගල හා වෘත්තීය සංවර්ධනය ද ඉගෙන ගනියි. අදියර III දී අවසාන වසරෙහි ඉගෙනුම ලබන විද්‍යාර්ථීන්ට වෛද්‍ය විද්‍යාව, ශල්‍යකර්ම, ප්‍රසවවේදය, නාරීවේදය, ළමා රෝග වැනි පවුල් සෞඛ්‍ය වෛද්‍ය විද්‍යාවට අදාළව වෘත්තීය පුහුණුව ලබා දේ. මෙම සායනික පුහුණුව සඳහා අවශ්‍ය සියලුම පහසුකම් රත්නපුර ශික්ෂණ රෝහල විසින් සපයනු ලැබේ. විද්‍යාර්ථීන් විසින් ලබාගත් දැනුම අඛණ්ඩ ඇගයීම් හා වසර අවසානයේ දී පැවැත්වෙන ප්‍රධාන පරීක්ෂණ මඟින් පරීක්ෂා කරනු ලැබේ. මෙහි දී ප්‍රධාන විභාග දෙවන එම්.බී.බී.එස්., තෙවන එම්.බී.බී.එස් හා අවසාන එම්.බී.බී.එස්. වශයෙන් සැදුම්ලත්ය.

තම අධ්‍යයන විෂයයන්ට අදාළව සියලු විද්‍යාර්ථීන් හට රෝහල් වල ප්‍රතිකාර ගැනීමට පැමිණ සිටින රෝගීන් හමුවීමට, රෝහල්වල විද්‍යාගාර භාවිතා කිරීම හා ලේඛන පාදක සිද්ධි අධ්‍යයනයන් සිදු කිරීම සඳහා ප්‍රථම සාමාසිකයේ සිටම අවස්ථාව ලැබේ. අප උපාධි පාඨමාලාවේ ප්‍රමුඛතම ලක්ෂණයක් වන්නේ විෂයයන් තිරස්ව හා සිරස්ව සමෝධානයනය කරමින් ඉගැන්වීම් කටයුතු කිරීමයි. මින් අපේක්ෂිත අරමුණ වන්නේ විද්‍යාර්ථීන්ට තම ග්‍රහණය කරගත් දැනුම රෝග විනිශ්චයේ දී යොදා ගැනීම සඳහා විෂයන් ඉගැන්වීම හා ඉගෙනීම අතර සහ සම්බන්ධතාව සෑම මට්ටමකදී ම ඉහළ ස්ථානයක පවත්වාගෙන යාම තහවුරු කිරීමයි.

අපගේ එම්.බී.බී.එස්. උපාධි පාඨමාලාවේ මෙහෙවර වන්නේ ඉතා උසස් වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව රෝගියා මූලික කරගත් ප්‍රතිකාර සිදු කිරීමට සායනික වෛද්‍යවරුන් සූදානම් කිරීම, සෞඛ්‍ය සේවා සැපයීමේ දී අදාළ රෝගය වළක්වාලීමට හා ප්‍රතිකාර සිදුකිරීම සඳහා වූ යාන්ත්‍රණයේ ඇති මූලික ගැටලු හඳුනාගැනීම සඳහා වෛද්‍ය ශිෂ්‍යයන්ට ඉගැන්වීම් කටයුතු කිරීමයි.

මේ අනුව යමින් සමාජීය, ආර්ථික, ජාති භේද, ස්ත්‍රී පුරුෂ බව, අනන්‍යතාව, විබලතාවන් හා වයස් පරතරයන් පසෙකලා සානුකම්පිතව දැඩි කැපවීමෙන් හා කුසලතාවයෙන් යුතුව දේශීය හා විදේශීය ජනයාගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීමේ ශක්‍යතාවයෙන් යුතු වෛද්‍ය පරපුරක් හෙට දිනයේ බිහිකරලීමට අප පීඨය මහත් කැපවීමෙන් කටයුතු කරයි. තවදුරටත්, නවීන තාක්ෂණය යොදා ගනිමින් දැනුම, කුසලතා ඔප්නංවාලමින් පර්යේෂණ පුහුණුවීම් ලබා දෙමින් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු හා රෝග වළක්වාලීමේ වැඩසටහන් පීඨය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම අවසාන පරීක්ෂණයෙන් සමත්වන වෛද්‍ය විද්‍යාර්ථීන් ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලයේ වෛද්‍ය වෘත්තිකයන් ලෙස ලියාපදිංචි කරන අතර සීමාවාසික පුහුණුව සඳහා ද යොමු කරනු ලැබේ. වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශ වලට යොමු වෙමින් සෞඛ්‍ය සේවා සපයන කණ්ඩායම් වල වැදගත් භූමිකාවක් නිරූපනය කිරීමට හැකි දක්ෂ හා සාර්ථක විද්‍යාර්ථීන් පිරිසක් අප පීඨයෙන් බිහිවනු ඇත.

කෘෂි විද්‍යා පීඨය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලීය කෘෂි විද්‍යා පීඨය මඟින් සිව් අවුරුදු කෘෂි විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබයි. කෘෂි විද්‍යා පීඨය කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, කෘෂි අපනයන අධ්‍යයනාංශය සහ සත්ව නිෂ්පාදන අධ්‍යයනාංශය ලෙස අධ්‍යයනාංශ තුනකින් සමන්විත වේ. මේ අතුරින් කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කෘෂි ව්‍යාපාර පිළිබඳව ඉගැන්වීම් සහ පර්යේෂණ සිදුකරනු ලබන පුරෝගාමී අධ්‍යයනාංශයක් ලෙස හඳුන්වාදිය හැකිය. මෙම අධ්‍යයනාංශය මඟින් පිරිනමන ආහාර ආශ්‍රිත ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී උපාධිය පිළිබඳ හැඳින්වීමක් වෙනම ස්ථානයක දක්වා ඇත. කෘෂි අපනයන අධ්‍යයනාංශය කෘෂි පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩිදියුණුකරණය සහ වගා ආරක්ෂණය හා බෝග නිෂ්පාදන තාක්ෂණවේදය ලෙස අධ්‍යයන මොඩියුල ත්‍රිත්වයක් පිරිනමනු ලබන අතර සත්ව නිෂ්පාදන අධ්‍යයනාංශය මඟින් ජලජ ජෛව-සම්පත් කළමනාකරණය සහ සත්ව ජෛව-සම්පත් කළමනාකරණය ලෙස අධ්‍යයන මොඩියුල ද්විත්වයක් පිරිනැමීම සිදුවේ.

කෘෂි විද්‍යා විෂයෙහි විද්‍යාර්ථයෙකු සතු විය යුතු දැනුම, කුසලතාවන් සහ ආකල්ප උපර්ජනය කරගනු වස් සියලුම සිසුන් විසින් පූර්ණ කාලීන සිව්වස් පාඨමාලා කාලයක් සපුරාලීම උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමේ අවම සුදුසුකම ලෙසින් සැලකේ. සිව්වස් පාඨමාලාව වසරකව සමාසික දෙක බැගින් වන සමාසික අටකින් සමන්විත වන අතර එක් සමාසිකයක් සති පහළොවක කාලසීමාවකට යටත්වේ. පළමු වසර දෙකක කාලසීමාව තුළදී සියලු සිසුන් මූලික අධ්‍යයන පාඨමාලාවකට සහභාගී වියයුතු අතර අවසන් වසර දෙක තුළදී විශේෂීකරණ පාඨමාලාවකට සහභාගීවීමේ අවකාශය සිසුන්ට හිමිවේ. විද්‍යාවේදී උපාධිය සම්පූර්ණ කිරීමේ අවම සුදුසුකම ලෙසින් සියලුම සිසුන් තම සිව්වසරක අධ්‍යයන කාලය තුළදී අවම සම්භාර එකසිය තිහක් (130) ලබා ගැනීම අනිවාර්ය වේ.

විශේෂීකරණ මොඩියුලය - පළමු වසර දෙක තුළදී මූලික අධ්‍යයන පාඨමාලාව සාර්ථක ලෙස නිමකරනු ලබන සිසුන්ට තමන් වඩාත් ප්‍රියකරන විෂය ක්ෂේත්‍රයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබීමේ නම්‍යශීලී අවස්ථාවක් විශේෂීකරණ මොඩියුලය යටතේ හිමිවේ. එහිදී සිසුන් විසින් ප්‍රධාන අධ්‍යයනාංශ ත්‍රිත්වය මඟින් පිරිනමනු ලබන කෘෂි-පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩිදියුණුකරණය සහ වගා ආරක්ෂණය, බෝග නිෂ්පාදන තාක්ෂණවේදය, ජලජ ජෛව-සම්පත් කළමනාකරණය, සත්ව ජෛව-සම්පත් කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන මොඩියුල අතරින් එක් මොඩියුලයක් විශේෂීකරණ මොඩියුලය ලෙස තෝරා ගත යුතුවේ. මෙම විශේෂීකරණ මොඩියුල සඳහා රැකියා වෙළඳපළ තුළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතින බව හඳුනාගෙන ඇත.

උපාධි පාඨමාලාවේ ඉතා වැදගත් අංගයක් ලෙස සැලකෙන කර්මාන්ත පිළිබඳ පුහුණුව ලබාදීම සඳහා අවසන් සමාසිකය තුළදී සිසුන් කර්මාන්ත ආශ්‍රිත පුහුණුවකට යොමු කෙරේ. මූලික පාඨමාලාව අනිවාර්යය විෂය මාලාවකින් සමන්විතවන අතර විශේෂීකරණ පාඨමාලාව අනිවාර්යය සහ තෝරාගත හැකි විෂයය මාලාවකින් සමන්විත වේ.

කර්මාන්ත ආශ්‍රිත පුහුණුව සහ ශාස්ත්‍රීය නිබන්ධනය - විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ අතිශය වැදගත් සංරචකයක් ලෙස කර්මාන්ත ආශ්‍රිත පුහුණුව සහ ශාස්ත්‍රීය නිබන්ධනය පිළියෙල කිරීම හැඳින්විය හැකිය. ඒ තුළින් විද්‍යාර්ථයින් හට වැඩ ලෝකය පිළිබඳ යථා අවබෝධයක් ලබා දීම සිදුකෙරෙන අතර එහිදී සිසුන් තම විශේෂීකරණ මොඩියුලයට ගැළපෙන කර්මාන්තයක් ආශ්‍රිතව පවත්නා ගැටළුවක් හඳුනාගෙන එයට විසඳුම් සෙවීමේ ක්‍රියාවලියකට යොමුකරනු ලැබේ.

තව ද කෘෂි විද්‍යාවේදී උපාධි පාඨමාලාව සාර්ථකව හැදෑරීමට සහ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට අදාළ කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණ විෂයයන්

අනිවාර්ය විෂයයන් ලෙසින් පළමු වසර තුන පුරාවටම සිසුන්ට ඉගැන්වීම සිදුකෙරේ. තව ද මේ තුළින් පීඨය තුළ ගතකරන කාලසීමාව පුරාවටම සීඝ්‍රයෙන් නවමුවන තොරතුරු තාක්ෂණ ලෝකය පිළිබඳව අතැඹුලක් සේ ප්‍රත්‍යක්ෂ කරගැනීමේ අවකාශය සිසුන්ට හිමි වේ.

ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ, කෘෂි විද්‍යා පීඨයේ, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සිව් අවුරුදු පාඨමාලාවකි. එය 2016 වසරේ සිට ඉදිරිපත් කරනු ලබන නව උපාධි පාඨමාලාවකි.

මෙම පාඨමාලාව විශේෂයෙන්ම ලෝකයේ විශාලතම ව්‍යාපාරවලින් එකක් වන ආහාර සහ ඒ ආශ්‍රිත ව්‍යාපාර ජාලයට අවශ්‍ය කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව ආහාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණයේ සිද්ධාන්ත දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ද ඉතා පුළුල්ව ලබා දීම සඳහා සකස් කර ඇත. ආහාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය, ආහාර අලෙවිකරණය, ආහාර දාම කළමනාකරණය ඇතුළු ඉතා පුළුල් පරාසයක දැනුමක් මෙම පාඨමාලාව යටතේ ලබා දෙනු ඇත.

මෙම පාඨමාලාවේ ප්‍රධානතම ලක්ෂණයන් වන්නේ

- ආහාර ව්‍යාපාර කළමනාකරණය සහ ආහාර අලෙවිකරණ ක්ෂේත්‍රවල ඉතා පුළුල් වූ සහ ප්‍රායෝගික දැනුම ලබාදීම.
- ආහාර දාම කළමනාකරණය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා දීම. මෙම දේශන පවත්වනු ලබන්නේ අදාළ ක්ෂේත්‍රයේ නිපුණතා ඇති විශ්වවිද්‍යාලයීය සහ නිෂ්පාදන ක්ෂේත්‍රයේ දේශකවරුන් විසිනි.
- ආහාර ව්‍යාපාර ක්ෂේත්‍රය සහ එහි ප්‍රවීනයන් සමඟ ඉතාමත් සමීප සබඳතාවයක් පවත්වා ගැනීම.
- ශිෂ්‍යයන්ගේ ඉගෙනීම සඳහා අධ්‍යනාංශය සතුව ඉතාමත් හොඳ පහසුකම් තිබීම.

මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා උපාධියෙන් පසුව ආහාර ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය, වෙළඳපොළ පර්යේෂණ, නව නිෂ්පාදන සංවර්ධනය, ආහාර අගය දාම කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය වැනි පුළුල් පරාසයක රැකියාවන් විවෘත වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨය

ව්‍යවහාරික විද්‍යා පීඨය අධ්‍යයනාංශ හතරකින් සමන්විත වේ.

1. ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
2. භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
3. ආහාර විද්‍යා හා තාක්ෂණය අධ්‍යයනාංශය
4. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපනය අධ්‍යයනාංශය

මෙම පීඨය යටතේ ඇති දෙපාර්තමේන්තු හතර මඟින් පහත උපාධි පාඨමාලා පිරිනැමේ.

ස්වභාවික සම්පත් සහ භෞතීය විද්‍යා හා තාක්ෂණය යන අධ්‍යයනාංශ වල ලියාපදිංචි වන උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ කැමැත්ත අනුව තුන් අවුරුදු හෝ සිව් අවුරුදු පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවේ. ව්‍යවහාරික විද්‍යා පීඨය මඟින් පිරිනමන සියලුම උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එමෙන්ම අර්ධ වාර්ෂික පදනම් කරගත් පාඨමාලා සම්භාර ක්‍රමය පීඨයේ සියලු උපාධි පාඨමාලා සඳහා ක්‍රියාත්මක වේ.

උපාධි පාඨමාලා

1. ආහාර විද්‍යාව හා තාක්ෂණය ගෞරව උපාධිය
2. පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය ගෞරව උපාධිය
3. පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය සාමාන්‍ය උපාධිය
4. රසායනික විද්‍යා තාක්ෂණ ගෞරව උපාධිය
5. පරිගණක විද්‍යාව හා තාක්ෂණ ගෞරව උපාධිය
6. ව්‍යවහාරික භෞතික විද්‍යා ගෞරව උපාධිය
7. භෞතීය විද්‍යා සාමාන්‍ය ගෞරව උපාධිය
8. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය ගෞරව උපාධිය
9. ශාරීරික අධ්‍යාපනය ගෞරව උපාධිය

භෞතීය විද්‍යා

* ව්‍යවහාරික විද්‍යාව යටතේ භෞතීය විද්‍යා විෂය ධාරාව සඳහා පීඨය මඟින් භෞතීය විද්‍යා හා තාක්ෂණය පිළිබඳ තුන් අවුරුදු උපාධි පාඨමාලාවක් පවත්වනු ලබන අතර පරිගණක විද්‍යාව හා තාක්ෂණය, රසායනික විද්‍යා තාක්ෂණය සහ ව්‍යවහාරික භෞතික විද්‍යාව පිළිබඳ සිවි අවුරුදු විශේෂ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ.

මෙම උපාධි පාඨමාලා රටෙහි පවතින නූතන රැකියා අවශ්‍යතාවලට සරිලන අයුරින් සකසා ඇත. මේ අනුව ව්‍යවහාරික භෞතික විද්‍යා, රසායන විද්‍යා හා පරිගණක විද්‍යා විෂය ධාරාවන්ට බරව විෂය නිර්දේශය සකසා ඇත.

රසායනික විද්‍යා තාක්ෂණය

විද්‍යුත් රසායනික විද්‍යා තාක්ෂණය, බහුද්‍රව්‍යවික තාක්ෂණය, කාර්මික රසායනික විද්‍යාව, ඖෂධවේදී රසායනය, ස්වභාවික නිෂ්පාදන රසායනික විද්‍යාව, විශ්ලේෂණ තාක්ෂණය, පාරිසරික රසායනික විද්‍යාව, ජෛව අකාබනික අනු පිළිබඳ රසායනික හා ආහාර රසායනික විද්‍යාව

පරිගණක විද්‍යාව හා තාක්ෂණය

වැඩසටහන්කරණ ක්‍රමෝපායන්, අන්තර්ජාල වැඩසටහන්කරණය, දත්ත ගබඩා කළමනාකරණ පද්ධති, මෘදුකාංග ඉංජිනේරු තාක්ෂණය, පරිගණක රූපසටහන්, රූ සටහන් සැකසුම.

ව්‍යවහාරික භෞතීය විද්‍යාව

ඊට අමතරව සියලුම සිසුන් පළමු අධ්‍යයන වර්ෂය තුළදී ගණිතය හා සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූලධර්ම යන විෂයන් අනිවාර්ය විෂයන් වශයෙන් හදාරනු ලබයි. මෙම පාඨමාලාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී සියලුම සිසුන් පර්යේෂණ/ කාර්මික පුහුණුවකට සහභාගී විය යුතු බවයි.

පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය

පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාව ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය මඟින් පවත්වාගෙන යනු ලැබේ. මෙම සිවි අවුරුදු උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. මෙම පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලාව සමත් වීමට නම් අවම වශයෙන් සියලුම පාඨමාලා සඳහා අදාළ අධ්‍යයන අර්ධ වාර්ෂික වලදී ‘C’ ශ්‍රේණි ලබා ගත යුතු අතර, උපාධි පාඨමාලාව අවසානයේදී FGPA ලකුණු ප්‍රමාණය 02 ඉක්මවා ලබා ගත යුතු වේ. උපාධි සහතිකයට ඇතුළත් කළ යුතුය. ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය මඟින් මෙම පාඨමාලාව සඳහා Credit ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ. ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජෛව විද්‍යාව, සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූලධර්ම, තොරතුරු හා සන්නිවේදනය යන අනු විෂයන් පළමු අවුරුද්දේදී අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

ප්‍රථම පාඨමාලාවෙහි විෂය නිර්දේශයට පාරිසරික විද්‍යාව, ස්වභාවික සම්පත් කළමනාකරණය, වන විද්‍යාව, මිහිතල විද්‍යාව, ජෛව විවිධත්වය, ස්වභාවික සම්පත් ආර්ථික විද්‍යාව, පාංශු විද්‍යාව, පාංශු බාදනය හා සංරක්ෂණය ආදී වශයෙන් විෂයයන් රාශියක් ඇතුළත් වන අතර, ඒවා පාරිසරික විද්‍යාව, ජෛව විවිධත්ව සංරක්ෂණය හා මිහිතල විද්‍යාව යන මූලික තේමාවන් 03ක් යටතේ වර්ග කර ඇත. අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී ඉහත පාඨමාලාවලට අමතරව සති 15ක පර්යේෂණ/ ක්ෂේත්‍ර පුහුණුවකට සහභාගී වී ඒ හා සම්බන්ධ නිබන්ධනයක් පිළියෙල කර පිළිගැන්විය යුතුය.

ආහාර විද්‍යාව හා තාක්ෂණය

ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය මඟින් මෙම ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව පිරිනමයි. මෙය සිවි අවුරුදු පාඨමාලාවක් වන අතර මෙය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙහි ඒකායන අරමුණ වනුයේ ආහාර නිෂ්පාදන කර්මාන්තය තුළ තාක්ෂණික, අධීක්ෂණ වෙළඳ හා කළමනාකරණය කිරීමෙහිලා මනා දැනුමක් ඇති උපාධිධරයන් බිහි කිරීමයි. තව ද මෙම පාඨමාලාව ආහාර සංරක්ෂණය සහ ආහාර සකස් කිරීම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම මඟින් නව නිෂ්පාදන බිහිකිරීම අරමුණු කර ඇත. මෙම උපාධිය හදාරන සිසු සිසුවියන් හට ආහාර සැකසුම් මූලධර්මයන් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම, ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම ලබාදීම, ව්‍යාපාරික ධනාත්මක ආකල්ප සංවර්ධනය සංස්ථානය කිරීම, තාක්ෂණික කුසලතා හා පර්යේෂණ දක්ෂතා දියුණු කිරීම හා පෞරුෂත්ව කළමනාකරණ හා නායකත්වය දියුණු කිරීම යන කරුණු ලබා දීම අපේක්ෂා කරයි.

පළමු අර්ධ වාර්ෂිකය තුළදී මූලික අනුවිෂයන් වන ගණිතය හා සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූලධර්ම සහ තොරතුරු හා සන්නිවේදනය, භෞතීය විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව විෂයන් හැදෑරිය යුතුය.

ඉදිරි වර්ෂවලදී ආහාර රසායන කළ ආහාර විශ්ලේෂණය, ආහාර ජීව සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාවල ආහාර සැකසුම්, ඉංජිනේරු විද්‍යාවල ආහාර සැකසුම් තාක්ෂණය සහ රසායනය, තත්ව කළමනාකරණය හා මානව පෝෂණය යන ප්‍රධාන විෂය ධාරාවන්ට අයත් විෂයන් හැදෑරිය හැකිවේ. අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී සති 15 ක පර්යේෂණ ව්‍යාපෘතියකට/ ක්ෂේත්‍ර පුහුණුවකට සහභාගි වී ඒ හා සම්බන්ධ නිබන්ධන වාර්තාවක් පිළියෙල කර පිළිගැන්විය යුතුය. මෙම පාඨමාලාව සඳහා ද පීඨය මඟින් Credit ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය

දැනට මෙම උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ පවතී. රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් බිහිකිරීම මෙහි අරමුණ වේ.

ශාරීරික අධ්‍යාපනය

දැනට මෙම උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ පවතී. රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ශාරීරික අධ්‍යාපනය හා කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් බිහිකිරීම මෙහි අරමුණ වේ.

භූවිඥාපන පීඨය

භූවිඥාපන පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ දෙකකින් සමන්විත වේ.

ඇ) මැනුම් හා භූමිතික අධ්‍යයනාංශය
ආ)දුරස්ථ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය

උපාධි පාඨමාලාව

සිවි අවුරුදු මැනුම් විද්‍යා උපාධි පාඨමාලාව මැනුම් විද්‍යා මූලධර්ම, භූමිතිය, අනුකූලන න්‍යායන්, සිතියම් විද්‍යාව, ඡායාරේඛනමිතිය, දුරස්ථ ගෝචර ග්‍රහණය, භූමි තොරතුරු පද්ධති, කැඩැස්තර මැනුම්, ජලමාන මැනුම් මෙන්ම ගණිතය, භෞතික විද්‍යාව, පරිගණක නියැළුම්, කළමනාකරණය, පරිසර විද්‍යාව ආදිය ද ආවරණය කරයි.

උපාධි පාඨමාලාව සමාසික (වර්ෂාර්ධ) අට (08) කින් යුක්ත වේ. ඉන් මුල් සමාසික පහ (05) සියලුම සිසුන්ට පොදු වන අතර මෙහිදී බිම් මැනීමට අදාළ සෑම අංශයක්ම උගන්වනු ලබයි. ඊළඟ සමාසික තුනේදී (03) සිසුන් විශේෂ උපාධිය සඳහා යොමු කරන අතර එහිදී (I) බිම් මැනීම සහ භූමිතික මැනීම (II) ඉඩම් කළමනාකරණය (III) ජලමාන මැනුම් (IV) දුරස්ථ ගෝචරය (V) භූගෝලීය තොරතුරු පද්ධති යන විශේෂීකරණයන්ගෙන් එකක් හදාරනු ඇත. අවසාන සමාසිකය ආයතනික අභ්‍යාසයන් සඳහා වෙන් කර ඇත.

මෙම උපාධි පාඨමාලාව වර්ෂ 2015 දී රාජකීය වරලත් මිනින්දෝරු ආයතනය (Royal Institution of Chartered Surveyors – RICS) මඟින් පිළිගෙන ඇති අතර ඊට අමතරව ජලමාන මැනුම් විශේෂ උපාධිය ජලමාන මිනින්දෝරුවන් සඳහා වන නිපුණතා ප්‍රාමාණික ජාත්‍යන්තර මණ්ඩලය විසින් සහ නාවික සිතියම් විද්‍යාඥ ප්‍රභේද B මට්ටම (FIG/IHO/ICA- Cat B) යටතේ පිළිගනු ලැබ ඇත. එසේම, මෙම පීඨය ජාත්‍යන්තර මිනින්දෝරු ෆෙඩරලයේ (FIG) අධ්‍යයන සාමාජිකයෙකි.

කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයන පීඨය, 1996 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. සිවි අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා, පීඨය විසින් හඳුන්වා දී ඇති අතර එම උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කරනු ලබන පළමු වසරේ සිටම වෙන් කරනු ලබයි. මෙම සියලු පාඨමාලා පවත්වාගෙන යනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. සාර්ථකව අධ්‍යයන කටයුතු නිම කරනු ලබන උපාධි අපේක්ෂකයන්ට ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සහ සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ මඟින් පහත සඳහන් උපාධි පිරිනමනු ලැබේ.

ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය -	විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව උපාධිය
	විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ ගෞරව උපාධිය
ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය -	විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය
අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය -	විද්‍යාවේදී අලෙවි කළමනාකරණ ගෞරව උපාධිය
සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය -	විද්‍යාවේදී සංචාරක කළමනාකරණ ගෞරව උපාධිය
	විද්‍යාවේදී පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය
	විද්‍යාවේදී සත්කාරසේවා කළමනාකරණ ගෞරව උපාධිය

පීඨයේ සෑම උපාධි පාඨමාලාවක්ම, වසරකට අර්ධ වාර්ෂික දෙකක් බැගින් වූ පූර්ණ කාලීන අර්ධ වාර්ෂික අටකින් සමන්විත වේ. එක් අර්ධ වාර්ෂිකයකට ලිත් සති 15 කි. මෙම අර්ධ වාර්ෂික අට තුළදී උපාධි අපේක්ෂකයන් විසින් තම උපාධිය සඳහා අවම වශයෙන් පාඨමාලා ඒකක රැසක් සම්පූර්ණ කළ යුතු අතර, අවසාන අර්ධ වාර්ෂිකයේදී සම්පූර්ණ කළ යුතු සිව් මස් ප්‍රායෝගික පුහුණුව හෝ ස්වාධීන පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කිරීම ද මෙයට ඇතුළත් වේ. සෑම අර්ධ වාර්ෂිකයක් අවසානයේදීම ලිඛිත පරීක්ෂණයක් පැවැත්වෙන අතර උපාධි අපේක්ෂකයන්ගේ කුසලතා ඇගයීම සඳහා GPA ඇඟයීම් ක්‍රමය භාවිතා කරයි. සෑම උපාධි අපේක්ෂකයෙක්ම තම උපාධිය සඳහා පීඨය පිළිගත් ආයතනයකින් සිව් මස් ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීම හෝ තම විශේෂීකරණ ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කිරීම හෝ සිදු කළ යුතුව ඇත.

විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව උපාධිය

මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන්වල නියැලීමට බලාපොරොත්තු වන සිසුන් වෙනුවෙන් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. ප්‍රධාන වෘත්තීමය ගණකාධිකාරී ආයතන මඟින් මෙහෙයවන පාඨමාලා වලට ගැලපෙන ලෙස මෙම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සකසා ඇති බැවින් උපාධිය සම්පූර්ණ කළ පසු වෙනත් වෘත්තීය පාඨමාලා වල ඇතැම් විෂය ඒකක නිදහස් කර ගැනීමට උපාධිධාරීන්ට හැකියාව ඇත.

විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ ගෞරව උපාධිය

විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව වෙසෙසින්ම සකස් කර ඇත්තේ එම ක්ෂේත්‍රයට අදාළ දැනුමින්, ආකල්පවලින් හා කුසලතාවලින් පිරිපුන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රවීනයන්ට උචිත බැංකු සහ රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ හැකියාවන්ගෙන් පරිපූර්ණ විශේෂ ප්‍රාගුන්‍යයක් ඇති උපාධිධාරීන් බිහි කිරීමේ අරමුණෙනි. අදාළ න්‍යායික හා ප්‍රායෝගික පුළුල් දැනුමක් ලබාදීම අරමුණු කරගෙන සුවිශේෂී විෂය ඒකක කිහිපයක් මෙම පාඨමාලාවට හඳුන්වාදී ඇති අතර එමඟින් ඔවුන්ගේ සාමුහික සහ විශේෂ විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් උපාධි අපේක්ෂකයින්ගේ, පොදු ජනතාවගේ සහ බැංකු හා රක්ෂණ ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන් හා ඉල්ලුම් සපුරාලීමට අපේක්ෂා කරයි.

විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

කළමනාකරණ, වෙළඳ සහ වාණිජ යන ක්ෂේත්‍රයන්ට අදාළ රැකියාවල නිරතවීමට අපේක්ෂා කරන සිසුන් වෙනුවෙන් විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. නූතන ව්‍යාපාර ලෝකයේ අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා සහ ආකල්ප වලින් සිසුන් සන්නද්ධ කිරීම මෙම උපාධි පාඨමාලාව මඟින් සිදු කෙරේ.

විද්‍යාවේදී අලෙවි කළමනාකරණ ගෞරව උපාධිය

අලෙවිකරණ ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි, දක්ෂතා පිරි සහ රැකියා නියුක්ත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම සඳහා මෙම උපාධි පාඨමාලාව සැලසුම් කරන ලදී. නිෂ්පාදනය, ප්‍රවාහනය, සන්නිවේදනය, වෙළඳාම, රක්ෂණ, බැංකු සහ රාජ්‍ය ව්‍යාපාර වැනි ක්ෂේත්‍රවලට අදාළ රැකියා වල නියැලීමට මෙම උපාධිධාරීන්ට හැකියාව ලැබේ.

විද්‍යාවේදී සංචාරක කළමනාකරණ ගෞරව උපාධිය

සංචාරක ක්ෂේත්‍රයට අදාළව විවිධ රැකියාවල නිරතවීමට හැකිවන පරිදි සිසුන්ගේ මූලික දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා විද්‍යාවේදී සංචාරක කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව යටතේ සිසුන්ට වෙනත් විදේශීය භාෂාවක් අධ්‍යයනය කිරීමට ද හැකියාව ලැබේ. මෙම උපාධිය සාර්ථකව නිම කරනු ලබන උපාධි අපේක්ෂකයින් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සංචාරක ක්ෂේත්‍රයේ විවිධ ව්‍යාපාරවල කළමනාකාරීත්ව තනතුරු දැරීම සඳහා සුදුස්සන් වී ඇත.

විද්‍යාවේදී පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

ව්‍යාපාරික සහ වෙනත් ආයතන මුහුණපාන විවිධ පාරිසරික ගැටළු වලට තාක්ෂණික හා තිරසාර විසඳුම් ලබා දීම කෙරෙහි නැඹුරු වූ කළමනාකරණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව තුළින් සිසුන්ගේ මූලික කළමනාකරණ කුසලතා, ගැටළු විසඳීමේ හැකියාවන් හා පෞද්ගලික කුසලතාවයන් සංවර්ධනය කරමින් තිරසාර සංවර්ධනය හා සම්බන්ධ ගැටළු වලට සංවේදී කළමනාකරුවන් පිරිසක් බිහිකරනු ලබයි.

විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ ගෞරව උපාධිය

සත්කාරක සේවා කළමනාකරණ ව්‍යාපාර ක්ෂේත්‍රයට අවැසි න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබා දෙනු වස් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන් හට වෙනත් විදේශීය භාෂාවක් ද අධ්‍යයන කාලය තුල හැදෑරීමට අවස්ථාව උදාවනු ඇත. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව නිමකළ

උපාධිධාරීන්ට දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සත්කාරක සේවා ව්‍යාපාර ක්ෂේත්‍රයේ කළමනාකරණ තනතුරු දැරීමට හැකියාව ලැබෙනු ඇත.

සමාජීය විද්‍යා හා භාෂා පීඨය

කලා අධ්‍යයන පාඨමාලාව

කලා විෂය ධාරාවෙන් හෝ වාණිජ්‍යය විෂය ධාරාවෙන් අවම සුදුසුකම් සපුරා ඇති සිසුන්ට මෙම අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කළ හැකිය.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨය පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වයි.

එනම්,

1. ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - (වසර හතරකි)
2. ශාස්ත්‍රවේදී උපාධිය - (වසර තුනකි)

ශාස්ත්‍රවේදී උපාධිය පීඨයේ අධ්‍යයනාංශ පහ එක්ව පිරිනමනු ලබන අතර, අදාළ විෂයයන්ට අනුව ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පහත පරිදි පිරිනමනු ලැබේ.

ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී ගෞරව ආර්ථික විද්‍යාව
ශාස්ත්‍රවේදී ගෞරව සංඛ්‍යානය
ශාස්ත්‍රවේදී ගෞරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි මාධ්‍යය පමණි)

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය

මෙම අධ්‍යයනාංශය ප්‍රධාන හෝ අනු විෂයයක් ලෙස ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) හා විශ්වවිද්‍යාල අධ්‍යයන කාලයෙහි සිසුන්ට ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම සිදු කරයි.

භූගෝල විද්‍යාව හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී ගෞරව භූගෝල විද්‍යාව

තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය

තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පාඨමාලා විශ්වවිද්‍යාල අධ්‍යයන කාලයෙහි සිසුන්ට පැවැත්වීම සිදුකරයි.

භාෂා අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී ගෞරව සිංහල
ශාස්ත්‍රවේදී ගෞරව දෙමළ
ශාස්ත්‍රවේදී ගෞරව ඉංග්‍රීසි
ශාස්ත්‍රවේදී ගෞරව ජර්මන්
ශාස්ත්‍රවේදී ගෞරව චීන
ශාස්ත්‍රවේදී ගෞරව හින්දි
ශාස්ත්‍රවේදී ගෞරව ජපන්
ශාස්ත්‍රවේදී ගෞරව පරිවර්තන අධ්‍යයනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී ගෞරව දේශපාලන විද්‍යාව
ශාස්ත්‍රවේදී ගෞරව සමාජ විද්‍යාව

සිව් අවුරුදු ගෞරව උපාධිය සඳහා සිසුන් තෝරා ගැනීම පළමු වසරේදී සිසුන් දක්වන කුසලතා මත පදනම්ව සිදු කෙරේ.

තාක්ෂණ පීඨය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ හත්වන පීඨය වන තාක්ෂණ පීඨය, ජෛව පද්ධති තාක්ෂණවේදය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන අධ්‍යයනාංශ දෙකකින් සමන්විත වන අතර එම අධ්‍යයනාංශ මඟින් පහත සඳහන් පූර්ණකාලීන උපාධි පාඨමාලා දෙක පිරිනමනු ලබයි.

1. ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය (Bachelor of Biosystems Tecnology Honours Degree Programme).

2. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය (Bachelor of Engineering Technology Honours Degree Programme)

ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය සිව් වසරක උපාධි පාඨමාලාවක් වන අතර, එහි පළමු වර්ෂ දෙක, පොදු හර විෂයන්ගෙන් සමන්විත වේ. තෙවන වර්ෂයේ සිට සමාජික කාර්මික පුහුණුවක් ද ඇතුළත්ව, ජෛව බලශක්තිය (Bio-Energy), ජෛව තාක්ෂණය (Biotechnology), ඖෂධ අනාවරණය (Drug Discovery) යන ප්‍රධාන විෂයමාලා තුනක් යටතේ සිසුන්ට අධ්‍යයන කටයුතු කිරීමට ඉඩ සලසා දී ඇත.

ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යනාංශය පිරිනමනු ලබන සිව් අවුරුදු ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය හදාරන සිසුන්, යාන්ත්‍රික ඉංජිනේරු හා විදුලි ඉංජිනේරු සේවා ක්ෂේත්‍රය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්හි, වෘත්තිකයෙකු වීම උදෙසා සූදානම් කරනු ලබයි. ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යයනාංශයේ උපාධිධාරීන් මූලික විද්‍යාත්මක හා යාන්ත්‍රික ඉංජිනේරු දැනුමෙන් යුක්ත වන අතර, එකී දැනුම යාන්ත්‍රික හා ඊට අදාළ ක්‍රියාකාරකම් වලදී භාවිතා කිරීමටත්, සමාජීය, විද්‍යාත්මක, තාක්ෂණික දියුණුව හා තිරසාර සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීමටත්, හැකියාවක් සහිතව සීඝ්‍රයෙන් වෙනස් වන වෘත්තීය ක්ෂේත්‍රයන්හි, විභවයක් සහිත වෘත්තීය නිපුණයන් වනු ඇත.

තාක්ෂණ පීඨයේ ප්‍රධාන අරමුණ වනුයේ, විද්‍යාව හා තාක්ෂණ විෂයන් ඉගැන්වීමෙහි සහ පර්යේෂණ සිදුකිරීමෙහිලා ජාත්‍යන්තරව පිළිගත් සන්නාමයක් බවට පත්වීමයි.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (කුලියාපිටිය)

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
කළමනාකරණය	-	E
කෘෂිකර්මය	-	E
ආහාර විද්‍යාව සහ පෝෂණය	-	E
ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා)	-	E
ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E

වෛද්‍ය පීඨය

වෛද්‍ය විද්‍යා (එම්.බී.බී.එස්.) පාඨමාලාව

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ එම්.බී.බී.එස්. පාඨමාලාව වසර පහකි. පූර්ව සායනික (විෂයයන් 03 ක්), සම සායනික (විෂයයන් 06 ක්) සහ සායනික (විෂයයන් 05 ක්) ලෙස වෙන් වූ ප්‍රධාන විෂයයන් 14 කින් සමන්විතය. පූර්ව සායනික සහ සම සායනික විෂයයන් මොඩියුල ක්‍රමය යටතේ උගන්වනු ලබයි. එහි දී, පූර්ව සායනික විෂයයන් මුල් සමාසික 03 තුළදී ද, සම සායනික විෂයයන් 04 වන සමාසිකයේ සිට 07 වන සමාසිකය දක්වා ලෙස ද උගන්වනු ලැබේ.

සායනික විෂයයන් 04 වන සමාසිකයේ සිට 10 වන සමාසිකය දක්වා විහිදෙන අතර ඒවා විෂය පාදක වේ.

මොඩියුල, පාඨමාලාව අතරතුරදී හා පාඨමාලාව අවසානයේදී වන විභාග වශයෙන් ඇගයෙන අතර ප්‍රධාන සංයුක්ත විභාග 02 කින් සමන්විත ය. ඒවා නම්, දෙවන එම්.බී.බී.එස්. සහ අවසන් එම්.බී.බී.එස්. ලෙස වේ.

අපේ මෙහෙවර වන්නේ උසස් කුසලතාවෙන් සමන්විත, සමාජයට වගකියනු ලබන සෞඛ්‍ය රැකවරණයේ යෙදෙන උසස් වෘත්තීමය තත්වයෙන් යුතු විවිධත්වය, තාර්කික චින්තනය, අන්තර්ග්‍රහණය සහ නිර්මාණශීලීත්වයට දායකත්වයක් දක්වන සංස්කෘතියක ශික්ෂණය දියුණු කිරීම කෙරෙහි කැපවීමෙන් කටයුතු කරන වෘත්තිකයන් බිහි කිරීමය.

අධ්‍යයන පාඨමාලා මෙහෙයවන ප්‍රධාන මූලධර්ම සහ එම්.බී.බී.එස්. උපාධිධාරියෙකුගෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල වන්නේ (1) උපරිම සෞඛ්‍ය ආරක්ෂාවක්, අභිවර්ධනය සහ විශිෂ්ඨතාව ළඟා කර ගැනීමට ඇති කැපවීම, (2) සාමාජීය හා මහජන සෞඛ්‍ය කෙරෙහි ඇති කැපවීම, (3) සඵලදායී සහයෝගීතාව හා සන්නිවේදනය, (4) සදාචාර සම්පන්න හැසිරීම හා වෘත්තීයවේදීත්වය, (5) නායකත්වය සහ කණ්ඩායම් වැඩ, (6) විවිධත්වය ගරු කිරීම වේ.

එම්.බී.බී.එස්. පාඨමාලාවේ ඇති ප්‍රධාන ලක්ෂණය වන්නේ පළමු සමාසිකයේ සිටම උගන්වනු ලබන විෂයයන්වල ඇති සායනික අදාළත්වය සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට හඳුන්වාදීමයි. මෙය අත්කරගනු ලබන්නේ මුල් අවධියේ රෝගීන්, ඡායාරූප, වීඩියෝ සහ ලිඛිත මාධ්‍යමය සිද්ධීන් යොදා ගනිමිනි.

4 වන සමාසිකයේ සිට රෝහල් කේන්ද්‍ර කොටගත් සායනික පුහුණුව කෙරෙහි වැඩි නැඹුරුවක් ඇත. බොහෝ විට අවසාන වසර එක හමාරක කාලයකදී පුහුණු කිරීම හා ඉගැන්වීම සිදුවන්නේ රෝහල්වලය. පාඨමාලාවේ අමතර ලක්ෂණ වන්නේ පාඨමාලාවේ ආරම්භයේ සිට ගැටළු විසඳීමේ හැකියාවක් ඇති කරවීමයි. වෛද්‍ය විද්‍යාවේ භාවිතයන් සඳහා මූලික විද්‍යාවන් යොදා ගැනීම, ශිෂ්‍ය කේන්ද්‍රීය හා ස්වයං නියාමන අධ්‍යයනය, කුඩා කණ්ඩායම් අධ්‍යයනය සහ තිරස් සහ සිරස් විෂයය ඒකාබද්ධතාවයයි. සිසුන් විසින් ඔවුන්ගේ පුහුණුවේ කොටසක් වශයෙන් පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

අධ්‍යයන පාඨමාලාවේ උපදෙස් ලබා දෙන මාධ්‍ය සහ ඇගයීම් මාධ්‍ය වන්නේ ඉංග්‍රීසි භාෂාවය. විභාගයේදී සාර්ථක වන මනා චරිතයකින් හෙබි ශිෂ්‍යයන් සීමාවාසික පුහුණුව හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා නිර්දේශ කරනු ඇත.

ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය

පීඨයෙහි දැනට පාඨමාලා සම්මාන ක්‍රමයක් ක්‍රියාත්මක වේ. වසර 04 ක කාලසීමාව සඳහා මුළු සම්මාන සංඛ්‍යාව 120 කි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබන පාඨමාලාවල ශිෂ්‍යයන්ට ලබා ගත හැකි විශේෂීකරණ ක්ෂේත්‍ර වන්නේ ව්‍යාපාර කළමනාකරණය, ගණකාධිකරණය හා ව්‍යාපාර මූල්‍ය, බැංකු හා මූල්‍ය සහ රක්ෂණය හා මූල්‍යයයි. ශිෂ්‍යයන් කැමැත්ත පළ කළ පාඨමාලාවන්ගෙන් පළමු වසර දෙක (සමාසික I, II) තුළදී ඔවුන් දැක්වූ සාධනය මත විශේෂීකරණය සඳහා තොරා ගැනීම පදනම් වේ.

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය උපාධි පාඨමාලා දෙකක් සඳහා සිසුන් බඳවා ගනියි.

I. විද්‍යාවේදී ගෞරව කෘෂිකර්ම උපාධිය - [BScHons (Agriculture)]
II. විද්‍යාවේදී ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධිය - [BBST(Hons)]

ක්‍රෙඩිට් (Credit) ඒකක ක්‍රමය පදනම් කර ගනිමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙම උපාධි පාඨමාලා දෙකම මෙහෙයවනු ලැබේ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ඔවුන් සතු කුසලතා හා පහසුකම් පදනම් කර ගනිමින් සිසුන්ගේ භාෂා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා මූලික අධ්‍යයන වැඩසටහන් මඟින් උපාධි පාඨමාලාව සඳහා දායකත්වය සපයයි.

(i) විද්‍යාවේදී ගෞරව කෘෂිකර්ම උපාධි පාඨමාලාව - [BScHons (Agriculture)]

SLQF අදියර 6 හා සමගාමී වන පරිදි විශේෂයෙන් සැලසුම් කරන ලද මෙම අවුරුදු හතරක උපාධි පාඨමාලාව කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ මූලික සංකල්ප, න්‍යායයන්, ප්‍රායෝගික දැනුම සහ තාක්ෂණය පිළිබඳ පදනම් කරගත් බහුවිධ ක්ෂේත්‍රයන්හි දැනුමෙන් සමන්විත උපාධිධාරීන් බිහිකරලීම සඳහා සැලසුම් කරන ලද්දකි. මෙම උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනැමෙන අතර ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් සකසන ලද ක්‍රෙඩිට් 120 කින් සමන්විත සවිස්තර විෂය නිර්දේශය මූලික පාඨමාලා සහ විශේෂ පාඨමාලාවන්ගෙන් සමන්විතය. මූලික විෂය පාඨමාලාව පළමු වසර දෙක ඇතුළත ඉගැන්වෙන අතර එහි දී ශිෂ්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය සහ වැවිලි බෝග, ආහාර විද්‍යාව, කෘෂිකාර්මික රසායන විද්‍යාව, පාංශු විද්‍යාව, කෘෂිකාර්මික හා කාර්මික ක්ෂුද්‍රජීවී විද්‍යාව, ආර්ථික විද්‍යාව, කෘෂි ව්‍යාපාර කළමනාකරණය සහ අලෙවිකරණය, භෝග භෞතවේදය, භෝග සංරක්ෂණය සහ භෝග අභිජනනය, සත්ත්ව පාලනය, භෝග ආශ්‍රිත පර්යේෂණ, කෘෂි ඉංජිනේරු විද්‍යාව සහ සංඛ්‍යානමය ක්‍රමවේදය ආදී විෂයන් ආවරණය කෙරේ.

තෙවන වසරේ සිට ශිෂ්‍යයන්හට තම අභිමතය පරිදි විෂය ඒකක හයක් (06) අතරින් එක් ධාරාවක් තෝරා ගත හැකිය. එම විෂය ඒකක කෘෂි ආර්ථික විද්‍යාව සහ කෘෂි ව්‍යාපාර කළමනාකරණය, වැවිලි සම්පත් කළමනාකරණය, වැවිලි නිෂ්පාදන සංවර්ධන තාක්ෂණය, උද්‍යානවිද්‍යා හා භූමි අලංකරණය, පශ්චාත් අස්වනු උද්‍යාන විද්‍යාව සහ ජෛව තාක්ෂණය යන අංශයන්ය. අවසන් වසරේදී සිසුන් ස්වාධීන විචාර චින්තන හැකියා සහ වාචික සහ ලිඛිත සන්නිවේදන හැකියා වර්ධනය සඳහා මඟ පෙන්වන පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම අවශ්‍යය. තව ද අවසන් වසර සිසුන් පෞද්ගලික අංශයේ ආයතනික පුහුණුවක් සඳහා සහභාගී විය යුතු අතර එමඟින් සත්‍ය ලෝකයේ වැඩ කටයුතු කෙරෙන අන්දම පිළිබඳව අත්දැකීමක් ලැබෙනු ඇත. එමඟින් තම රැකියා සුරක්ෂිතභාවය ද ලැබේ. තවත් එක් ප්‍රමුඛතාවයක් වන්නේ සිසුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කර ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මඟින් සම්පාදනය කරන ලද ඒ සඳහාම විශේෂයෙන් සකසන ලද වැඩසටහන්ය. මෙම විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සකසන ලද පාඨමාලා විෂය ඒකක මඟින්

උපාධිධාරීන්ට දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීමය රැකියා අවස්ථා සඳහා ඉඩ ප්‍රස්ථා ලැබෙනු ඇත.

බොහොමයක් සිසුහු උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොමු වීමට විදේශ ශිෂ්‍යත්ව ලබා ගැනීමෙහි සමත් වෙති.

(*ii*) *විද්‍යාවේදී ජෛවපද්ධති තාක්ෂණ ගෞරව උපාධිය - [BBST(Hons)]*

විද්‍යාවේදී ජෛවපද්ධති තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව වසර හතරක (04) උපාධි පාඨමාලාවකි. ශ්‍රී ලංකාවේ ජෛව විද්‍යා නිෂ්පාදන පද්ධතියේ සහ නිෂ්පාදන සංවර්ධනයේ තිරසාර භාවිතය පිළිබඳ තාක්ෂණය සහ ප්‍රායෝගික භාවිතය, මූලික සංකල්ප පිළිබඳ උසස් න්‍යායාත්මක දැනුමක් සහිත උපාධිධාරීන් බිහිකරලීම සඳහා මෙය සකසනු ලැබ ඇත. වඩාත් විධිමත්ව සැලසුම් කරන ලද විෂය මාලාවක් මඟින් ක්‍රෙඩිට් (Credit) ඒකක 124 ක් ආවරණය වන පරිදි මෙය සකසා ඇත. මේ පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සිසුන්හට කෘෂිකාර්මික තාක්ෂණය, ජෛව ශක්ති ප්‍රභව, විද්‍යුතය හා විද්‍යුත් තාක්ෂණය, පරිසර තාක්ෂණය, ආහාර තාක්ෂණය, ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ තිරසාර පැවැත්ම යන විෂයන් පිළිබඳව පුළුල් ප්‍රවීනත්වයක් ලබා ගත හැකිය. අධ්‍යාපන හා අධ්‍යයනමය නූතන සංකල්ප සමඟින් පර්යේෂණ මත පදනම් වූ බහුවිධ විෂයීක දැනුම, ආහාර සුරක්ෂිතතාව සහ තීරණ ගැනීමේ සහ උපදේශන සේවා හා නව සොයා ගැනීම් සඳහා දායකත්වය සැපයිය හැකි සංකීර්ණ ගැටළු විසඳිය හැකි නව්‍ය අත්දැකීමකින් සමන්විත ප්‍රාමාණික දැනුමකින් සමන්විත උපාධිධාරීන් බිහිකරලීම මෙහි අරමුණය.

පර්යේෂණ ව්‍යාපෘති සහ සවිස්තරාත්මක ප්‍රායෝගික පුහුණුව මඟින් තම නෛසර්ගික මෘදු කුසලතා සහ දැනුම මඟින් අප රටෙහි කර්මාන්ත ක්ෂේත්‍රයේ මධ්‍යම සහ ඉහළ මට්ටමේ තාක්ෂණික සහ තාක්ෂණ කළමනාකරණ තනතුරු සඳහා බැඳීමේ අවස්ථාව උපාධිධාරීන් හට උදා වෙයි. කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය පන්නල සිට කි.මී. 4 ක් දුරින් මාකඳුරෙහි ස්ථාපිතව ඇති අතර මීගමුව කුරුණෑගල මාර්ගයේ දන්කොටුව සිට කි.මී. 15 ක් දුරින් පිහිටා ඇත. කොළඹ සිට පැය 1 1/2 කට අඩු කාලයකින් ළඟාවිය හැකිය.

පශු සම්පත්, සීවර සහ පෝෂණ පීඨය

මෙම පීඨය මඟින් විද්‍යාවේදී උපාධි පාඨමාලා දෙකක් පිරිනමනු ලබයි. ඒවා නම්,

(අ) ආහාර විද්‍යාව සහ පෝෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය

(ආ) ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම සිව් අවුරුදු පාඨමාලාවේදී ප්‍රථම වසර දෙක තුළදී උපාධි අපේක්ෂකයින් විසින් පොදු පාඨමාලාවක් හදාරනු ලබන අතර, අවසන් දෙවසර තුළදී ව්‍යවහාරික පෝෂණය හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය යන අංශ යටතේ ගෞරව උපාධිය හැදෑරීම සඳහා අවකාශ ලැබේ.

(අ) ආහාර විද්‍යාව හා පෝෂණය

ආහාර විද්‍යාව හා පෝෂණ පාඨමාලාව මඟින් ආහාර තාක්ෂණය හා මානව පෝෂණය සම්බන්ධ මූලධර්ම පිළිබඳව සිසුන් හට පුළුල් අවබෝධයක් ලබා දෙයි. සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන සිසුන් (1) ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳව පුළුල් විද්‍යාත්මක දැනුමක්, (2) සමාජ විද්‍යාව, අලෙවිකරණය හා කළමනාකරණ යේදීම් ආශ්‍රිත දැනුමක් සහ අවබෝධයක්, (3) ගැටළු විසඳීමේ හා ආශ්‍රිත පර්යේෂණවල යෙදීමේ හැකියාවක්, (4) විෂයානුබද්ධ වෘත්තීමය හා ප්‍රායෝගික නිපුණතාවයන් සහ ව්‍යාපාර හා පුද්ගල නිපුණතාවන් ලබා ගනී.

පළමු මට්ටම (Level I) තුළදී පිරිනමනු ලබන විෂයයන් තුළින්, ජීව රසායන විද්‍යාව, මානව කායික විද්‍යාව, ආහාර හා පෝෂණය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ආහාර අළෙවිකරණය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව, ආහාර සැකසුම හා පරිරක්ෂණය, ආහාර විශ්ලේෂණය හා තත්ව සහතිකකරණය පිළිබඳ ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

මීට අමතරව සිසුන් විසින් ඉංග්‍රීසි, ගණිතය, සංඛ්‍යානය හා තොරතුරු තාක්ෂණ විෂයයන් හැදෑරිය යුතුය. මට්ටම් II හා III තුළදී සිසුන් තමන්ගේ විශේෂ අධ්‍යයන ධාරාවට අනුබද්ධව: ව්‍යවහාරික පෝෂණ ක්ෂේත්‍රය (ආහාරවේදය, මහජන සෞඛ්‍ය හා ප්‍රජා පෝෂණය, ආහාර හා රෝගාබාධ, ක්‍රීඩා හා ව්‍යායාම පෝෂණය), ආහාර විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රය (ආහාර රසායන විද්‍යාව, ආහාර ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, ආහාර ආරක්ෂිතතාව, කිරි, මත්ස්‍ය, මාංශ, ධාන්‍ය, එළවළු හා පළතුරු ආශ්‍රිත ආහාර තාක්ෂණය) විෂයයන් හදාරයි. සියලුම විෂයන් සඳහා විද්‍යාගාර හෝ ක්ෂේත්‍ර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

හත්වන සමාසිකය තුළදී සියලුම සිසුන් විසින් පර්යේෂණ ව්‍යාපෘතියක නියැලිය යුතුය. අවසාන සමාසිකය

තුළදී සිසුන් සඳහා විෂය ධාරාවට සම්බන්ධ පිළිගත් බාහිර ආයතන තුළ සති දහයක සේවාස්ථ පුහුණුවක (In plant Training) නියලීමට අවස්ථාව සලසා ඇත.

මෙම උපාධි පාඨමාලාව මඟින් සිසුන් හට ආහාර තාක්ෂණවේදී, පෝෂණවේදී, ආහාරවේදී, ආහාර රසායනඥ, තත්ත්ව සහතික විද්‍යාඥ, කළමනාකරු, පුද්ගලික ව්‍යාපාර, අධ්‍යාපනඥ, පුහුණුකිරීම් හා පර්යේෂණ ක්ෂේත්‍රවල රැකියාවල නියැලීමට අවශ්‍ය සිද්ධාන්තමය හා වෘත්තීමය නිපුණතාවය ලබා දෙයි. තව ද මෙම පාඨමාලාව මඟින් පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා නිපුණත්වය ලබා දෙයි.

(ආ) ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය

මෙම පාඨමාලාවේදී ප්‍රථම වසර දෙක උපාධි අපේක්ෂකයන් පොදු පාඨමාලාවක් හදාරනු ලබන අතර අවසන් දෙවසර තුළ පශු සම්පත් හා පක්ෂි විද්‍යාව හෝ ධීවර හා ජලජ ජීවී විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන් සිසුනට තෝරා ගත හැකිය.

ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණ පිළිබඳ ගෞරව සිව් අවුරුදු පාඨමාලාව එම ක්ෂේත්‍රයේ දේශීය සහ විදේශීය අවශ්‍යතාවන් සපුරාලන අතර නිෂ්පාදන කළමනාකරණය ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතාවයන්ට සහ අනාගත අභියෝගයන්ට අනුකූලව සැකසී ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ඔස්සේ ඉදිරියට දිවෙන මෙම පාඨමාලාවෙහි අන්තර්ගතය තුළ ක්ෂේත්‍ර අධ්‍යයනයන්, ආයතනගත අධ්‍යයනයන් සහ ආහාර නිෂ්පාදනය හා බැඳුණු පර්යේෂණයන්ගෙන් ද සමන්විත වනු ඇත.

සෛද්ධාන්තික දැනුම මෙන්ම ප්‍රමාණවත් ප්‍රායෝගික දැනුමක් ලබාදීම පිණිස අනිවාර්යය විෂය ධාරාවන්ට අමතරව තෝරාගත හැකි විෂයයන් රාශියක් ඇතුළත් කර තිබීම මෙහි විශේෂයක් වන අතර ආයතනගත පුහුණුවට අමතරව සයමසක පර්යේෂණ පාඨමාලාවකට සිසුන් යොමුකරලීම මෙහි ඇති අනෙක් විශේෂත්වයයි. බහුවිධ විෂය මාලාවන් ඔස්සේ මූලික විෂයය සංකල්පයන්ගේ සිට පුළුල් විෂය දැනුමක් සහ අවබෝධයක් ලබා දීම මඟින් විශේෂ කුසලතාවයන් සහ ආකල්පයන්ගෙන් සපිරි රැකියා සඳහා මනා ප්‍රවීණතාවයක් ඇති උපාධිධාරීන් පිරිසක් මෙමඟින් බිහිකෙරේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ මුල් දෙවසර තුළ පැවැත්වෙන පළමු පෙල විෂයයන් ඔස්සේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලි හා අනුගත මූලික සංකල්පයන් හා කුසලතාවයන් වෙත සිසුන් යොමු කෙරෙන අතර පරිගණක දැනුම, ගණිතය, සංඛ්‍යානය වැනි විෂයය දැනුම ද ලබා දේ.

පළමු පෙල විෂයය මාලාව සාර්ථකව සම්පූර්ණ කරන සෑම ශිෂ්‍යයකුටම තමන් තෝරා ගන්නා, අධ්‍යයන අංශයක් තුළ තුන්වන සහ හතරවන වසරවලදී ගෞරව පාඨමාලා හැදෑරීමේ අවස්ථාව හිමි වේ.

මේ යටතේ පශු සම්පත් සහ පක්ෂි විද්‍යා අධ්‍යනාංශයේ හෝ ධීවර සහ ජලජ ජීවී අධ්‍යයන අංශයේ විෂයය සංකලනයන් ඔවුනට තෝරා ගත හැකිය. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ආහාර විද්‍යාව හා තාක්ෂණ අධ්‍යයනාංශය සහ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය මඟින් පිළිගනු ලබන සමහර විෂයයන් හැදෑරීමේ අවස්ථාව ද, ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය සිසුන්ට හිමිවනු ඇත.

මෙම උපාධි පාඨමාලාවේ විශේෂත්වය වන්නේ සම්ප්‍රදායික දැනුමෙන් ඔබ්බට යොමුවෙමින් ආහාර නිෂ්පාදන තාක්ෂණය හා බැඳුනු නූතන දැනුම ගවේශණය කරමින් නිෂ්පාදන සහ ව්‍යාපාර කළමනාකරණය, පාරිභෝගික අධ්‍යයනයන සහ ජීවන කුසලතා සංවර්ධනය යන අංශයන් ඔස්සේ දැනුම, හැකියාවන්, නායකත්වය සහ ගැටළු විසඳීමේ නිපුණතාවයන්ගෙන් හෙබි රැකියානුබද්ධ උපාධිධාරියකු බිහිකිරීමයි. මීට අමතරව ආහාර නිෂ්පාදන අධීක්ෂණය, අලෙවිකරණය, පරීක්ෂණ සහ නව නිපැයුම් කෙරෙහි යොමුවන දැනුම සහ හැකියාවන්ගෙන් ඔවුන් යුක්ත වනු ඇත.

ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ ව්‍යාපාර හා බැඳුණ දැනුම සහ කුසලතාව හදුනා ගැනීමට ආයතන ගත පුහුණුව ඔස්සේ සිසුන්ට ඉඩ සැලසෙන අතර රැකියා සඳහා වඩා උචිත කුසලතා වර්ධනයට මෙම වෘත්තීයය පුහුණුව මඟින් ඔවුන්ට අවස්ථාව උදා වේ.

වෘත්තීය මට්ටමේදී මෙන්ම පශ්චාත් උපාධි මට්ටමේදී වැදගත් වන විශ්ලේෂණ සහ විචක්ෂණ කුසලතාවයන් දියුණු කිරීමේ අරමුණින් සය මසක පර්යේෂණ ව්‍යාපෘතියක් මෙම පාඨමාලාවට අන්තර්ගත කර ඇත.

ව්‍යවහාරික විද්‍යා පීඨය

අ.පොෂ. (උසස් පෙළ) භෞතීය විද්‍යා විෂය ධාරාව හදාළ සියලු සිසුන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයට ඇතුළත්වීමට සුදුසුකම් ලබන අතර අදාළ සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.4.7 කොටසෙහි සඳහන් පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය. ඒ අනුව,

(අ) විෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියක් සහිත වසර හතරක ගෞරව උපාධිය
(ආ) කර්මාන්තමය පුහුණුව සහිත වසර හතරක බද්ධ ප්‍රධාන විෂය උපාධිය සහ
(ඇ) වසර තුනක සාමාන්‍ය උපාධිය යනුවෙන් පහත විස්තර කෙරෙන අන්දමින් උපාධි පාඨමාලා තුනකි.

පීඨයේ ප්‍රථම වසර දෙක තුළ දක්වන ලද අධ්‍යයන ක්‍රියාකාරිත්වය මත පදනම් වූ අභ්‍යන්තර තේරීම් ක්‍රමයක් මඟින් වසර හතරක උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය ලබාදීම සිදු කෙරේ. මූලිකව අ.පොෂ. (උසස් පෙළ) විභාගයේදී ලබා ගන්නා ලද ඉසෙඩ් ලකුණු සහ ඒ ඒ දිස්ත්‍රික්කය මඟින් පීඨයේ ලියාපදිංචිය ලැබූ ප්‍රතිශතය මත පදනම්ව සෑම සිසුවෙකුම පහත සඳහන් විෂය සංයෝග අතුරින් එකක් සඳහා තෝරා ගනු ලැබේ.

සංයෝග 1 : පරිගණක හා තොරතුරු පද්ධති, ඉලෙක්ට්‍රොනික, ගණිතය සහ සංඛ්‍යානය
සංයෝග 2 : ඉලෙක්ට්‍රොනික, කර්මාන්ත කළමනාකරණය, ගණිතය සහ සංඛ්‍යානය
සංයෝග 3 : පරිගණක හා තොරතුරු පද්ධති, කර්මාන්ත කළමනාකරණය, ගණිතය සහ සංඛ්‍යානය

ඉහත සඳහන් දෙවන විෂය සංයෝගය සඳහා තේරී පත්වන සිසුන් සඳහා ද උපාධි පාඨමාලාවට අමතරව තම පරිගණක හා තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමාවක් හැදෑරීම සඳහා අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

ඕනෑම විෂය සංයෝගයක් සඳහා සුදුසුකම් ලැබූ සියලු සිසුන් පළමු අධ්‍යයන වර්ෂ දෙක තුළ එම විෂයයන්ට අදාළ අධ්‍යයන කටයුතු කළ යුතු වේ. දෙවන වසර අවසානයේදී, පීඨය මඟින් විශේෂ කොට (අ) සහ (ආ) යටතේ සඳහන් වසර හතරක උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අයදුම් කළ හැකිය.

(අ) වසර හතරක විද්‍යාවේදී ගෞරව ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)
වසර හතරක විද්‍යාවේදී ගෞරව කර්මාන්ත කළමනාකරණ උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)
වසර හතරක විද්‍යාවේදී ගෞරව සංඛ්‍යානය සමඟ ගණිතය උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)

ඉහත සඳහන් උපාධි පාඨමාලා සිසුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා වන උනන්දුව සහ පර්යේෂකයන් වීමට හෝ යම් විෂය ක්ෂේත්‍රයක් අදාළ පසු එම විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයින් වීමට ඇති උනන්දුව අනුව සකසන ලද පාඨමාලා වේ. ගෞරව උපාධි පාඨමාලාවක් සඳහා ප්‍රවේශය ලැබීම අතිශය තරඟකාරී වන්නේ ඉහත අදාළ විෂය ක්ෂේත්‍රයේ උසස් ප්‍රවීණතාවක් පෙන්වා උසස් තත්වයක් අත්පත් කර ගන්නා ලද සීමිත සිසුන් කිහිප දෙනෙකුට පමණක් වන බැවිනි. සියලු ගෞරව උපාධි පාඨමාලාවන් සඳහා විශේෂීකරණය වන විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිව්වන වසර තුළ අන්තර්ගතය.

(ආ) වසර හතරක විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) උපාධිය - ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 † (ඉංග්‍රීසි මාධ්‍යය)

† ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 විෂයයන් පහත සඳහන් පරිදි සංයෝග වේ.

ප්‍රධාන විෂය 1	ප්‍රධාන විෂය 2
පරිගණක හා තොරතුරු පද්ධති	ඉලෙක්ට්‍රොනික/ කර්මාන්ත කළමනාකරණය/ ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය
ඉලෙක්ට්‍රොනික	පරිගණක හා තොරතුරු පද්ධති/ කර්මාන්ත කළමනාකරණය/ ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය
කර්මාන්ත කළමනාකරණය	පරිගණක හා තොරතුරු පද්ධති/ ඉලෙක්ට්‍රොනික/ ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය
ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය	පරිගණක හා තොරතුරු පද්ධති/ ඉලෙක්ට්‍රොනික/ කර්මාන්ත කළමනාකරණය

ප්‍රධාන විෂය 1 විෂය ධාරාව මඟින් ඒ ඒ සංයෝගය සඳහා ප්‍රධාන විෂය 2 ට වඩා සිසුන්ට විෂය පිළිබඳව පුළුල් ආවරණයක් සැපයෙන අතර ඇතැම් ප්‍රධාන විෂය 1 විෂයයන් සඳහා සීමිත පිරිසක් ලියාපදිංචි කෙරෙන අතර ඒ සඳහා වන ඉඩකඩ අභිබවා ඉල්ලුමක් පවතී.

මෙම සියලු බද්ධ ප්‍රධාන විෂය උපාධීන් ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 ලෙසින් තෙවන වසර සිට ඉදිරියට ක්‍රියාත්මක වන පාඨමාලාවන් වන අතර සිව්වන වසර සමන්විත වන්නේ මුල් සමාසික පීඨය තුළ ඉගෙනුම් පාඨමාලාවලින් සමන්විත වන පරිදි සහ දෙවන සමාසිකය රාජ්‍ය හෝ පෞද්ගලික බාහිර ආයතනයක පූර්ණ අත්දැකීම් සහ අවබෝධය සහිත ආයතනික සමාසික පුහුණුවකින් සමන්විත වන අන්දමිනි.

මෙම බද්ධ ප්‍රධාන විෂය උපාධීන් මඟින් අපේක්ෂා කරන්නේ සිසුන් විසින් අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍ර දෙකකට අදාළව දැනුම සහ අත්දැකීම් පුළුල් කර ගැනීමත් උපාධිය ලබා ගැනීමට ප්‍රථම පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ ආයතනවල පරිසරය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමත්ය.

(අ) හි සඳහන් විෂයානුබද්ධ ගෞරව උපාධි පාඨමාලා සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය තරම් මෙම උපාධි පාඨමාලාව සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය තරඟකාරී නොවේ. එහෙයින් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු විශේෂයෙන් පෞද්ගලික අංශයේ රැකියා අපේක්ෂා කරන සිසුන් සඳහා මෙහි වැඩි අවස්ථාවක් පවතී.

(ඇ) වසර තුනක - විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය

ආරම්භයේ සිට වසර තුනක අධ්‍යයන කාලය නිම කිරීමෙන් විශ්වවිද්‍යාලයෙන් පිටවීමට අපේක්ෂා කරන සිසුන් සඳහා සහ වසර හතරක උපාධි පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වසර තුනක විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව හැදෑරිය හැකිය. මෙම පාඨමාලාව ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකෙරේ. මෙම උපාධිය මුල් විෂය සම්බන්ධතාවට අදාළව ලැයිස්තු ගත කරන ලද ප්‍රධාන විෂයන් තුනකින් සමන්විතය.

මෙහි (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් කරන ලද සියලු උපාධි පාඨමාලා සඳහා භාෂා මාධ්‍යය ඉංග්‍රීසි වන හෙයින් ඉංග්‍රීසි ඉගැන්වීම විෂය සමගාමී අධ්‍යයන වැඩසටහන හා සමගාමීව මුල් වසර දෙක තුළ සිදු කෙරේ. තව ද ව්‍යාපාර ඉංග්‍රීසි (Business English) පාඨමාලාවක් සහ උසස් ඉංග්‍රීසි කුසලතා පාඨමාලාව (Advanced English Proficiency Course) තුන්වන වර්ෂය තුළ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් උසස් කුසලතා අත්පත් කර ගැනීමට අදහස් කරන සිසුන් සඳහා පිරිනැමේ.

තාක්ෂණ පීඨය

වයඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය පහත සඳහන් අධ්‍යයන අංශ හතරකින් සමන්විත වේ.

1. ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයන අංශය
2. විද්‍යුත් තාක්ෂණ අධ්‍යයන අංශය
3. යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශය
4. ද්‍රව්‍ය සහ නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයන අංශය

උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදී විෂය ධාරාවේ සිසුන් ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා තාක්ෂණ පීඨයට ඇතුළත් කරගනු ලැබේ. සිසුන්හට ඉහත සඳහන් අධ්‍යයන අංශ යටතේ පහත පරිදි විශේෂීකරණ උපාධි ලබාගත හැකිය.

(i) ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය
(ii) විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය
(iii) යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය
(iv) ද්‍රව්‍ය සහ නැනෝ විද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

උපාධි පාඨමාලා ක්‍රෙඩිට් (Credit) අගය මත පදනම් වූ පාඨමාලා ඒකක ක්‍රමයක් යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. සියලුම උපාධි පාඨමාලා පූර්ණකාලීන වන අතර පාඨමාලාවල අධ්‍යයන කාලය අධ්‍යයන වර්ෂ හතරකි.

විශේෂීකරණ පාඨමාලා තෝරා ගැනීම

පීඨයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද ශිෂ්‍ය අත්පොතේ දක්වා ඇති නිර්ණායකයන්හි විස්තර කර ඇති පරිදි තාක්ෂණ පීඨයට ඇතුළත් කර ගන්නා සිසුන් ඔවුන්ගේ තේරීම හා Z- අගය මත පදනම්ව ඉහත උපාධි පාඨමාලා වෙත යොමු කරනු ලැබේ. ඉහත දක්වා ඇති (i),(ii) සහ (iii) විශේෂීකරණ උපාධි පොදු කණ්ඩායමක් ලෙස පළමු සමාසික තුන සම්පූර්ණ කිරීමෙන් පසු සිව්වන සමාසිකයේ සිට ආරම්භ කෙරේ. ඉහත දක්වා ඇති (iv) විශේෂීකරණ උපාධිය ආරම්භයේ සිටම වෙනම අධ්‍යයන වැඩසටහනක් ලෙස ආරම්භ වේ.

විශේෂීකරණ වැඩසටහන් යටතේ හැදෑරිය යුතු පාඨමාලා

(i),(ii) සහ (iii) උපාධි සඳහා පොදු වැඩසටහන යටතේ පොදු සමාසික තුනට ඉංජිනේරු ගණිතය, ඉංජිනේරු භෞතික විද්‍යාව, කාර්මික කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ විශේෂීකරණ වැඩසටහන් තුනට පොදුවේ සම්බන්ධ වන මොඩියුල කිහිපයක් ඇතුළත් වේ. සිව්වන සමාසිකයේ සිට සිසුන් හට විශේෂීකරණ ක්ෂේත්‍රය යටතේ වන අනිවාර්ය විෂයයන් සහ තෝරාගත් විෂයයන් අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසේ. උපාධි පාඨමාලාවේ අවසාන අධ්‍යයන වර්ෂයන්හිදී සිසුන් විසින් කණ්ඩායම් සැලසුම් ව්‍යාපෘතියක් සහ තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරනු ලැබේ. සියලුම උපාධි පාඨමාලා සඳහා වන පාඨමාලා මොඩියුලවල සම්පූර්ණ ලැයිස්තු පීඨ වෙබ් අඩවියේ පළකර ඇති ශිෂ්‍ය අත්පොතේ දක්වා ඇත. ලොවපුරා වඩාත් සුලබ ඉංජිනේරු තාක්ෂණ අංශවල රැකියා වෙළඳපොල සපුරාලීම සඳහා මෙම විශේෂීකරණ උපාධි තුන සැලසුම් කර ඇත.

සිව්වන (iv) විශේෂීකරණ උපාධි පාඨමාලාවේ පළමු සමාසික දෙක භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව පිළිබඳ මූලික විෂයයන්ගෙන් සමන්විත වේ. කාර්මික අංශයේ ගැටළු සඳහා විසඳුම් සෙවීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා ස්වයං ඉගෙනුම් කුසලතා වර්ධනය කර ගැනීම සඳහා තෙවන සමාසිකයේ සිට සිසුන් ද්‍රව්‍ය සහ නැනෝ විද්‍යා තාක්ෂණයේ ප්‍රධාන ක්ෂේත්‍රයන්ට අදාළ මූලික සිද්ධාන්ත අධ්‍යයනය කර ඒවා

ක්‍රියාත්මක කරයි. උපාධි වැඩසටහන සඳහා රසායන විද්‍යාව, භෞතික විද්‍යාවල ද්‍රව්‍ය විද්‍යාව, ජීව තාක්ෂණය, නැනෝ ඖෂධ සහ බලශක්ති වැනි විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ අත්‍යවශ්‍ය සෛද්ධාන්තික සහ ප්‍රායෝගික කරුණුවලින් සමන්විත වේ. නැනෝ තාක්ෂණයේ පරිගණක යෙදුම් සඳහා සිසුන් පරිගණක විද්‍යාව පිළිබඳව විශේෂ දැනුමකින් විෂය සමගාමීව අධ්‍යයනය කරනු ඇත.

මීට අමතරව පාඨමාලා හතරට ඇතුළත් සිසුන්ගේ මෘදු කුසලතා (Soft skills) වර්ධනය සඳහා අවස්ථාව සලසා දෙනු ලබයි. කණ්ඩායම් සැලසුම් ව්‍යාපෘතිය සහ/ හෝ තනි පර්යේෂණ ව්‍යාපෘති හරහා සැබෑ ලෝකයේ තාක්ෂණික ගැටළු විසඳීම සඳහා දැනුම හා කුසලතා යෙදවීමට සිසුන්ට පුහුණුව ලබාදෙනු ඇත. රැකියා පරිසරය පිළිබඳව අත්දැකීමක් ලබාදෙනු පිණිස හත්වන සමාසිකයේ දී සිසුන් බාහිර ආයතනයක සති 24ක අනිවාර්ය පුහුණුවක් සඳහා යොමුකරනු ලැබේ.

ශ්‍රී ලංකා උඩ වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
වෛද්‍ය විද්‍යාව	-	E
විද්‍යාව සහ තාක්ෂණය	-	E
පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	-	E
ව්‍යවසායකත්වය සහ කළමනාකරණය	-	E
සත්ව නිෂ්පාදනය සහ ආහාර තාක්ෂණය	-	E
අපනයන කෘෂිකර්මය	-	E
කාර්මික තොරතුරු තාක්ෂණය	-	E
ඛණිජ සම්පත් සහ තාක්ෂණය	-	E
ජලජ සම්පත් තාක්ෂණය	-	E
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	-	E
ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	-	E
ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	-	E
මානව සම්පත් සංවර්ධනය	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
ඉංග්‍රීසි භාෂාව සහ ව්‍යවහාරික වාග් විද්‍යාව	-	E
වැවිලි කළමනාකරණය හා තාක්ෂණය	-	E

විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය

දැනුම, හැකියාවන් සහ සංකල්පමය වර්ධනය විවිධ වූ විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීමත්, ස්වභාවික හා දේශීය සම්පත්වලට වඩා වැඩි අගයක් හිමිකර දෙමින් විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ ක්ෂේත්‍රයන්හි නව පිබිදීමක් ඇතිකරලීමත් මෙහි අරමුණ වෙයි.

පරිගණක විද්‍යාව හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය

ස්වයං අධ්‍යයනය හා පර්යේෂණ මඟින් ලබාගත් පරිගණක තාක්ෂණික දැනුම භාවිතා කරමින් දේශීය කර්මාන්තිකයන්ට අගයක් එකතු කර එමඟින් ජාතික ආර්ථිකයේ දියුණුවට දායකවිය හැකි උපාධිධාරීන් බිහි කිරීම.

ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ව්‍යවසායකත්වය සහ කළමනාකරණය

උපාධි පාඨමාලා විස්තරය
උඩ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය, කළමනාකරණ අධ්‍යයන පීඨයට අයත් කළමනාකරණ විද්‍යා අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබන, ව්‍යාපාර කළමනාකරණවේදී; ව්‍යවසායකත්ව හා කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ සය වැනි ස්තරයට අයත්වන සිව් අවුරුදු

වෘත්තීයමය උපාධි පාඨමාලාවකි.

උපාධි පාඨමාලාවේ අරමුණ
ව්‍යවසායකත්ව හා කළමනාකරණ නිපුණතාවලින් පරිපූර්ණ, දේශීය සහ විදේශීය තරඟකාරී රැකියා වෙළඳපළට ගැලපෙන ව්‍යාපාරික හා ව්‍යවසායකත්ව ඥානයෙන් යුක්ත, ව්‍යවසායකයින් බිහි කිරීම මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණයි.

උපාධි පාඨමාලාවේ අන්තර්ගතය
අධ්‍යයන වාර අටකින් සමන්විත ව්‍යවසායකත්වය හා කළමනාකරණය පිළිබඳව ගෞරව උපාධි පාඨමාලාව, අනිවාර්යය හා විකල්ප පාඨමාලා ඒකක වලින් යුක්ත වේ.

පළමුවන අධ්‍යයන වර්ෂයට අයත් අධ්‍යයන පාඨමාලාවන්, උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය මූලික කළමනාකරණ සිද්ධාන්ත, ව්‍යවසායකත්වය, අලෙවි ක්‍රමවේද, ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම ලබා දීම අරමුණුකොට ඇති අතර අත්‍යාවශ්‍ය ජීවන කුසලතා හා පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ද සමන්විත වෙයි.

දෙවන අධ්‍යයන වර්ෂය, ව්‍යවසායකත්ව හා කළමනාකරණයට අදාළ න්‍යාය හා සිද්ධාන්ත පාඨමාලාවන්ගෙන් ද තොරතුරු කළමනාකරණය, මූල්‍ය විශ්ලේෂණය මෙන් ම පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපන සහ අත්‍යාවශ්‍ය ජීවන කුසලතා සම්බන්ධ පාඨමාලා ඒකක වලින් ද සමන්විත වෙයි.

තෙවන හා සිව්වන අධ්‍යයන වර්ෂවලට අදාළ විෂය මාලාවේ හරය, ව්‍යවසායකත්වය හා කළමනාකරණය පිළිබඳ ක්‍රමවේද අධ්‍යයනයට අදාළ නිර්මාණාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවන්ගෙන් ද ක්ෂේත්‍රයෙහි ආචාරධර්ම හා ආකල්ප සංවර්ධනය ද අරමුණු කොට සකස් කර ඇත. තව ද උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය, ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, අලෙවි කළමනාකරණය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය ඇතුළු කළමනාකරණ හා ව්‍යවසායකත්ව ක්ෂේත්‍ර වලට අදාළ ව්‍යවහාරික දැනුම සහ කුසලතා ලබාදීම ද, විද්‍යාර්ථීන්ගේ තාර්කික චින්තනය, නවෝත්පාදනය, විශ්ලේෂණ කුසලතා සංවර්ධනය හා පෞරුෂත්ව සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලාවන්ගෙන් ද සමන්විත වේ. උපාධි අපේක්ෂකයින්ගේ අවසන් අධ්‍යයන වාරයෙහි පූර්ණ කාලය ව්‍යවසායකත්ව හා කළමනාකරණ ක්ෂේත්‍රවලට අදාළ ස්වාධීන පර්යේෂණ නිබන්ධන ව්‍යාපෘති හා ප්‍රායෝගික ගැටළු නිරාකරණය අරමුණු කරගත් ව්‍යවහාරික ක්‍රියාවලියකින් සහ ව්‍යවසායකත්ව හා කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයෙහි ප්‍රායෝගික පුහුණුව සඳහා ද වෙන් කර ඇත.

විද්‍යාවේදී ගෞරව සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය උපාධි පාඨමාලාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයෙහි සත්ත්ව පාලන විද්‍යා අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබන සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත අධ්‍යාපන සුදුසුකම් රාමුවෙහි 06 වන අදියරට (SLQF Level 06) අනුගත වන ලෙස සකසා ඇත. ගොවිපළ සත්ත්ව කර්මාන්තය හා ආහාර නිෂ්පාදන කර්මාන්තයට අදාළ දේශීය සම්පත් සඳහා නව අගයන් එක් කිරීම මෙම උපාධි පාඨමාලාවේ අරමුණයි. තව ද ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය හා කළමනාකරණය (Farm Animal Production & Management) සහ ආහාර තාක්ෂණය (Food Technology) විද්‍යානුකූලව හා ප්‍රායෝගිකවත් ගුණාත්මකව හා සංරක්ෂණශීලීවත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නව අධ්‍යාපනික ක්‍රමවේදයන්ට අනුව මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත.

පාඨමාලාවේ පළමු අදියරේදී ජීවන කුසලතා සංවර්ධනය, පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපනය, ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය හා කළමනාකරණය සහ ආහාර විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්පාදනය කරනු ලබයි. දෙවන අදියරේදී ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය, විද්‍යානුකූලව ආහාර නිෂ්පාදන තාක්ෂණය, ශිල්පීය ඥානය සහ ක්‍රමවේද භාවිතාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙයි. පාඨමාලාවේ තෙවන අදියරේදී ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය හා කළමනාකරණය සහ ආහාර නිෂ්පාදන තාක්ෂණවේදය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව මෙන්ම ඒ ආශ්‍රිතව නවීන තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීමට සැලසුම් කර ඇත. තව ද මෙම පාඨමාලාව දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතාවයන් කේන්ද්‍ර කොටගත් ශිල්පක්‍රම භාවිතාව, ක්ෂේත්‍ර පුහුණුව (Field Training) සහ ආයතනික පුහුණුව (Industrial Training) ආදී අංශයන්ගෙන් යුක්තය. න්‍යාය අධ්‍යයනය, සිද්ධාන්ත අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් ලැබූ දැනුම සහ කුසලතාවය නිර්මාණාත්මකව භාවිතා කරමින් සිව්වන වසර උපාධි අපේක්ෂකයා තම ස්වාධීන පර්යේෂණ නිබන්ධන කාර්යයෙහි නියුතු වියයුතු අතර එහිදී ගොවිපළ සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණ කර්මාන්තයන්හි ප්‍රායෝගික ගැටළු හඳුනාගෙන පර්යේෂණාත්මකව ඒ සඳහා විසඳුම් ලබාදීම සිදුකරයි. එමෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනය, ආයතනික පුහුණුව සහ පර්යේෂණ නිබන්ධන මඟින් උක්ත ක්ෂේත්‍රයන්ට අදාළ කර්මාන්ත සහ ආයතන සමඟ ඇති කරගන්නා වූ සමීප සම්බන්ධතාවයන් මත උපාධිධාරීන්ට වැඩි රැකියා අවස්ථා විවර වේ. අවසාන වශයෙන් දේශීය සම්පත්වලට නව අගයක් එකතු කිරීමේ ශක්‍යතාවයෙන් හෙබි සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිලාභීන් සඳහා තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ තම අවශ්‍යතාවය තහවුරු කර ගනිමින් ඊට අදාළ වෘත්තීය මංපෙත් සාක්ෂාත් කරනු ලබයි.

විද්‍යාවේදී ගෞරව අපනයන කෘෂිකර්මය උපාධි පාඨමාලාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයෙහි අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය විසින් මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර හදුන්වා දෙනු ලැබුවේ කෘෂිකාර්මික නිපැයුම් සඳහා අගය එකතු කිරීමෙහිලා විශේෂිත දැනුමෙන් යුතු වූ උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින් යුතුවය. විද්‍යාවේදී ගෞරව අපනයන කෘෂිකර්මය උපාධිය යනු සිව් අවුරුදු (සමාසික අටක) විශේෂ උපාධි පාඨමාලාවක් වන අතර එය රැකියා වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් SLQF මට්ටම 6ට ගැලපෙන සේ නිර්මාණය කර ඇත.

ඉහත පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා උපාධි අපේක්ෂකයින්ගේ ව්‍යවසායකත්වය සහ කළමනාකරණ කුසලතා වැඩිදියුණු වන පරිදි අධ්‍යාපන කටයුතු සැලසුම් ගත කර ඇති අතර පළමු වසර දෙක තුළ ලබාදෙන සියලු පාඨමාලා සිසුන්ට අනිවාර්යය වේ. එහිදී ඔවුනට කෘෂිකර්මාන්තය පිළිබඳ මූලික පාඨමාලා, පුළුල් විෂය ධාරා පිළිබඳ සාමාන්‍යය අධ්‍යාපනයට අනුපූරක විෂය කරුණු (ආචාරධර්ම හා නීතිය පිළිබඳ මූලික කරුණු සෞන්දර්යාත්මක අධ්‍යයනය ආදිය) සහ අත්‍යාවශ්‍ය ජීවන නිපුණතා සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනයට (ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණය, ප්‍රමාණාත්මක තර්කණය ආදිය) අදාළ දැනුම ලබාදෙනු ඇත. තෙවන වසරේදී උපාධි අපේක්ෂකයින් කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය, ආහාර සැකසුම් තාක්ෂණය සහ ව්‍යවසායකත්ව කෘෂිකර්මය යන විෂය ධාරා තුනෙන් එකක් යටතේ විශේෂීකරණය වීම අපේක්ෂා කෙරේ. මොවුනට පුළුල් පරාසයක බහුවිධ පාඨමාලා පිරිනැමෙන අතර තවදුරටත් ප්‍රායෝගික දැනුම ඔප්නැංවීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන අංශයෙහි ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක (Field Training) නියැලීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මීට අමතරව සැබෑ සේවා පරිසරය අත්විඳීමටත් ඒ සඳහා උපාධි අපේක්ෂකයන් හැඩගැස්වීම උදෙසා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ කෘෂි පාදක කර්මාන්තවලට අනියුක්තව ආයතනික පුහුණුවක් (Industrial Training) සඳහා යොමු කරනු ලැබේ. අවසාන අධ්‍යයන වාරයේදී සියලුම සිසුන් සය මාසික පර්යේෂණ ව්‍යාපෘතියක නියැලිය යුතු අතර නවීන විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රවේශයන් අනුගමනය කරමින් දේශීය කෘෂිකාර්මික සම්පත් සඳහා අගය එකතු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමුවන ලෙස පර්යේෂණ සිදුකරනු ලබයි. මේ අනුව විද්‍යාවේදී ගෞරව අපනයන කෘෂිකර්මය උපාධිධාරීන් ඕනෑම ක්ෂේත්‍රයක රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් සඳහා සුදුසුකම් සපුරනු ලබන අතර ඔවුන් නව ව්‍යාපාර ගොඩනගා ගැනීමේ හැකියාවන්ගෙන් පිරිපුන් සාර්ථක ව්‍යවසායකයන් පිරිසක් බවට පත්වීම ද අපේක්ෂා කෙරේ.

කාර්මික නොරතුරු තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය

දේශීය කර්මාන්ත සඳහා නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කිරීම සඳහා වූ පරිගණක විද්‍යා හා තාක්ෂණික දැනුම ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වෙයි.

බනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය

දේශීය බණිජ සම්පත් පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක දැනුමක් ලබාදීම, න්‍යායාත්මක දැනුම සහ නූතන ප්‍රායෝගික පුහුණුව උපයෝගී කර ගැනීම තුළින් බණිජ සම්පත් සහ තාක්ෂණවේදය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබාදීම, බනිජ සම්පත් වල අගය වැඩි කිරීම සහ උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අවශ්‍ය විද්‍යා හා තාක්ෂණික දැනුම සැපයීම මෙම පාඨමාලාවේ අරමුණ වෙයි.

විද්‍යාවේදී ගෞරව ජලජ සම්පත් තාක්ෂණය උපාධි පාඨමාලාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයෙහි සත්ත්ව පාලන විද්‍යා අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබන විද්‍යාවේදී ගෞරව ජලජ සම්පත් තාක්ෂණය උපාධි පාඨමාලාව දේශීය සම්පත් සඳහා අගය එකතු කිරීම අරමුණු කරගත් සුවිශේෂී උපාධි පාඨමාලාවකි. ජලජ සම්පත් සඳහා අගය එකතු කිරීම ව්‍යූහගත කරගත් මෙම පාඨමාලාව එකී නිෂ්පාදන ජලජ සම්පත් කළමනාකරණය සහ තිරසාර සංවර්ධනය පදනම්ව සකස් කර ඇත. මෙම උපාධි පාඨමාලාව නූතන න්‍යායන් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් නව විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණික ක්‍රමවේද වලට අනුකූලව ගොඩනගා ඇත. එමෙන්ම පාඨමාලාව අවසානයේදී නවීන තාක්ෂණික ක්‍රමවේද මඟින් ජලජ සම්පත් ගවේශනය කර තිරසාර සංවර්ධනයට යොමු කිරීම සඳහා අවශ්‍ය නිර්මාණශීලී කළමනාකාරිත්වයෙන් හෙබි පරිපූර්ණ බුද්ධිමතුන්, නවෝත්පාදකයන් සහ නායකයන් බිහි කිරීම ද අරමුණු කර පවතී. තව ද ජලජ සම්පත් පිළිබඳ තිරසාර සංවර්ධනය අරමුණු කරගත් මෙකී පාඨමාලාව දේශීය හා ජාත්‍යන්තර අවශ්‍යතා සඳහා වෘත්තිකයන් සම්පාදනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත අධ්‍යාපන සුදුසුකම් රාමුවෙහි 06 වන අදියරට (SLQF Level 06) අනුගත වන පරිදි මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව සකසා ඇත.

පාඨමාලාවේ පළමු අදියර තුළදී ජීවන කුසලතා සංවර්ධනය කිරීම, පුළුල් විෂය ධාරා පිළිබඳ සාමාන්‍ය දැනුම හා ජලජ සම්පත් පිළිබඳ මූලික දනුම ලබාදීම අපේක්ෂා කරනු ලබයි. දෙවන අදියරේදී ජීව-අජීව ජලජ සම්පත් සහ ඒවායේ විවිධත්වය, නිෂ්පාදන තාක්ෂණය, පාරිභෝජනය හා කළමනාකරණය යන විෂය කරුනු සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබාදෙයි. පාඨමාලාවේ අවසන් අදියර දේශීය හා ජාත්‍යයන්තර ප්‍රවණතාවයන් කේන්ද්‍ර කොටගත් ජලජ සම්පත් තාක්ෂණය, ක්‍රමශිල්ප භාවිතාව, ක්ෂේත්‍ර පුහුණුව (Field Training) සහ ජලජ සම්පත් පිළිබඳ ආයතනික පුහුණුව (Industrial Training) ආදී අංශයන්ගෙන් යුක්තය. අවසන් වසර උපාධි

අපේක්ෂකයන් විසින් තම ස්වාධීන පර්යේෂණ නිබන්ධනය ඉදිරිපත් කළ යුතු අතර එය ජලජ සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත ගැටළු හඳුනාගෙන ඒ සඳහා වඩාත් උචිත විද්‍යාත්මක විසඳුම් මත පදනම් විය යුතුය. එමෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනය, ආයතනික පුහුණුව සහ පර්යේෂණ නිබන්ධනය මඟින් එකී ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත සහ ආයතන සමඟ ඇති කරගන්නා වූ සමීප සම්බන්ධතාවය මත උපාධිධාරීන්ට වැඩි රැකියා අවස්ථා විවර වේ. අවසාන වශයෙන් මෙම උපාධි පාඨමාලාව මඟින් නිර්මාණය කරනු ලබන දේශීය ජලජ සම්පත්වලට නව අගය එකතු කිරීමේ ශක්‍යතාවයෙන් හෙබි ජලජ සම්පත් තාක්ෂණවේදය පිළිබඳ විශේෂවේදී උපාධිලාභීන් විසින් තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ තම අවශ්‍යතාවය තහවුරු කරගනිමින් ඊට අදාළ වෘත්තීය මංපෙත් සාක්ෂාත් කරනු ලබයි.

ව්‍යාපාර කළමනාකරණවේදී ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව

උපාධි පාඨමාලා විස්තරය
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය, කළමනාකරණ පීඨයට අයත් සංචාරක අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබන, ව්‍යාපාර කළමනාකරණවේදී ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ සය වැනි ස්තරයට අයත්වන සිව් අවුරුදු වෘත්තීමය උපාධි පාඨමාලාවකි. තව ද, මෙම පාඨමාලාව එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය මඟින් නිකුත් කරනු ලබන UNWTO.TEDQUAL තත්ත්ව සහතිකය ලබා ඇති මෙරට ප්‍රථම උපාධි පාඨමාලාවයි.

උපාධි පාඨමාලාවේ අන්තර්ගතය
අධ්‍යයන වර්ෂ හතරකින් සහ අධ්‍යයන සමාසික අටකින් සමන්විත ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව, අනිවාර්යය හා විකල්ප පාඨමාලා ඒකක වලින් යුක්ත වේ.

පළමුවන අධ්‍යයන වර්ෂයට අයත් අධ්‍යයන පාඨමාලාවන්, උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය මූලික කළමනාකරණ සිද්ධාන්ත, අලෙවි ක්‍රමවේද, මානව සම්පත් කළමනාකරණය, ගිණුම්කරණය, සංචරණ හා සංචාරක සේවා පිළිබඳ මූලික දැනුම ලබාදීම අරමුණු කොට ඇති අතර අත්‍යවශ්‍ය ජීවන කුසලතා හා පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ද සමන්විත වෙයි.

දෙවන අධ්‍යයන වර්ෂය, ආගන්තුක සත්කාර, සංචාරක සේවා සහ සිද්ධි කළමනාකරණයට අදාළ න්‍යාය හා සිද්ධාන්ත පාඨමාලාවන්ගෙන් ද විදේශීය භාෂා දැනුම, සන්නිවේදන කුසලතා ප්‍රමුඛ අන්තර් පුද්ගල සම්බන්ධතා හා මනෝ සමාජීයීය කුසලතා සංවර්ධනය උදෙසා ද නිර්මාණය කොට ඇත.

තෙවන සහ සිව්වන අධ්‍යයන වර්ෂ පාඨමාලාවන්හි විෂය මාලාවේ හරය, ආගන්තුක සත්කාර සේවා ක්‍රමවේද පිළිබඳ නිර්මාණාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවන්ගෙන් ද සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයෙහි ආචාර ධර්ම හා ආකල්ප සංවර්ධනය අරමුණු කොට ද සකස් කර ඇත. තව ද, පුහුණු අධීක්ෂකවරයෙකු යටතේ කණ්ඩායම් ව්‍යාපෘති හා පර්යේෂණ ව්‍යාපෘතීන් හි නියැලීමට ද අධ්‍යයන ක්‍රමවේද සැලසුම් කර ඇත. උපාධි අපේක්ෂකයන්ගේ අවසන් අධ්‍යයන වර්ෂයෙහි පූර්ණකාලීන සංචාරක ව්‍යාපාරකරණයට අදාළ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතියක්, ප්‍රායෝගික ගැටළු නිරාකරණය අරමුණු කරගත් සංචාරක ව්‍යාපාර උපදේශන වාර්තාවක් සහ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන්කර ඇත.

මෙම ව්‍යාපාර කළමනාකරණවේදී, ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව, දේශීය හා විදේශීය වශයෙන් තරඟකාරී රැකියා වෙළඳපොළ තුල ආකල්ප, කුසලතා හා දැනුමින් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සෘජු දායකත්වයක් සපයන පරිපූර්ණ විද්‍යාර්ථිකයෙකු බිහිකිරීම අරමුණු කොට ම නිර්මාණය කර ඇත.

යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය, තාක්ෂණික අධ්‍යයන පීඨයට අයත් ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ සය වැනි ස්තරයට අයත් වන මෙම උපාධි පාඨමාලාව සිව් අවුරුදු වෘත්තීමය උපාධි පාඨමාලාවකි.

අධ්‍යයන වර්ෂ හතරකින් සහ අධ්‍යයන වාර අටකින් සමන්විත යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව, අනිවාර්ය හා විකල්ප පාඨමාලා ඒකක වලින් යුක්ත වේ. පළමු සහ දෙවන වර්ෂ අධ්‍යයන පාඨමාලාවන්, උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය විද්‍යාව, ගණිතය හා ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ මූලික දැනුම ලබාදීමට අරමුණු කොට ඇති අතර අත්‍යාවශ්‍ය ජීවන කුසලතා හා පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ද සමන්විත වේ.

තෙවන සහ සිව්වන අධ්‍යයන වර්ෂ පාඨමාලාවන්හි විෂය මාලාවේ හරය, යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණයට

විශේෂ අවධානයක් යොමු කරමින් ශුද්ධ හා ව්‍යවහාරික ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා ඒකක වලින් අධ්‍යාපනය ලබා දෙයි. තව ද යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උසස් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා ද තෙවන සහ සිව්වන අධ්‍යයන වර්ෂවලට අයත් අධ්‍යයනවාර පඨමාලාවන් සැලසුම් කර ඇත. එමෙන්ම මෙම උපාධි පාඨමාලාව තුළදී පුහුණු අධීක්ෂකවරයෙකු යටතේ අධ්‍යයන වාර දෙකක් පුරාම උපාධි අපේක්ෂකයින්ට කණ්ඩායම් ව්‍යාපෘති හා පර්යේෂණ ව්‍යාපෘතීන්හි නියැලීමට ද අධ්‍යයන ක්‍රමවේද සකස් කර ඇත.

උපාධි අපේක්ෂකයන්ගේ හය වන අධ්‍යයන වාරයෙහි පූර්ණ කාලය ව්‍යවහාරික යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේ නවීනතම කාර්මික ක්‍රියාවලින් සහ භාවිතාවන් ඉගෙනුම මෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ආචාරධර්ම හා සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම පිළිගත් කර්මාන්තශාලාවක කාර්මික පුහුණුව සඳහා වෙන්කර ඇත.

මෙම යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව දේශීය හා විදේශීය වශයෙන් තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ ආකල්ප, කුසලතා හා දැනුමින් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සෘජු දායකත්වයක් සපයන පරිපූර්ණ විද්‍යාර්ථිකයෙකු බිහිකිරීම අරමුණු කොට ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණික අධ්‍යයන පීඨය පිරිනමනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී සිව් අවුරුදු ගෞරව උපාධිය ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ සය වැනි ස්තරය හා සබැඳි උපාධි පාඨමාලාවකි. එමෙන්ම මෙම උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා පරිගණක සංසදය සහ සෝල් සම්මුතීන්ට අනුරූප වන අයුරින් සැකසී ඇත.

අධ්‍යයන වර්ෂ හතරකින් සමන්විත වන මෙම උපාධි පාඨමාලාව අධ්‍යයන වාර අටක් පුරා අනිවාර්ය හා විකල්ප පාඨමාලා ඒකක වලින් යුක්ත වන පරිදි සකස් කොට ඇත. පළමු සහ දෙවන වසර අධ්‍යයන පාඨමාලාවන් උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ගණිතය සහ කළමනාකරණය විෂයයන් පිළිබඳ මූලික දැනුම ලබාදීමට අරමුණු කොට ඇති අතර අත්‍යවශ්‍ය ජීවන කුසලතා හා පුළුල් විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍යය අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ද සමන්විත වේ. එමෙන්ම විෂය මාලාවේ හරය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන ඒකක වලින් සමන්විත වන අතර මෘදුකාංග තාක්ෂණය සහ ව්‍යාපාර බුද්ධිය පිළිබඳ විශේෂිත වූ දැනුම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. මෘදුකාංග තාක්ෂණය සහ ව්‍යාපාර බුද්ධිය පිළිබඳ උසස් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා තෙවන හා සිව්වන අධ්‍යයන වසර වලට අයත් අධ්‍යයන පාඨමාලා සැලසුම් කර ඇත.

මෙම උපාධි පාඨමාලාව තුළදී අධීක්ෂකවරයෙකු යටතේ අවසාන වසර පුරාවට කණ්ඩායම් ව්‍යාපෘති හා පර්යේෂණ ව්‍යාපෘතීන්හි නියැලීමට අධ්‍යයන ක්‍රමවේදය සකස් කර ඇත. එමෙන්ම උපාධි අපේක්ෂකයන්ගේ හයවන අධ්‍යයනවාරයෙහි පූර්ණ කාලය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නවීනතම තාක්ෂණයන් සහ එහි යෙදවුම් පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම මෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අචාර ධර්ම හා සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම සඳහා පිළිගත් ආයතනයක කාර්මික පුහුණුව සඳහා වෙන්කර ඇත.

මෙම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව, දේශීය හා විදේශීය වශයෙන් තරඟකාරී රැකියා වෙළඳපොළ තුල ආකල්ප, කුසලතා හා දැනුමින් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා සෘජු දායකත්වයක් දක්වන තාක්ෂණික උපාධිධාරියකු බිහි කිරීම අරමුණු කොට ඇත.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය		
අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
සංගීතය	-	S
නර්තනය	-	S
නාට්‍ය හා රංග කලා	-	S
දෘශ්‍ය කලා	-	S

දෘශ්‍ය කලා පීඨය

චිත්‍ර කලා අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - චිත්‍ර කලා*

චිත්‍ර කලා භාෂාව, එහි ශාස්ත්‍රාලීය, නූතන සහ සමකාලීන ව්‍යාකරණයන් පිළිබඳව ඉතා ගැඹුරු ශාලිකාගත අධ්‍යයනයන්ගෙන් සහ විචාරශීලී න්‍යායන්, සංකල්පයන් අධ්‍යයනය කරමින් දේශීය, කලාපීය සහ ගෝලීය සංස්කෘතික මෙන්ම කලා ක්ෂේත්‍රයට වෘත්තීමය චිත්‍ර ශිල්පීන් බිහි කිරීම.

මූර්ති කලා අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - මූර්ති කලා*

මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ නිර්මාණාත්මක සංකල්පනා විවිධ මාධ්‍යයන්ගෙන් ත්‍රිමානව ඉදිරිපත් කිරීම, විෂය පථයට අදාළ ද්‍රව්‍ය හඳුන්වා දීම, ඇඹීම, නෙලීම, වාත්තු හා ඉදිකිරීම් ප්‍රතිමා ප්‍රමාන මූලධර්ම වැනි විෂයයන් පිළිබඳව අවබෝධයක් විද්‍යාර්ථීන් හට ලබා දීම සඳහාය.

මූර්ති කලාවේ ජාත්‍යන්තර ප්‍රවණතා සංස්කෘතික හා ඓතිහාසික සංවර්ධනය පිළිබඳව ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව පාඨමාලාවේදී සාකච්ඡා කරනු ලැබේ.

මුද්‍රණ කලා අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - මුද්‍රණ කලා*

මුද්‍රණ කලාව කඩදාසියක් මත මුද්‍රණය කෙරෙන කලාකෘතියක් ලෙස බොහෝ විට වරනැගෙන මුත් රෙදිපිළි, ප්ලාස්ටික් හෝ වෙනත් ඕනෑම මතුපිටක් මත බහුවිධ තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ කලාකරුවාගේ දැතින් හෝ ඔවුන්ගේ අධීක්ෂණය යටතේ මුද්‍රණය කළ හැකිය (Encyclopedia Britannica). මුද්‍රණ කලා අධ්‍යයනාංශයේ විෂය මාලාවෙහි ලලිත කලා, දෘශ්‍ය කලා සහ ව්‍යවහාරික කලා ධාරාවන්ට අයත් විෂය ඒකකයන් අන්තර්ගතව ඇත. එම විෂය ධාරාවන් හැදෑරීම උපාධි අපේක්ෂකයන් හට සිය දෘශ්‍ය කලා උපාධිය ලබාගැනීම මෙන්ම වෘත්තීමය ජීවිතය වැඩිදියුණු කරගැනීමට ද මහඟු පිටුවහලක් වනු ඇත.

දෘශ්‍ය සන්නිවේදන සැලසුම් අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - දෘශ්‍ය සන්නිවේදන සැලසුම් කලා*

නූතන සන්නිවේදන තාක්ෂණයේ ග්‍රැෆික් සැලසුම්කරණය සන්නිවේදන කාර්යයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකේ. ඒ අනුව නූතන සැලසුම් ප්‍රවණතාවයනට අදාළ ප්‍රචාරණය, නිදර්ශන, මුද්‍රණ, රූපවාහිනිය සහ සිනමාව සඳහා වන ග්‍රැෆික් සැලසුම්කරණය පිළිබඳ හැදෑරීමට විද්‍යාර්ථීන් යොමු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් කලා*

මානව අවශ්‍යතා පරිදි නිර්මාණ සැලසුම්කරණයට ප්‍රවේශවීමේ ක්‍රමවේදයන් මෙම පාඨමාලාවෙන් අවධාරණය කෙරේ. සංකීර්ණ සමාජීය අවශ්‍යතාවයන්ට පිළිතුරු ලෙස නිර්මාණාත්මක සැලසුම් සංකල්පයන් වෙළෙඳපොළ අවශ්‍යතා දක්වා අමුද්‍රව්‍ය, ශිල්ප ක්‍රම හා නූතන තාක්ෂණයේත් අපූර්ව නිමැවුමක් ලෙස බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් පාඨමාලාවෙන් අර්ථ ගැන්වේ.

සෙරමික් කලා අධ්‍යයනාංශය- *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - සෙරමික් කලා, සෙරමික් සැලසුම් පාඨමාලාව සහ සෙරමික් මූර්ති*

ව්‍යවහාරික කලා විෂයන් අතර ඉතා ජනප්‍රිය හා උපයෝගීතාවාදී කලා මාධ්‍යයක් වන සෙරමික් අධ්‍යයනය පිළිබඳව නිර්මාණාත්මකව හා වෘත්තීයමය දැනුමක් සෙරමික් කලා පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත ලබා දීම මෙම අධ්‍යයනාංශය මඟින් සිදුවේ.

බහු මාධ්‍ය කලා අධ්‍යයනාංශය - *දෘශ්‍ය කලා ගෞරව උපාධිය - බහු මාධ්‍ය කලා*

බහු මාධ්‍ය කලා විෂය සැලසුම් වී තිබෙන්නේ විවිධ කලාත්මක ආකෘති කිහිපයක් සම්මිශ්‍රණය වීමෙනි. අක්ෂර, හඬ, නිශ්චල රූප, සජීවීකරණය, චලන රූප (video) සහ අන්තර් ප්‍රතික්‍රියා (interactive) දක්වන ක්‍රීඩා වැනි

නිර්මාණ යන අංග එක්වීමෙනි. දෘශ්‍ය කලා උපාධිය සඳහා බහු මාධ්‍ය කලා විෂය හදාරන විද්‍යාර්ථීන් හැදෑරිය යුතු විෂයයන් කිහිපයක් වේ. වර්ණ, ඩිජිටල් නිරූපණ චිත්‍ර ඇතුළු රූ රටා සැලසුම්, වෙබ් අඩවි නිර්මාණය, සෞන්දර්ය/ කලා/ බහු මාධ්‍ය කලා මූලධර්ම, බහු මාධ්‍ය කලා ඉතිහාසය, සිනමාව සහ දැන්වීම්කරණයේ විකාශනය, අක්ෂර නිර්මාණය, ඩිජිටල් සිතුවම් ඇඳීම, පරිගණක ග්‍රැෆික්, ද්විමාන, ත්‍රිමාණ සජීවීකරණය ඇඳීමේ මූලධර්ම සහ ආකෘතිකමය අධ්‍යයනය, ජීව චිත්‍ර ඇඳීම ආදිය හැදෑරිය යුතු වේ.

වර්තමාන ලෝකයේ බහු මාධ්‍ය කලා භාවිතාව පිළිබඳව පුළුල් දැක්මක් මෙම විෂය අධ්‍යයනය තුළින් ඔබට ලැබෙන අතර බහු මාධ්‍ය කලා නිර්මාණ සහ ක්‍රමවේදය පිළිබඳ දැනුම සංවර්ධනය වීම ද සිදුවේ.

රෙදිපිළි හා ඇඟළුම් අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා ගෞරව උපාධිය - රෙදිපිළි හා ඇඟළුම් කලා

ව්‍යවහාරික කලා විෂයන් අතර වර්තමානයේදී ඉතා ජනප්‍රිය හා මානව උපයෝගීතාව පරිදි නිර්මාණාත්මයෙන් හෙබි කලා මාධ්‍යයක් ලෙස රෙදිපිළි හා ඇඟළුම් අධ්‍යයනය නම් කළ හැක. විවිධ අවශ්‍යතා සඳහා රෙදිපිළි හා ඇඟළුම් භාවිතය නූතන තාක්ෂණයේදී පරිහරණය පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුම තුළින් වෘත්තීමය හා කලා කුසලතාවයෙන් හෙබි විද්‍යාර්ථීයෙකු බිහි කිරීම හා නව මාවතකට යොමු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා ගෞරව උපාධිය - ඉතිහාසය හා කලා සිද්ධාන්ත

ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය වනාහි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ ස්ථාපිත කරන ලද නව අධ්‍යයනාංශයකි. මෙම අධ්‍යයනාංශයේ මූලික අරමුණ වන්නේ ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට වර්තමාන මොහොත දක්වා දෘශ්‍ය කලාව පිළිබඳ විධිමත් සහ පුළුල් අවබෝධයක් ශිෂ්‍යයාට ඇතුසංස්කෘතිකමය සහ අන්තර් විෂයික ප්‍රවේශයකින් ලබාදීමයි. මෙම අධ්‍යයන අංශය මඟින් පිරිනැමෙන පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කෙරෙන ගෞරව උපාධි පාඨමාලාව මඟින් ශිෂ්‍යයාට ශාස්ත්‍රීය පර්යේෂණ, අභිරක්ෂක ව්‍යාපෘති, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, කලාවේ න්‍යායාත්මක ප්‍රවේශ, කලා විචාරයට අවැසි පුහුණුව මෙන්ම කලා ඉතිහාසය සංස්කෘතික සහ කලා න්‍යායන්ට අදාළ ජාතික සහ ජාත්‍යන්තර කතිකා තලයට පිවිසීමට අවැසි පරිචය ලබාදෙනු ලැබේ.

නර්තන හා නාට්‍ය කලා පීඨය

නර්තන හා නාට්‍ය කලා පීඨයේ අධ්‍යයනාංශ හතක් යටතේ සිව් අවුරුදු ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලා හඳුන්වා දී ඇත. මෙම සියලු පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන අතර සාර්ථකව අධ්‍යයන කටයුතු නිමකරනු ලබන විද්‍යාර්ථීන් හට ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලබයි.

සිව් වසරක ගෞරව උපාධි පාඨමාලාවන් ලෙස සම්පාදනය කොට ඇති මෙම උපාධි පාඨමාලාවන් හි අරමුණ වන්නේ විද්‍යාර්ථීන්ගේ විෂයානුබද්ධ දැනුම, නිර්මාණාත්මක කුසලතා, විචාරාත්මක චින්තනය සහ ධනාත්මක චර්යා හා ආකල්ප ප්‍රවර්ධනය කිරීමයි. මෙම ප්‍රධාන විෂය ධාරා මඟින් නර්ථනය, නාට්‍ය, වාද්‍ය හා සංගීත සහ ශ්‍රව්‍ය යන රංග කලාවට අනුබද්ධ ක්ෂේත්‍ර ආවරණය කරනු ලබයි. එමෙන්ම එමඟින් නර්තන විෂයට අදාළව සම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායන් හා සබැඳි විෂය ක්ෂේත්‍ර ආවරණය කරනු ලබයි.

මෙම ගෞරව උපාධි පාඨමාලා මඟින් පොදුවේ ප්‍රාසාංගික කලාවේ සම්ප්‍රදායික ලක්ෂණ සහ තත්කාලීන ප්‍රවණතා, විචාර මූලධර්ම විමර්ශනය, විෂයානුබද්ධ අධ්‍යාපනයේ භාවිතාවන්, සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක සිද්ධාන්තයන් පමණක් නොව ප්‍රාසාංගික අවකාශයන්හි ඉදිරිපත් කිරීමට අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප ද ලබා දේ. එපමණක් නොව මෙම උපාධි පාඨමාලාවන්ට සමගාමීව විද්‍යාර්ථීන්ගේ වෘත්තීය ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ආයතනගත ක්ෂේත්‍ර පුහුණු, පර්යේෂණ ව්‍යාපෘති මෙන්ම ඉංග්‍රීසි භාෂා දැනුම, දෙමළ භාෂා දැනුම මූලික කරගත් භාෂා කුසලතා ද, තොරතුරු තාක්ෂණය, පරිගණක දැනුම/ කුසලතා හා වෘත්තීය අවස්ථා වර්ධනය කරගන්නා ආකාරයේ විෂයයන් ද ඇතුළත් වන පරිදි මෙම පාඨමාලා සැලසුම් කොට ඇත.

පීඨයේ සෑම උපාධි පාඨමාලාවක්ම වසරකට අර්ධවාර්ෂික දෙකක් බැගින් වූ පූර්ණකාලීන අර්ධවාර්ෂික අටකින් සමන්විත වේ. එක් අර්ධවාර්ෂිකයක් ලිත් සති 15 කි. මෙම අර්ධවාර්ෂික අට තුළදී උපාධි අපේක්ෂකයන් විසින් තම උපාධිය සඳහා සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂය ඒකක රැසක් සම්පූර්ණ කළයුතු අතර අවසාන අර්ධවාර්ෂිකයේදී ස්වතන්ත්‍ර පර්යේෂණ නිබන්ධිකාවක් ද ඉදිරිපත් කළ යුතුව ඇත. සෑම අර්ධවාර්ෂිකයක් අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වෙන අතර උපාධි අපේක්ෂකයාගේ කුසලතා ඇගයීම සඳහා GPA ඇගයීම් ක්‍රමයක් භාවිතා කරයි. මෙම පාඨමාලාවන් සාර්ථකව හදාරා සම්පූර්ණ කරන විද්‍යාර්ථීන් හට රාජ්‍ය, අර්ධරාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ද, සමාජ සුභසාධන සංවිධානවල මෙන්ම නිදහස් වෘත්තිකයන් සහ ව්‍යවසායකයන් ලෙස වෘත්තීය අවස්ථා ලබා ගත හැකිය.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - උඩරට නර්තනය

උඩරට නර්තන අධ්‍යනාංශය හඳුන්වා දෙන මෙම පාඨමාලාව මඟින් මූලික සරඹ අභ්‍යාස, පැනීම් කැරකීම් ආදී වූ ශිල්ප ක්‍රම, වන්නම්, උඩරට ශාන්තිකර්ම පෙළපාලි අංග, ජන නැටුම් හා ජන නාටක, උඩැක්කි, පන්තේරු නර්තන හා ගායන වාදන පිළිබඳ ශාස්ත්‍රීය ශිල්ප ධර්මයන් හා ඊට අදාළ නිර්මාණාත්මක කුසලතාවයන් පිළිබඳ පුළුල් ප්‍රායෝගික දැනුමක් සහ අවබෝධයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. නර්තන නිර්මාණකරණය, රංගාලෝකරණය, අනුෂංගික කලා සහ වේදිකා තාක්ෂණය සම්බන්ධයෙන් වන නව භාවිතයන් ප්‍රායෝගික හා සෛද්ධාන්තික වශයෙන් අධ්‍යයනය කිරීමට හැකිවේ. භාෂා භාවිතය හා පර්යේෂණ ක්‍රමවේදය, විචාර සිද්ධාන්ත හා ප්‍රාසාංගික කලා, නර්තනයේ සමාජ මනෝවිද්‍යාත්මක, අධ්‍යාපනික මනෝවිද්‍යාත්මක පසුබිම යනාදී වූ සෛද්ධාන්තික දැනුම හා අවබෝධය ලබාදීම ද අරමුණු වේ. සිව් වසරක අවසානයේදී සම්ප්‍රදායික රඟමඩලේ සහ ප්‍රාසාංගික වේදිකාවේ කුසලතා දැක්විය හැකි මෙන්ම රංගවින්‍යාසකරණයෙහි කුසලතා සපිරි, සෛද්ධාන්තික දැනුමෙන් ද පොහොසත් පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - පහතරට නර්තනය
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - ආනුෂංගික කලා

පහතරට නර්තනය විෂයක් වශයෙන් හැදෑරීමට උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා එම විෂය ක්ෂේත්‍රය සඳහා පුළුල් දැනුමක් ලබා ගැනීමට හැකිවන අයුරින් මෙම පාඨමාලාව සකස් කොට ඇත. පහතරට ශාන්තිකර්මයන්හි අන්තර්ගත නර්තන අංග, නාට්‍යමය පෙළපාලි, පහතරට බෙර වාදනය, කෝළම් නාට්‍ය, කෝලම් නර්තනය, දේශීය හා ඉන්දියානු ජන නැටුම්, පහතරට උඩැක්කි, නිර්මාණාත්මක ගායන වාදන, වේදිකා ප්‍රසංග, ආනුෂංගික කලා (රංග වස්ත්‍රාභරණ නිර්මාණය) සැරසිලි, මෝස්තර, කැටයම්, වෙස් මුහුණු නිර්මාණය යන විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීම මඟින් මෙම පාඨමාලාව සම්පූර්ණ කළ හැකිය. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් බෙන්තර, මාතර හා රයිගම යන රංග ශෛලීන් පිළිබඳව සෛද්ධාන්තික මෙන්ම ප්‍රායෝගික වශයෙන් පෘථුල දැනුමක් ලබා ගත හැකිය. උපාධිය අවසානයේදී සම්ප්‍රදායික රඟ මඩලක හා ප්‍රාසාංගික වේදිකාවේ කුසලතා දැක්විය හැකි පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - සබරගමු නර්තනය

සබරගමු නර්තන පාඨමාලාවට ප්‍රවේශ වන විද්‍යාර්ථීන් හට තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුම ලබාගත හැකි අයුරින් මෙම පාඨමාලාව සකස් කර තිබේ. සබරගමු නර්තනයට ආවේනික මූලික සරඹ සම්ප්‍රදායික සබරගමු නර්තනය, සබරගමු නර්තන කලා, සිද්ධාන්ත, සාහිත්‍ය අධ්‍යයනය, ප්‍රාසාංගික කලා සිද්ධාන්ත, නර්තනයේ සමාජ මානව විද්‍යාත්මක පසුබිම, උඩරට නර්තනය, පහතරට නර්තනය, ගායනවිධි අධ්‍යයනය, සම්ප්‍රදායික සබරගමු දවුල් වාදනය, අන්තර් සංස්කෘතික ජන නැටුම් අධ්‍යයනය, අංගම් ශිල්ප කලාව, මානව වංශ විද්‍යාව, සබරගමු සොකරි නාටක අධ්‍යයනය, ශාන්තිකර්ම, නාට්‍යමය පෙළපාළි, නර්තන නිර්මාණකරණය, භාෂා භාවිතය හා පර්යේෂණ ක්‍රමවේද, රංගකලාව හා තාක්ෂණය, ආනුෂංගික කලා (සිංහල සැරසිලි), ශරීර විඥානය හා ස්වස්ත ව්‍රත, ස්වයං අධ්‍යයනය පර්යේෂණ ව්‍යාපෘති, විෂයානුබද්ධ පරිගණක තාක්ෂණය, රංගාලෝකනය, වේදිකා තාක්ෂණය හා වේදිකා ප්‍රසංග නිර්මාණකරණය, විචාර සිද්ධාන්ත හා ප්‍රාසාංගික කලා සිද්ධාන්ත, නර්තනයේ අධ්‍යාපන මනෝවිද්‍යාත්මක පදනම හා ඉගැන්වීමේ ක්‍රම, තෝරාගත් විෂය ක්ෂේත්‍රයක් උපදේශකවරයෙකු යටතේ උපාධි නිබන්ධනයක් ලෙස රචනා කිරීම යන මේ අයුරින් ශාක්‍යතා වර්ධනය වන අයුරින් සිව් වසරක විශේෂ උපාධි පාඨමාලාවක් ලෙස මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. සබරගමු ශිල්ප කලා ඥාණයෙන් හෙබි නිර්මාණ හා විචාරශීලීත්වයෙන් යුතු නව තාක්ෂණික දැනුම ඇති විද්‍යාර්ථීයෙකු බිහි කිරීම මෙම පාඨමාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - ශ්‍රී ලාංකේය බෙර වාදනය

ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන්ට ආවේණික බෙර වාදන පිළිබඳ පුළුල් ලෙස හැදෑරීමට උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන්ට, එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ලබා ගත හැකි වන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත. තව ද ඉන්දියානු වාදන, බටහිර වාදන, මෙන් ම ලතින් ඇමරිකානු, බ්‍රසීල හා අප්‍රිකානු ආදී පෙර අපර දෙදිග වාදන සම්ප්‍රදායන් පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගත හැකිවන අතර, සම්ප්‍රදායික නර්තනය, ගායනය, නිර්මාණාත්මක වාදනය, ආනුෂංගික කලාව, බෙර නිර්මාණ කලාව, සංගීතය මෙන්ම ධ්වනි තාක්ෂණ විෂය යටතේ ශබ්ද පටිගත කිරීම, ශබ්ද සංස්කරණය ආදි විෂයයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකි වන අයුරින් සිව් වසරක උපාධි පාඨමාලාවක් ලෙස මෙම පාඨමාලාවක් සකස් වී ඇත.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - රූපණය
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - මුද්‍රා නාට්‍ය හා නව නර්තනය

නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය, 2006 වර්ෂයේදී නාට්‍ය හා රංග කලාවේ, නෘත්‍ය නාට්‍ය හෝ මුද්‍රා නාට්‍යයේ සහ නූතන හා සමකාලීන නර්තනයේ විවිධ මානයේ ගවේෂණය කිරීමට අවස්ථා සැලසීමේ

අරමුණින් ස්ථාපිත විය. ඉහත විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උසස් පාඨමාලා ක්‍රියාත්මක කරමින් නිර්මාණශීලී හා විචාරශීලී නාට්‍ය රචකයින්, නාට්‍ය අධ්‍යක්ෂකයින්, රංගන ශිල්පීන්, මුද්‍රා නාට්‍ය හා සමකාලීන නර්තන ශිල්පීන් නිෂ්පාදකයින්, රංගනවින්‍යාස ශිල්පීන්, අනුෂංග නිර්මාණ ශිල්පීන්, සංගීත නිර්මාණ ශිල්පීන්, හඬ නළුවන්, නාට්‍ය කේන්ද්‍රීය ගවේශකයින්, වේදිකා තාක්ෂණ ශිල්පීන් හා කළමනාකරුවන්, පර්යේෂකයින් සහ විචාරකයින් බිහිකිරීම අධ්‍යයනාංශයේ අරමුණයි. මෙම අධ්‍යයනාංශය, නාට්‍ය හා රංග කලාව හදාරණ විද්‍යාර්ථීන් සඳහා රූපණය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව ද, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව ද, නෘත්‍ය නාට්‍ය සඳහා නැඹුරුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා මුද්‍රා නාට්‍ය හා නව නර්තන ගෞරව උපාධි පාඨමාලාව ද, ලෙස ප්‍රධාන පාඨමාලා තුනක් පිරිනමයි. මෙම උපාධි පාඨමාලා, විද්‍යාර්ථීන් ගුරු වෘත්තිය, පර්යේෂණය, ව්‍යාපෘති කළමනාකරණය, උපදේශනය, ව්‍යවසායකත්වය ආදී වෘත්තීය මාර්ග පුළුල් කෙරෙන ප්‍රාසාංගික කලා කර්මාන්ත අවකාශයට නිරාවරණය කරමින් පර්යේෂණ, ශාස්ත්‍රීය හා කළමනාකරණය ඥානය හා ශක්‍යතාවයන් වර්ධනය කරයි. තව ද, මෙම අධ්‍යයනාංශය විසින් නාට්‍ය නිෂ්පාදන, ව්‍යවහාරික හා විකල්ප අභිවහන කලා ව්‍යාපෘති, රංග ව්‍යවහාරය පදනම් කරගත් පර්යේෂණ ව්‍යාපෘති, සහ නාට්‍ය උත්සව සඳහා දායක වීමට අවස්ථා සලසා දෙයි. මෙම අධ්‍යයනාංශය සෑම වසරකටම එක් නාට්‍ය නිෂ්පාදනයක් සහ සමකාලීන නර්තන නිෂ්පාදකයන් වශයෙන් දැවැන්ත රංග කලා නිර්මාණ ද්විත්වයක් නිෂ්පාදනය කරයි. එමෙන්ම, බදාදා කවය පර්යේෂණ සම්මන්ත්‍රණය සහ ශිෂ්‍ය පර්යේෂණ පරිසංවාද වැනි වැඩසටහන් හරහා ශිෂ්‍යයින්ගේ පර්යේෂණ ශක්‍යතා සඳහා අවස්ථා සලසා දෙයි. තව ද, අධ්‍යයනාංශය සංවිධානය කරන ඇකඩමීන් තෙස්පියන්ස් නාට්‍ය උළෙල ශිෂ්‍යයින්ගේ කලා නිර්මාණ හා ප්‍රායෝගික ශක්‍යතාව පොදු ප්‍රේක්ෂකයා වෙත රැගෙන යාමට අවකාශ ලබා දෙයි.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - භරත නාට්‍යම්
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - කථක් නර්තනය

ඉන්දියානු ආසියාතික නර්තන අධ්‍යයනාංශය මේ වන විට කථක් හා භරත නාට්‍යම් විෂයයන් සඳහා ගෞරව උපාධි පාඨමාලා හඳුන්වා දී තිබේ. දේශීය හා විදේශීය නර්තනය පිළිබඳ තුළනාත්මක අධ්‍යයනය, බෙර වාදනය, දේශීය හා විදේශීය ජන නැටුම්, රූපවාහිනී හා සිනමා නර්තන රචනය, රංගකලාව හා තාක්ෂණය, අවස්ථා කළමනාකරණය, වෘත්තීය මාර්ගෝපදේශනය, නර්තන කලා සිද්ධාන්ත, විදේශීය නර්තන කලා සිද්ධාන්ත, ගායන හා වාදන සංගීතය, වේදිකා ප්‍රසංගය වැනි අවශ්ෂ විෂයන් රාශියක් පිළිබඳ පෘථුල සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමට විද්‍යාර්ථීන් හට අවස්ථා සලසා දී ඇත. මේ හැර කථක් නර්තනය පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා වසර පුරා හින්දි භාෂාවත්, භරත නාට්‍යම් පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා වසර පුරා දෙමළ භාෂාවත් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලා හදාරන විද්‍යාර්ථීන්ට අවස්ථාව සලසා ඇත.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - රූපමාධ්‍ය සඳහා නර්තන රචනය
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - සන්නිවේදන හා ජනශ්‍රැති අධ්‍යයනය
ප්‍රාසාංගික කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව - ඩිජිටල් සිනමා

රූප මාධ්‍ය සඳහා නර්තන රචනය පාඨමාලාව මඟින් පීඨයේ විද්‍යාර්ථීන් සඳහා රූපමාධ්‍යයෙහි නව තාක්ෂණික දැනුම මෙන්ම රූපමාධ්‍ය සඳහා නිර්මාණාත්මක නර්තන රචනය හා වීඩියෝ තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ දැනුම ලබා දීම සිදු කරයි. දේශීය නර්තනය කැමරාව සඳහා ප්‍රතිනිර්මාණය කිරීම හා නර්තනයේ භාවිත ස්වරූපය ඉතා ඉහළ ස්ථරයකට ගෙන ඒම මඟින් විද්‍යාර්ථීන්ගේ බුද්ධිමය හා ශාස්ත්‍රීය කුසලතා වර්ධනය කිරීම මෙම පාඨමාලාවේ මුඛ්‍ය අරමුණ වේ.

සන්නිවේදන හා ජනශ්‍රැති අධ්‍යයනය උපාධි පාඨමාලාව මඟින් සන්නිවේදන සහ ජනගත දැනුම, කුසලතා පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයන් සිදුකෙරේ. එමෙන්ම සන්නිවේදනයේ සහ ජනශ්‍රැති පිළිබඳ න්‍යායාත්මක ප්‍රවේශ සහ පර්යේෂණ කෙරෙහි ප්‍රමුඛස්ථානයක් දෙනු ලබයි. අනාගත අභියෝග ජය ගැනීමට අවශ්‍ය පෞරුෂයකින් හෙබි නිර්මාණශීලී චින්තනයකින් පිරිපුන් විද්‍යාර්ථීයෙකු බිහි කිරීම මෙම පාඨමාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ඩිජිටල් සිනමා පාඨමාලාව මඟින් සිනමා කලාව හා බැඳී පවතින ප්‍රායෝගික විෂයයන් මෙන්ම න්‍යායාත්මක විෂයයන් අධ්‍යයනය කෙරෙහි ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ. මෙම පාඨමාලාව මඟින් අංකිත සිනමාකරණයේ (Digital Film Making) නව තාක්ෂණික දැනුම විද්‍යාර්ථීන්ට ලබා දීමත්, එමඟින් නව නිර්මාණයන් බිහි කිරීමට අවශ්‍ය පසුබිම ඇති කිරීමත් නව රැකියා වෙළඳපොළට යෝග්‍ය උපාධිධාරීන් බිහිකිරීමත් මෙමඟින් අපේක්ෂිත ය.

සංගීත පීඨය

මෙම පීඨය විසින් හඳුන්වා දී ඇති ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධිය (Bachelor of Performing Arts Honours Music) පූර්ණ කාලීන සිව් අවුරුදු පාඨමාලාවකි. පළමු වසරේ සිට අධ්‍යයන කටයුතු ආරම්භ කෙරෙන අතර පළමු වසර පදනම් වසර ලෙස වෙන් කරනු ලබයි. පදනම් වසරේදී සිසුන්ගේ කුසලතා හඳුනා ගැනීම, විවිධ විෂය ධාරාවන් පිළිබඳ සාමාන්‍ය අධ්‍යාපනය, ප්‍රායෝගික හා ශිල්පීය ඥානය පිළිබඳ

දැනුම හා නවීන තාක්ෂණික දැනුම ලබා දීමට සැලසුම් කර ඇත. සිසුන්ගේ කැමැත්ත හා ඒ ඒ විෂයයට ලබා ගන්නා ශ්‍රේණිය අනුව දෙවන වසරේ සිට අධ්‍යයනාංශ හා පාඨමාලා තෝරා ගැනීම සිදු කළ හැකිය. ඒ සඳහා පාඨමාලා හයක් (06) ක්‍රියාත්මක වේ.

01. උත්තර භාරතීය සංගීත පාඨමාලාව - (උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය)
02. බටහිර සංගීත පාඨමාලාව - (බටහිර සංගීත අධ්‍යයනාංශය)
03. මානවවංශ සංගීතවිද්‍යා පාඨමාලාව - (මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යයනාංශය)
04. ව්‍යවහාරික සංගීත හා ජන සන්නිවේදන පාඨමාලාව -(ව්‍යවහාරික සංගීත හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය)
05. සංගීතවිද්‍යා පාඨමාලාව - (සංගීතවිද්‍යා අධ්‍යයනාංශය)
06. දක්ෂිණ භාරතීය සංගීත පාඨමාලාව - (දක්ෂිණ භාරතීය සංගීත අධ්‍යයනාංශය)

මෙම සියලු පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන අතර තෝරාගනු ලබන විෂයයන් කිහිපයක් පමණක් ඉංග්‍රීසි හා ද්‍රවිඩ භාෂාවලින් අධ්‍යයන කටයුතු සිදු කිරීමට පහසුකම් සලසා ඇත. සාර්ථකව අධ්‍යයන කටයුතු නිමකරනු ලබන උපාධි අපේක්ෂකයන් සඳහා ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධිය (Bachelor of Performing Arts Honours Music) පිරිනමනු ලැබේ.

මෙම උපාධි පාඨමාලා මඟින් සංගීත විෂයයේ සම්භාව්‍ය හා සම්ප්‍රදායික ලක්ෂණ, විමර්ශන හා විචාරාත්මක ගවේෂණය, සංගීත අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, සමාජ හා සන්නිවේදන ශක්‍යතා පිළිබඳ සෛද්ධාන්තික දැනුමත්, සංගීත විෂයයේ ප්‍රායෝගික නිපුණතාව හා කුසලතාව වර්ධනය කරගනිමින් ප්‍රාසාංගික ඉදිරිපත් කිරීමේ ශක්‍යතාව දියුණු කර ගැනීම සඳහා අවැසි ශිල්පීය හා තාක්ෂණික දැනුම ලබා දේ. මෙම පාඨමාලාව ඉංග්‍රීසි භාෂාව මෙන් ම පරිගණක හා තාක්ෂණික දැනුම වර්ධනය කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම ඇතුළත් වන පරිදි සකසා ඇත.

මෙම උපාධි පාඨමාලා වසරකට අර්ධ වාර්ෂික දෙක බැගින් වූ අර්ධ වාර්ෂික අටකින් සමන්විත වන අතර ඒ ඒ අර්ධ වාර්ෂිකය සඳහා ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂයය ඒකක රැසක් සම්පූර්ණ කළ යුතු අතර අවසාන වසරේදී ස්වතන්ත්‍ර පර්යේෂණ නිබන්ධිකාවක් ද ඉදිරිපත් කළ යුතුය. උපාධි අපේක්ෂකයාගේ නිපුණතාව හා කුසලතාව ඇගයීම සඳහා GPA ඇගයීම් ක්‍රමය භාවිතා කෙරේ. මෙම පාඨමාලා සාර්ථකව හදාරා අවසන් කරනු ලබන උපාධි අපේක්ෂකයන්ට රජයේ හා පෞද්ගලික පාසල්, සංස්කෘතික හා විවිධ අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පළාත් ආයතනවල රැකියා අවස්ථා ලබා ගත හැක. පෞද්ගලික ව්‍යවසායකයන් ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා අන්තර්ජාතික සම්බන්ධතා මෙහිදී පූර්ණය කරගත හැකිය.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත - උත්තර භාරතීය සංගීත පාඨමාලාව

උත්තර භාරතීය ගායනය සහ වාදනය කෙරෙහි උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් හට එම විෂයට අදාළ ප්‍රාසාංගික කරුණු පිළිබඳ විශේෂ දැනුමක් ලබාගත හැකිවන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. උත්තර භාරතීය සංගීතය හා සම්බන්ධ වෙනත් සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂයයන් ඇතුළත් කොට ඇති අතර ඒ පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබාගැනීමට මෙමගින් අවකාශ සැලසේ. උත්තර භාරතීය සංගීතය ශ්‍රී ලාංකේය නූර්ති ගීතය, සරල ගීතය, චිත්‍රපට සංගීතය හා වෙනත් නිර්මාණ කාර්යයන් කෙරෙහි ඉතා ගැඹුරින් භාවිතා වන ජාත්‍යන්තරව පිළිගත් සංගීත ක්‍රමයකි. එය ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මැනවින් ස්ථාපනය වී ඇත.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත - බටහිර සංගීතය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමී අධ්‍යයනාංශයක් ලෙස බටහිර සංගීත අධ්‍යයනාංශය තම පූර්ණ හැකියාවන් අවබෝධ කරගැනීමට සහ අනුවර්තනය වීමට ශක්‍යතාවය ඇති, යහපත් සමාජයක් ගොඩනැගීමෙහි ලා දායක වීමට සූදානම් සංගීතඥයන් ලෙස දැනුම ලබාගෙන, කුසලතා පෝෂණය කරගනිමින් විශිෂ්ඨත්වයට පත්වීම සඳහා මග පෙන්වයි.

සංගීත පීඨයේ බටහිර සංගීත අධ්‍යයනාංශය ලෙස, සංගීත අධ්‍යාපනය, ප්‍රාසාංගික ඉදිරිපත් කිරීම් සහ පර්යේෂණ වැනි විෂයයන් සහ ඒ හරහා ඇති ඉහළ ගුණාත්මක භාවයකින් යුතු සියලුම උපාධි අපේක්ෂක වැඩසටහන් මඟින්, සිසුන්ට නිර්මාණාත්මක සහ ශාස්ත්‍රීය අත්දැකීම් ලබා දෙයි.

එමෙන්ම, සංගීත අධ්‍යාපනය හරහා කලාත්මක හා ශාස්ත්‍රීය ප්‍රසංග, පටිගත කිරීම්, ප්‍රකාශන, දේශන සහ ඉදිරිපත් කිරීම් මඟින් දක්ෂ ශාස්ත්‍රඥයින්, කලාකරුවන් සහ විද්වතුන් වැනි කණ්ඩායම් සමඟ සම්බන්ධ වීමට ද අවස්ථා සලසයි.

බටහිර සංගීතයට අදාළව, ගායනය, පියානෝවේ සිට බටහිර තත් සහ සුෂිර වාද්‍ය භාණ්ඩ ඇතුළුව අනෙකුත්

ප්‍රායෝගික විෂයයන් දක්වා පුළුල් පරාසයක විහිදෙන මොඩියුලයන් බටහිර සංගීත අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබයි.

විද්‍යාර්ථීන් හට තමන් තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය අනුව පුනුණුව ලැබිය හැකි වාද්‍ය වෘන්දයක් සහ ගායක කණ්ඩායමක් අධ්‍යයනාංශය මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් ඔවුනට වෘත්තීය මට්ටමින් තම ප්‍රසාංගික හැකියාවන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙයි. බටහිර සංගීත අධ්‍යයනාංශය, බටහිර සංගීත සිද්ධාන්ත සහ බටහිර සංගීත ඉතිහාසය සඳහා සිංහල සහ ඉංග්‍රීසි භාෂා වලින් දේශන පවත්වන අතර ඇගයීම් සහ විභාග ක්‍රම ද ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධි පාඨමාලාව - මානවවංශ සංගීත විද්‍යාව

ස්පර්ශ කළ හැකි සහ නොහැකි ශ්‍රී ලාංකේය හා ලෝක උරුමය විමසීමේදී මානවවංශ සංගීතය අප සංස්කෘතිය සමඟ පුළුල් ලෙස බද්ධ වී ඇති බව පෙනී යයි. විවිධ සංස්කෘතීන්හි අනන්‍යතාව සිංහල සංස්කෘතිය සමඟ සම්බන්ධ කරමින් සකස් කරන ලද විෂය ඒකක මෙම පාඨමාලාවට ඇතුළත් කොට ඇත. විවිධ පර්යේෂණ සහ ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා ද අවකාශ සලසා ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය පාරම්පරික සංගීතය හා වෙනත් රටවල ජනසංගීතය පිළිබඳ පුළුල් අවබෝධයක් විද්‍යාර්ථීන් හට ලබා ගත හැකිය. මානවවංශ සංගීතය පිළිබඳ විශේෂ දැනුමක් ලබාගනිමින් ශ්‍රී ලාංකේය වාර්ගික විවිධත්වයක් සහ අනන්‍යතාවය හඳුනා ගැනීමේ අවකාශය සලසා ඇත. මෙම පාඨමාලාව අධ්‍යයනයෙන් මානවවංශ සංගීත විද්‍යා විෂය ක්ෂේත්‍රයට අනුව ලොව පර්යේෂණ ක්ෂේත්‍රවලට යොමු වීමේ හැකියාවක් විද්‍යාර්ථයින් හට ලැබේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධි පාඨමාලාව - ව්‍යවහාරික සංගීත සහ ජනසන්නිවේදනය

මානව හැඟීම් ප්‍රකාශනයේ හා රසවින්දනයෙහි පුළුල් මාධ්‍යයක් වන ‘‘ව්‍යවහාරික සංගීතය’’ ලෝක සංගීත ක්ෂේත්‍රයෙහි ප්‍රධාන ශික්ෂාවක් ලෙස හැඳින්විය හැකිය. ලෝක සංගීත ක්ෂේත්‍ර පිළිබඳ මූලික අවබෝධය සමඟ මානව සංගීතය හා ඒ හා බැඳි සම්භාව්‍ය සංගීත ක්ෂේත්‍ර පිළිබඳ දැනුම, අවබෝධය, සෛද්ධාන්තිකව හා ප්‍රායෝගිකව ලබා දීම මෙම පාඨමාලාව මඟින් සිදු කෙරෙන එක් කාර්යයකි. එවැනි විවිධ සංගීත ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය හදාරන උපාධිධාරීන් තම දැනුම, ආකල්ප හා හැකියාවන් යොදා ගනිමින් ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ විවිධ අවශ්‍යතා සපුරාලිය හැකි සම්පත් දායකයෙකු බිහි කිරීම ද මෙම පාඨමාලාව මඟින් සිදු කෙරේ. එවැනි සම්පත් දායකයෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ පිළිබඳ පුළුල් දැනුම් පරාසයක් සිනමාව, ගුවන්විදුලිය, රූපවාහිනිය මුද්‍රිත මාධ්‍ය යනාදී විවිධ මාධ්‍ය ක්ෂේත්‍ර මෙන්ම ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය අධ්‍යයනය හා තාක්ෂණය පිළිබඳ පුළුල් දැනුමක් ද ශ්‍රව්‍ය සංකලනය, ශ්‍රව්‍ය සැලසුම්කරණය යනාදිය හා ඒ පිළිබඳ වූ ඉංජිනේරු තාක්ෂණය ලබාදීම ද සංගීත අධ්‍යක්ෂණය, නිර්මාණකරණය, වාදක මණ්ඩල මෙහෙය වීම, ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ වෘත්තීමය වාදකයෙකු හෝ ගායකයෙකු වීම හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා උදාකර ගත හැකි මග පෙන්වීම මෙම පාඨමාලාව මඟින් ලබාදෙනු ඇත. තව ද ව්‍යවහාරික සංගීතය හා ජන සන්නිවේදන ක්ෂේත්‍රය හා බද්ධ නිර්මාණකරණය නිවැරදි මාර්ගයෙහි මෙහෙය වීමට අවශ්‍ය කරන මඟ පෙන්වීම ද මෙම අධ්‍යයනාංශය මඟින් සිදු කරනු ඇත.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධි පාඨමාලාව - සංගීත විද්‍යාව

සංගීත විද්‍යා විෂය ක්ෂේත්‍රගත විවිධ විෂය ඒකක තුලනාත්මකව සහ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ අවකාශය මෙම පාඨමාලාව මඟින් ලබා දී ඇත. සංගීත විද්‍යා විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂය කරුණු ලෝක සංගීත ශික්ෂාවන්ට අනුගත වන පරිදි විෂය මාලාවෙහි දක්වා ඇත. විවිධ පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ ඇතුළත් කොට ඇති මෙම පාඨමාලාව තුළින් විද්‍යාර්ථියාගේ සංගීත විෂයට අදාළ විද්‍යාත්මක ඥානය සහ තුලනාත්මක දැනුම වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී සමාජ විද්‍යාව, මානව විද්‍යාව සහ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍ර කෙරෙහි ද අවධානය යොමු කිරීම විශේෂත්වයකි. මෙම පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික ආයතන, තාක්ෂණික ක්ෂේත්‍රය සහ මාධ්‍ය ආයතනවල රැකියා අවස්ථා උදා කර ගත හැකිය. ස්වකීය ගායන වාදන කුසලතා දියුණු කරගනිමින් විද්‍යාත්මක පසුබිමක කටයුතු කිරීමට විද්‍යාර්ථීන් හට අවකාශ සැලසේ.

ප්‍රාසාංගික කලාවේදී ගෞරව සංගීත උපාධි පාඨමාලාව - දක්ෂිණ භාරතීය සංගීතය

දක්ෂිණ භාරතීය ගායනය සහ වාදනය කෙරෙහි උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් හට එම විෂයට අදාළ ප්‍රාසාංගික කරුණු පිළිබඳ විශේෂ දැනුමක් ලබාගත හැකිවන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. ජාතික ඒකාබද්ධතාවය කෙරෙහි අවබෝධයක් ඇතිවන පරිදි මෙම පාඨමාලාවට විෂය ඒකක ඇතුළත් කොට ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික පදනම පිළිබඳව මෙන්ම දෙමළ ජනවාර්ගික සංස්කෘතික අධ්‍යයනය කිරීමට මෙමඟින් අවකාශ සැලසේ. දක්ෂිණ භාරතීය සංගීතය ලොව පිළිගත් සංගීත සම්ප්‍රදායක් වන අතර ශ්‍රී ලාංකේය ද්‍රවිඩ ජනතාව අතර ප්‍රචලිත වී ඇත. මෙම පාඨමාලාව තුළින් සිංහල ජනයා අතර ද මෙම සංගීත ක්‍රමය ප්‍රචලිත කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී අධ්‍යාපනික සහ සමාජයීය කරුණු කෙරෙහි ද අවධානය යොමු කොට ඇත.

මෙම පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ට රාජ්‍ය සහ පෞද්ගලික පාසල්වලට, රාජ්‍ය නොවන සංවිධානවල සහ මාධ්‍ය ආයතනවල රැකියා අවස්ථා ලබා ගත හැකිය. මෙම පාඨමාලාවේ විශේෂත්වය වනුයේ ඔවුනට සිංහල මෙන්ම ද්‍රවිඩ සංස්කෘතිය ද එකසේ අගය කිරීමට ද සංස්කෘතීන් අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට ඇති හැකියාවයි. විශ්වවිද්‍යාලය තුළ මෙන්ම බාහිර ආයතනවල ඒකාබද්ධ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීමට විද්‍යාර්ථීන් උනන්දු කරවනු ලැබේ.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය	-	E

ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය

මෙය පූර්ව-සායනික, පැරා-සායනික සහ සායනික පුහුණු විෂයන්වලින් සමන්විත වසර පහක පූර්ණකාලීන පාඨමාලාවකි. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම සඳහා රජයේ ආයුර්වේද රෝහලක අතිරේක එක් වසරක සීමාවාසික පුහුණුවක් අවශ්‍ය වේ. මෙම වැඩසටහන අධ්‍යයන වාර සහිත පාඨමාලා ඒකක ක්‍රමයක් යටතේ සිදු කරනු ලබයි. සෑම වසරක්ම අධ්‍යයන වාර දෙකකින් සමන්විත වේ. උපාධිය පිරිනැමීම සඳහා අවම වශයෙන් සම්මාන 150ක් ලබා ගත යුතුවන අතර උසස් පෙළ විභාගයේදී ජීව විද්‍යා අංශයෙන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයන් සඳහා පෙනී සිටි ශිෂ්‍යයින් උපාධිය සඳහා ඇතුළත්වීමට සුදුසුකම් ලබයි.

අධ්‍යයන වැඩසටහනේ පළමු සහ දෙවැනි වසරවල දී ශිෂ්‍යයින් විසින් ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ මූලිකාංග ඉගෙන ගනියි. තෙවැනි, හතරවැනි සහ පස්වැනි වසරවල දී කායචිකිත්සාව, දේශීය චිකිත්සාව, ස්ත්‍රී රෝග (නාරීවේදය), කෞමාරභාත්‍ය (ළමා රෝග), ශල්‍ය තන්ත්‍ර (ශල්‍යකර්මය), ශලාක්‍ය තන්ත්‍ර (උගුර, කන, නාසය) ඇතුළු ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සියලුම හරයාත්මක ක්ෂේත්‍ර ආවරණය කරනු ලැබේ. තෙවැනි වසරේ සිට සායනික පුහුණුව ද ආරම්භ කරනු ලබන අතර මූලික වශයෙන් යක්කල පිහිටි ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල සහ අනෙක් රජයේ ආයුර්වේද රෝහල්වල පවත්වනු ලැබේ. එමෙන්ම ප්‍රධාන ඖෂධ නිෂ්පාදන සමාගම්වල පිහිටි සුදුසුකම්ලත් නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ශිෂ්‍යයින්ට ඖෂධ සකස් කිරීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ද හැකියාව ලැබේ.

වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කළමනාකරණ අධ්‍යයන (TV)	-	E
ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යාව)	පාරිසරික විද්‍යාව	E
ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව)	ව්‍යවහාරික ගණිතය සහ ආගණනය	E
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	-	E
ව්‍යාපෘති කළමනාකරණය	-	E
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	E
බැංකුකරණය සහ රක්ෂණ	-	E

ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
ප්‍රසංග කලා	-	S
ජනමාධ්‍ය	-	S

ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය මඟින් ප්‍රසංග කලාව පිළිබඳ සිව් වසරක ගෞරව උපාධියක් නර්තනය, සංගීතය, නාට්‍යය හා රංගකලාව, සිනමා අධ්‍යයනය හෝ චිත්‍ර හා සැලසුම්කරණය යන විෂයයන්ගෙන් එකක් පිළිබඳව ලබාගත හැකිය.

විද්‍යාර්ථියා විසින් තෝරා ගන්නා විෂයෙහි න්‍යායික සහ ප්‍රායෝගික දැනුම හා සමාන්තරව අනෙකුත් ප්‍රසංග කලා විෂයන් පිළිබඳ දැනුම වර්ධනය කෙරෙන ආකාරයෙන් මෙම ගෞරව උපාධිය සැලසුම් කර ඇත.

ඉහත අරමුණ සැපිරීම සඳහා යෝග්‍ය වන පරිදි සියලු විද්‍යාර්ථීන් විසින් තෝරාගන්නා ප්‍රධාන විෂයට අමතරව සම්පූර්ණ කළයුතු හර විෂයන්, පදනම් පාඨමාලා සහ වෛකල්පිත විෂයන්ගෙන් සමන්විතව ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සැකසී තිබේ.

අවසන් වසර තුළ විද්‍යාර්ථියා ප්‍රායෝගික වැඩ ලෝකයට සුහුරු කිරීම අරමුණු කරගනිමින් ප්‍රායෝගික නිෂ්පාදන ව්‍යාපෘතියක් සම්පූර්ණ කළයුතු වේ.

ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලීය ශ්‍රී පාලි මණ්ඩපය සිව් අවුරුදු ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.

ජනමාධ්‍ය අධ්‍යයන අංශය විෂය ඒකක ක්‍රමයට අනුව සිව් අවුරුදු පාඨමාලාව ඉදිරිපත් කරනු ලබයි. ජනමාධ්‍යවේදයේ සංකල්ප සිද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම ලබාදීම මෙම ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ.

මෙම පාඨමාලාවේ විෂය නිර්දේශය පහත සඳහන් සිව් වැදෑරුම් පාඨමාලාවකින් යුක්ත වේ.

1. ප්‍රධාන විෂය පාඨමාලා
2. පදනම් පාඨමාලා
3. වෛකල්පිත පාඨමාලා හා
4. සේවා පාඨමාලා වශයෙනි.

ජනමාධ්‍ය අධ්‍යයන අංශය මඟින් වසර හතර පුරා මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.

ත්‍රිකුණාමල මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
කළමනාකරණ අධ්‍යයන (TV)	කළමනාකරණය, ගණකාධිකරණය සහ මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු පද්ධති, අලෙවි කළමනාකරණය	E
සන්නිවේදන අධ්‍යයන	සන්නිවේදනය, වාග් විද්‍යාව, ඉංග්‍රීසි	E
සිද්ධ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය ##	-	E
ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව)	-	E
පරිගණක විද්‍යාව	-	E

විද්‍යාත්මක පර්යේෂණ ප්‍රවේශය අනුව පුහුණුකර මනා අධ්‍යාපනයක් ලත් දේශීය වෛද්‍යවරුන් ඇති කිරීමෙන් මෙම පද්ධතිය විද්‍යාත්මකව ඉහළ නැංවීම.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
පරිගණක විද්‍යාව	-	E
තොරතුරු පද්ධති	-	E

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

අධ්‍යයන පාඨමාලාව	විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)	ඉ/මා
සංගීතය	-	T
නර්තනය	-	T
නාට්‍ය හා රංග කලා	-	T
දෘශ්‍ය සහ තාක්ෂණික කලා	-	T